

අභිධර්ම කොෂය

ප්‍රථම භාගය

පරමාර්ථ රත්නාවලී

ව්‍යාඛ්‍යා සහිතයි.

බොධිසත්ත්ව වසුබන්ධු ආචාර්යයන් විසින් ප්‍රණීත

අභිධර්ම කෝශය.

ප්‍රථම භාගය.

පානදුරේ
රත්කොත් විහාරාධිපති
කරඹම්පිටියේ ජෝතිරත්නාභිධාන අමරපුරනිකායේ අධිකරණ
නායක මහාස්ථවිර සවාමිපාදයන් වහන්සේගේ
ප්‍රධාන ශිෂ්‍ය වූ
පින්වල පාටලිරුක්ඛාරාම විහාරවාසී,
පානදුරේ රත්කොත් විහාරයේ සෞගත විද්‍යාලයාධිපති පණ්ඩිත
මොරටුවේ සාසනාරතන ස්ථවිරයන් වහන්සේ

විසින්

ලියන ලද

පරමාර්ථ රත්නාවලී

ව්‍යාඛ්‍යා සහිතයි.

පානදුරේ
වදුරුමුල්ලේ "සිසිර" නිවාස වැසි
ඇම්. ඇල්ප් සී. පෙරේරා මහතා විසින්

පානදුරේ
නන්දන සන්ත්‍රාලයේ මුද්‍රණය කරවන ලදී.

බු: ව: 2492
ක්‍රි: ව: 1948

Acarya Bodhi Sattva Vasubandhu's

Abhi Dharma Kosaya.

PART I

with

The Commentary of

Paramartha Ratnavali.

Edited By

Rev. Pandit Moratuwe Sasanaratana Thero

of

Patali Rukkharamaya

Pinwala. Panadura.

The Principal of Saugata Viddyalaya,

Rankot viharaya, Panadura.

and

Pupil of

Ven'ble Karagampitiye Jotiratana

Adhikarana Nayaka Maha Thera.

Rankot Viharaya,

Panadura.

Published by

Mr. M. F. C. Perera,

"Sisira" Wandura Mulla, Panadura.

Printed at

The Nandana Press.

Panadura.

2492 B. E.

1948 A. D.

ආශ්‍රිත හා සංධක ග්‍රන්ථ

අඞ්ගුත්තර නිකාය
අත්ථසාළිනී
අත්ථසාළිනී සන්නය
අභිධර්ම චන්ද්‍රිකා
අභිධර්ම ප්‍රදීපිකා
අභිධර්මය
අභිධර්මාර්ථ සඞ්ග්‍රහ භාව සන්නය
අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නය
අමර කොෂය
ආර්ය විද්‍යාසුධාකර
උදානට්ඨකථා
උදාන පාළි
උපදෙශ සාහශ්‍රී
උපනිෂද්
කඨොපනිෂද්
කථාවත්ථුප්පකරණ
චුල්ලවග්ග පාළි
ජාතකට්ඨකථා
තෛත්තිරීය ආරණ්‍යක
දිව්‍යාවදාන
දීඝනිකාය
දීපවංසය
ධම්මපදට්ඨකථා
ධම්මසඞ්ගණිප්පකරණ
ධර්මප්‍රදීපිකා
නාලන්දිකා ටීකා
නිකාය සඞ්ග්‍රහය
න්‍යාය කුසුමාඤ්ජලි
න්‍යාය ප්‍රවේශය
න්‍යාය බිත්දු
පඤ්චප්පකරණට්ඨකථා
පට්ඨානප්පකරණ
පටිච්චසමුප්පාද විවරණ
පද්මොත්තර ඛණ්ඩ
පපඤ්ච සූදනී
ප්‍රඥා පාරමිතා
ප්‍රපඤ්ච දීපිකා
බෘහදාරණ්‍යක උපනිෂද්
බ්‍රහ්ම සූත්‍ර භාෂ්‍යය
බ්‍රහ්මවත් ටීකා
මඤ්ජු ශ්‍රී මූල කල්ප
මනොරථ පූරණී
මනු සමෘති
මහා භාරත
මහා රූප සිද්ධි ව්‍යාඛ්‍යා
මහා වංසය
මාධ්‍යමික කාරිකා
මිලින්ද ප්‍රශ්නය
මුණ්ඩකොප නිෂද්
රත්නාවලී (නාගාර්ජුන)
විභඞ්ගට්ඨකථා
විභඞ්ගප්පකරණ
විභාවිනී ටීකා
විමති විනොදනී ටීකා
විවෙක විලාස
විශුද්ධිමාර්ග ව්‍යාඛ්‍යා
විසුද්ධිමග්ග
විසුද්ධිමග්ග ටීකා
වෙදාන්ත සාර
සඩර්ම රත්නාකරය
සමන්ත පාසාදිකා
සමෙමාහ විනොදනී ටීකා
සර්වදර්ශන සඞ්ග්‍රහ
සාරත්ථ දීපනී ටීකා
සංයුත්ත නිකාය
ස්‍යාද්වාද මඤ්ජර්
සුත්ත නිපාතට්ඨකථා
සුමඞ්ගල විලාසිනී
සුශ්‍රැතය
Asoka
Buddhism
Cultural Haritage of India
Cambridge History of India
History of Buddhist Thought
History of India (Dunber)
History of India (Sinha)
India
Lankawatar Sutra
Mahawansa
The Gods of Northern Buddhism

විඥපතිඃ

අස්ති පානදුරාක්‍ඛ්‍යාතා
පුරී වාසව පුරිව
ප්‍රභූජන ගණාකීර්ණා
විබුධෛඃ සෙවිතා සදා

ස්වර්ණ ශාඛශාශ්‍රමො නාම
විහාරස්තත්‍ර රාජතෙ
පුණ්‍යාර්ත්ථිනාං සිද්ධ භූමි-
රාකරඃ පුණ්‍ය සම්පදාම්

තත්‍රාධි පත්‍ය මුපගො
ධර්ම ශාස්ත්‍ර විශාරදඃ
ජීව්‍යාච්චිරං මමාචාර්‍යො
ජ්‍යොතිරත්න යතීශ්වරඃ

ආබාල්‍යාත්තස්‍ය පාදාබ්ජ
රෙණූන් චුම්බයතා සදා
සුශික්ෂිතෙන සාවීඥෙ
ශාස්ත්‍රෙෂු ච ප්‍රයත්නතඃ

ප්‍රධානාචාර්‍ය යතිනා
විද්‍යා සදමති සෞගතෙ
නාම්නා ශාසනරත්නෙන
පණ්ඩිතොපාධි ධාරිණා

ව්‍යාක්‍ඛ්‍යා'භිධර්මකොශස්‍ය
කෘතෙ'යං ධර්ම දීප්තයෙ
සා සාධූනාං මනීසීනාං
ප්‍රමොදායෙව වර්තතාම්

ඊර්ෂ්‍යා පිශාචි චාපල්‍යා-
දවිචාරතයා'පි යෙ
නින්දන්තු වා ප්‍රශංසන්තු
න තච්ඡ්‍රශ්‍රූයතෙ මයා

ශම්.

භූමිකා.

බුද්ධ පරිනිර්වාණයෙන් ප්‍රථම ශතවර්ෂය අවසානයේදී වෛශාලියෙහි වාත්සීපුත්‍රීය (=වජ්ජිපුත්‍රක) භික්ෂූන් ඉපද වූ දශ වස්තුව නිසා සත්සියයක් මහරහතන් වහන්සේ විසින් කාලාශොක (ක්‍රි: පූ: 390-365) රජුගේ සහායත්වයෙන් චිතීය සඞ්ගීතිය පවත්වා ස්ථවිර වාදයට විරුද්ධ මිතධාරී දසදහසක් * භික්ෂූහු අධර්මවාදී හුය යි නෙරපන ලදහ. එසේ නෙරපනු ලැබූ භික්ෂූහු කොසඹැ නුවර අන්‍යතර මහා සමේමලනයක් පවත්වා මහාසඞ්ඝික 1 නම් ආචාර්‍යවාදයක් ඇති කළහ මේ ආචාර්‍යවාදය 2 මහා සඞ්ගීති නමින් දිපවංසයෙහි හඳුන්වයි ලක්දිව ශාසනවංශ ග්‍රන්ථවල සහ අටුවාවන්හි දක්නා අයුරු ඒ චිතීය සඞ්ගීතියෙන් බැහැර කළ භික්ෂූන් නිසා උතුරු බුද්ධාගම හෙවත් මහායාන බුද්ධාගම ආරම්භ විය.

චිතීය සඞ්ගායනාවට හෙතුවූ දශවස්තුව පිළිබඳ විනිශ්චය ඉතා බැරෑරුම් කරුණක් 3 විය. වජ්ජිපුත්‍රක භික්ෂූන්ට පළමු වෙන් පක්ෂ වූ කාලාශොක රජ පසුව සඞ්ගීතිකාරක ස්ථවිරයන් වහන්සේට පක්ෂ විය. චූල්ලවග්ග පාළියේ දක්නා අයුරු වජ්ජි පුත්‍රක භික්ෂූන්ට දශවස්තුවටත් වඩා උවමනා වූයේ 4 "බුදු වරුන් පෙරදිග ජනපදයන්හි උපදින බව ද, පෙරදිග වැසි භික්ෂූන් ධර්මවාදීන් බව සහ පාවෙය්‍යක භික්ෂූන් අධර්මවාදීන් බව ද," පිළිගන්වා ගැනීම යි. මෙය විසඳනු පිණිස ප්‍රාචීනක-පාවෙය්‍යක දෙපක්ෂයෙන් අටනමකින් යුත් උබ්බාහිකා (=කාරක සභා) වක් පත්කරන ලදි. ඒ උබ්බාහිකාවට අයත් අටනම දශ වස්තුව විනිශ්චය කළා විනා බුදුවරු කොහි උපදිත් ද? ප්‍රාචීනක-පාවෙය්‍යක භික්ෂූන්ගෙන් කවරහු අධර්මවාදීහු වෙත් ද? යන

---

* මහාවංස 5 පරි: 3 1. නිකාය සඞ්ග්‍රහ 5 2 දිපවංස 5 පරි:

3 ඉදං බො අධිකරණං කක්ඛළඤ්ච වාළඤ්ච-චූල්ලවග්ග පාළි 444

4 එත්තකං භන්තෙ ථෙරෙ සඞ්ඝ මජ්ඣෙ වදෙතු-පුරත්ථිමෙසු ජනපදෙසු බුද්ධා භගවන්තො උප්පජ්ජන්ති ධම්මවාදිනො ප්‍රාචීනා භික්ඛූ. අධම්මවාදිනො පාවෙය්‍යකා භික්ඛූති.

චූල්ලවග්ග පාළි. 446.

කරුණු විනිශ්චය නො කළහ. දෙපසින් දෙනම බැගින් සතර නමක් වෙන තැනකදී පෙරදිග වැසි භික්ෂූන් අධර්මවාදීන් බව ප්‍රකාශ කළ නමුදු ඒ පිළිබඳ නියම විනිශ්චයක් නො කළහ. බුදුවරු කොහි උපදිත් ද? යනු එවක මතභෙද සහිතව ම පැවැත්තේ ය. මිනිය සඞ්ගිතියෙන් නෙරපනු ලැබූ භික්ෂූහු පිරිස් බලයෙන් දියුණුවූවාහු වෛශාලියෙහි ද, තමන් ගේ බලය පෙන් වමින් ඉතා ඉක්මනින් පැතිරී ගියහ.

කාලාශොක රජුගේ අභාවයෙන් පසු උත්තර භාරතයේ රජවරුන් අතර භෙදභින්නතා වැඩි වූවාය. නන්දරාජ පරම්පරාව ධනනන්ද රජුගෙන් අවසාන කොට * චාණක්‍ය මන්ත්‍රීන් විසින් චන්ද්‍රගුප්ත රජු (ක්‍රි: පූ: 322) සිංහාසනාරූඪ කරවනතුරු උත්තර භාරතයේ බලසම්පන්න රජෙක් නො විය. චන්ද්‍රගුප්ත රජුගෙන් ආරම්භ වූ මෞර්‍ය අධිරාජ්‍යයේ මුල් අවධියේ දී ම 1 මහ ඇලෙක් ෂැන්ඩර් රජුගේ භාරතාවතරණය (ක්‍රි: පූ: 327-326) සිදු වූ බැවින් උත්තර භාරතයේ දෙශපාලන කලබල නිතරම හටගත් තේ ය. ක්‍රි: පූ: 305 දී ඉන්දියාව ආක්‍රමනය කළ සිරියාවේ රජුට විරුඩව විශාල බළ සෙනඟක් ගෙන පෙරමුණට ගිය චන්ද්‍රගුප්ත රජ සෙලුසියස් රජු 2 පැරැද විය. මේ යුද කලබල අතර ධ්‍රහ්මාගම්, බුඩාගම සහ ජෛනාගමත් 3 තැනින් තැන පැවැත්තේ ය. බුද්ධාගම සහ ධ්‍රහ්මාගම අතර බලවත් තරඟ යක් ද, වූයේ ය. මේ අතර භික්ෂූහු පිරිස් බලයෙන් දියුණු වූ නමුදු නියම පාලකයකු නැති බැවින් නානා නිකායවලට කැඩී බිඳී ගියහ. මෙහි වෙගය කොතරම් ද යත්? කාලාශොක - ධර්මා ශොක දෙරජුන් අතර වූ ශතවර්ෂය තුළ භික්ෂූහු නිකාය සතළොසක් වූහ. දීපවංසයේ දක්වන අයුරු ඒ නිකායයන් ගේ ප්‍රභවය මෙසේ ය.

---

* මහාවංස 5. 17. 1 Cambridge History of India P. 470

2 History of India. By Dunber. P. 48

3 The three Faiths, Brahmanism, jainism and Buddhism, lived side by side. But the age had grown tired of eloborali ritual and Buddhism was challenging Brahmanism.

History of India P. 48



මේ බෞද්ධ නිකායයන්ගෙන් බුදුඩ පරිනිර්වාණයෙන් ප්‍රථම ශත වර්ෂය අවසාන වනතුරු * එක ම ස්ථවිර නිකාය පමණක් පැවැති බව ලක්දිව ශාසනවංස ඉතිහාසයෙහි සඳහන් වේ. බුදුඩ පරිනිර්වාණයෙන් දෙවන ශතවර්ෂයේ අවසානය සහ තුන්වන ශත වර්ෂයේ මුල් භාගය අතර පැවැති විතීය තෘතීය සඞ්ගායනාවන් ගෙන් පසු1 ඉතිරි නිකායයන්ගෙන් වැඩි හරියක් පැන නැංගේය. එසිතුදු හෙමවත-රාජගිරික-සිද්ධත්ථික-පුබ්බසෙලීය- අපර සෙලීය-වාජිරිය යන ෂඩ්නිකාය ආරම්භ වුයේ බුද්ධවර්ෂයෙන් තුන්වන ශතවර්ෂයේදී ය ධම්මරුචි හෙවත් අභයගිරි නිකාය බුද්ධ වර්ෂයෙන් පස්වන ශතවර්ෂයේ වළගම්බා කාලයේ ද, සාගලිය හෙවත් ජේතවන නිකාය බුද්ධ වර්ෂයෙන් නවවන ශතවර්ෂයේ අවසාන භාගයේ මහසෙන් රජු දවස ද, ආරම්භ විය.

* දීපවංස පරි 5, මහාවංස, පරි 5 1 නිකාය සඞ්ගුණය 7

ඉට්සිං නම් චීන ග්‍රන්ථ කතෘ කියන හැටියට මහා සඞ්ඝික නිකායයේ ශාඛා සතකි. ස්ථවිර වාදයේ ශාඛා තුනකි සර්වාස්ති වාදයේ ශාඛා සතරකි සම්මතීය නිකායයේ ද, ශාඛා සතරකි. මහාව්‍යුත්පත්ති කථාව අනුව මේ සියලු නිකායාන්තරයෝ 1 ආර්‍ය සර්වාස්තිවාද. 2 ආර්‍ය සම්මතීය. 3 ආර්‍ය මහා සඞ්ඝික. 4 ආර්‍ය ස්ථවිර යනුවෙන් කොටස් සතරකට බෙදෙති.

i ආර්‍ය සර්වාස්ති වාද
- 1 මූල සර්වාස්ති වාද
- 2 කාශ්‍යපිය
- 3 මගීශාසක
- 4 ධර්මගුප්තිය
- 5 බහු ශ්‍රැතිය
- 6 තාම්‍රශාටිය
- 7 විභජ්‍ය වාදි

ii ආර්‍ය සම්මතිය
- 1 කුරුකුල්ලක
- 2 ආවන්තික
- 3 වාත්සීපුත්‍රීය

} මේ දශ සාම්ප්‍රදායිකයෝ වෛභාෂික සිද්ධාන්තයන් පිළිගත්හ.

iii ආර්‍ය මහා සඞ්ඝික
- 1 පූර්වශෛල
- 2 අවරශෛල
- 3 හෛමවත
- 4 ලොකොත්තරවාදි
- 5 ප්‍රඥප්තිවාදි

iv ආර්‍ය ස්ථවිර
- 1 මහා විහාර
- 2 ජේතවනීය
- 3 අභය ගිරික

} මේ අෂ්ට සාම්ප්‍රදායිකයෝ සෞත්‍රාන්තික සිද්ධාන්තයන් පිළිගත්හ.

භදන්ත වසුමිත්‍රගේ 2 මතය අනුව එකව්‍යාහාරික-කුක්කුරික-ලොකොත්තරවාද-බහුශ්‍රැතිය - ප්‍රඥප්තිවාද-යන නිකායයෝ බුඩ වර්ෂයෙන් දෙවන ශතවර්ෂයේදී හටගත්හ. තුන්වන ශත වර්ෂයේදී සර්වාස්තිවාද-විභජ්‍ය වාද-හෛමවත-වාත්සී පුත්‍රීය-ධර්මෝත්තරීය-භද්‍රයානීය-සම්මතීය- ෂණ්ණාගාරීය - මහීශාසක- ධර්ම ගුප්තීය යන නිකායයෝ හටගත්හ. සිව්වන ශතවර්ෂයේදී සඞ්ක්‍රාන්තික-සූත්‍රවාද නිකායයෝ හටගත්හ.

ක්‍රි: ව: සත්වන ශත වර්ෂයේ අවසාන භාගයේදී 3 මගධ ජනපදයෙහි සහ ඉන්දියාවේ උතුරුදිග පළාත්වල සර්වාස්තිවාදීහු ද, වයඹදිග සම්මතීයයෝ ද. දකුණුදිග ස්ථවිරවාදීහු ද, පැතිරී සිටියාහ. නැගෙනහිරි පළාත්වල සර්වාස්තිවාදීහු ද, සම්මතීයයෝ ද, මහා සඞ්ඝිකයෝ ද, මිශ්‍රව සිටියාහුයයි ක්‍රි: ව: 7 වන ශත වර්ෂයේ අවසාන භාගයේ දී ඉන්දියාවට පැමිණි ඉට්සිං නම් චීනයාත්‍රික පඬිවරයා කියයි. මෙයින් ඉතා වැදගත් වූයේ 4 සර්වාස්තිවාදයයි.

ක්‍රි: ව: 7 වන ශතවර්ෂය වනවිට සර්වාස්තිවාදය සමස්ත භාරතයේ සෑම තැන ම වාගේ පැතිරී ගියේය. හියු එං සියැං චීන භික්ෂුව භාරතයේ සැරිසරද්දී සර්වාස්තිවාදී නිකායට අයත් ආරාම සිය ගණනක් ද, ඒවාහි දහස් ගණන් භික්ෂූන් ද, දුටු බැව් ඒ භික්ෂුව ගේ ගමන් වාතීවේ සඳහන් වේ. බාණභට්ටයන් ගේ කාදම්බරියෙහි ද, සර්වාස්ති වාදය සඳහන් කරයි. ඒ වකවනුවේ සර්වාස්තිවාදය බොහෝ දෙනා ගේ ගෞරවයට භාජන විය.

බුඩ ඝොෂාචාර්ය පාදයන් වහන්සේ (ක්‍රි: ව: 5 වන ශතවර්ෂය) ගේ කථාවස්තු ප්‍රකරණ අටුවාහි 5 ඉන්දියාවේ උතුරු-දකුණු දෙදිග පැතිර සිටි ස්ථවිරවාද-සම්මතීය-මහාසඞ්ඝික-සර්වාස්තිවාද-නිකායිකයන්ගේ සහ අන්ධක - උත්තරාපථක - වෙතුලල නිකායිකයන්ගේ මතාන්තරයෝ ද, දක්නා ලැබෙත්.

---

2 Bnddhist sects P. 286

3 Buddhist sects P. 286

4 The Chief schools that have to be Considered in Connection will the new buddhological doctrines are the Theravadins, the Mahasaṅghikas, and the Sarvastivadins, of these the Sarvastivadins are the most importint. Their cheif seat was at Mathura, but they extended up to the north west as far as Kasmir,

History of Buddhist Thought P. 167

5. Mahawanda Geigar Vol I P. 287.

ක්‍රී: පූ: 324 දී මහ ඇලෙක්ෂැන්ඩර් රජ පර්සියාවේ සුසා නගරයේදී කාල ක්‍රියා කෙළේය. ඒ වනතුරු පඤ්ජාබය ඇතුළු භාරතයේ වයඹ දිග පළාත් ග්‍රීක් සෙනෙවියන් යටතේ පැවැත්තේය. රජුගේ මරණයෙන් පසු මගධාධිපති චන්ද්‍රගුප්ත අධිරාජයෝ ග්‍රීකයන්ගෙන් භාරතය මුදාගෙන කීර්තිමත් වූහ නම්දා නදිය, හිමාලය සහ හින්දුකුෂ් පර්වත කෙළවර දක්වා සමස්ත උත්තර භාරතය තමන්ගේ ශාසනාධිකාරයෙහි කැඩූහ ග්‍රීක් වීරයෙක් වූ සෙලුකස් තෙමේ චන්ද්‍රගුප්ත රජු සමග යුඩකොට පැරැදි ග්‍රීක් ආණ්ඩුව යටතේ පැවැති පඤ්ජාබ් දෙශය සහ කාබුල් දෙශය ද, බොහෝ යුද්ධොපකරණ ද, * පාවා දී චන්ද්‍රගුප්ත රජු හා සමගි විය. චන්ද්‍රගුප්ත රජ ග්‍රීක කුමරියක් ද, ආවාහ කර ගත්තේය. ඒ ප්‍රාචීන කාලයෙහි හින්දු ග්‍රීක් ජාතීහු අතිශයින් ම සභ්‍ය වූහ. ග්‍රීකයෝ භාරතීයයන්ගෙන් නානා විද්‍යා කලාවන් හා ආධ්‍යාත්මික චින්තාවන් ද, හින්දුහු ග්‍රීකයන්ගෙන් ජ්‍යොතිශ් ශාස්ත්‍රය, ගණිත ශාස්ත්‍රය සහ ප්‍රතිමා කලා ශිල්පාදිය ද, උගත්හ. චන්ද්‍රගුප්ත රජුගේ අධිරාජ්‍යය කුඩා රාජ්‍ය එකසිය අටළොසකට බෙදන ලද ප්‍රතිරාජයන් 1 තිදෙනකු යටතේ පැවැති, රාජ්‍ය තුනකින්, යුක්ත විය. තක්ෂශිලා-උජ්ජයිනී-තොසලි-යන නගරයෝ ඒ රාජ්‍යයන්හි අගනුවරවල් වූහ. ප්‍රතිවිරුඬ රජුන් පරදවා භාරත වර්ෂයෙහි සර්ව ශ්‍රේෂ්ඨ පදවියට පත් චන්ද්‍රගුප්ත අධිරාජයෝ ක්‍රී: පූ: 298 දී පමණ කාලක්‍රියා කළහ.

චන්ද්‍රගුප්ත අධිරාජයාගේ මරණින් පසු "අමිත්‍ර ඝාත" යනුවෙන් ද, හඳුන්වන බින්දුසාර රජ ක්‍රී: පූ: 297 දී සිංහාසනාරූඪ විය. පිය රජු මෙන්ම ග්‍රීකයන් හා මිත්‍රත්වයෙන් වෙසෙමින් විද්‍යා කඳුවැටිය 2 දක්වා ස්වකීය අධිරාජ්‍යය විශාල කළ බින්දුසාර රජුගේ රාජ සභාවේ ග්‍රීක් තානාපතිවරු ද, සිරියාවේ රජු විසින් යැවූ තානාපතිවරු ද, සිටියාහ එහෙත් චන්ද්‍රගුප්ත රජුට තරම් බලයක් බින්දුසාර රජුට නො විය චන්ද්‍රගුප්ත බින්දුසාර රජවරු බෞද්ධයෝ ද නො වූහ. මේ වකවනුවේ අශොක කුමාරයා උදේනියේ ප්‍රතිරාජයා විය. ක්‍රී: ව: 273 දී බින්දුසාර රජු කාලක්‍රියා කළ බැවින් මගධාධිරාජ්‍යය තත් පුත්‍ර අශොක කුමාරයාට අයිති විය.. එහෙත් අවුරුදු සතරක් ගතවනතුරු 3 අශොක

---

* India. By Rawlinson P. 66

1 India P. 69

2 India. P. 75. 3 India. P. 75.

කුමාරයා ඔටුණු නො පැළැන්දේ ය. ක්‍රිස්තු පූර්ව 269 දී පමණ සිංහාසනාරූඪවූ අශොක රජුගේ මුල් අවුරුදු කීපය ගතවූයේ ස්වකීය අධිරාජ්‍යය විශාල කර ගැන්මට ය එබැවින් * දක්ෂිණ භාරතයෙහි ද, ස්වකීය ආඥාවක්‍රය පවත්වනු කැමැති අශොක රජ රාජ්‍යයෙන් 8 වැනි වර්ෂයෙහි දී කාලිඞ්ගය (ඔරිස්සා) ආක්‍රමණය කෙළේය. මහානදි-ගොදාවරී 1 නදි අතර පිහිටි කාලිඞ්ගය ජයගැන්ම අශොක රජුට දුෂ්කර කරුණක් විය. අශොක බළසෙනඟට නො පරදින බළ සෙනඟක් කාලිඞ්ග රජුට සිටිය නමුදු අවසානයේ කාලිඞ්ගය අශොක අධිරාජ්‍යයට යටත් විය. කාලිඞ්ග යුඩයේදී සිදු වූ ජීවිත විනාශය නිසා අශොක රජ සම්පූර්ණයෙන් වෙනස් විය. ඒ යුද්ධයෙහි දී එක්ලක්ෂ පණස් දහසක් මිනිසුන් සිරභාරයට ගෙන එරටින් ඉවත් කරන ලදී. ලක්ෂයක් යුද්ධයෙහි දී මරන ලදී. සෙසු මියගියවුන් ගේ ගණන ද, ඉතා විශාලය. අශොක රජු විසින් ම පිහිටවූ ෂාබාශ්ගර්හි තෙළෙස්වන ලිපියෙන් 2 කියන අයුරු කාලිඞ්ග යුඩයේ දී සිදු වූ ජීවිත විනාශය නිසා අශොක රජ ඉතා කණගාටු විය.

---

* Asoka, to enlarge his empire towards the south, made war upon the Dravedian kingdoms of the Kalinga, and Conquered it— History of India P. 48

1 India P. 75.

2. I (අඨ) වස අ (භි) සිත (ස දෙවන) ප්‍රි (ය) ස ප්‍රි (ය) දශිස ර (ඤ්ඤ) ක (ලිඟ) විජිත දියඩ මත්‍රෙ ප්‍රණ ශත (සහ) ස්‍රෙයෙ තතො අපවුඨෙ ශත සහස්‍ර මත්‍රෙ තත්‍ර හතෙ බහු තවත (කෙව) මුටෙ.

ii තතො (ප) ව අ (ධු) න ලධෙෂු (කලිඟෙෂු) තිව්‍රෙ ධ්‍රමගිලන ධ්‍රම-ක මත (ධ්‍රමනු ශස්ති ව දෙවන ප්‍රියස සො (අ) සති අනුශොවන දෙවන ප්‍රියස විජිතති කලඟති.

ili අවිජිතං (ඝිව්) ජීන මනො යො තත්‍ර වධ ව මරණං ව අපව ශොව ජනස තං ධඪං වෙදනිය ම (තං) ගුරු මතං) ව දෙවනං ප්‍රිය ස ඉදං පි වු තතො ගුරු මතතරං දෙවනං ප්‍රියස යෙ තත්‍ර වසති ධ්‍රමණ ශ්‍රමණ අංඤ්ඤෙ ව ප්‍රෂංඩ ග්‍රහත ව යෙසු විහිත එෂ අග්‍ර භූටි සුශ්‍රැෂ මත පිතුෂු සුශ්‍රැෂ ගුරුන සුශ්‍රැෂ මිත්‍ර සංස්තුත සහය.

v ක්‍රති කෙෂු දස භටකනං සම්ම ප්‍රති ප (ති) ද්‍රිඪ භතිත තෙෂ තත්‍ර හොති (අ පග්‍රතො ව වධොව අභිරතන ව නික්‍රමණං යෙෂ වපි සුවිහිතනං (සි) හො අපි ප්‍රහිනො එතෙ ෂ මිත්‍ර සංස්තුත සහය ක්‍රතික වසන ප්‍රපූණති තත්‍ර තං පි තෙෂ වො අපස්‍රතො හොති.

* "මේ රාජ්‍යයෙහි බ්‍රාහ්මණ-ශ්‍රමණ මිථ්‍යා ගුරු ජනයන් කෙරෙහි අශෝක රජ භක්තිය කෙරේ. නෑ නොනෑ ආත්මීය සවජන දුසි දුසයන් කෙරෙහි සද්ව්‍යවහාරය කෙරේ මෙසේ චාරිත්‍රවත් ජනයා යම් දෙශයක වාසය කෙළේ ද. ඒ දෙශය විනාශ කරන ලද්දේ ද, යමෙක් ශීල චාරිත්‍ර ඇති මවුන් නැසුයේ ද, වන්දි කරන ලද්දේ ද. අශෝක ද, සවභාවයෙන් ම මවුන් අනුව තැවේ"

මෙසේ කාලිඛය යුද්ධයෙන් සිදු වූ ජීවිත විනාශය නිසා පසු තැවිලි වූ අශෝක රජ පසුව මථුරා වැනි 1 උපගුප්තා සථවිරයන් වහන්සේ වෙතින් බුඩාගම පිළිගත්තේය. ලක්දිව ශාසනාරම්භ ඉතිහාසයෙහි උපගුප්ත සථවිරයන් වහන්සේ මොග්ගලිපුත්ත තිස්ස 2 තෙමේන් හඳුන්වනු බුඩාගම වැළඳගැනීමට පෙර ඉතා දරුණු වූ අශෝක රජ ඉන්පසු ධර්මිෂ්ඨයෙක් විය අශෝක රජු බුඩාගම පිළිගැන්ම බුඩ ධර්මය භාරතයෙහි සහ භාරතයෙන් පිටත් රාජ්‍ය යන්හි ද, පැතිරි යෑමට හේතු විය. මේ කාලය වන විට සමසමා භාරතයම වාගේ අශෝක රජු යටතේ පැවැත්තේ ය එසේ ම ග්‍රික්-රෝම-සිරියා දී රාජ්‍යයන් සමග ඉතා කිට්ටු සම්බන්ධයක් ද, ඇති විය. අශෝක රජ බුඩාගම පිළිගත් නමුදු එවක පැවැති 3 සියලුම ආගම්වලට හරු කෙළේ ය

අශෝක රජු බෞද්ධයකු වන විට භාරතයේ බුඩ ශාසනය ඉතා භයානක තත්ත්වයක පැවැත්තේ ය. අශෝක රජුට පෙර ආඥාචක්‍රවර්ති බෞද්ධ රජකු නොවූ හෙයින් ද, නානා නිකායික යන්හෙන් බෞද්ධ සඞ්ඝයා යුක්ත වූ හෙයින් ද, තීර්ථකයින් පවා ලාභසත්කාර උදෙසා 4 පැවිදි විම නිසා ද, ශික්ෂාකාම භික්ෂු සමූහයා ගේ වචනයට දුශ්ශීල භික්ෂූන් කන් නොදුන් නිසා ද, බුඩ ධර්මය භාරතයෙහි මෙලෙසී පැවැත්තේ ය. මේ නිසා සත් අවුරුද්දකින් පොහෝ පවුරුණු කිරීමක් නොවිය. බුඩ ධර්මය 5 නානා වාදයන්ගෙන් දූෂිත විය.

---

* India. P. 77 1. India. P. 76 2. මහාවංස 5 193
3 India. P. 77 4. මහාවංස 5. පරි 220-235.

5 සයං කාසාව මාදය - වසිංසු සහ භික්ඛුහි
ශුද්ධා සකසමයෙ වාදං-බුඩ්ඩවාදෙති දීපයුං.

මහාවංස 5-231

එබැවින් බුද්ධ ශාසනය පිරිසුදු කරනු කැමැති ධර්මාශෝක රජ ක්‍රි: පූ: 259 (235?) දී පමණ මොග්ගලිපුත්ත තිස්ස (උප ගුප්ත?) මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අශෝකාරාම යෙහි දී භික්ෂූන් දහසකගෙන් යුත් මහා සම්මේලනයක් පවත්වා පුරා නවමසකින් ශාසන ශුද්ධියක් කර විය. මේ සඞ්ගයනාවෙහි දී පරවාදීන් ගේ මත ඛණ්ඩනය කරනු පිණිස මොග්ගලිපුත්ත තිස්ස ස්ථවිරයන් වහන්සේ විසින් "කථාවස්තු" ප්‍රකරණය * කරන ලදී. ශාශ්වතාදී නානා දෘෂ්ටිගත් සැට දහසක් භික්ෂූන් මේ සඞ්ගායනාවට පෙරාතුව ම රජු ගේ අනුමැතියෙන් සිව්රු හරවන ලදී. සිය පුතණුවන් වූ මහෙන්ද්‍ර කුමාරයා සහ සඞ්ඝමිත්‍රා දියණි ය ද, පැවිදි කරවූ ධර්මාශෝක රජතුමා බුද්ධ ධර්මය ලොකයේ පැතිරවීම පිණිස ස්වකීය අධිරාජ්‍යයෙහි මෙන් ම එයින් පිටත් නොයෙකුත් රටවලට ද, 1 ධර්මදූතයන් පිටත් කර යැවීය. සිරියාව ඇතුළු බටහිරි ආසියාවට ද, මැසිඩෝනියා එපිරස් ඇතුළු නැගෙනහිරි යුරෝපයට ද, ඊජිප්තුව ඇතුළු උතුරු අප්‍රිකාවට ද, වෙල (මාන්ද්‍රාජ්) පාණ්ඩ්‍ය (මදුරා) සත්‍යපුර (සත්‍යපුර පර්වත ශ්‍රේණි) කෙරළ (ත්‍රිවාංකුර) කාශ්මීර-ගන්ධාර-මයිසූර්-පඤ්ජාබ්-බැක්ට්‍රියා-මධ්‍ය හිමාලය-පහළ බුරුමය යන රටවලට ද, ධර්මදූත යන් යැවීය. සිරියා-මිශර-එපිරස්-මැසිඩෝනියා සහ සිරිනේර්හි ග්‍රීක් රාජ්‍යයන් වෙත ද, අශෝක රජුගේ ධර්මදූතයෝ ගියාහුය යි අශෝක ලිපියක ම සඳහන් වේ. එතුමා තම පුත්‍ර මහෙන්ද්‍ර මහ රහතන් වහන්සේ ඇතුළු ධර්මදූත පිරිසක් ද, සඞ්ඝමිත්‍රා නම් සිය දියණිය වූ රහත් මෙහෙණිය ද, ලංකාවට එවිය. ස්වකීය ආඥාචක්‍රය පැවැති සියලු ම පළාත්වල නොයෙකුත් ධර්මානුශාසනා ලිපි ලිය වූ චක්‍රවර්ති අශෝක රජ 2 ශ්‍රේෂ්ඨ ගෘහ නිර්මාණ ශිල්පියෙක් ද විය. බුදුරදුන් ගේ සහ ශ්‍රාවකයන් ගේ ධාතූන් පිහිටුවා සාඤ්චි-බාර්හුත් වැනි ඉතා විශාල ස්තූපයන් ද, කරවූ අශෝක රජතුමා බෞද්ධ උපාසකයෙක් ව සමස්ත භාරතයෙහි සෑම තැන ම ඇවිද්දේය. බුද්ධ ධර්මයා ගේ ව්‍යාප්තිය පිණිස සියල්ල ම පරිත්‍යාග කෙළේය.

---

* මහාවංස. 5 279. සමන්තපාසාදිකා. 29

1 The Cultural Haritage of India. Vol I. P. 287. India. P. 79. Cambridge History of India P. 515. Asoka P. 46. History of India P. 117

2 Asoka. was a great builder, and appears to have introduced the practice of using stone instead of wood. India P. 82

අශෝක රජු ගේ මේ ශ්‍රේෂ්ඨ ව්‍යාපාරය වැඩි කලක් පැවතුණේ නැත. ක්‍රි: පූ: 232 දී රජතුමා කාලක්‍රියා කෙළේය. රජුගෙන් පසු මෞර්ය අධිරාජ්‍යයට උරුමව සිටියාහු තීවර-කුණාල - ජලෞක යන රජු ගේ පුතුන් තිදෙනා සහ දශරථ-බෘහත්රථ (=සම්ප්‍රති) යන දෙමුණුබුරෝ ද, වෙත්. අශෝක රජුගෙන් පසු රාජ්‍යය හිමි වූයේ මුණුබුරු වූ දශරථ කුමාරයාටය. ඔහුගෙන පසු ඔහු සොහොවුරු බෘහත්රථ රජ විය. එහෙත් ඒ රජු ගේ සෙනෙවියා වූ පුෂ්‍යමිත්‍ර විසින් රහසින් රැකසිට බෘහත්රථ රජු මරා ක්‍රි: පූ 289 දී වන්ද්‍රගුප්ත රජුගෙන් ආරම්භ වූ මෞර්ය වංශය අවසන් කරන ලදී බෘහත්රථ රජුගෙන් පසු සුංග පරම්පරාවේ නිර්මාපකයා වූ පුෂ්‍යමිත්‍ර සෙනෙවියා රජ විය.

අශෝක චක්‍රවර්තීන් ගේ ප්‍රබල උත්සාහය නිසා ථෙරවාද බුද්ධාගම සමස්ත භාරතයේ මෙන් ම තදන්‍ය දෙශවල ද, පැතිරී ගිය නමුත්; රජු ගේ අභාවය සමග ඒ අනුගමනය කරන්නට සෑහෙන ප්‍රබලයකු නො සිටි බැවින් රජු ගේ අභාවයෙන් තුන් අවුරුද්දක් ගතවන්ටත් පෙර නැවතත් ශාසනාර්බුද ඇති විය. ධර්මාශෝක රජු විසින් ශාසනයෙන් පහ කළ තීර්ථකයෝ රජගහනුවර සමීපයෙහි වූ නාලන්දාවට රැස්ව,

> "ජනයන් ශාසනාවගාහ නො කරන පරිද්දෙන් ශාක්‍ය භික්ෂූන් ගේ ධර්ම විනය දෙක බිඳවුව මැනව; හෙද වනාහි ඔවුන් ගේ සමය හෙද නො දැනැ නො පිළිවන. එබැවින් යම්කිසි උපායයෙකින් යළිදු මහණවුව මැනැවයි"

සාකච්ඡාකොට * මහා සඞ්ඝිකාදීන් කරා එළඹ මහණව පිටකත්‍රය විපර්යාශ කොට පෙරළා ගෙන කොසඹෑ නුවරට ගොස් හෙමවතය-රාජගිරිය - සිද්ධාර්ථය - පූර්වශෛලීය - අවරශෛලීය - වාජිරිය - වෛතුල්‍යකය - අන්ධකය - අන්‍ය මහාසඞ්ඝිකය යි 1 නව නිකායක් වූහ.

ධර්මාශෝක රජු ගේ කාලයේ සිට ගුප්ත කාලය (ක්‍රි: ව: 454) දක්වා දඹදිව ඉතිහාසය, ව්‍යාකූල වූ අන්ධකාරයෙහි ගිලී ඇත් තේය. අශෝක රජු ගේ මරණින් පසු අවුරුදු පන්සියයකටත් වැඩි කාලයක් තුළ මගධ රාජ්‍යය පිළිබඳව එතරම් සැලකිය යුතු වාර්තා නැත එහෙත් කණිෂ්ක (ක්‍රි: ව: 78 කාලය වනතුරු මගධ-කලිඟු දෙරට සවප්‍රධානතාව පැවතුණා විය හැක. කෙසේ නමුත් මගධ රාජ්‍යය එයට අයත්ව තුබූ පිටිසර දෙශයන් නැතිව

---

*නිකාය සඞ්ග්‍රහය 7. 1 නිකාය සඞ්ග්‍රහය. 7. සඞ්මීරත්නාකරය 239

මගධ-වංශය යන පුරාණ රාජධානීන්ගෙන් හා කොශල ජනපද යෙහි නැගෙනහිරි කොටසින් යුක්තව තුබුණේය යි කල්පනා කරති. මේ අතර කාලිඛගයේ දක්ෂිණභාගය ආන්ධ්‍රරාජවංශයෙහි බලසම්පන්න ස්ථානය විය අශෝක රජු ගේ මරණින් පසු උත්තර භාරතය සුලු සුලු කොටස්වලට බෙදී ගියේ ය. එබැවින් තත් කාලීන උත්තර භාරතීයයෝ සවාධීනතාය ප්‍රකාශ කළහ.

බෘහත්රථ රජුගෙන් මෞර්‍ය වංශය අවසන්කොට සුංග වංශය පිහිට වූ පුෂ්‍යමිත්‍ර ගේ රාජ්‍යය එතරම් විශාල නොවිය. එය පාටලිපුත්‍රයේ සිට නම්දා නදිය දක්වා විහිදී ගියේ ය. අයොධ්‍යා විදිශා-ජාලෙන්ද්‍ර සාගල යන නගර ද, පුෂ්‍යමිත්‍ර විසින් ම පාලනය කරන ලදී. මේ අතර පුෂ්‍යමිත්‍ර විසින් මරා දැමූ බෘහත්රථ රජු ගේ ඥාතිපුත්‍රයකු වූ යඥසේන නම් කුමාරයකු විසින් විදර්භ නගර යේ සවාධීන කුඩා රාජ්‍යයක් පිහිටුවා මෞර්‍යවංශය නැවත නඟා සිටුවා ලීමට උත්සාහ කරන ලදී. එහෙත් පුෂ්‍යමිත්‍ර-යඥසේන දෙදෙනා අතර යුද්ධයෙන් යඥසේන පැරැදී මරණයට පත්විය. භාරත වර්ෂයෙහි මෞර්‍යවංශය පිළිබඳව පැවැති සියලු ම අපේක්ෂා මේසින් අවසන් වූවාය. පුෂ්‍යමිත්‍ර ගින්දු භාර්ගවයකු නමුදු බුද්ධාගමට ද ළැදිකමක් දක්වීය බාර්හුත් චෛත්‍යස්ථානයේ ස්තූප දෙකක් ඔහු විසින් ගොඩනඟන ලදී. පුෂ්‍යමිත්‍රගෙන් පසු ඔහු පුත් අග්නි මිත්‍ර රජ විය කාලිදාස ගේ **"මාලවිකාග්නි මිත්‍රය ද"** සඳහන් වන මේ රජුගෙන් පසු භාගවත ආගම වැළඳගත් භාගභද්‍ර රජවිය. ඉන්දියාවේ වයඹ දිග වූ ග්‍රීකයන් හා භාරතීයයන් අතර මේ කාලයේ දැඩි සම්බන්ධයක් පැවැත්තේ ය භාරතීය සභ්‍යත්වයෙහි ග්‍රීකයන් ගේ බල පැවැත්ම වැඩි වීම හා සමග ග්‍රීකයෝ ඉන්දියානු ආගම් කෙරෙහි ආශාවක් ද දක්වූහ. **පුෂ්‍යමිත්‍ර** විසින් පිහිට වූ සුංගරාජ බලය පැවැත්තේ අවුරුදු 112 කි. ක්‍රිස්තු පූර්ව 75 දී පමණ ව සුදේව නම් ඇමතියකු විසින් සුංගරාජ වංශයේ අන්තිමයා වූ දෙවභූති රජු මරා දමා සිංහාසනය හෙන කාණ්ව රාජවංශය පිහිටුවන ලදී. එහෙත් කාණ්ව රාජවංශය අවුරුදු 45 කින් අවසන් විය. කාණ්වයන්ගෙන් පසු නැගෙනහිරි මාලව ජනපදය **සාතවාහනයන්ට** අයත් විය ඔවුන් ගේ බලය අවුරුදු 300 ක් පමණ පැවැත්තේ ය. සාතවාහන වරු මහා රාෂ්ට්‍රය- (ඩෙකාන්) පෛඨාන් – කොන්කන – කසියවාර් – බීරාර්-මාලව-ආන්ධ්‍ර-දක්ෂිණ කොශලය ඇතුළු විශාල ප්‍රදේශ කීපයක් ම ආණ්ඩු කළහ. ක්‍රි: ව: 3 වන ශතවර්ෂයේ දී පමණ සාතවාහන රාජ බලය අවසන් විය. **සාතවාහන** වංශය ලංකාවේ ලියවිලිවල **සාලිවාහන** නමින් සඳහන් වේ. මේ කාලය වනවිට සෘෂ්ටිර්, කීර්ත භාගභද්‍ර ආදී පුරාණ බෞද්ධ රාජධානිවල ගින්දු

බලය ලියලා ගොස් අවසානය. හින්දුන් ගේ බලය වැඩිවීම සමග භාරතයේ ස්ථවිරවාදය ක්‍රමයෙන් පිරිහී ගියේය. සෙසු නිකායික භික්ෂූහු උතුරුදිග සහ-වයඹදිග පළාත් කරා ක්‍රමයෙන් ඇදී ගියෝය.

ධර්මාශෝක රජු ගේ මරණින් පසු මෞර්ය අධිරාජ්‍යයේ බලය පිරිහී ගිය බැවින් ද, නොයෙකුත් දෙශපාලන කලබල ඇතිවූ බැවින් ද, ග්‍රීක් රජවරු නැවතත් ඉන්දියාවේ වයඹ දිග ග්‍රීක ආධිපත්‍යය පැතිර වූහ. එබැවින් ක්‍රි: පූ: 200 දී පමණ බැක්ට්‍රියාවේ රජය කරවූ යුතෙඩමස් නම් ග්‍රීක් රජ අප්ඝනිස්ථානයෙන් විශාල කොටසක් ද, ජය ගෙන ස්වකීය අධිරාජ්‍යයට ඇදා ගත් තේය. ඔහු ගෙන් පසු රජ පැමිණි ඩෙමට්‍රියස් නම් ග්‍රීක් රජ පඤ්ජාබයෙන් කොටසක් ද යටත් කෙළේය. පසුව යුක්රටඩිස් නම් ග්‍රීක් සෙනෙවියකු විසින් ඩෙමට්‍රියස් පළවා හැර සාගල නුවර (සියල්කොට්) රාජධානිය කොට වයඹ දිග ඉන්දියාව පාලනය කරන ලදී. මේ රජ ඛරොෂ්ඨ-ග්‍රීක් අක්ෂර 1 දෙවර්ගයෙන් ම කාසි ව්‍යවහාර කෙළේය. මෙයින් පසු බැක්ට්‍රිය ග්‍රීක් රජවරු ඉන්දියාවේ වයඹ දිග ආණ්ඩු කළහ. එයින් බෞද්ධ පොත්වල පවා ඥාහන් වන මිණැන්ඩර් (මිළිඳු) රජ ප්‍රධානය, ක්‍රිස්තු පූර්ව 180-60 අතර සාගල නුවර රාජධානිය කරගත් මිළිඳු රජු ගේ බලය ඉතා විශාල විය. පාණ්ඩිත්‍යයෙන් මෙන් ම 2 රණකාමිත්වයෙන් ද, යුත් මිළිඳු රජ නොයෙකුත් කාසි වර්ග භාවිත කරන ලදී. මථුරා-කාබුල්-ඛන්ඩ්ලි-ඛාන්ඩ් වැනි ඈත ප්‍රදෙශවලදී පවා මිළිඳු රජු ගේ කාසි සොයාගනු ලැබේ නාගසෙන ස්ථවිරයන් වහන්සේ සහ මිළිඳු රජු අතර වූ සංවාදය "මිළිඳු පඤ්හ" (මිළිඳු ප්‍රශ්න) නම් පොතේ දක්නේය. නාගසෙන ස්ථවිරයන් වහන්සේ සමග මේ සංවාදය උදෙසා මිළිඳු රජු සහ පැමිණි බොහෝ දෙනා ග්‍රීකයෝ වූහ. දෙව මන්ත්‍රී-අනන්තකාය යනුවෙන් දක්නේ 3 ඩෙමට්‍රියස්

---

1 History of India. P, 141.

2 Menender himself was a scholor as well as a soldier. as a disputend he was hard to equeld, harder still to over come, the acknoweldged superior of all the founders of the verious schools of thought. as in wisdoms, so in strength of body, seviptness and valour, there was found none equal to milinda in India, India P. 91,

3 Cambridge History of India P, 517-551, මිළිඳුප්‍රශ්න 55

සහ ඇන්ටියාකස් යන ත්‍රීක සෙනෙවියෝ වෙති. අලසන්දු සහ ඇලැක්ෂැන්ද්‍රියාදිය. මේ සංවාදය අවසානයෙහි මිළිඳු රජ නාගසේන සථවිරයන් වහන්සේ වෙත පැවිදිව රහත් වූ බැවි සඳහන් වේ. මිළිඳු රජ නාගසෙන සථවිරයන් වහන්සේ වෙත පැමිණීමට පෙර බුඩ ධර්මය ඉතා ම සියුම් අයුරින් දැන සිටියේය. මේ නිසා මිළිඳු රජ පළමුවෙන් ඇවි.ඇතිවාදි බෞද්ධයෙක් විය යි කල්පනා කරති. මිළිඳු රජුට පෙර මෙන් ම පසුවත් වයඹ දිග ඉන්දියාව ග්‍රීකයන්ගෙන් තොර නොවිය.

ක්‍රිස්තු වර්ෂයෙන් යට 165 දී පමණ වයඹ දිග චීනයේ යුඑහ්චි (Yuch-Chi) නම් එක් ජනතාවක් වාසය කළාය. පසුව තෝමඩික් ශෝත්‍රිකයන්ගෙන් ඔවුන්ට දරුණු පහරක් වැදුණු බැවින් ඔවුහු බටහිර දෙසට පළාගියහ. ඒ අතර ඉලි නම් නදිය අසල සුත් ශෝත්‍රිකයන් සමග ද, සටන් කරන්නට ඔවුන්ට සිදු විය. එයින් ජයගෙන, පසුව ශකවරුන් ද, පරදවා තව නවත් බටහිර දෙසට විහිදි ගොස් ක්‍රි: පූ: 140 දී පමණ ඔක්සස් නිම්න භූමියේ ඔවුහු නැවතුණාහ. එහි සිට පාලනයෙහි පහසුව උදෙසා සවකිය රට ගොත්‍ර අනුව කොටස් පසකට බෙදන ලදී. එයින් චිත්‍රාල්-පඤ්ජ්ෂියාර් අතර ප්‍රදේශය කුශාන් වංශිකයන් විසින් ම ආණ්ඩු කරන ලදී. පසු කාලයෙහි කුජුල කඩ්ෆිසිස් (Kajula, Kad Phises) රජ විය හෙතෙම එක්සස් ප්‍රාන්තය ද, යටත් කෙළේය.

ඉන්පසු කුශාන් වංශික කණිෂ්ක රජ ක්‍රි: ව: 120 දී සිංහාසනාරූඪ විය ධර්මාශෝක රජුගෙන් පසු ඉන්දියාවේ ඇති වූ ශ්‍රෙෂ්ඨ * නරවීරයා කණිෂ්කයා ය. කණිෂ්ක රජු ගැන බුදුනුදු වදාළ බැව් පාඨියන් 1 කියයි. මඤ්ජුශ්‍රී මූල කල්පයේ 2 මේ රජුගේ නම "තුරුෂ්ක" යයි සඳහන් වේ

---

* Kaniska was undoubtedly the greatest Kusan ruler of India But the information available about him is in many respects unsatisfactory.. History of India. P. 149.

1 පාඨියන් ගේ ගමන් විස්තාරය. 27.

2 සිද්ධිං ගෙත්වාථ පරං දිව්‍යං-මානුෂ්‍යෝ සාධයිෂ්‍යති
කුරුෂ්ක නාමා වෛ රාජා-උත්තරා පථ මාශ්‍රිතඃ

මිනාසෛන්‍යෝ මහා විර්‍යඃ-තසම්ං සථානෝ භවිෂ්‍යති
කාශ්මීර බාර පර්‍යන්තං-බිම්බසාලොඩ්‍යං සකාවීශම්

ස රාජා ශ්‍රිත්‍යා දෙවසත්‍ය-සවගී ලොකා භවිෂ්‍යති
අහා බුදුවලීඝ්‍ර කීර්තිපෙහා-බෙඩ්ඩිං ප්‍රාප්‍යසපතීං මුසකාමි

මඤ්ජුශ්‍රී මූල තන්ත්‍රය. 551-559.

කණිෂ්කා රජ රජයට පැමිණි වකවනුව පිළිබඳ * මත භෙද පවතී. මෙකල **පැපාවෝර්** නමින් හඳුන්වන පැරණි පුරුෂ පුරය කණිෂ්කා රජුගේ රාජධානිය විය. මේ රජුගේ අධිරාජ්‍යය භාරතයෙන් පිට පළාත්වල ද, පැතිරී ගියේය. අප්සනිස්ථානය බැක්ට්‍රියා-කෂ්ගාර්-ඛොටාන්-යාර්ඛාන්ඩ් යන පළාත්ද, පඤ්ජාබය කාශමීරය-සින්ඩ්-එක්සත් ප්‍රාන්තය ද, එයට ඇතුළත් විය හිමාලය මධ්‍ය ප්‍රදේශය හා මධ්‍යම ආධියාවේ විශාල කොටසක්ද, සුං ලිං කඳුවැටියෙන් ඔබ්බෙහි වූ 1 චීන දෙශ සීමාවෙහි පිහිටි රටවල ද, 2 කණිෂ්කා රජුගේ අණසක පැවැත්තේය. චීනයේ කහ ගඟින් බටහිරි රටවලින් කණිෂ්කා රජුට කප්පන් ගෙවන ලදී. බිහාරය-බෙංගාලය වැනි පළාත්වල පවා කණිෂ්කා රජුගේ කාසි 3 සම්භූවේ "**ක්ෂත්‍රප**" "**මහාක්ෂත්‍රප**" යන විරුද නාම ධාරී ප්‍රතිරාජවරු කණිෂ්කා අධිරාජයන් යටතේ විසූහ. **මිතිය අශෝක-රාජාධිරාජ-දිව්‍ය පුත්‍ර-දෙව පුත්‍ර** යන නම් වලින්ද හඳුන්වන 4 කණිෂ්කා රජ අවුරුදු දෙසාලිසක් (ක්‍රී: ව: 120-162) රජය කරවිය.

කණිෂ්කා රජ රජකමට පැමිණීම හා සමග බෞද්ධයෙක් වූයේය. සර්වාස්තිවාදී බෞද්ධයකු වූ කණිෂ්කා රජු බුද්ධාගම වැළැඳගැන්ම පිළිබඳ පුවතක් හියු එං සියැං කියයි.

"ධර්මා ධර්ම විවෙචනයක් නො කළ මේ රජ පළමුවෙන් බුදු දහම පහත් කොට සැලකීය එක් දිනක් පඳුරු සහිත වගුරු බිමක ඇවිදින රජ සුදු හාවකු දැක ඌ අනුව යන්නේ අඩි තුනක් පමණ උසැති කුඩා සෑයක් ගොඩ නඟන ගොපලු දරුවකු දුටුවේය. "තෝ කුමක් කෙරෙහි ද" යි ඇසූ විට "මෙරට රාජ්‍යයට පත්වන රජෙක් මාගේ ශරීර ධාතු වලින් විශාල කොටසක් පිහිටුවා මෙතැන ස්තූපයක් ගොඩ නංවන්නේ යයි ශාක්‍ය මුනීන්ද්‍රයන් විසින් ප්‍රකාශ කරන ලදී. කණිෂ්කාධිරාජයෝ පුරා කෘත පුණ්‍ය ඇත්තෝය. ඒ උත්තම ශාස්තෘවරයාගේ අනාවැකිය සිද්ධ කිරීමට මෙය යොග්‍ය කාලය බව සිහිපත් කරවමි"යි උත්තර දී ගොපලු දරුවා නො පෙනී ගියේය. මේ කීම ඇසූ රජ මහත් ප්‍රීතියට පත්ව බෞද්ධාගමට ගෞරව කරමින්" බුද්ධාගම වැළඳ ගත්තේය.

---

* History of Indian Literature, Vol I P. 611.

1 සර් ජෝන් මාර්ෂල් මහතුන් ගේ 1912-13 පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්තාව.

2 හියු එං සියැං වාර්තාව 81. 3 India P. 95,

4 Cambridge History of India, P, 583, India, P, 97.

කණිෂ්කා රජු ගේ සමහර කාසිවල බුද්ධිරූපය දක්නේ ය. මේ රජතුමා අඩි 550 ක් උස් වූ විශාල චෛත්‍යයක් කරවා එහි ගන්ධෙහි නැලි අටක් පමණ සළුඳු ධාතු නිධාන්කොට මුදුනෙහි රන් ආලෙප කළ තාම්‍රමය ඡත්‍ර පස් විස්සක් යකඩ කණුවක සවි කොට කොතක් මෙන් පිහිටුවිය විශාල ධර්ම සඞ්ඝායනාවක් ද, සූත්‍ර, ධර්මය සහ සාස්ත්‍රවල ලියවා තැන්පත් කරවිය. කණිෂ්කා රජ සැදුහැති බෞද්ධයකු වූ නමුදු අධිරාජ්‍ය යේ යටත් වැසියන් ගේ ආගම්වලට ද, ගරු කෙළේ ය. රජු ගේ අධිරාජ්‍යය පැවැති ප්‍රදේශයන්හි ලැබෙන පැරණි කාසිවල හින්දු-ග්‍රීක් දෙවිවරුන් ගේ රූප දක්නේ එබැවිනි. කණිෂ්කා රජ කලාශිල්පයන්හි ද, ශ්‍රේෂ්ඨ අනුශාසකයෙක් විය. රජු විසින් පුරුෂ පුරයෙහි හොඳ නැකැත් * ආරම්භ රජු ගේ මරණින් බොහෝ කලක් ගතවනතුරු පැවැති බව යාත්‍රිකයන් ගේ වාර්තාවලින් පෙනේ. අඩි 600 ක් පමණ උසට රජු විසින් කරවූ ස්තූපය එවක ලොකයේ පුදුම වස්තූන්ගෙන් එකක් විය. එය ග්‍රීක ගෘහනිර්මාණ ශිල්පි ඒජිසලස් ලවා නිර්මාණය කරවා එහි ඔහු ගේ නම ද කොටවා තැබිය තක්ෂශිලාවට නුදුරින් කණිෂ්කපුර නමින් නුවරක් ද, හොඳ නංවන ලදී. මෙ අධිරාජයා ගේ රාජ සභාව පාර්ශ්ව-වසුමිත්‍ර-අශ්වඝෝෂ - නාගාර්ජුන - චරක ආදි ශ්‍රේෂ්ඨ පඬිවරුන්ගෙන් බැබළුණේය.

සැදුහැති කණිෂ්ක රජු ගේ කාලය වන විට නානා නිකාය වලට අයත් භික්ෂූහු දහස් ගණනක් වූහ ඒ ඒ නිකායිකයෝ තමතමන් ගේ අදහස්වලට අනුව බුද්ධ වචනය විස්තර කළහ. දිනපතා භික්ෂු නමක් රජමැදුරට ගෙන්වා ධර්මශ්‍රවණය කරන රජු; මේ එක එක භික්ෂුව ධර්මපදයන්ට එක එක තේරුම් දීමට හේතුව කිම්දැයි තමා ගේ විශෙෂ ගෞරවයට පාත්‍ර වූ පාර්ශ්ව සථවිරයන් වහන්සේ ගෙන් දිනක් ඇසීය බුදුන් ගේ ඇවැමෙන් පසු ඒ ඒ මහතෙරුන් තම තමන්ට රුචිවනසේ ධර්මපදයන්ට අර්ථදීම නිසා මේ වෙනස ඇතිවියයි තෙරණුවෝ කීහ. තථාගත

---

* මහ සැයෙන් බටහිර දෙස කණිෂ්කාදි රජයන් කර වූ පුරුණ සංඝාරාමය පිහිටියේ ය. එහි වූ යුනල් කූටාගාරයෝ ද, එකි නෙකට සම්බන්ධ වූ වෙදිකාවෝ ද, මහල් සහිත ගෘහ පඬිත්තීහු ද, ගැඹුරු කාමර ද, එහි විසූ ශිල්වත් මහ තෙර වරුන් ගේ මහත්වය දැනුත් ප්‍රකාශ කරත්. හොඳ නැකැත් වල ආශ්චර්යවත් භාවය වටහා නැත්ම පහසු නොවේ. සිංහල ඓ සියෑ චාර්තාව 123

ධර්මය ස්ථාවර නොවන පිණිස ද, එත් එත් අය ගේ ස්වාර්ථවික අදහස් නිසා පැන නගින දුෂ්කරතාවන් සමන් කරනු පිණිස ද, ධර්ම සඞ්ගායනාවක් කළ යුතුයයි කල්පනා කළ රජ් ඒ පිණිස සවකීය අධිරාජ්‍යය සහ අනික්‌ත් රටවලින් ත්‍රිපිටකධාරී භික්ෂූන් * 500 නමක් තෝරා කාශ්මීරයෙහි කුණ්ඩලවන ආරාමයෙහි දී පාළිව සප්තීරයන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් පුරා සමයක් ධර්මය සඞ්ගායනා කරවිය මේ ධර්ම සඞ්ගායනාව සතරවැනිවූ ද, අවසානවූ ද, සඞ්ගායනාව විය. මේ සඞ්ගායනාව ගන්ධාරයෙහි හෝ රජගහනුවර සප්තපර්ණී ගුහාවාරයෙහි හෝ පැවැත්වීමට රජු කැමැති වූ නමුත් එහි බොහෝ මිථ්‍යාවාද ගත්තන් ඇති බැවින් ඔවුන් හා වාද කිරීමට යෑමෙන් මේ කටයුත්ත මුදුන් පත් නොවන්නේයයි කියා පාළිව සප්තීරයෝ එයට නොකැමැති වූහ මහාකවි භදන්ත අශ්වඝෝෂ-වසුමිත්‍ර- නාගාර්ජුන ආදි මහා ප්‍රාඥයන් හෙන් යුක්‌ත වූ මේ ධර්ම සඞ්ගායනාවට ලක්‌ව භික්ෂූහු නොපැමිණියාහුය. එහෙත් අනික්‌ත් සියලුම රටවල භික්ෂූහු පැමිණියාහුය. මේ සඞ්ගායනාව රහතන් වහන්සේලා විසින් ම කළ බව ද, සියලු අන්දමින් ප්‍රථම ධර්ම සඞ්ගායනාවට සමාන බැව් ද, සඳහන් වේ. සඞ්ගීති කාරක භික්ෂූහු පළමුවන්ත් සූත්‍ර පිටකයේ අර්ථ වර්ණනා කරමින් ශ්ලෝක දශලක්ෂයකින් යුත් **"උපදේශ ශාස්ත්‍රය"** නම් ග්‍රන්ථයක් ද විනයපිටකයට **"විනය විභාෂා"** නම් ග්‍රන්ථයක් ද, අභිධර්ම පිටකයට **"අභිධර්ම විභාෂා"** නම් ග්‍රන්ථයක් ද, සූත්‍රපිටකයට ම **"මහා විභාෂා"** නම් විශ්වකොෂයක් ද, සම්පාදනය කළහ. ඉතා ලිහිල් ප්‍රශ්නයේ පටන් ඉතා ගැඹුරු ප්‍රශ්නය දක්වා සියල්ල විසඳමින් ලියූ මේ **විභාෂා** (අටුවා) වෝ නානා දෙශවාසීන් විසින් ප්‍රමාණවත්වයෙන් පිළිගන්නා ලදහ. සඞ්ගායනාවසානයේ දී කණිෂ්ක රජ මේ සියලු ධර්මය හා විභාෂා (අටුවා) වන් තඹපත්වල ලියවා සියල්ල ගල්පෙට්ටියක බහා නිදන් කොට සැයක් බන්දවා

---

* රජතෙමේ සතියක් මුළුල්ලේ සඟනට මහදන් පවත්වා පිරිස අති විශාල බැවින් රහත්ඵලය ලැබූවන් හැර සෙස්සෝ ඉක්ම යෙත්වා!යි ප්‍රකාශයක් කෙළේය. එසේ ඉවත් වූ පසුත් විශාල සඞ්ඛ්‍යාවක් ඉතිරි වූ බැවින් ෂඩභිඥ ත්‍රිවිද්‍යාලාභීන් හැර සෙස්සෝ ඉවත්ව යෙත්මැයි ප්‍රකාශයක් කොට ඉතිරි වූවන් අතරෙන් ත්‍රිපිටකධාරිවූ ද, ශබ්ද විද්‍යාදි පඤ්ච විද්‍යාවන්හි දක්ෂවූ ද, රහතන් 499 නමක් ඇතැ'ර භක්ෂෝය. නියු එං ෂියැං සැතීයේ. 155. India P. 84.

අන්‍ය පාක්ෂිකයන්ගෙන් වන උවදුරු වළක්වා ලීම පිණිස එහි ආරක්ෂාව සලසාලිය. කණිෂ්ඨක රජු ගේ මේ ධම් සඞ්ගීතිය නිසා බුද්ධ ධර්මයේ නවයුගයක් උදා විය එහි ප්‍රතිඵලය වූයේ **මහායාන බුද්ධාගම** * පැන නැගීමයි ආඥාවක්‍රවර්ති කණිෂ්ඨක රජු ගේ බලය නිසා මේ අභිනව ධර්මය ඉතා ඉක්මනින් ආසියාවේ නොයෙකුත් පළාත්වල පැතිරී ගියේය. කණිෂ්ඨක කාලය වනවිට සංස්කෘත භාෂාවේ උද්දීපනිය බෙහෙවින් පැවතීම මෙයට තව ආධාරයක් විය. ඉන්දියාවේ වයඹ දිගින් හට ගෙන; ග්‍රීක ධර්මය, ඉරෝ ඇස්ට්‍රේරියන් ධර්මය, හින්දූ ධර්මය සහ මධ්‍යම ආසියාවේ යම් යම් ලබ්ධින් සමග මිශ්‍ර වීමෙන් භාරතයේ උතුරුදිග තැනිතලා ඔස්සේ බුඛධර්මය ව්‍යාප්ත වීමේදී එහි පැවැති පාරම්පරික ප්‍රාථමික අදහස් බෙහෙවින් වෙනස්වී අමුතුම විලාශයක් ගත්තේය. කණිෂ්ඨක කාලයට පෙර පැවැති, ථේරවාදයෙන් බිදීගිය සියලු ම නිකායිකයන් **"මහායානය"** නම්වූ එක ම ක්‍රමයක් යටතේ සකස්වූයේ කණිෂ්ඨක රජු ගේ මේ සඞ්ගීතියෙන් පසුව ය. **"මහායාන"** යන වචනය ද. ව්‍යවහාරවූයේ ඉන් පසුවය. කණිෂ්ඨක සඞ්ගීතියෙහි ප්‍රමුඛ ස්ථානයක් ඉසුළු මහාකවි අශ්වඝෝෂයන් විසින් **"මහායාන ශ්‍රද්ධෝත්පාද සූත්‍රය"** ලියන ලදි. **"මහායාන"** යන වචනය පළමුවෙන් දක්නේ මේ පොතේ ය.

කණිෂ්ඨක රජු ගේ අනුග්‍රහලබ්ධ බලය නිසා **මහායානය** ඉතා ඉක්මනින් උතුරු දිග පළාත්වල පැතිරී ගියේය. මේ ශතවර්ෂයේදී ම කාශ්‍යප මාතඞ්ග භික්ෂූව විසින් චීනයට බුද්ධාගම ගෙනයන ලදී. මහායානය ක්‍රමයෙන් පැතිරී යෑමේදී එය හීන යානයට හෝ මහායානයට නැති අමුතු ම මුණුවරක් ගත්තේය. කණිෂ්ඨක කාලයේ හටගත් මහායානයේත්, පසු කාලයේ ව්‍යාප්ත වී ගිය මහායානයේත් පරතෙරය ඉතා විශාලය. කණිෂ්ඨක කාලයේ අදහන ලද්දේ එක ම ගෞතම බුදුන් නමුදු කල්යත් ම බොහෝ බුදුවරු ද, බොධිසත්ත්වවරයෝ ද, නිර්මාණය කර ගත්හ. මෙසේ වූයේ මහායානය පැතිරී ගිය රටවල ප්‍රාථමික ආගම්වල දෙවිවරුන් මේ ධර්මය සහ සම්බන්ධ කළ බැවිනි. ක්‍රමයෙන් බුදුරජුන් කෙරෙහි භක්තිය ම දියුණු කොට, බුදුරජුන් හා බොධිසත්ත්වවර

---

* Kaniska Council at Kasmera markes the begining of a new epaok in the history of Buldhism The was the rise of the mahayana or Northern Church, which differs as much from the primitive Buddhism of the Hinayana. India P, 96

යන් පිළිබඳව විසිතුරු කථා ගෙතූහ. හින්දු ධර්ම දෘෂ්ටික පක්ෂයෙන් දියුණු වූ බැවින් හා ඔවුන්ගෙන් හැඟට වඳින්නට සිදු වූ බැවින් බුඩාගම ද, දෘෂ්ටික පක්ෂයෙන් දියුණු කළහ. බුදුරජුන් ගේ අතිමානුෂකත්වය විදහාලනු පිණිස බුදුන් දෙසූ අපුරින් හා වචන වලින් ඇතුළත් වූ [illegible] ලියූහ. කල් යත් යත් වජ්‍රයාන-තන්ත්‍රයාන ආදී මාර්ගයන්ගෙන් ද, මෝක්ෂය ලබනු කැමැති වූහ. මේ කාලයවන විට මහායානය නේපාලය-ටිබැට්-චීන - ජපන් - මොන්ගෝලියා යන රටවල ද, හීනයානය ලංකා-සියම්-බුරුම-විටගොන් යන රටවල ද පැතිර පැවැත්තේය. මහායානිකයෝ බුඩත්වයෙන් නිර්වාණය ලැබීම ද, හීනයානිකයෝ ප්‍රත්‍යෙක බුඩත්වයෙන් හෝ අර්හත්වයෙන් නිර්වාණය ලැබීම් ද, කියා පැහැ. එසේ ම මහායානිකයෝ සංස්කෘතය සහ මිශ්‍ර සංස්කෘතය ද, හීනයානිකයෝ පාළි භාෂාව ද, ව්‍යවහාර කළහ. ඉන්දියාවට මධ්‍යස්ථානය දී ඉන්දියාවට උතුරින් පිහිටි රටවල බුඩාගම උතුරු බුඩාගමයයි ද, දකුණින් පිහිටි රටවල බුඩාගම දකුණු බුඩාගමයයි ද, කීහ. හීනයාන බුඩාගමට වඩා මහායාන බුඩාගම නූතන නාමුදු එය උතුරුදිග පළාත්වල ආරම්භව දකුණු දිග ද, ඉතා ඉක්මණින් පැතිරී ගියේය. මහායානිකයන්, පොදු මහජනයා සමඟ ගැටෙමින් ඔවුන් ගේ ඓදිනෙදා ජීවිතයේ දුක් පිඩා ඉවත්කර ලීමට උත්සාහ කළ බැවින් එය පැතිරී යෑම වළක්වා ලිය නොහැකි විය. එබැවින් ක්‍රි: ව: 7, 8, 9, 10 ශතවර්ෂ අතර ලංකාවේ ද, සෑම තැන ම මෙය පැතිරී ගියේය. ස්ථවිරවාදීන් රාජබලය පෙරටු කොට මහායානය පැතිරී යෑමේ වේගය නවත්වාලීමට කොතෙකුත් උත්සාහ ගත් නමුත් එය සාර්ථක නො විය. මේ කාලය වනවිට මහායානිකයන්ට ලක්දිව තුබූ බලය කොතරම් ද යත්? ස්ථවිර වාදයේ මූලස්ථානය වූ මිහින්තලය පවා මහායානිකයන් ගේ මූලස්ථානයක් බවට පත්විය. අනුරාධ පුරය ඔවුන්ට ම හිමිවිය. දැන හෝ නො දැන බොහෝ හීනයානිකයෝ මහායානිකයන් ගේ ඇදහිලි ක්‍රම ද, ඔවුන් ගේ පොත් පත් ද, බෙහෙවින් භාවිත කළහ. දඹදෙණි රාජධානී සමයේ විසූ දෙවැනි පැරකුම්බා, මයුරපාද බුඩ පුත්‍ර ගුරුළුගෝමි ආදී පඬිවරු ද, ජයවර්ධන පුර රාජධානී සමයේ විසූ මහා කවි ශ්‍රී රාහුල, විමලකීර්ති ආදී පඬිවරු ද, මහායානිකයන් ගේ ග්‍රන්ථ ඉතා ආදරයෙන් භාවිත කළහ. මහායාන ග්‍රන්ථාගත භාධකයන්ගෙන් සමහරක් සැරසුහ. එයින් දෙවැනි පැරකුම්බා රජු විසින් විශුඩිමාර්ග සන්නයට ද, මහාකවි ශ්‍රී රාහුල මාහිමියන් විසින් පඤ්චිකා ප්‍රදීපයට ද, මේ

අභිධර්ම කොශයෙන් කරුණු උපුටා ගත්හ. මහායාන ධර්මය අද ලක්දිව නැතැයි සලකතත් ලක්දිව තවමත් බෙහෙවින් බලපවත් මන්නේත් ඒ මහායාන ධර්මය ම ය.

අශෝක රජු ගේ ධර්ම සඞ්ගායනාවෙන් පසුව හීනයානය පැතිරී ගියාක් මෙන් කණිෂ්ක සඞ්ගීතියෙන් පසුව මහායානය පැතිරී ගියේය. අශෝක රජු ස්ථවිරවාදය පතළ කළාක් මෙන් කණිෂ්ක රජ සර්වාස්තිවාදය පතළ කෙළේය. උතුරු දිග පළාත් වල ස්ථවිරවාදය ව්‍යාප්ත කරලීමට අශෝක රජු උත්සාහ ගත් නමුදු එය එතරම් සාර්ථක නො විය. පාහියන්-හියු එං සියැං-ඉට්සිං-තාරානාථ ආදී චීන පර්යටකයන් ගේ වාර්තා අනුව හීනයාන ය ද, උතුරු දිග සමහර පළාත්වල පැතිරී ගිය බැව් දක්නේය. "හීනයානය යනුවෙන් ස්ථවිරවාදය ම අදහස් නො කෙරේ. හීනයාන-මහායාන යන නම් දෙක ම පාළි පොත්වල නො දක්නේය. අශෝක රජු දවස විභජ්ජවාද-ථෙරවාද-යනු විනා හීනයානයක් තුබුණේ නැත. හීනයාන ශබ්දය "මහායාන" ශබ්දයට වඩා නූතනය. මහායානය පිළිබඳ ආරම්භය ක්‍රි: ව: ප්‍රථම ශතවර්ෂයේ නමුදු මහායාන අදහස් ඊට වඩා බොහෝ පැරණිය. ක්‍රි: ව: සවන ශතවර්ෂය පමණේදී ඉන්දියාවේ හීනයානය මැඩගෙන මහායානය ඉල්පි සිටියේ ය. මහායාන බුද්ධාගමෙන් ඔප්නැගුණු සංස්කෘත භාෂාව වසුමිත්‍ර-නාගාර්ජුන-අශ්වඝෝෂ ආදී මහාපඬිවරුන් ගේ කෘතීන් නිසා තව තවත් ඔප් නැගී උතුරුදිග පළාත් වල පැතිර යන අතර එයට බෙහෙවින් ආධාර සහ අනුබල ලැබෙන ලෙස බෞද්ධ ආයතන කීපයක් බෙංගාලයෙහි සහ මගධ රාජ්‍යයෙහි පිහිටුවන ලදී. මේ ආයතන බෞද්ධ විශ්ව විද්‍යාලය නමින් දන්නේය වජ්‍රාසන-නාලන්දා-ජගද්දලා-ඔදන්තපුරි යන විශ්ව විද්‍යාලයයෝ එයින් ප්‍රධාන වෙති. මෙයින් බුද්ධගයා වෙහි වජ්‍රාසන විශ්වවිද්‍යාලය හැර සෙසු විද්‍යා පීඨයෝ මහායානිකයන් ගේ කෙන්ද්‍රස්ථාන වූහ. වජ්‍රාසන විද්‍යාලය හීනයානිකයන් සතුය. නාලන්දා විශ්ව විද්‍යාලය ලොකව්‍යාප්ත වූවකි. මේ බෞද්ධ විශ්ව විද්‍යාලයවලින් බෞද්ධ ලොකයට සැලසුණු සේවය ප්‍රමාණ කළ නො හැක. අර්ථකථාචාර්ය බුද්ධඝෝෂාචාර්ය පාදයන් වහන්සේ හීන යානිකයන් සතු වූ වජ්‍රාසන විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෙකි.

ශතවර්ෂ කීපයක් ඉතා උත්කර්ෂ අන්දමින් දියුණුවී ලොකයට විශාල සේවයක් සැලසූ හීනයාන-මහායාන බුද්ධාගම ක්‍රීස්තු වර්ෂයෙන් දොළොස්වැනි ශතවර්ෂයේ අවසාන භාගයේදී සිදු වූ මහමමදිකයන් ගේ භාරතාක්‍රමණය නිසා භාරත වර්ෂයෙන් සම්පූර්ණයෙන් කෙළවර විය.

මහම්මදිකයන් ඉන්දියාව ආක්‍රමණය කරන්නට පටන්ගත් කාලයේ සිට ම හින්දූන්ට මෙන් ම බෞද්ධයන්ට බලවත් ලෙස විරුධකම් දක්වන ලදි. බවුහු බෞද්ධ භික්ෂූන්ට දරුණු වධදි මරා සිඛස්ථාන වනසාලූහ ක්‍රි: ව: 1193 දී පමණ නැගෙනහිරි දෙසට ආක්‍රමණය කළ මහම්මදිකයෝ Kutb,ud-din Ibak නම් සෙනෙවි යා යටතේ බරණැස් නුවර යටත් කොට එහි බෞද්ධ භික්ෂූන් මැරූහ. නාලන්දු මහා විහෙ විද්‍යාලය ද, එහි විශාල පුස්තකාලය ද, විනාශ කළහ. වෙහෙර-විහාර පෙති පිළිම ආදිය සුණු විසුණු කළහ මරණයෙන් බේරුණු භික්ෂූහු ටිබැට්රටට ද, නේපාලයට ද, දකුණු දිගට ද, පැන ගියහ. එයින් ඉන්දියාවේ බුද්ධාගම * අවසාන විය

ස්ථවිර වාදයට විරුධ මතවලට මෙන් ම මහාසාංඝිකයන්ට ද, **"මහාතුල්‍යවාද"** **"මහාතුල්‍යවාදි"** යන මේ නම් පොදුවේ ව්‍යවහාර කළහ. **"මහාතුල්‍යවාදය"**යි විශෙෂ වාදයක් ඇති බැවින් එය ද, අනිකුත් නිකායාන්තරයන් ගේ මත භෙදයන් ද, ඛණ්ඩනය කරනු පිණිස **"කථාවත්‍ථු ප්‍රකරණය"** සම්පාදිතය. එහි සකවාදි-පරවාදි, දෙදෙනකුන් අතර පැවැති සංවාදයක විලාශයෙන් ස්ථවිර වාදයට විරුධව එවක පැවැති මතාන්තරයන්-ගෙන් සමහරක් ඛණ්ඩනය කරන ලදි. බුද්ධඝොෂාචාර්ය පාදයන් එයට ලියූ අටුවාවෙන් ඒ ඒ නිකායිකයන් ගේ මතාන්තරයන් දැන ගත හැක ඒ අටුවාවට අනුව මොග්ගලිපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ විසින් සඛබත්ථිවාද – මහාසඞ්ඝික – ගොකුලික-මහිංසාසක-වජ්ජීපුත්තක – හද්‍රයානික-සම්මතීය-කස්සපික – පුබ්බ සෙලීය-අපරසෙලීය-රාජගිරික-සිඛත්ථික-උත්තරාපථ-වෙතුල්ලවාද යන තුදුස්නිකායිකයන්ගේ මතාන්තරයෝ ඛණ්ඩනය කරන ලදහ. එයිනුදු "අඤ්ඤ"යයි හදුන්වන පුබ්බසෙලීය – අපරසෙලීය – රාජගිරික-සිඛත්ථික – යන නිකායිකයන්ගේ ද, මහාසඞ්ඝික – සඛබත්ථිවාද-උත්තරාපථ-සම්මතීයයන්ගේ ද, මතාන්තර ම බෙහෙවින්

---

* In about the year 1193 he invaded Bihar, sacked the Capital of Odantapuri, destroyed its great monastary and dealt Buddhism in its last stronghold a blow from which it was unable to recover, from that day the Buddhist religion was at an end in Northern India, The monks who succeeded in escaping from the massacre seattered to Nepal, Tibet and the South.

History of India, (By Dunber) Vol I, P. 99.

ඛණ්ඩිතය. මහිංසාසකයන් ගේ මත නවයක් ද, වජ්ජිපුත්තකයන් ගේ මත තුනක් ද, ඛණ්ඩනය කරන ලදී. භද්‍රයානිකයන් සහ කස්සපිකයන් ගැන සඳහන්වනුයේ එක් තැනක පමණි. වෙතුල්ලවාදී නම් නිකායිකයන් සහ ඔවුන් ගේ මත අටක් සඳහන්කර එය ද ඛණ්ඩනය කරන ලදී. හෙමවත-සඞ්කන්තික - සුත්තවාද-ධම්මගුත්තික-ජන්නාගාරික-එකබෙබාහාරික-පඤ්ඤත්තිවාද - බාහුලික-චෙතිය වාද-යන නිකායිකයන් හෝ ඔවුන් ගේ මතාන්තරයන් ගැන කිසිත් සඳහන් නොවේ. ස්ථවිරවාදයෙන් බාහිර වූ සියලු ම නිකායාන්තරයන්ට "වෙතුල්ලවාදී"යයි කියතුදු එනමින් වෙනම ම නිකායක් පැවැති බව කථාවස්තුප්‍රකරණ අටුවාවෙන් පෙනේ. "මහා පුඤ්ඤවාදී" යනු ද ඔවුන්ට නමකි. උත්තරාපථිකයන්ගේ ද, ශාඛාවන් පැවැති බව "එකච්චානං උත්තරාපථකානං" යන වාක්‍යඛණ්ඩවලින් පෙනේ. හෙතුවාදීන් යනුවෙන් "සර්වාස්තිවාදීන්" ඇදින්වූහ. සම්මතීයයන් සහ අන්ධකයන් ද, අන්ධකයන් සහ උත්තරාපථකයන් ද, මහිංසාසකයන් සහ සම්මතීයයන් ද, බොහෝ මතාන්තරයන්හිදී එකමතිකය. වෙතුල්ලවාදීන් ගේ මත අන් එක ද නිකායිකයකු ගේ මත සමග සම්බන්ධයක් නැත. අන්ධකයන් අතර වුව ද, පුබ්බසෙලිය අපරසෙලියයන් එක් මතයක් ගත් තැන් ඇත්තේ ය. මහායාන බුඩාගමේ උත්කර්ෂවත් දීප්තිය පැවැති කාලයේ පැතිරී ගිය මතාන්තර ද, ඊට බොහෝ පෙර සිට ම පැවැති බැව් සබ්බත්ථිවාද-වෙතුල්ලවාදීන්ගේ මතාන්තරයන්ගෙන් පෙනේ. පසු කාලයෙහි හටගත් නිකායිකයන් ගේ මතාන්තර ඛණ්ඩනය කරන ලද හෙයින් කථාවස්තු ප්‍රකරණය තෘතීය ශතවර්ෂයෙන් මෑත කාලයෙහි මහායාන ශාඛාවන් ගේ ව්‍යාප්තියටත් පසු කාලයේ කරන ලදැයි * යුරෝපීය පඬුවෝ කල්පනා කරති. මේ නිකායයන්ගෙන් ස්ථවිර වාදයට ඉතා ම ආසන්නවූයේ සර්වාස්තිවාදී නිකායයි. හෙතුවාද-හෙතුවිද්‍යා - මුරුන්තක යන නම්වලින් ද, හඳුන්වන සර්වාස්තිවාදය ස්ථවිර වාදයෙන් බිඳිගිය ප්‍රධාන ශාඛාවකි. කාලත්‍රයෙහි සියලු ධර්මයන් ගේ අස්තිත්වය ප්‍රකාශ කරන හෙයින් "සර්වාස්තිවාදී" නම් වීය "තදස්තිවාදාත් සර්වාස්තිවාදී මතඃ" යනුවෙන් ඒ බැව් අභිධර්මකොශයෙහි ම කියයි..

---

* Even though the Kathawatthu in its present form Cannot be regarded as a work of the 3rd Century, B. C. it neverthi less throws intersting light on the devolopment of Buddhist dogmatice during the later Centuries.

History of Indian Literature, Vol. II, P. 373

ක්‍රි: ව: 8 වන ශතවර්ෂයේ විසූ විනීතදෙව සර්වාස්තිවාදීන් සංස්කෘත භාෂාව ව්‍යවහාර කළ බැව් කියයි. සථවිරවාදීන් ගේ ප්‍රධාන නගරය මහධ්‍ය වූවාක් මෙන් සර්වාස්තිවාදීන් ගේ ප්‍රධාන නගරය කාශ්මීරය විය. අශෝක කාලයේ කාශ්මීරයට විභජ්‍ය වාදය ගෙන ගියේ නමුදු ඉන්පසුව සර්වාස්තිවාදය එහි ගෙන ගියේය. කණිෂ්ක සඬගීතිය පවත්වන ලද්දේ කාශ්මීරයේ සර්වාස්තිවාදීන් ගේ බලය මහාදට ම පැතිරුණු පසුය. කාශ්මීර-ගන්ධාර-උජ්ජයිනී-කණෞජ්-පර්සියා යන රටවල් ද, සර්වාස්තිවාදීන් විසූ බැව් කියූ එං සියැං කියයි ජාවා-සුමාත්‍රා-කාම්බෝජ්-ලාව-සිඤ්ඡු තුර්කිස්ථානය-නැගෙනහිර ඉන්දියාව ආදී දෙශාන්තරයන් හිද විසූ බැව් ඉටිසිං කියයි. ක්‍රි: ව: 7 වන ශතවර්ෂයේ සඬකර ලියූ සොත්වල ද, සර්වාස්තිවාදීන් ගැන සඳහන් වේ. මේ ශත වර්ෂයේ ම විසූ මහා කවි බාණභට්ටයන් කළ කාදම්බරියෙහි උජ්ජයිනී නගර වර්ණනාවෙහි ද, සර්වාස්තිවාදීන් සඳහන් වේ. ක්‍රි: ව: 14 වන ශතවර්ෂයේ විසූ මාධවාචාර්ය නම් පණ්ඩිතයා වෛභාෂික නමින් සර්වාස්තිවාදීන් ගැන ලියමින් ඔවුන් පිළිබඳ තොරතුරු කියයි. ක්‍රි: ව: 14 වන ශත වර්ෂයෙන් පසු සර්වාස්තිවාදිනිකාය පිරිහී ගියා විය හැක.

තෘතීය සඬගීතියෙහි දී ඉන් බැහැර කළවුන්ගෙන් වැඩි දෙනා සර්වාස්තිවාදීහු වූහ. ඔවුහු කාලන්දවට රැස්ව එය තමන් ගේ ප්‍රධාන ස්ථානය කර ගත්හ. සුංකරාජ් කාලයෙහි දී පැළලුප් නුවර බ්‍රාහ්මණ බලය පැතිරී ගිය හෙයින් එහි සිටි සර්වාස්තිවාදීහු මථුරා වෙහි නවහට්ය විහාරය ප්‍රධාන ස්ථානය කරගත්හ. තථාගතයන් වහන්සේ ගේ සතරවැනි ප්‍රධාන ශිෂ්‍ය වූ මහා කාශ්‍යප ස්ථවිර ශ්‍රාවකයන් වහන්සේ නොයෙක්වර විසූ මථුරාහි ගුහුවනයෙහි සුංග සමයෙහි දී සර්වාස්තිවාදීහු විසූහ එහි විසූ ඔවුහු "මථුරාසර්වාස්තිවාදීහු" නම් වූහ. සුංග සමයේ පටන් කුෂාන් කාලය දක්වා මෙහි විසූ සර්වාස්තිවාදීහු එකල ඇති වූ සංස්කෘත භාෂාවෙන් උත්කෂීවත් උද්දිපනීය ද, සංස්කෘතයෙන් ලියූ ග්‍රන්ථයන්ට ලැබෙන සම්මානය ද, දැක තුමූ ද, සංස්කෘත ව්‍යවහාරය පටන් ගත්හ. මහර්ෂි පතඤ්ජලීන් විසින් මේ කාලයේ ම "මහාභාෂ්‍ය ය" ලියන ලදී. ශාක්‍යභික්ෂු-ශ්‍රෞතසූත්‍රාදිය" සම්පාදනය කෙළේ ද, මේ කාලයේ ම ය.

කණිෂ්ක රජු විසින් කරවූ ධර්ම සඬගායනාවට පූර්වයෙහි සිටම ගන්ධාර-කාශ්මීර යනුවෙන් සර්වාස්තිවාදීහු දෙකොටසක් වූහ. ඒ සඬගායනාවෙහි දී මේ උභය පක්ෂය ම සම්මේලන කරන ලදී. මේ

අතර මාථුරාවෙහි විසුවෝ "මාථුර සර්වාස්තිවාදී" නමින් ප්‍රකට වූහ. ඔවුහු මේ දෙකොටසට ම අයත් නොවූහ. එබැවින් ඒ මාථුර සර්වාස්තිවාදීන්ගෙන් වෙනස් කරනු පිණිස කණිෂ්ක සඞ්ගිතියෙන් පසුව ගන්ධාර-කාශමීර සර්වාස්තිවාදීහු "මූලසර්වාස්තිවාදීහුය" යි නම් කළහ. එවිට මාථුර සර්වාස්තිවාදීහු; තුමූ "ආර්ය සර්වාස්තිවාදීහුය" යි කීහ. කුශාන් අධිරාජ්‍යය පැවැති කාලයේ මාථුර සර්වාස්තිවාදීන්ට ද, විශාල බලයක් තුබුණේ ය. එහෙත් ඔවුන්ගේ පොත්වලින් අද දක්නේ අශෝකාවදානය පමණකි. එහි අශෝක රජුගේ චරිතය ඉතා උතකම් අන්දමින් ලියා ඇත්තේය අශෝක රජුගේ ආචාර්ය වූයේ උපගුප්ත ස්ථවිරයන් වහන්සේය යි අශෝකාවදානයේ දක්නේය.

ඉට්සිං නම් චීන භික්ෂුව විසින් (700-712) මූල සර්වාස්තිවාදීන්ගේ ග්‍රන්ථ රාශියක් ම පරිවර්තනය කරන ලදැයි සඳහන් වේ. කාශ්මීර සර්වාස්තිවාදීහු කණිෂ්ක සඞ්ගිතියේ දී කළ විභාෂාවන් ප්‍රමාණ කරමින් විශෙෂයෙන් එය හදාළහ. එබැවින් ඔවුහු *වෛභාෂිකයෝ නම් වූහ. පැරණි සියලු ම නිකායාන්තරයන්ට ඔවුනොවුන් අයත් පිටකයන් තුබූ නමුදු අද දක්නට ඇත්තේ සර්වාස්තිවාදීන්ට අයත් පිටක ග්‍රන්ථයන් පමණකි. ස්ථවිරවාදීන්ට මෙන් ම සර්වාස්තිවාදීන්ට ද පිටක තුනකි. සූත්‍ර පිටකයේ පොත් පහක් සර්වාස්තිවාදීන්ට ද, ඇත්තේය. එහෙත් ක්ෂුද්‍රකාගමයෙහි (=බුද්දක නිකාය) ඔවුන්ට ඇත්තේ පොත් පසකි. ස්ථවිරවාදීන්ට එහි පොත් පසළොසකි. ස්ථවිර වාදීහු සූත්‍ර පිටකයේ පොත් නිකාය - ආගම යන උභය නාමයන්ගෙන් ම ව්‍යවහාර කරතත් සර්වාස්තිවාදීහු ආගම නාමයෙන්ම ව්‍යවහාර කරති විනය පිටකයෙහි ස්ථවිරවාදීන්ට පොත් පසකි එහෙත් සර්වාස්ති වාදීන්ට පොත් තුනකි. අභිධර්මපිටකයේ ස්ථවිර වාදීන්ට මෙන්ම සර්වාස්තිවාදීන්ට ද, පොත් සතකි. ස්ථවිරවාදීන්ගේ සහ සර්වාස්තිවාදීන්ගේ අභිධර්මපිටකයට අයත් ග්‍රන්ථ පිළිබඳව නාම සාම්‍යය මෙන් ම විෂය සාම්‍යය ද, ඇත්තේය. සර්වාස්තිවාදීන්ගේ අභිධර්ම ග්‍රන්ථයන් කළ කර්තෘවරු විද්‍යමාන වෙත්. ස්ථවිරවාදීහු "කථාවත්ථුප්පකරණය" පමණක් මොග්ගලී පුත්ත තිස්ස රහතන් වහන්සේ විසින් කරන ලදැ යි කියති. උභයවාදීන්ගේ පිටකත්‍රය පිළිබඳව ග්‍රන්ථ සඞ්ඛ්‍යව මෙසේය

---

* The Vibhashas were especially studied by the Sarvasti vadins of Kasmir, and hence their name of Vaibhasikas. History of Buddhist Thought. P. 176

ක්‍රි: ව: 8 වන ශතවර්ෂයේ විසූ විනීතදෙව සර්වාස්තිවාදීන් සංස්කෘත භාෂාව ව්‍යවහාර කළ බැව් කියති. සථවිරවාදීන් ගේ ප්‍රධාන නගරය මගධය වූවාක් මෙන් සර්වාස්තිවාදීන් ගේ ප්‍රධාන නගරය කාශ්මීරය විය. අශෝක කාලයේ කාශ්මීරයට විභජ්‍ය වාදය ගෙන ගියේ නමුදු ඉන්පසුව සර්වාස්තිවාදය එහි ගෙන ගියේය. කණිෂ්ක සඞ්ගීතිය පවත්වන ලද්දේ කාශ්මීරයේ සර්වාස්තිවාදීන් ගේ බලය මහාදට ම පැතිරුණු වූ පසය. කාශ්මීර-ගන්ධාර-උජ්ජයිනි-කණෙරුජ-පර්සියා යන රටවල ද, සර්වාස්තිවාදීන් විසූ බැව් කියූ එං සියැං කියයි ජාවා-සුමාත්‍රා-කාම්බෝජ-ලාව-සිඤ්ඤ තුර්කිස්ථානය-නැගෙනහිර ඉන්දියාව ආදි දෙශාන්තරයන් හිද විසූ බැව් ඉටිසිං කියති. ක්‍රි: ව: 7 වන ශතවර්ෂයේ සඞ්කර ලියූ සොත්වල ද, සර්වාස්තිවාදීන් ගැන සඳහන් වේ. මේ ශත වර්ෂයේ ම විසූ මහා කවි බාණභට්ටයන් කළ කාදම්බරියෙහි උජ්ජයිනී නගර වර්ණනාවෙහි ද, සර්වාස්තිවාදීන් සඳහන් වේ. ක්‍රි: ව: 14 වන ශතවර්ෂයේ විසූ මාධවාචාර්ය නම් පඬිවරයා වෛභාෂික නමින් සර්වාස්තිවාදීන් ගැන ලියමින් ඔවුන් පිළිබඳ තොරතුරු කියති. ක්‍රි: ව: 14 වන ශත වර්ෂයන් පසු සර්වාස්තිවාදීන්ගේ කාය පිරිහී ගියා විය හැක.

තෘතීය සඞ්ගීතියෙහි දී ඉන් බැහැර කළවුන්ගෙන් දැනී සිටි සර්වාස්තිවාදීහු වූහ. ඔවුහු නාලන්දාවට රැස්ව එය තමන් ගේ ප්‍රධාන ස්ථානය කර ගත්හ. සුංගරාජ් කාලයෙහි දී පැළලුප් නුවර බ්‍රාහ්මණ බලය පැතිරී ගිය හෙයින් එහි විසූ සර්වාස්තිවාදීහු මථුරා වෙහි නවතිටිය විහාරය ප්‍රධාන ස්ථානය කරගත්හ. තථාගතයන් වහන්සේ ගේ සතරවැනි ප්‍රධාන ශිෂ්‍ය වූ මහා කාශ්‍යප ස්ථවිර ශ්‍රාවයන් වහන්සේ නොයෙක්වර විසූ මථුරාහි ගුහාවනයෙහි සුංග සමයෙහි දී සර්වාස්තිවාදීහු විසූහ එහි විසූ ඔවුහු "මථුරකසර්වාස්තිවාදීහු" නම් වූහ. සුංග සමයේ පටන් කුෂාන් කාලය දක්වා මෙහි විසූ සර්වාස්තිවාදීහු එකල ඇති වූ සංස්කෘත භාෂාවෙන් උත්කර්ෂවත් උද්දිපනීය ද, සංස්කෘතයෙන් ලියූ ග්‍රන්ථයන්ට ලැබෙන සම්මානය ද, දැක තුබූ ද, සංස්කෘත ව්‍යවහාරය පටන් ගත්හ. මහර්ෂි පතඤ්ජලීන් විසින් මේ කාලයේ ම "මහාභාෂ්‍ය ය" ලියන ලදී. ශාක්‍යභික්ෂු-ශ්‍රෞතසූත්‍රාදිය" සම්පාදනය කෙළේ ද, මේ කාලයේ ම ය.

කණිෂ්ක රජු විසින් කරවූ ධර්ම සඞ්ගායනාවට පූර්වයෙහි සිටම ගන්ධාර-කාශ්මීර යනුවෙන් සර්වාස්තිවාදීහු දෙකොටසක් වූහ. ඒ සඞ්ගායනාවෙහි දී මේ උභය පක්ෂය ම සම්මේලනය කරන ලදී. මේ

අතර මථුරාවෙහි විසුවෝ "මාථුර සර්වාස්තිවාදී" නමින් ප්‍රකට වූහ. ඔවුහු මේ දෙකොටසට ම අයත් නොවූහ. එබැවින් ඒ මාථුර සර්වාස්තිවාදීන්ගෙන් වෙනස් කරනු පිණිස කණිෂ්ක සඞ්ගිතියෙන් පසුව ගන්ධාර-කාශමීර සර්වාස්තිවාදීහු "මූලසර්වාස්තිවාදීහුය" යි නම් කළහ. එවිට මාථුර සර්වාස්තිවාදීහු; තුමූ "ආර්ය සර්වාස්තිවාදීහුය" යි කීහ. කුශාන් අධිරාජ්‍යය පැවැති කාලයේ මාථුර සර්වාස්තිවාදීන්ට ද, විශාල බලයක් තුබුණේ ය. එහෙත් ඔවුන්ගේ පොත්වලින් අද දක්නේ අශෝකාවදානය පමණකි. එහි අශෝක රජුගේ චරිතය ඉතා උත්කර්ෂ අන්දමින් ලියා ඇත්තේය අශෝක රජුගේ ආචාර්ය වූයේ උපගුප්ත ස්ථවිරයන් වහන්සේය යි අශෝකාවදානයේ දක්නේය.

ඉට්සිං නම් චීන භික්ෂුව විසින් (700-712) මූල සර්වාස්තිවාදීන්ගේ ග්‍රන්ථ රාශියක් ම පරිවර්තනය කරන ලදැයි සඳහන් වේ. කාශ්මීර සර්වාස්තිවාදීහු කණිෂ්ක සඞ්ගිතියේ දී කළ විභාෂාවන් ප්‍රමාණ කරමින් විශෙෂයෙන් එය හදාළහ. එබැවින් ඔවුහු *වෛභාෂිකයෝ නම් වූහ. පැරණි සියලු ම නිකායාන්තරයන්ට ඔවුනොවුන් අයත් පිටකයන් තුබූ නමුදු අද දක්නට ඇත්තේ සර්වාස්තිවාදීන්ට අයත් පිටක ග්‍රන්ථයන් පමණකි. ස්ථවිරවාදීන්ට මෙන් ම සර්වාස්තිවාදීන්ට ද පිටක තුනකි. සූත්‍ර පිටකයේ පොත් පහක් සර්වාස්තිවාදීන්ට ද, ඇත්තේය. එහෙත් ක්ෂුද්‍රකාගමයෙහි (=බුද්දක නිකාය) ඔවුන්ට ඇත්තේ පොත් පසකි. ස්ථවිරවාදීන්ට එහි පොත් පසළොසකි. ස්ථවිර වාදීහු සූත්‍ර පිටකයේ පොත් නිකාය - ආගම යන උභය නාමයන්ගෙන් ම ව්‍යවහාර කරතත් සර්වාස්තිවාදීහු ආගම නාමයෙන්ම ව්‍යවහාර කරති විනය පිටකයෙහි ස්ථවිරවාදීන්ට පොත් පසකි. එහෙත් සර්වාස්ති වාදීන්ට පොත් තුනකි. අභිධර්මපිටකයේ ස්ථවිර වාදීන්ට මෙන්ම සර්වාස්තිවාදීන්ට ද, පොත් සතකි. ස්ථවිරවාදීන්ගේ සහ සර්වාස්තිවාදීන්ගේ අභිධර්මපිටකයට අයත් ග්‍රන්ථ පිළිබඳව නාම සාම්‍යය මෙන් ම විෂය සාම්‍යය ද, ඇත්තේය. සර්වාස්තිවාදීන්ගේ අභිධර්ම ග්‍රන්ථයන් කළ කර්තෘවරු විද්‍යමාන වෙත්. ස්ථවිරවාදීහු "කථාවත්ථුප්පකරණය" පමණක් මොග්ගලී පුත්ත තිස්ස රහතන් වහන්සේ විසින් කරන ලදැ යි කියති. උභයවාදීන්ගේ පිටකත්‍රය පිළිබඳව ග්‍රන්ථ සඞ්ඛ්‍යව මෙසේය

---

* The Vibhashas were especially studied by the Sarvasti vadins of Kasmir, and hence their name of Vaibhasikas.
History of Buddhist Thought. P. 176

සුත්‍ර පිටකය

ස්ථවිරවාද	සර්වාස්තිවාද
1 දීඝනිකාය (=දීඝාගමෝ)	1 දීර්ඝාගමඃ
2 මජ්ඣිම නිකාය (=මජ්ඣිමාගමෝ)	2 මධ්‍යමාගමඃ
3 සංයුත්තනිකාය (=සංයුත්තාගමෝ)	3 සංයුක්තාගමඃ
4 අඞ්ගුත්තරනිකාය (=අඞ්ගුත්තරාගමෝ)	4 අඞ්ගෝත්තරාගමඃ
5 ඛුද්දක නිකාය (=ඛුද්දකාගමෝ)	5 ක්ෂුද්‍රකාගමඃ
1 ඛුද්දක පාඨ	
2 ධම්මපද	1 ධර්මපද
3 උදාන	2 උදාන
4 ඉතිවුත්තක	
5 සුත්තනිපාත	3 සූත්‍ර නිපාත
6 විමාන වත්ථු	4 විමාන වස්තු
7 පෙතවත්ථු	
8 ථෙර ගාථා	
9 ථෙරී ගාථා	
10 ජාතක	
11 නිද්දෙස	
12 පටිසම්භිදා	
13 අපදාන	
14 බුද්ධවංස	5 බුද්ධවංශ
15 චරියා පිටක	

විනය පිටකය.

විභඞ්ග	1. පාරාජිකා	1	පාරාජිකා
	2. පාචිත්ති	2.	ප්‍රායශ්චිත්ත
ඛන්ධක	3. මහාවග්ග	}	අවදානම්
	4. චුල්ලවග්ග	}	(=ජාතකම්
	5. පරිවාර		

අභිධර්ම පිටකය.

1 ධම්මසඞ්ගණි	1 ධර්මසංග්‍රහපාදඃ (ආර්‍යසාරිපුත්‍ර)
2 විභඞ්ග	2 විභඞ්ගනිකායපාදඃ (දෙවශර්මී ස්ථවිර)
3 ධාතුකථා	3 ධාතුකාය පාදඃ (පූර්ණ ස්ථවිර)
4 පුග්ගල පඤ්ඤත්ති	4 ප්‍රඥප්ති පාදඃ (ආර්‍ය මෞද්ගල්‍යායන)
5 කථාවත්ථුප්පකරණ	5 ප්‍රකරණ පාදඃ (වසුමිත්‍රස්ථවිර)
6 යමක	6 සංගිතිපර්‍යාය පාදඃ
	(මහාමෞද්ගලිපුත්‍ර ස්ථවිර)
7 පට්ඨාන	7 ඥානප්‍රස්ථාන පාදඃ (ආර්‍යකාත්‍යායනී)

සර්වාස්තිවාදීන්ගේ අභිධර්මපිටකයට අයත් ග්‍රන්ථ අතරෙන් ඉතා ශ්‍රේෂ්ඨවූයේ ආර්‍ය කාත්‍යායනී පුත්‍රයන් වහන්සේගේ "ඥානප්‍රස්ථාන"යයි. එහි ග්‍රන්ථ 8 කි. වර්ග 44 කි. ශ්ලෝක 15072 කි.

මේ "ඥාන ප්‍රස්ථාන" ශාස්ත්‍රය අනුව කාශ්මීර විභාෂාව ද, කාශ්මීර විභාෂාව ආශ්‍රයෙන් අභිධර්ම කෝශය ද, සම්පාදිතය. මෙය ලියා ලද්දේ කාරිකා ක්‍රමයෙනි. කාරිකා ක්‍රමය නම්: ව්‍යාකරණ සූත්‍ර මෙන් කරුණු රාශියක් පිටු කොට සැකෙවින් කියන ක්‍රමයයි. "ඉතඋර්ධ්වං සමුත්පාදඃ - සමුත්පන්නඃ ඵලංමතම්" යනා කාරිකාද්වයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදය සහ ප්‍රතීත්‍ය සමුත්පන්නය උගන්වන ලදි. අභිධර්ම කෝශයෙහි කෝශස්ථාන අටකි. කාරිකා සියල්ල පන්සිය අනූහතරකුත් එකාඩියකි.

කාරිකා ග්‍රන්ථයක් ලියූ ආචාර්යවරයන් විසින් ම සවකීය ග්‍රන්ථයට භාෂ්‍යයක් ලිවීම සිරිතය. ඒ නුව අභිධර්ම කෝශයට භාෂ්‍යයක් වසුබන්ධු විසින් ම ලියන ලදි. පසු කාලයේ විසූ බොහෝ ආචාර්යවරු ද, අභිධර්ම කෝශයට ටීකා ලියූහ. "ත්‍රිපාත් ඡාන්ත්‍රිද්" ග්‍රන්ථමාලාවේ දක්නා අයුරු "යශෝමිත්‍ර" ගේ "ස්ඵුටාර්ථ ටීකාව" ද, "පූර්ණවර්ධනයන් ගේ" "ලක්ෂණානුසාරිණී ටීකාව" ද, "ගුණමතිස්ථිරදේවයන් ගේ" "ඔපපත්තිකි ටීකාව" ද, "දිඩ්නාගයන්" ගේ "ඉන්ද්‍රියපරීක්ෂා" ද, "සථිරමති" ආචාර්යයන්ගේ "තත්ත්වාර්ථ භාෂ්‍ය ටීකාව" ද, එයින් කිපයකි. පැලියගොඩ විද්‍යාලඞ්කාර පිරිවෙණෙහි ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ ත්‍රිපිටකාචාර්‍ය ශ්‍රී රාහුල සාංකෘත්‍යායනස්ථවිරයන් වහන්සේ විසින් "කාරිකාභිධර්ම ටීකාව" ලියන ලදි. මෙයින් වසුබන්ධු හා සමකාලීන යශෝමිත්‍රගේ "ස්ඵුටාර්ථ ටීකාව" ඉතා පැරණිය. "ඡාන්ත්‍රිද්" ග්‍රන්ථ මාලාවේ දක්නා අභිධර්මකෝශ ටීකා-භාෂ්‍යාදියෙන් වැඩි හරියක් නාම-මාත්‍ර ශෙෂය. බුදු දහමේ සියලුම අංශයන් කාරිකා ක්‍රමයෙන් උගන්වන මේ ග්‍රන්ථය භාරත භූමියේ පමණක් නොව බෞද්ධ ලොකයේ සෑම තැනම පැතිරී ගිය්සේය. ලක්දිව පණ්ඩිතයන් ද, මේ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථය ඉතා ආදරයෙන් හදාළහ. බාණයන්ගේ හස්තිවනාවේ අවතම්බක්ඛවාසයෙහි දක්නා "කුතෝකරණි ශාක්‍ය ඝාණයා කුශලාභ්‍යුපගමාශා යම්මූඩ්හි සදිසෝ" යනු විවරණය භාරත සඞ්ඝයා හාවිතා වෙයි දැ "ඉතිහාසා බුද්ධිසිද්ධාභාසනා වසූබන්ධු භාෂ්‍ය ඉති" යනුවෙන් මේ ග්‍රන්ථය ඇදිරිවූණ අභිවදනාව සෑකෙවුම්කා රජු විසින් ලියූ විදර්ශනාකී සන්නයෙහි දී

15 සංඝකාරසඝකඛි වතුවීසාතනඤ්ඤා-සංඝකාරෝ ච ඉමෙකුණ්ඩ ධම්මායතන ධාතවාකඛඤ්ඤා-ඝකා විඤ්ඤත්තා සංඝකාරඛඤ්ඤා

භාවය:—රූප-වේදනා-සංඥා-විඤ්ඤාන යන ඝකඛි සතරින් අන්‍යවූ සංඝකාර, සංඝකාරඝකඛි නමි අවිඤ්ඤත්ති-අසංඝකාත-ධම්මායතන යන ධාතුත්‍රය සංඝකාරඝකඛියාගේ ප්‍රභෙදයෝ වෙති.

සංඝකාරඝකඛි.

විපත්ති:—තමන්ගේ හෙතු උපකාර ධර්මයන් විසින් සිඛ කටයුතුවූ ඵල ධර්මය ඝකඝ් කරන හෙයින්, සංඝකාරය යි කියති. වදුරන ලද්දේ මැයි. ''ඝඛත මභිසඛඛරොන්ති ති ඛො භික්ඛවෙ තඝමා සඛඛාරොති වුච්චන්තීති.'' වේදනා- සංඥා හැර ස්පර්ශාදි පණස් චෛතසිකයෝ සංඝකාරඝකඛි නම්. කියා ලද මැයි. 'වෙදනා ඝඤ්ඤ වජ්ජිතා ඵස්සාදයො ඵඤ්ඤස චෙතසිකා සංඛාරඛඤ්ඤොනාම'' ඝපර්‍ශ-චෙතනාදින්ගේ චෙන් වෙන් ලක්‍ෂණ ඇත්තේ නමුදු, ඒ සියල්ල එක් රැස් කොට සංඝකාරඝකඛිය යි කියනු ලැබේ. ''සඛඛාරඛඤ්ඤොපි අඤ්ඤදෙව ඵස්ස ලඛඛණං අඤ්ඤං චෙතනාදිනං සමොධානෙත්වා පන සඛඛාරඛඤ්ඤොත්වෙව වුච්චති'' යනු සමෙම්ග විනොදනී විභඞ්ග අටුවාහි.

ධම්මායතන ධාතවාකඛඤ්ඤා

විපත්ති:—දෙපණස් චෛතසික-සොළස සූක්‍ෂම රූප-නිර්‍වාණ යන එකුන් සැත්තෑ ධර්මයෝ ධම්මායතන යි ද, ධම්මධාතු යි ද, කියති.

තත්ථ කතමං ධම්මායතනං වෙදනාඛඛඤ්ඤො ඝඤ්ඤඛඛඤ්ඤො සඛඛාරඛඛඤ්ඤො යං ච රූපං අනිදස්සනං අපපටිඝං ධම්මායතන පරියාපන්නං අසංඛතා ච ධාතු''

''තත්ථ කතමා ධම්මධාතු වෙදනාඛඛඤ්ඤො ඝඤ්ඤඛඛඤ්ඤො සඛඛාරඛඛඤ්ඤො යං ච රූපං අනිදස්සනං අපපටිඝං ධම්මායතන පරියාපන්නං අසංඛතාව ධාතු'' යනු විභඞ්ග පාළියි. ධම්මායතනය සූක්‍ෂමරූප සඛඛ්‍යාතය. එහෙයින් අනාරම්මණය. කියා ලද මැයි සමෙම්ග විනොදනී අටු යොජනාහි,

''නඤ්ච ඛො සුඛුමරූප සඛඛ්‍යාතං ධම්මායතනං අනාරම්මණතා නාවත්තාබ්බ නොභාසං තප්ප''

අවිඥප්ති-වෙදනාස්කන්ධ-සංඥාස්කන්ධ-ආකාශ-ප්‍රතිසංඛ්‍යා නිරෝධ-අප්‍රතිසංඛ්‍යා නිරෝධ යන සත ධර්මධාතු නමැයි නාලන්දිකා ටිකාහි කියයි.

ත්‍රිවිධ අරූපස්කන්ධය (වෙදන-සංඥා-සංස්කාර) ඡොඩශ විධ සූක්ෂම රූපය-අසංස්කෘත ධාතුය යන මොවුන්ගේ විශයෙන් ධර්මධාතුව විධිවැදැරුම්ය යි කියයි. කියනා ලද මැයි විභඞ්ග අටුවාහි.

ධම්මධාතු තිණ්ණං අරූපක්ඛන්ධානං සොළසන්නං
සුඛුමරූපානං
අසඞ්ඛතායච ධාතුයා වසෙන වීසතිධම්මාති සඞ්ඛං ගච්ඡති

16 විඥානං ප්‍රතිවිඥප්තිඃ-මන ආයතනං ච තත්
මනාඃ තෙ ධාතවඃ සප්ත-ෂඩ්විඥානාන්‍යථෝ මනඃ

භාවය:—විෂයයක් පාසා උපලබ්ධිය විඥානස්කන්ධය යි. එය මනායතන නමුදු වේ. ෂඩ් විඥානයෝ ද, මනස ද, සප්ත-ධාතුහුය යි දන්නා ලදහ.

විඥානං

විප්පති:—මිනිය යුතු වස්තුවක් නැලියෙන් මනින පුරුෂයකු මෙන් සංඥාව නිසා හැඳිනීම් මාත්‍රයෙන් ලබන විෂයග්‍රහණයට වඩා විශිෂ්ට ආකාරයෙන් විෂය ග්‍රහණය කරනුයේ විඥාන ය යි. වදාරන ලද්දේ මැයි.

"විජානාති විජානාතීති ඛො ආවුසො තස්මා විඤ්ඤාණන්ති වුච්චති."

විඤ්ඤාණය නම් සිතයි. ඒ විඥානයාගේ එකුන් අනූ හෝ එක්සිය එක් විසි ප්‍රභෙදය සහ අතීතාදි භෙදය සලකා විඥානස්කන්ධය යි වදාරන ලද්දේය.

මන ආයතනං ච තත්.

විප්පති:—මනින්ද්‍රිය ම මනායතන නම්.

ධාතවඃ සප්ත

විප්පති:—චක්ෂුර් විඥානාදි විඥාන ෂට්කය සහ මනො ධාතුව ද සප්තධාතුහු වෙත්.

17 ෂණ්ණාං අනතතරාතීතං-විඥානං යද්ධි තන්මනඃ
ෂඪ්ආශ්‍රය ප්‍රසිද්ධ්‍යර්ථං-ධාතවොෂ්ටාදශස්මෘතාඃ

භාවය:– ෂඩ්විඥානයන්ට අනතුරුව වන්නාවූ ද, අතීත කාලික වූ ද, යම් විඥානයක් වේ ද, එය මනස ය යි දන්නේය. සවන මනොවිඥානයාගේ ආශ්‍රය ප්‍රසිද්ධිය පිණිස මනස ගේ ගැනීම වේ. ධාතුහු අටළොසක් ය යි දන්නා ලදහ.

මනඃ

විප්පතී:—එකම පුරුෂයා පියා ද, පුතා ද, වන්නාක් මෙන්, එක ම බීජය ධාන්‍යය හා බීජය වන්නාක් මෙන්, ෂඩ් විඥානයන්ට අනතුරු වූ ද, අතීත කාලික වූ ද, විඥානය මනො, විඥානය යි.

ෂඪ්ආශ්‍රය ප්‍රසිද්ධ්‍යර්ථං

විප්පතී:—චක්ෂුරාදී පංච විඥානයන්ට චක්ෂුරාදී පංච ආශ්‍රයෝ වෙත්. මනො විඥානයට අන්‍ය වූ ආශ්‍රයක් නැති. මනො විඥානයට ආශ්‍රය වන්නේ මනස ම ය.

ධාතවොෂ්ටාදශ.

විප්පතී:—චක්ෂුරිත්‍රියාදී ෂඩිත්‍රියයෝ ද, චක්ෂුර් විඥානාදී ෂඩ් විඥානයෝ ද, රූපාදී ෂඩාලම්බනයෝ ද, අෂ්ටාදශ ධාතුහු වෙත්, වදාරන ලද්දේ මැයි; විභඞ්ග පාළියෙහි,

"අට්ඨාරස ධාතුයො චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණ ධාතු සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු ඝාණධාතු ගන්ධධාතු ඝාණවිඤ්ඤාණධාතු ජිව්හාධාතු රසධාතු ජිව්හා විඤ්ඤාණධාතු කායධාතු ඵොඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු."

18 එකෙනසකන්ධායතන–ධාතුනා ධර්ම සඞ්ග්‍රහඃ –
පරභාව වියුක්තත්වාත්-ස්වභාවෙ නෙව සංග්‍රහඃ

භාවය:—සකන්ධය, ආයතනය, ධාතුය යන මේ තුණෙහි එකිනෙකින් සියලු ධර්මයන්ගේ සඞ්ග්‍රහය වේ පරභාවයෙන් වියුක්ත හෙයින් ස්වභාවයෙන් ම සඞ්ග්‍රහය වේ.

එකෙනසකන්ධායතන ධාතුනා ධර්ම සඞ්ග්‍රහඃ

විප්පනි:—සියලු ම සංස්කෘත ධර්මයෝ සකන්ධයන්හි සඞ්ග්‍රහ කරන ලදහ. සියලු සාශ්‍රව ධර්මයෝ උපාදානසකන්ධයන්හි සඞ්ග්‍රහ කරන ලදහ. කියන ලදී. අභිධර්ම කොශයෙහි ම,

"තෙ පුනඃ සංස්කෘතා ධර්මා–රූපාදිසකන්ධ පංචකම්"
යෙ සාස්‍රවා උපාදානසකන්ධා"

සියලු ම ධර්මයෝ ආයතනයන්හි ද, ධාතුන්හි ද, සඞ්ග්‍රහ කරන ලදහ.

පරභාව වියුක්තත්වාත් ස්වභාවේ නෛව සඞ්ග්‍රහඃ

විප්පනි:—එක ධර්මයක් අන්‍ය ධර්මයක් හා සමානවූයේ ස්වභාව නම්. එසේ සමාන නොවූයේ පරභාව නම්. චක්ෂුරින්ද්‍රිය රූපසකන්ධයෙහි සඞ්ග්‍රහ කරන ලද්දේ ය. එහි චක්ෂුස රූපය හා ස්වභාවයෙන් සමානය. චක්ෂුන්ගේ වෙදනාව සමග එබඳු සමානත්වයක් නැත. එහෙයින් වෙදනා සකන්ධයෙහි සඞ්ග්‍රහ නො වීය. පරභාව බැවිනි. (අනතුරු කාරිකාව බලනු)

19 ජාතිගොචර විඥාන–සාමාන්‍යාත් එක ධාතුතා
විත්වෙපි චක්ෂුරාදීනාං–ශොභාර්ථං තු මයොද්‍රහවඃ

භාවය—චක්ෂුරාදීන්ගේ විත්වය ඇත ද, එකජාති (=ස්වභාව) එක ගොචර (=කාර්යක්ෂේත්‍ර=ආලම්බන) එක විඥාන (=කාර්ය) යන් සමාන බැවින් එක ධාතු භාවය වේ. දෙක බැගින් උත්පත්තිය ශොභාව පිණිස ය.

එකධාතුතා.

විප්පනි:—චක්ෂුරාදිහු ජාති, ගොචර, විඥාන යන මෙයින් එක සමාන වෙත්. එබැවින් ඔවුන් චක්ෂුර්ධාතු-ශ්‍රොත්‍රධාතු යනුවෙන් එක ධාතුත්වයෙන් සලකනු ලැබේ. දෙක බැගින් හට ගැන්ම ශොභාව පිණිසය. විශුඛිමාර්ගයෙහි ජාතිය පමණක් ගෙන එකත්වය කියති.

"සඞ්ඛතොති තාව ජාතිතො එකො ධම්මොත්වෙව සඞ්ඛංගච්ඡති"යි.

20 රාශ්‍යා'යචාර ශොත්‍රාර්ථාඃ–සකන්ධායතන ධාතවඃ
මොහෙන්ද්‍රිය රූපී ත්‍රෛධාත්–සකන්ධාදිත්‍රය දෙශනා

භාවය:—සකන්ධයෝ රාශ්‍යාර්ථයහ. ආයතනයෝ චාරාර්ථයහ. ධාතුහු ආකාරාර්ථයහ. මොහ, ප්‍රඥෙන්ද්‍රිය, අධිමොක්ෂා යන මොවුන්ගේ ත්‍රිවිධත්වය හෙතුවෙන් සකන්ධ-ආයතන-ධාතු යන තිදෙනාගේ දෙශනාවයි.

රාශ්‍යා'යර්ථාරණාත්‍රාර්ථාඃ

විභාගනිඃ— 1 මෙහි සකඛ ශබ්දය රාශ්‍යාර්ථයෙහි වේ. "මහා උදකක්ඛන්ධෝ" යනාදියෙහි මෙහි. එහෙයින් අතීතාදි විභාග භින්න සියලු රූප රාශිය එකතු කොට "රූපමේව ඛන්ධෝ රූපක්ඛන්ධෝ" සි සමානාධිකරණ සමාස දත යුතු. කියන ලදි. ආර්ෂසත්‍යාවතාරයෙහි,

"අස්ති හෙදෙහිරූපාදෙ-රතීතාදි වසෙන සඃ
රාශ්‍යාර්ථෝනෙව සංක්ෂිප්‍ය-සකඛ්‍යෙනෙවභිධියතෙ"

"තීහි ඛන්ධෙහි ඉණං දස්සාම" යනාදියෙහි මෙන් සකඛ ශබ්දය භාගාර්ථයෙහි ද වැටේ. එයින් රූප කොඨාසය යන අර්ථය ලැබේ. වීභඞග අටුවාහි,

"අයං හි ඛන්ධෝ නාම පිණ්ඩෝ පූගෝ සටෝ රාසෝ. තස්මා රාසි ලක්ඛණං ඛන්ධාති වෙදිතබ්බා කොට්ඨාසොතිපි වත්තුං වට්ටති. එවමෙව රූපක්ඛන්ධොති රූපරාසි රූප කොඨාසෝ. වෙදනාක්ඛන්ධා වෙදනාරාසි වෙදනා කොට්ඨාසොති ඉමිනා නයෙන සඤ්ඤාක්ඛන්ධාදිනං අත්ථෝ වෙදිතබ්බෝ'සි ඒ බැව් කියති.

2 මෙහි ආයතන 'ශබ්දය වාරාර්ථය. "**ආයතනාකෝ ආකාරානං නානානෙතා ආකාරස්සච නායනාතෙතා ආයතනං**"ඩි චිත්ත චෛතසිකයන් ආලම්බන රසාස්වාදයෙහි ප්‍රයත්න කරන හෙයින් ද, සවභාව ධර්මයන් විස්තර කරන හෙයින් ද, සසර දුකට පමුණුවන හෙයින් ද, ආයතන නමැයි කියති. ආයතන ශබ්දය පර්‍යාය වශයෙන් නිවාසාර්ථ-ආකරාර්ථ-සමෝසරණාර්ථ-සඤ්ජාති දෙහාර්ථ-කාරණාර්ථයන්හි ද වැටේ. "ආයතනානි එත්ථ තං තං වාරාරම්මණ චිත්ත චෙතසිකානෙන තෙන කිච්චෙන සටටනානි වායමනානි" යනුවෙන් වාරාර්ථය පවසයි.

3. "අණනාකප්පකාරං සංසාරදුක්ඛං වීදහතෙති" යනු ඉවත් ධාතූන්ගේ ආකාරාර්ථය වීභඞග අටුවාහි ද, කියයි. (අර්ථමී කොෂයෙහි 1-12 කාරිකාවට ලියූ විවරණය බලනු)

මොහෙන්ද්‍රිය රුචි ත්‍රෛධාත් සකන්ධාදිත්‍රය දෙශනා

විස්තර:—1. චෛත්ත-රූප-චෛත්තරූපයන්හි අයථා දර්ශන නම් වූ මොහය ක්‍රමයෙන් ඒ අනුව තුන්වැදැරුම් ය.

2. මෙහි ඉන්ද්‍රිය නම්, ප්‍රඥෙන්ද්‍රිය යි. එය ද, තීක්ෂණ-මධ්‍ය-මෘදු භෙදයෙන් ත්‍රිවිධ ය.

3. රුචිය නම්, අධිමෝක්ෂාවයි. එය සංක්ෂිප්ත-මධ්‍ය-විස්තර භෙදයෙන් තෙවැදැරු ය. එහි ශමථ චරිතයන්ට සංක්ෂිප්ත රුචිය ද, ශමථ විදර්ශනා චරිතයන්ට මධ්‍ය රුචිය ද, විදර්ශනා චරිතයන්ට විස්තීර්ණ රුචිය ද, වේ.

මෙසේ මොහ-ඉන්ද්‍රිය-රුචින් ගේ ත්‍රිප්‍රභෙදයෙන් සකන්ධ-ධාතු-ආයතනයන් ගේ ත්‍රිප්‍රභෙදය වදාරන ලදි. එහි ද. තීක්ෂණ-මධ්‍ය-මෘදු යන භෙදයෝ වෙත්. මේ සියල්ල විශුද්ධි මාර්ග සන්නයෙහි මෙසේ කියයි.

"සකන්ධාදීන් කෙරෙහි එකෙකිනුදු අර්ථසිද්ධියවත්; කුමක් හෙයින් බොහෝ ධර්මයෝ භූමියොගයෙන් ගන්නා ලද්දාහු ද යත්? ත්‍රිවිධ සත්ත්වානුග්‍රහය පිණිස සකන්ධ ධාත්වායතන ග්‍රහණය කටයුතුයි. නො එසේ වූව සර්ව සාධාරණානුග්‍රහය නොකරණ ලදු වේ. සත්වයෝ වනාහි රූපසම්මුඪයහ; අරූප සම්මුඪයහ; උභය සම්මුඪයහ යි; තුන්වැදැරුම් වෙත්. ඔවුන් කෙරෙහි අරූප සම්මුඪයන් පිණිස සකන්ධ ග්‍රහණය කරණ ලදී. ඉහි අරූප ධර්මයන් චතුධා විභක්ත බැවිනි රූපසම්මුඪයන් පිණිස ආයතන ග්‍රහණය කරණ ලදී. ඉහි රූපධර්මයන් අධ්‍යේකාදසප්‍රකාරයෙන් විභක්ත බැවිනි. උභය සම්මුඪයන් පිණිස ධාතු ග්‍රහණය කරණ ලදී. ඉහි නාමරූපවය ම විභක්ත බැවිනි. එසේ ම තීක්ෂණන්ද්‍රිය මධ්‍යමෙන්ද්‍රිය මුදින්ද්‍රිය ය යි ඉන්ද්‍රිය වශයෙන් ද, සංක්ෂිප්තරුචිය මධ්‍යමරුචිය විස්තාර රුචිය යි ද, සත්වයෝ ත්‍රිවිධ වෙත්. ඔවුන් කෙරෙහි තීක්ෂණන්ද්‍රියයන් පිණිස සංක්ෂිප්තවූ ඉන්ද්‍රිය ග්‍රහණය කරණ ලදී. මධ්‍යමෙන්ද්‍රියයන් පිණිස නාතිසංක්ෂිප්තවූ ආයතන ග්‍රහණය කරණ ලදී. මුදින්ද්‍රියයන් පිණිස විස්තර වූ ධාතු ග්‍රහණය කරණ ලදී. එසේ ම සංක්ෂිප්තරුචිනට සකන්ධ ග්‍රහණය ද, මධ්‍යම රුචිනට ආයතන ග්‍රහණය ද, විස්තාර රුචිනට ධාතු ග්‍රහණය ද කරණ ලදැයි දතයුතු"

21 විවාද මූල සංසාර-කාරණාත් ක්‍රම කාරණාත් වෙතෙතහෙයා වෙදනා සංඥෙ-පෘථක් සකන්ධෞ ව්‍යවස්ථිතෙ

භාවය—කාමයන්හි ද, දෘෂ්ටින්හි ද, ඇලීම නම් වූ විවාදමූලය සංසාරයට කාරණ වන හෙයින් ද, සකන්ධයන්ගේ මා ක්‍රම හෙතුවෙන ද, වෙදනාස්කන්ධ සංඥාස්කන්ධයෝ වෙතෙත ධර්ම යන් කෙරෙන් වෙන්ව දෙශනා කරන ලද්දාහ.

විවාද මූල.

විප්පති:—"මෙහි විවාද මූලයෝ දෙදෙනෙකි. කාමාධ්‍යාවසානය සහ දෘෂ්ට්‍යාධ්‍යවසානය යන දෙදෙනායි. **කාමාධ්‍යවසාන නම්**, කාමාභිනිවෙසය යි. **දෘෂ්ට්‍යාධ්‍යවසාන නම්**, දෘෂ්ට්‍යාභිනිවෙසය යි ඉහි කාමාධ්‍යවසානය වෙදනාස්වාද වශයෙන් බොහෝසේ ගෘහීනට වෙයි. දෘෂ්ට්‍යාධ්‍යවසානය අධර්මයෙහි ධර්මසංඥාදී විපරීත සංඥා වශයෙන් ප්‍රව්‍රජිතයනට වෙයි. මෙසේ වෙදනාස්වාද හෙතුවෙන් වන ගෘහීන්ගේ විවාදයට ද, ධර්මයෙහි අධර්මසංඥාදීන් වන ප්‍රව්‍රජිතයන්ගේ විවාදයට ද, වෙදනා සංඥා දෙදෙනා හෙතු වෙතියි දතයුතු. යම් හෙයකින් වෙදනාවෙහි ගිජුවූයේ, විපර්යස්ත සංඥා ඇත්තේ සංසරණය කෙරේ ද, එහෙයින් වෙදනා සංඥා දෙදෙනා සංසාරයට ප්‍රධාන හෙතුවයි" යනු විශුද්ධිමාර්ග සන්නයි.

අඞ්ගුත්තර නිකාය ඡක්ක නිපාතයෙහි **කොධ-මක්ඛ-ඉස්සා-සාඨෙය්‍ය-පාපිච්ඡතා-සන්දිඨි පරාමාස** යනුවෙන් විවාදමූලයෝ සදෙනෙක් දෙශනා කරන ලද්දාහ. වදාරන ලද මැයි.

"**ඡයිමානි භික්ඛවෙ විවාද මූලානි**. කතමානි ඡ. ඉධ භික්ඛවෙ භික්ඛු කොධනො හොති උපනාහී, යො සො භික්ඛවෙ භික්ඛු කොධනො හොති උපනාහී සො සත්ථරිපි අගාරවො විහරති අප්පතිස්සො ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සො සංඝෙපි අගාරවො විහරති අප්පතිස්සො සික්ඛාය පි න පරිපූර කාරී හොති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො ධම්මෙ අගාරවො විහරති අප්පතිස්සො සංඝෙ අගාරවො විහරති අප්පතිස්සො සික්ඛාය න පරිපූරකාරී සො සංඝෙ විවාදං ජනෙති යො හොති විවාදෙ බහුජනාහිතාය බහුජනා සුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං එවරූපං වෙ

තුමෙහ භික්ඛවෙ විවාද මූලං අජ්ඣත්තං වා බහිඩාවා සමනුපස්සෙය්‍යාථ නනු තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාද මූලස්ස පහානාය වායමෙය්‍යාථ එවරූපං වෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිඩා වා න සමනුපස්සෙය්‍යාථ නනු තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ එවමෙතස්ස පාපකස්ස විවාද මූලස්ස පහානං හොති එවමෙතස්ස පාපකස්ස විවාද මූලස්ස ආයතිං අනවස්සවො හොති පුනච පරං භික්ඛවෙ භික්ඛු මක්ඛිහොති පලාසි-ඉස්සුකි හොති මච්ඡරි-සඨො හොති මායාවි-පාපිච්ඡො හොති මිච්ඡදිඨි සන්දිඨි පරාමාසි හොති ආධානගාහි දුප්පටිනිස්සග්ගි-ඉමානි ඛො භික්ඛවෙ ඡ විවාද මූලානීති.

අඞ්ගුත්තර නිකාය දසම නිපාතයෙහි ද, සූත්‍ර දෙකකදි විවාදමූලයෝ දෙශනා කරන ලද්දහ.

"කතිනු ඛො භන්තෙ විවාදමූලානීති දස ඛො උපාලි විවාද මූලානීති. කතමානි දස ඉධුපාලි භික්ඛු

1 අධම්මං ධම්මොති දිපෙති

2 ධම්මං අධම්මොති දිපෙති

3 අවිනයං විනයොති දිපෙති

4 විනයං අවිනයොති දිපෙති

5 අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දිපෙති

6 භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දිපෙති.

7 අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දිපෙති

8 ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දිපෙති

9 අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දිපෙති

10 පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දිපෙති

ඉමානි ඛො උපාලි දස විවාද මූලානීති

කති නු ඛො භන්තෙ විවාදමූලානීති දස ඛො උපාලි විවාද මූලානීති. කතමානි දස ඉධුපාලි භික්ඛු

1 අනාපත්තිං ආපත්තීති දිපෙන්ති
2 ආපත්තිං අනාපත්තීති දිපෙන්ති
3 ලහුකං ආපත්තිං ගරුකා ආපත්තීති දිපෙන්ති
4 ගරුකං ආපත්තිං ලහුකා ආපත්තීති දිපෙන්ති
5 දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දිපෙන්ති
6 අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දිපෙන්ති
7 සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දිපෙන්ති
8 අනවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දිපෙන්ති
9 සපපටිකම්මං ආපත්තිං අපපටිකම්මා ආපත්තීති දිපෙන්ති
10 අපපටිකම්මං ආපත්තිං සපපටිකම්මා ආපත්තීති දිපෙන්ති

ඉමානි ඛො උපාලි දස විවාදමූලානීති

සංසාර කාරණාව

විපසනී:—"ඒ විවාද හෙතූන් දෙදෙනා අතුරෙන් පස්කම් සැපෙහි දැඩිවූ ග්‍රහණය වෙදනා සවාදයෙන් වෙයි. මිථ්‍යාදෘෂ්ටියෙහි දැඩි ග්‍රහණය සංඥාවිපර්‍යාශයෙන් වෙයි. ඒ එසේමැයි. සංඥා විපර්‍යාශය කරණකොට ගෙන චිත්ත විපර්‍යාශය හටගන්නේ වෙයි. චිත්ත විපර්‍යාශය කරණකොට ගෙන දෘෂ්ටි මාන තෘෂ්ණා ප්‍රපඤ්චයන් ගේ විපර්‍යාසය හටගන්නේ වෙයි. එසේ ම වෙදනා නැමැති හේතුයන් නැවත නැවත විඳුනා ලද්දාවූ විපර්‍යාස සංඥා ඇත්තා වූ සත්ව තෙමේ සසර හැසිරෙන්නේ වෙයි. වෙදනා නමැති හේතුයන් විඳුනා ලද්දාහුට වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව සිඳවන්නී ය. ඒ තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන සංඛ්‍යාත වූ දැඩි තෘෂ්ණාව හටගන්නේ වෙයි. මෙසේ මේ ක්‍රමයෙන් භවචක්‍රය පෙරළන්නේ මෙයි. විපරීත වූ සංඥා ඇත්තහුට ඒ සංඥාව නිදාන කොට ගෙන ප්‍රපඤ්ච සංඛ්‍යාත වූ තෘෂ්ණා දෘෂ්ටිමානයෝ හටගන්නීත්ය යි වදාළ බැවින් දෘෂ්ටි මාන තෘෂ්ණාවන් නොසිඳීමෙන් සංසාරයාගේ නොසිඳ පැවැත් ම වන්නේ යි. මෙසේ පඤ්චකාම යෙහි බලවත් ආශාවය, මිථ්‍යාදෘෂ්ටියෙහි දැඩිවූ ග්‍රහණය, යන විවාද කාරණයන්ට හෙතු භවය සංසාරයට හෙතු භවය යනු විඤ්ඤාණයි කාව සත්ථාති (ඛුද්ද. 43 පිටුව)

ක්‍රම කාරණාත්

විස්තී:—මිළඟ කාරිකාව බලනු.

චෙතෙත්‍යා වෙදනා සංඥා
පෘථක්සකන්ධෞ ව්‍යවස්ථිතෙ

විස්තී:—**වෙදනාසකන්ධය** සහ **සංඥාසකන්ධය** චෛතසික ධර්මයන් කෙරෙහි ඇතුළත් නොකොට වෙන ම දෙශනා කරන ලදි. විශුද්ධිමාර්ග සන්නයෙහි මෙසේ කියයි.

"චෛතසිකයන් කෙරෙහි **වෙදනා සංඥා** දෙදෙන සංසකාරසකන්ධයෙන් වෙන් කොට කුමක් පිණිස සකන්ධ භාවයෙන් තබන ලද ද යත්? විවාදමූල හෙතු බැවින් හා සංසාර හෙතු බැවින් ද, කර්ම හෙතු බැවින් දැයි යන ත්‍රිවිධ කාරණයන් හෙතුකොට ගෙණ වෙදනා සංඥා දෙදෙන සංසකාරසකන්ධයෙන් නිකුත් කොට වෙනම සකන්ධ භාවයෙන් දෙශනා කරන ලද්දහු ය යි දතයුතු ඒ විවාද මූලයට හෙතු භාවාදිය වනාහි මෙසේයි. හේ කෙසේයත්? ගිහිගෙයි වසන්නවුන්ට කාමාභිනිවෙශ සංඛ්‍යාතවූ පස්කම් සැපයෙහි දැඩි ආශාව විවාදයට මුල් හෙතුව වෙයි මේ වදාරණ ලදුයේ මැයි. නැවත ද "මහණෙනි වස්තුකාමය ක්ලෙශකාමය හෙතු කොට ගෙණ ඒ චිප්‍රකාර කාමය නිදාන කොට ගෙණ ඒ චිප්‍රකාර කාමය ප්‍රධාන කාරණ කොට ගෙණ මව ද පුතයා සමග විවාද කෙරෙයි. පුත්‍ර තෙමේ ද මව හා සමග විවාද කෙරෙයි යනාදියයි. පැවිද්දන්ට මිථ්‍යාදෘෂ්ටියෙහි දළහ-ග්‍රහණය විවාදයට මුල් කාරණය වෙයි. මේ ද වදාරණ ලදුයේ මැයි. යම් ප්‍රව්‍රජිත කෙනෙක් මිථ්‍යාදෘෂ්ටිය උසස් කොට ගෙණ හැසිරෙද්ද, මේ සැබෑ ය යි විවාද කෙරෙද්ද, ඒ ප්‍රව්‍රජිතයන්ගේ මිථ්‍යාදෘෂ්ටිය දැඩිවශයෙන් ගැනීම විවාද-යට මුල් හෙතු වෙයි. යනාදියයි.

මේ විවාදමූලත්වාදි විශෙෂය දක්වන පිණිස සංසකාර-සකන්ධයෙහි අවරොධනය හෙවත් ඇතුළත් කිරීම නොකොට වෙදනා සංඥාවෝ- දෙදෙන වෙන වෙන ම සකන්ධභාවයෙන් ශන්නා ලද්දහුය"

(විශුද්ධි මාර්ග සන්නය 43 පිට)

22 සකන්ධෙෂ්ව සංස්කෘතං-නොක්තං අර්ථා'යොගාත් ක්‍රමං පුනඃ
යථෞදාරික සංක්ලෙශ-භාජනාද්‍යර්ථ ධාතුතඃ

භාවය:—අර්ථා'යොග හෙතුවෙන් අසංස්කෘතය (=නිර්වාණය) සකන්ධයන්හි නො වදාරන ලදි. නැවත ඖදාරික-සංක්ලෙශ-භාජනාද්‍යර්ථ-ධාතු වශයෙන් ඔවුන්ගේ (=සකන්ධයන්ගේ) ක්‍රමය වදාරන ලදි. (විශුද්ධිමාර්ග සන්නයේ ඛන්ධ නිදේශයේ 50 වැනි පිටුව බලනු.)

සකන්ධෙෂ්ව'සංස්කෘතං නොක්තං
අර්ථායොගාත් ක්‍රමං පුනඃ

විප්පති:—සකන්ධයන්ගේ ලක්ෂණය වූ රාශිකරණාර්ථය නිර්වාණයෙහි නො ලැබේ. එබැවින් අසංස්කෘත නම් වූ නිර්වාණය සකන්ධයන්ගේ ලක්ෂණය වූ රාශිකරණාර්ථය නොලැබීමෙන් සවැනි සකන්ධය මෙන් නො වදාරන ලදි. නිර්වාණය මෙන් ම සංවෘතිය ද, ස්කන්ධයන්හි සංග්‍රහ නොවීමට හෙතු දක්වන පැරැකුම්බා රජතුමා විශුද්ධිමාර්ග සන්නයෙහි මෙසේ කියයි.

"නිර්වාණය හා සංවෘතිය මිහි කුමක් හෙයින් සංග්‍රහ නොවෙයි යත්? ද්‍රව්‍යයක් වුව ද, අතීතාදි විභාග භාවයෙන් නිර්වාණය සංග්‍රහ නොවේ එක ම නිත්‍ය වූ නිර්වාණයට අතීතාදි විභාග නොම ඇත්, සංවෘතිය වනාහි අද්‍රව්‍ය බැවිනුදු අතීතාදි විභාගාභාවයෙනුදු සංග්‍රහ නො වේ. මේ ද කිහ

අර්ථායොගාත්තු නිර්වාණම්-ද්‍රව්‍ය සන්ධෙෂු නොදිනම්
සකන්ධෙෂු තත්තිරුක්තාර්ථ යොගාදිති රාශ්‍යාර්ථ
යොගාත් අද්‍රව්‍යත්වාච්ච අර්ථයොගාච්චති සමුච්චයති"

තිහි ඛන්ධෙහි ඉණං දස්සාම" යනාදියෙහි මෙන් ස්කන්ධ ශබ්දය භාගාර්ථ කල්හි නිර්වාණයට ස්කන්ධාන්තරත්ව ප්‍රසඞ්ගය වෙයි යෙත්? රාශ්‍යාර්ථාසම්භවයෙන් නොපැමිණෙයි දතයුතු මෙම කිහ **"ඥෙය සම්පත්ති විකාවෙහි "විභාගාර්ථතා-යාත්තු නිර්වාණස්‍ය ස්කන්ධාන්තරත්ව ප්‍රසංයොගාස්‍යාත් යස්‍ය චාතීතාදි විභාගෙ සති තදපෙක්ෂත්වෙ නාසති ප්‍රසඞ්ගත්ති"**

ඖදාරික

විප්පති:—සියලුම සකන්ධයන් අතුරෙහි රූපසකන්ධය සථූලතම ය එබැවින් පළමුවනුව වදාරන ලදි. අරූපසකන්ධයන් අතුරෙහි වෙදනාව සථූලතමය 'හසේත මෙ වෙදනා පාදෙ මෙ වෙදනා" යනාදින් වෙදනාව සවුට වේ.

එබැවින් දෙවනුව වේදනාස්කන්ධය වදරන ලදී. සංඥා-සංස්කාර-විඥාන ස්කන්ධයෝ ද, ඖදාරිකත්වයෙහි තර-තම භාවයෙන් දෙශනා කරන ලදහ. සමේමාහ විනොදනී ටීකාව අට්ඨකථාවෙහි ද, දක්වන ලදී.

"අහෙදෙනහි යං පඤ්චසු ඛන්ධේසු අත්තගාහ පතිතං වෙනෙය්‍ය ජනං සමූහඝනා විනිබේහාග දස්සනේන අත්ත ගාහතෝ මොචෙතුකාමෝ භගවා හිතකාමෝ තස්ස ජනස්ස සුඛ ගහණත්ථං චක්ඛුආදිනාමපි ච්සයභූතං ඔළාරිකං පඨමං රූපක්ඛන්ධං දෙසෙසි. තතෝ ඉට්ඨානිට්ඨරූපසංවේදිතං වේදනං, යං වේදයති තං සඤ්ජානාතීති එව වේදනා ච්සයස්ස ආකාරගාහිකං සඤ්ඤං සඤ්ඤුවසෙන අභිසංඛාරණෙ සඞ්ඛාරෙ තෙසං වේදනාදිනං නිස්සයං අධිපතිභූතඤ්ච ච්ඤ්ඤුණනති එවං තාව කමතෝ විනිච්ඡයනයෝ වේදිතබ්බෝ."

සංකෙලෙශ

විපනි:—පඤ්චස්කන්ධයන්ගේ මේ ඖදාරික ක්‍රමයෙහි ස්කන්ධයන්ගේ සංකෙලෙශ ක්‍රමය හෙතු විය. එනම්, සත්ත්ව පුරුෂයෝ පළමු කොට රූපය කෙරෙහි ම රාගය කෙරෙති. ඉක්බිති ක්‍රමයෙන් වේදනා සංඥාදීන්හි රාගය කෙරෙති. මේ ස්කන්ධයන්ගේ සංකෙලෙශ ක්‍රමය යි.

භාජනාදීඤ්ච

විපනි: - රූපාදි පඤ්චස්කන්ධයෝ ක්‍රමයෙන් භාජන-භොජන ව්‍යංජන-පක්ඛ-භොක්තෘන් සමානයෝය. එහි රූපස්කන්ධය ආහාර බඳුන වැනිය. වේදනාස්කන්ධය භොජනය වැනිය. සංඥාස්කන්ධය ව්‍යංජනය වැනිය. සංස්කාරස්කන්ධය ආහාර පිසන්නා වැනිය. විඤ්ඤාණස්කන්ධය ආහාර අනුභව කරන්නා වැනිය. කියන ලදී. විශුද්ධිමාර්ගී සන්නයෙහි,

"භාජනං භජ්ජන ත්ථෙන්ච-ව්‍යඤ්ජනං කබළීං භොත්තා ච්ඤ්ඤු දීපෙතුං ස්කන්ධා-ක්‍රමෙනාණන්ත දේසිතා"

දක්වන ලද මැයි. විභාවිනී අටුවාහි ද,

"ඉමෙසු භාජන භොජන ව්‍යඤ්ජන සදිසවිඤ්ඤාණ ඤ්ඤුපුග්ගලා"

ධාතුනිඃ

කාමධාතුව රූපයෙන් ප්‍රභාවිත වේ. රූපධාතුව වේදනා-වෙන් ප්‍රභාවිත වේ ආරූප්‍යධාතුව ආදි ත්‍රිවිධ සථානයෝ සංඥාවෙන් ප්‍රභාවිත වෙත්. භවාග්‍රය (නෛවසංඥා නාසංඥා-යතනය) සංසකාර මාත්‍රයෙන් ප්‍රභාවිත වේ.

තවද විඥානසථිතිහු සතරක් වෙත්. එයින් රූපොපග විඥානසථිතිය කාමධාතුවෙහි ද, වේදනොපග විඥානසථිතිය රූපධාතුවෙහි ධ්‍යාන චතුෂකයෙහි ද, සංඥෙපග විඥාන-සථිතිය ආරූප්‍යධාතුත්‍රයයෙහි ද, සංස්කාරොපග විඥාන-සථිතිය භවාග්‍රයෙහි ද, වේ. මෙසේ ධාතූන්ගේ ක්‍රමයෙහුදු සකඹයෝ දෙශනා කරන ලදහ.

ෂඃ පංචාග්‍ර්‍යාවතීණාඤ්ච-හෞතිකාඤ්චාවතුෂටයම්
දූරා'ශුතර වෘත්තාභ්‍යාඤ්ච-ක්‍රමථවා සඞ්ගාශ්‍රයං ක්‍රමඃ

භාවය:—ප්‍රත්‍යුත්පන්න රූපාදි විෂය ඇති බැවින් චක්ෂුරාදි පස පළමු කොට දෙශනා කරන ලදි. එයින් ප්‍රථම චතුෂ්කය හෞතික විෂය ග්‍රහණය කරන හෙයිනි. එය ද දූරතර ආශුතර වෘත්තියෙන් හෝ සවකිය ආශ්‍රය සථාන වශයෙන් දෙශනා කරන ලදී.

හෞතිකාඤ්චාවතුෂටයම්

විෂය:—චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා යන සතර පළමුවිනු ව දෙශනා කරන ලද්දේ, උපාදය රූප නම් වූ හෞතික විෂය ග්‍රහණය කරන හෙයිනි. කායයට විෂය අනියතය. සමහර කලෙක භූත රූප ද, සමහර කලෙක හෞතික රූප ද, විෂය වේ. එහෙයින් කායය පසුව දෙශනා කරන ලදී.

දූරා'ශුතර වෘත්තාභ්‍යා

චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා යන ඉන්ද්‍රිය සතර දූරතම දූරතර-දූර-සමීප යන ක්‍රමයෙන් ද, එසේ ම ශීඝ්‍රතම-ශීඝ්‍රතර ශීඝ්‍ර-මන්ද යන ක්‍රමයෙන් ද, විෂයග්‍රහණය කරති. ඒ එසේ මැයි. ඇස, අසංඛ්‍යඝණන් යොදුන් ඈත පිහිටි තාරකාදිය දකියි. ශ්‍රොත්‍ර-ඝ්‍රාණයෝ එතරම් දුර විෂය ග්‍රහණය නොකරති. දිව කෙමෙ වෙන කුඹුවිත් ම දැනීමද කරයි.

ඇස විෂයග්‍රහණයෙහි ශීඝ්‍රතම ය. ශ්‍රොත්‍ර ඝ්‍රාණයන්ට එබඳු ශීඝ්‍රත්වයක් නැත. දිව සියල්ලට ම වඩා ශීඝ්‍රත්වයෙන් අඩු ය.

ස්වාශ්‍රයං ක්‍රමඃ

චක්ෂුර්ගොලය ශරීරයේ උඩ ම පෙදෙසෙහි ද, එයින් යට ශ්‍රොත්‍රය ද, එයින් යට නාසිකාව ද, සියල්ලට ම යට දිව ද, වේ. මේ ඔවුන් ගේ ආශ්‍රය ක්‍රමයයි.

මේ කාරිකාවේ දැක්වූ සියල්ල පිඩු කොට විශුද්ධිමාර්ග සන්නයේ මෙසේ කියයි.

"ප්‍රත්‍යුත්පන්නාලම්බන හෙයින් හෝ චක්ෂුරාදීහු පළමු කොට කියන ලදහු. ආලම්බන හෙයින් සුප්‍රකට බැවින් මනා යතනය වනාහි කිසිවෙක් ප්‍රත්‍යුත්පන්නාලම්බන. - පෙ - කිසිවෙක් යම්තාක් නවක්තව්‍යාලම්බනයයි පසු කොට කියන ලදී. ප්‍රත්‍යුත්පන්නාලම්බනයන් කෙරෙහිදු උපාදරූ-පාලම්බන සතරදෙන පළමු කොට කියන ලදහ. ඉක්බිති භූතරූපාලම්බනය කියන ලදී. උපාදරූපාලම්බනයන් කෙරෙහි දූරතරයෙහි දූරව, ශීඝ්‍රතරයෙහි සීඝ්‍රව, ආලම්බන සම්පටිච්ඡන දීපනය පිණිස චක්ෂුරාදීන්ගේ දෙශනා ක්‍රමය දතයුතු. ඒ එසේ මැයි. චක්ෂුස් ශ්‍රොත්‍රවය තෙමේ දූරගොචර නුයි; හැමට පළමු කොට කියන ලදී. දූරයෙහි නදි ශ්‍රොතස බලනුයේ ද, ඔහුගේ ද ශ්‍රොත්‍ර ප්‍රතිඝාත ශබ්දය නො අසන්-නේයි. ඝ්‍රාණ ජිහ්වාවන් කෙරෙහිදු ඝ්‍රාණය ශීඝ්‍රතර වෘත්ති නුයි පළමු කොට කියන ලදී. අභිමුඛයෙහි තුබූ මාත්‍රයෙහි ම භොජන ගන්ධය ගන්නා ලැබේ.

ස්ථාන ක්‍රමයෙන් හෝ මොවුන්ගේ දෙශනා ක්‍රමය වේ. මේ ශරීරයෙහි හැමයෙන් මතුයෙහි චක්ෂුරාධිෂ්ඨානය වෙයි. එයින් යට ශ්‍රොත්‍රාධිෂ්ඨානය වෙයි. එයින් යට ඝ්‍රාණාධිෂ්ඨානය වෙයි. එයින් යට ජිහ්වාධිෂ්ඨානය වෙයි. එයින් යට භූයො-වෘත්තීන් කායාධිෂ්ඨානය වෙයි. මනස වනාහි අරූපි බැවින් හැමදෙනාහට පසු කොට කියන ලදී."

(විශුද්ධිමාර්ග සන්නය. ආයතන ධාතු නිර්දෙශ 276 පිටුව)

24 විශෙෂණාර්ථං ප්‍රාධාන්‍යාත්-ඛහ්වග්‍ර ධර්ම සංග්‍රහාත්
රූපායතන මෙවෛකං-එකං ච ධර්ම සංඥකම්

භාවය:—ඔවුනොවුන් ගේ වෙසෙසීම පිණිස ද, ප්‍රධාන බැවින් ද, රූපායතන නම් එක් ආයතනයක් ද, බොහෝවූ ද, ප්‍රධාන වූ ද, ධර්මයන් ගේ සඞ්ග්‍රහය අන්‍යයන්ගෙන් වෙන් කරනු පිණිස ධර්මායතන නම් එක් ආයතනයක් ද, දෙයනා කරන ලදී.

රූපායතනං

විප්පති: - රූපය ම ආයතන වූයේ රූපායතන නම්.

ධර්මසංඥකම් (=ධර්මායතන)

විප්පති— වෙදනා-සංඥා-සංස්කාර සූක්ෂමරූප- නිර්වාණය, හෙවත්; දෙපණස් චෛතසික සංඛ්‍යාත වෙදනා-සංඥා-සංස්කාර-යන ත්‍රිවිධ නාමස්කන්ධය ද, ආපො ධාතු-භාවචය-හෘදයවස්තු-ජීවිතෙන්ද්‍රිය - ආහාර - ආකාශ - විඥප්තිවය - විකාරත්‍රය-ලක්ෂණවතුෂ්කය යන සොළොස් සූක්ෂමරූප ද, අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණය ද, යන එකුන් සැත්තෑ ධර්ම ධර්මා යතන නම්. (1-15 කාරිකාව බලනු)

ධර්මායතනය, ස්වභාව භෙද නානත්ව භෙදයෙන් අනෙක ප්‍රකාර භෙද ඇත්තේ ය. එහි සුඛ වෙදනා-දුක්ඛ වෙදනා-උපෙක්ෂා වෙදනා යනාදී භෙදය ස්වභාව භෙදය යි. චක්ඛු සම්ඵස්සජා-සොත සම්ඵස්සජා යනාදි භෙදය නානත්ව භෙදය යි.

25 ධර්මස්කන්ධ සහග්‍රාණ්‍ය-ශිතිර් යාන්‍යවදන්වුතිඃ
තාති වාග් නාම වා තෙෂාං-රූප සංස්කාර සංග්‍රහඃ

භාවය:—භාග්‍යවතුන් වහන්සේ අසූ දහසක් පමණ වූ යම් ධර්මස්කන්ධයක් වදාළසේක් ද, එය වාග් ශබ්දයෙන් හෝ නාම ශබ්දයෙන් ව්‍යවහාර කරත්. රූපස්කන්ධයෙහි සහ සංස්කාර-ස්කන්ධයෙහි ඔවුන් ගේ සංග්‍රහය වේ. (වාග්හුගේ සංග්‍රහය රූපස්කන්ධයෙහි ද, නාමයාගේ සංග්‍රහය සංස්කාර ස්කන්ධ-යෙහි ද වේ.)

ධර්මස්කන්ධ සහග්‍රාණ්‍යශිතිර්

විප්පති:—ධර්මස්කන්ධ සඞ්ඛ්‍යාව අසූ දහසක්ය යි මෙහි කියන ලදී. එහෙත් පාළි අටුවා පොත්වල අසූසාර දහසක් බැව් දක්නේය.

කෙතෙක් ධර්මයෝ ඔබ වහන්සේ විසින් දරන ලද දැයි ගොපක මොග්ගල්ලාන බ්‍රාහ්මණයා ධර්මභාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් ඇසිය. එයට පිළිතුරු දෙන උන්වහන්සේ,

"චාසීතිං බුඩතො ගණ්හිං-චෙසහස්සානි භික්ඛුතො
චතුරාසීති සහස්සානි-යෙමෙ ධම්මා පවත්තිනො"

යනුවෙන් දෙයාසූ දහසක් ධර්මස්කන්ධ බුදුරජාණන් වහන්සේ ගෙන් ද, දෙදහසක් ශාරිපුත්‍රාදි ස්ථවිරයන් වහන්සේගෙන් ද, උගතිමියි පැවසූහ. ඒ අනුව ධර්මස්කන්ධ සුවාසූ දහස ලැබෙනු යේ මෙසේ ය.

1 එකානුසන්ධික හෙවත් එක ම කරුණක් පිළිබඳව වදාළ සතිපට්ඨානාදි එක් එක් සූත්‍රයක් එක් එක් සකන්ධයකි.

2 අනෙකානුසන්ධික හෙවත් නොයෙක් කරුණු ඇතුළත් කොට වදාළ මහා පරිනිර්වාණාදි සූත්‍රයන්හි යම් පමණ කරුණු වෙත් නම්, ඒ එක් එක් කරුණක් එක් එක් සකන්ධයකි.

"කති ඡන්දෙ කති ජහෙ-කති චුත්තරි භාවයෙ
කති සඞ්ගාතිගො භික්ඛු-ඔඝතිණ්ණොති වුච්චති"

3 යනුවෙන් ගාථා ධර්මයන්හි වදාළ ප්‍රශ්න පෘච්ඡාවාරය එක් සකන්ධයකි.

"පඤ්ච ඡන්දෙ පඤ්ච ජහෙ-පඤ්ච චුත්තරි භාවයෙ
පඤ්ච සඞ්ගාතිගො භික්ඛු-ඔඝතිණ්ණොති වුච්චති"

4 යනුවෙන් එය විසඳමින් වදාළ විස්සජ්නවාරය එක් සකන්ධයකි.

5 අභිධර්මයෙහි තිකමාතිකා හෙවත් කරුණු තුණ තුණ බැගින් ඇති ධර්මයන් ගේ මාතෘකාය,

6 දුකමාතිකා හෙවත් කරුණු දෙක දෙක බැගින් ඇති ධර්මයන්ගේ මාතෘකාය යනාදින් දෙශනා කළ එක් එක් කොටසක් පිළිබඳ විස්තර විභාගය එක් එක් සකන්ධයකි

මේ තික දුක විභාගය නික්ෂේප කාණ්ඩ-අර්ථකථා කාණ්ඩ වශයෙන් දතයුත්තේ ය, එනම්,

"කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා"

ආදි ත්‍රිකයන්හි කුශලත්‍රිකය විභජන වශයෙන් වදාළ,

"කතමෙ ධම්මා කුසලා? තිස්සි කුසල මූලානි. අලොභෝ අදෙසෝ අමොහෝ, තං සම්පයුත්තෙනා වෙදනාක්ඛන්ධෝ සඤ්ඤක්ඛන්ධෝ සඩ්ඛාරක්ඛන්ධෝ විඤ්ඤාණක්ඛන්ධෝ තං සම්මුඨානං කායකම්මං වචිකම්මං මනොකම්මං ඉමෙ ධම්මා කුසලා.

කතමෙ ධම්මා අකුසලා? තීනි අකුසල මූලානි. ලොභෝ දොසෝ මොහෝ, තදෙකට්ඨාව කිලෙසා තං සම්පයුත්තෙනා වෙදනාක්ඛ න්ධා-පෙ-මනොකම්මං, ඉමෙ ධම්මා අකුසලා.

කතමෙ ධම්මා අබ්‍යාකතා? කුසලා'කුසලානං ධම්මානං විපාකා කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා වෙදනාක්ඛන්ධෝ-පෙ-විඤ්ඤාණක්ඛන්ධෝ යෙ ච ධම්මා ක්‍රියා නොව කුසලා නාකුසලා නාව කම්ම විපාකා සබ්බඤ්ච රූපං අසඞ්ඛතා ච ධාතු ඉමෙ ධම්මා අබ්‍යාකතාති."

7 මේ එක් ධර්මස්කන්ධයකි මෙසේ ම සෙසු ත්‍රිකයන්ගේ ද, එක් එක් ත්‍රිකයක්හුගේ විභජනය එක් එක් ධර්මස්කන්ධයකි.

"කතමෙ ධම්මා හෙතු? තයෝ කුසලා හෙතු තයෝ අකුසලා හෙතු තයෝ අබ්‍යාකතා හෙතු"

. ආදින්හි එක් එක් චිකයක්හුගේ විභජනය එක් එක් ධර්මස්කන්ධයකි.

නැවත අට්ඨකථා කාණ්ඩයෙහි වදාළ,

"කතමෙ ධම්මා කුසලා? චතුසු සුචිසු කුසලං. ඉමෙ ධම්මා කුසලා. කතමෙ ධම්මා අකුසලා? වාදස අකුසල චිත්තුප්පාදා ඉමෙ ධම්මා අකුසලා. කතමෙ ධම්මා අබ්‍යාකතා? චතුසු සුවිසු විපාකෝ තීසු සුවිසු ක්‍රියා බ්‍යාකතං රූපඤ්ච නිබ්බාණඤ්ච ඉමෙ ධම්මා අබ්‍යාකතා"

8 ආදින් කුශල ත්‍රිකාදි විභජන වශයෙන් පැවැති ත්‍රික භාජනයන්හි එක් එක් ත්‍රිකයක්හුගේ බෙදීම එක් එක් ධර්මස්කන්ධයකි.

එසේ ම,

"කතමෙ ධම්මා හෙතු? තයෝ කුසලා හෙතු. තයෝ අකුසලා හෙතු. තයෝ අබ්‍යාකතා හෙතු.

8 ආදින් චිකා භාජනයෙහි එක් එක් චිකා භාජනය එක් එක් ධර්මස්කන්ධයකි.

"යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං රූපාරම්මණං වා-පෙ-තස්මි සමයෙ ඵස්සො හොති-පෙ-අවික්ඛෙපොහොති"

10 යනාදීන් චිත්තොත්පාද කාණ්ඩයෙහි එක් එක් චිත්ත වාර විභාගය එක් එක් ධර්මසකන්ධයකි.
විනයයෙහි දී,

11 සුදින්න කාණ්ඩය ආදී වස්තුව එක් සකන්ධයකි.

12 "යො පන භික්ඛු භික්ඛූනං සික්ඛා සාජීව සමාපන්නො" ආදීන් පණවනලද ශික්ෂාපද සඞ්ඛ්‍යාත මාතෘකාව එක් සකන්ධයකි

13 "යො පනාති යො යාදිසො" ආදී පදභාජනිය එක් සකන්ධයකි

14 "පටිලාභං උක්ඛිපති ආපත්ති දුක්කටස්ස' ආදීන් ශික්ෂා පදයන් ගේ අන්තරයෙහි පණවන ලද අන්තරාපත්තිය එක් සකන්ධයකි.

15 "අනාපත්ති අජානන්තස්ස අසාදියන්තස්ස උම්මත්ත කස්ස ඛිත්තචිත්තස්ස වෙදනට්ටස්ස ආදිකම්මිකස්ස" යනාදී අනාපත්තිවාරය එක් සකන්ධයකි.

16 "දසාහාතික්කන්තෙ අතික්කන්ත සඤ්ඤී නිස්සග්ගියං පාචිත්තියං, දසාහාතික්කන්තෙ වෙමතිකො නිස්සග්ගියං පාචිත්තියං, දසාහාතික්කන්තෙ අනතික්කන්ත සඤ්ඤී නිස්සග්ගියං" ආදී තික පාචිත්ති තික දුක්කටාදී භෙද ඇති තික පරිච්ඡේදය එක් සකන්ධයෙකි.

මෙසේ සූත්‍ර පිටකයෙහි සහ විනය පිටකයෙහි විසිඑක් දහස බැගින් ද, අභිධර්මපිටකයෙහි පමණක් සතළිස් දෙදහසක් ද, ධර්මසකන්ධයෝ වෙති. සියල්ල අසූසාර දහසකි.

26 ශාසත්‍ර ප්‍රමාණ ඉත්‍යෙකෙ-සකන්ධාදීනාං කථෙකශඃ චරිත ප්‍රතිපක්ෂසතු-ධර්මසකන්ධො'නු වර්ණිතඃ

භාවය—සමහර ආචාර්‍යවරු ධර්මසකන්ධ ශබ්දයෙන් පිටක ප්‍රමාණ යම ගනිත්. අන් සමහරු සකන්ධාදීන්ගේ එක එක කථාව බැගින් ගනිත්. එහෙත්, ධර්මසකන්ධ නම්, රාගාදි චරිතයන්ට ප්‍රතිපක්ෂ ක්‍රමයෙන් වදාරන ලද දෙශනාවයි.

සකන්ධාදීනාං කථෙකශඃ

විප්පනි: සානුචර යනු බලනු. (50 වැනිපිටුව)

චරිත ප්‍රතිපක්ෂසතු

විප්පනි:—රාග - වෙෂ - මොහ-මාන-දෘෂ්ටි- විචිකිත්සාදි චරිත ඇති නානා පුද්ගලයෝ අසූසාර දහසක් වෙත්. ඔවුන් ගේ ඒ චරිත යන්ට ප්‍රතිපක්ෂ නියාමයෙන් අසූසාර දහසක් ධර්මසකන්ධ වදරන ලදි.

27 තථාන්‍යෙපි යථායොගං සකන්ධා යතන ධාතවඃ
ප්‍රතිපාද්‍ය යථොක්තෙෂු-සුවිමෘශ්‍ය ස්වලක්ෂණම්

භාවය:—එසේ ම අනිකුදු සකන්ධායතන ධාතුහු වෙත් ද, ඔවුන් ගේ ස්වකීය ස්වකීය ලක්ෂණයන් විමසා සකන්ධායතන ධාතුන් කෙරෙහි සඞ්ග්‍රහ කළ යුතු ය.

තථාන්‍යෙපි යථායොගං

විප්පනි:—රාශිකරණ ස්වභාවය සකන්ධයන් ගේ ලක්ෂණය යි. එබැවින් රාශිකරණ ස්වභාවය ඇති සියල්ල සකන්ධයන් කෙරෙහි සඞ්ග්‍රහ කළ යුතුය.

ආයද්වාර ස්වභාවය ආයතනයන් ගේ ලක්ෂණය යි. එබඳු ලක්ෂණ ඇති සියල්ල ආයතනයන් කෙරෙහි සඞ්ග්‍රහ කළ යුතුය.

ධාතුහු ආකාරාර්ථයහ. එබඳු ආකාරාර්ථවත් සියල්ල ධාතුන් කෙරෙහි සඞ්ග්‍රහ කළ යුතුය. ඒ මෙසේ යි;

ශීලසකන්ධය කාය වාග් විරති ස්වභාව හෙයින් එය රූපසකන්ධයෙහි සඞ්ග්‍රහය වේ.

චෛතසික ස්වරූප වූ සමාධි-ප්‍රඥා-විමුක්තිසකන්ධයෝ සංසකාරසකන්ධයෙහි සඞ්ග්‍රහ වෙති.

අලොභ ස්වභාව වූ පෘථිවි-අප්-තෙජස්-වායු-නීල-පීත-ලොහිත-අවදාත යන අෂ්ටකෘත්සනායතනයෝ ධර්මායතන යෙහි සඞ්ග්‍රහ වෙති.

එසේ ම, පංචවිමුක්තායතනයෝ ද, ප්‍රඥා විශෙෂ වූවාහු ධර්මායතනයෙහි සඞ්ග්‍රහ වෙති.

28 ඡිද්‍රමාකාශ ධාත්වාක්‍යං-ආලොක තමසි කිල විඥාන ධාතුර් විඥානං-සාස්‍රවං ජන්ම නිශ්‍රයඃ

භාවය:—ශූන්‍ය ස්වරූපවූයේ ආකාශ ධාතුව ය. එය ම ආලොකය යි ද, තමස්ය යි ද, සමහරු කියත්. අපිරිසුදු වූ (=සාශ්‍රව) විඥානය ම, විඥාන ධාතු නම්. එය උත්පත්තියට ආශ්‍රයවූයේ ය.

ඡිද්‍රමාකාශධාත්වාක්‍යං.

විස්තී:—ශූන්‍ය වූයේ ආකාශය යි. චාර – ගවාක්ෂ – නාසිකා කණ්ඩ්‍රඡිද්‍ර ආදින්හි ඡිද්‍ර ස්වරූපය ආකාශ ධාතුව වේ ය යි ටීකාහි කියයි.

විභඞ්ග පාළියෙහි ආකාශ ධාතුව මෙසේ දෙශනා කරන ලද්දේ ය.

"තත්‍ථ කතමා ආකාසධාතු? ආකාස ධාතුවයං අත්‍ථි අජ්ඣත්තිකා අත්‍ථි බාහිරා. තත්‍ථ කතමා අජ්ඣත්තිකා ආකාස ධාතු? යං අජ්ඣත්තං පච්චත්තං ආකාසො ආකාසගතං අඝං අඝගතං විවරො විවරගතං අසංවුඪං මංස ලොහිතෙහි අජ්ඣත්තං උපාදින්නං. සෙය්‍යථිදං. කණ්ණ ච්ඡිද්දං නාසච්ඡිද්දං මුඛ චාරං යෙන ච අසිත පීත ඛායිත සායිතං අජ්ඣොහරති. යත්‍ථ ච අසිත පීත ඛායිතං සන්තිඨති. යෙන ච අසිත පීත ඛායිත සායිතං අධොභාගං නික්ඛමති. යං වා පනඤ්ඤම්පි අත්‍ථි අජ්ඣත්තං පච්චත්තං ආකාසො ආකාසගතං අඝං අඝ ගතං විවරො විවර ගතං අසම්වුඪං මංස ලොහිතෙහි අජ්ඣත්තං උපාදින්නං අයං වුච්චති අජ්ඣත්තිකා ආකාස ධාතු.

තත්‍ථ කතමා බාහිරා ආකාස ධාතු? යං බාහිරං ආකාසො ආකාසගතං අඝං අඝගතං විවරො විවරගතං අසම්වුඪං චතුහි මහාභූතෙහි බහිඩා අනුපාදින්නා අයං වුච්චති බාහිරා ආකාස ධාතු. තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසංඛිපිත්වා අයං වුච්චති ආකාස ධාතු."

පරිච්ඡේද රූප නමින් අඳුන්වනුයේ මේ ආකාශ ධාතුව මැයි. යම් රූපයක් නිසා රූප කලාප හෝ ද්‍රව්‍යසම්භාර හෝ වෙන් වෙන් ව ප්‍රකාශවේ ද, ඒ රූපය ආකාශය එම නිර්ජීව හෙයින් ධාතු ද, වේ නුයි ආකාශ ධාතු නම්. ආකාශ ධාතුව රූපකලාප-රූපකලාපාන්තර හා සම්මිශ්‍ර නො වී පිරිසිඳින් නේය. රූපකලාප විසින් හෝ පිරිසිඳිනු ලබන්නේ ය. එහෙයින් එය පරිච්ඡේද රූප නම් විශුද්ධිමාර්ග සන්නයෙහි මෙසේ කියයි.

"යම් ධාතුවක් නොමෝ රෙඛා නොලිය හැකි වේ ද, ඒ ධාතු නොමෝ නීසඤ්ඤ නිජ්ජීවාඛ්‍යායෙන් ධාතු නාමුදු වන හෙයින් ආකාශ ධාතු නම් වෙයි. ආකාශ ධාතු නොමෝ චක්ඛුදීඝකාදි කලාපයෙහි අන්තගීත රූපයන් ශ්‍රොත්‍රදශකාදි අන්‍ය කලාපගත රූපයන් හා අසංකර භාවය සිඩ කිරීමෙන් අතරතුර ආකාශමාත්‍රය දක්වන බැවින් ඒ ඒ රූපකලාපයන් වෙන් කරන්නාක් මෙන් හට ගැණීම ලක්ඛණ කොට ඇති බැවින් ගී විටි ආදියෙන් සි සෑමක් හෝ නොකට හැක්කේය. පණ්ණත්ති සංඛ්‍යාත පන්නිත් ආදියෙන් නොලිය හැක්කේය; යන ශක්තියෙන් ආකාශ නම් වෙයි. ඒ ආකාශය නීලීකාදින් විසින් කල්පනා කරන ලද්දවූ සත්ත්වයක් හෝ ජීවයක් හෝ නොවූ පරමාණු සභාව ධර්මයක් වන හෙයින් ආකාශ ධාතු නම් වෙයි; කියායි. ඒ ආකාශ ධාතු නොමෝ ඒ ඒ රූප කලාපයන් වෙන් කරන්නාක් මෙන් හෝ වෙයි. වෙන් කරනු ලබන්නාක් මෙන් හෝ වෙයි. ඒ ඒ රූපකලාපයන් වෙන් කිරීම් මාත්‍රයක් හෝ වෙයි යන කතා කම් භාව ශක්තියෙන් පරිච්ඡේද රූප නම් වෙයි.

(විශුද්ධිමාර්ග සන්නය ධාතුනිද්දේශ – 110 වැනි පිටුව)

"යස්මිං කලාපෙ භූතානං පරිච්ඡේදෙ තෙනෙව අසම්මුය්හභාව පවුපඨානා ච්ජ්ජමානෙපි නි කලාපන්තර භූතානං කලාපන්තර භූතෙහි සම්මුය්හභාවෙ තං තං භූත විචිත්තතා රූප පරියන්තා ආකාසොති යෙසං යො පරිච්ඡේදෙ තෙහි සො අසම්මුය්හොව අඤ්ඤථා පරිච්ඡින්නතා නාසියා. තෙසං භූතානං ව්‍යාපිභාවා පතිට්ඨෙතා අව්‍යාපිතානි අසම්මුය්හතා තෙනාහ භගවා "අසම්මුය්හං චතූහි මහාභූතෙහි" ති තෙහි කණාණ චිජ්ඣ මුඛ විවරාදි වසෙන ච ජිද්ද විවරභාව පවුපඨානා" යනු විශුද්ධි මාර්ග ටීකායි.

ආලෝක නභසි කිල

විස්තර:–ආලෝකය සහ නභස ආකාශය මෙන් ගන්නෝ, ආලෝක (=ප්‍රකාශ) සවරූප ආකාශය දවහල් ය යි ද, තමස් (=අන්ධකාර) සවරූප ආකාශය රාත්‍රිය යි ද, කියත්.

චක්ඛු ධාතුඒ චිඤ්ඤාණං

විස්තර:—චක්ඛුර් ඒඤ්ඤාදී සඩ විඤ්ඤාය චිඤ්ඤාණධාතු නාමී. චිදූරත ලද්දි. විභව්‍ය පාළියෙහි,

"තත්‍ථ කතමා විඤ්ඤාණ ධාතු චක්ඛුවිඤ්ඤාණධාතු සොතවිඤ්ඤාණධාතු ඝාණවිඤ්ඤාණධාතු ජිව්හාවිඤ්ඤාණ-ධාතු කායවිඤ්ඤාණධාතු මනොවිඤ්ඤාණධාතු අයං වුච්චති විඤ්ඤාණ ධාතු"

29 සනිදර්ශන එකොත්‍ර-රූපං සප්‍රතිඝාදශ
රූපිණඃ අව්‍යාකෘතා අෂ්ටෞ—තෙ රූප ශබ්දවර්ජිතාඃ

භාවය:—මෙහි එක ම ධාතුවක් චක්ෂුර් විඥාන භූතය. (සනිදර්ශනය) ඒ රූපය යි. ආවරණ ප්‍රතිඝාත සහිත වූ දශයක් සප්‍රතිඝය. ඔවුහු රූපීහු නම් වෙත්. රූප ධාතු-ශබ්දධාතු හැර සෙසු අෂ්ටධාතුහු අව්‍යාකෘත නම් වෙත්.

සනිදර්ශන එකොත්‍ර රූපං

විප්පනී:—"රූපායතනං නිපස්සති, සච්චක්ඛතො විජානාතීති, නිදස්සනං. චක්ඛුවිඤ්ඤාණං; තෙන චක්ඛුවිඤ්ඤාණ සංඛා-තෙන නිදස්සනෙන සහ වත්තනතො සනිදස්සනං. රූපා-යතනං" යනු බැවින් දොළොස් වැදැරුම් ඖදාරික රූපයෙහි රූපායතනය ප්‍රත්‍යක්ෂව දන්නා බැවින් චක්ෂුර් විඥානය නිදර්ශන නම්. ඒ චක්ෂුර් විඥාන සඞ්ඛ්‍යාත නිදර්ශනය සමග පවත්නේ සනිදර්ශන නම්. එන ම්, රූපය යි. මෙහි ඖදාරික රූප නම්, ප්‍රසාද රූප ෂට්කය සහ විෂය රූප ෂට්කයත් වෙති.

සප්‍රතිඝාදශ රූපිණඃ

විප්පනී:—'වත්ථාරම්මණානං අඤ්ඤමඤ්ඤ පටිහනනං පටිඝො. තෙන සහ වත්තතීති සප්පටිඝං" යනු බැවින් විෂය විෂයී සංඝට්ටණය **සප්‍රතිඝ** නම්.

"ආවරණ ප්‍රතිඝාතෙන **සප්‍රතිඝා**"යි නාලන්දිකා ටීකාහි කියයි. ඔවුහු රූපීහු වෙත්. සප්‍රතිඝයෝ දශයක් වෙත්. "දස ධාතුයො සප්පටිඝා"යි විභඞ්ග පාළියෙහි ද, වදාරන ලදී. "දඞ්ඛබ්බභාව සංඛාතෙන සහ නිදස්සනෙනාති සනිදස්සනං. පටිහනනභාව සංඛාතෙන සහ පටිඝෙනාති සප්පටිඝං සනිදස්සනඤ්ච තං සප්පටිඝඤ්චාති සනිදස්සන සප්පටිඝං" මෙහි යමක්හට දෘෂ්ටව්‍යවහාරය ඇත ද, හේ සනිදර්ශන නම්. චක්ෂුර්විඥානයට ගොචර බව ම දෘෂ්ටව්‍යබව නම් වේ. ඔහු ගේ රූපායතනයා කෙරෙන් අන්‍යත්වයක් නැත ද, සෙසු ධර්මයන් කෙරෙන් රූපායතනය වෙසෙසනු පිණිස අතිකක්හු මෙන් කොට "සහනිදස්සනෙන සනිදස්සනං" යි කිහු. ධර්මභාව

සාමාන්‍යයෙන් එකි භූතවූ ධර්මයන් කෙරෙහි නානත්වකර යම් විශෙෂයක් ඇත ද, හේ අනිකක් මෙන් කොට උපවරණ යට යුක්ත වේ. එසේ කල්හි අර්ථ විශෙෂාවබොධය වන හෙයින් තමා විසිනුදු, නිශ්‍රය වශයෙනුදු, සම්ප්‍රාප්තයන්ගේ ද, අසම්ප්‍රාප්තයා යවා‍ගේ ද, සම්ප්‍රතිවුධ්‍යාවියාත් අතෙ‍ාදාහාසිමුබ බවක් වේ ද, ඒ ප්‍රතිහනන භාව නම් ඒ ප්‍රතිහනන භාවය හෙතු කොට ගෙණ යම් ව්‍යාපාරාදි විකාරප්‍රත්‍යයාන්තර සහිතවූ චක්ෂුරාදින්ගේ නිශ්‍රයෙහි විකාරොත්පත්ති වෙති”යි දතයුතු. මෙහි සප්‍රත්‍යවය තෙමේ ම සම්ප්‍රාප්ත වෙයි කාය රස ජිහ්වා ගන්ධ ඝ්‍රාණය යන මොවුහු නිශ්‍රය වශයෙන් සම්ප්‍රාප්ත වෙති. චක්ෂුශ් ශ්‍රොත්‍ර රූප ශබ්ද යන මොහු උභය ප්‍රකාරයෙන් ම සම්ප්‍රාප්ත නො වේ. ඖදාරික රූපය අනිදර්ශන සප්‍රතිඝ සනිදර්ශනත්වය නැති බැවින් අනිදර්ශනය උභතොභාගින් ම **සප්‍රතිඝයි”** යනු විශුද්ධිමාර්ග සන්නයි. (බඹු නිදන 74 වැනි පිට)

අව්‍යාකෘතා අෂ්ටෙව තෙ රූප ශබ්දවර්ජිතාඃ

විපත්තිඃ—රූප ධාතු, ශබ්දධාතු දෙක හැර ඉතිරි අෂ්ට ධාතූහු කුසල් හෝ අකුසල් නොවන බැවින් අව්‍යාකෘතයෝ නම් වෙත්.

30 ත්‍රිධාත්වෙය කාමධාත්වාපන්නාඃ – සඒ රූපෙ චතුර්දශ වින්‍ය ගන්ධ රසඝ්‍රාණ-ජිහ්වා විඥාන ධාතවඃ

භාවයඃ—අන්‍ය ධාතූහු කුසල-අකුසල-අව්‍යාකෘතය යි තෙපරිදි වෙත්. සියලු ම අටළොස් ධාතූහු කාම ධාතුවෙහි සඞ්ගෘහීත වෙති. ගන්ධ-රස-ඝ්‍රාණ-ජිහ්වා හැර සෙසු තුදුස රූප ධාතුයෙහි වේ.

ත්‍රිධාත්වෙය

විපත්තිඃ—චක්ෂුර්විඥානාදි සය ද, මනොධාතුව ද, යන චිත්තධාතූහු කුශලාශ්‍රය සම්බන්ධයෙන් කුශල ද, අකුශලාශ්‍රය සම්බන්ධයෙන් අකුශල ද වෙති. උභය මිශ්‍ර වූවාහු අව්‍යාකෘත වෙති. ධර්මධාතු රූපධාතූහු ද, මෙසේ ම ය.

කාමධාත්වාපන්නාඃ සඒ

විපත්තිඃ—අටළොස් ධාතුව ම කාමධාතුවෙහි සඞ්ගෘහීත වෙත්.

රූපෙ චතුර්දශ

විෂ්ෂනි:—ගන්ධ-රස-ඝ්‍රාණ-ජිහ්වා යන සතර හැර සෙසු චතුර්දශ ධාතුහු රූපධාතුවෙහි වෙති.

"රූපාවචර බ්‍රහ්මලොකයෙහි ගන්ධායතන රසායතනයන් හා ඝ්‍රාණෙන්ද්‍රිය ජිව්හෙන්ද්‍රියයන් නැති බැවින් එහි රූප කලාපයන්ගේ අංග වශයෙන් ගන්ධ රසයන් නැතැයි සිතිය යුතු වේ. කාමභව රූපභව දෙක්හි අටකින් හා සයකින් අඩුව රූපකලාපයන්ගේ පහළ නොවීම ඒ ඒ ලොකයන්ගේ ස්වභාවය යි සිතිය යුතු වේ" යනු "පඤ්චසකන්ධ විභාගය නම් පොතේ දක්නේය.

මෙය විවෙචනය කරන ලක්දිව අනෙක් පඬිවරයෙක් ස්වයං කෘත "අභිධර්මය" නම් පොතේ මෙසේ කියයි

"බ්‍රහ්ම ලොකයෙහි ගන්ධායතන රසායතන දෙක නැති බවක් බුඩාගමේ නැත්තේ ය. ඝ්‍රාණෙන්ද්‍රිය ජිව්හෙන්ද්‍රිය යන දෙක නැතිවා සැබෑවුවත් එපමණක් නොව කායෙන්ද්‍රියයත් නැත්තේම ය. ඝාණ ජිව්හා දෙක නැති නිසා ගන්ධ-රස දෙකත් නැතැයි කියයුතු නම්, කායෙන්ද්‍රියයත් නැති නිසා ඵොට්ඨබ්බායතනය එනම්: පඨවී තෙජෝ වායො යන භූත තුණත් නැතිවිය යුතුයි. එසේ කල කිසි ද රූපයක් නො ලැබේ මැයි.

චක්ඛු සොතාදිය පවා නැති අසඤ්ඤසත්ත බ්‍රහ්ම ලොකයෙහි ප්‍රතිසන්ධියේදී ජීවිත නවක කලාපය ද, ප්‍රවෘත්තියේ දී ශුද්ධඨක ලහුතාදෙකාදසක යන කලාප දෙක ද ලැබෙන බව දක්වා තිබේ. ඒ තුණට ම ගන්ධ රසයෝ අවයව වෙති. විරෝධ ප්‍රසංගය ද වෙයි. ඒ මෙසේ යි. අප බුදුන්ගේ ශාසනයෙහි දැනට ප්‍රසිද්ධව තිබෙන රූපකලාප 22 ට ඔය කියන සේ බ්‍රහ්මයන්ට ලැබෙන අංග දෙක දෙකින් අඩු කලාප 15 ත් සමග කලාප 37 ක් දක්වා තිබෙන්ට ඔහොම නම් යුතුව තිබුණේ ය. ඔය මතයමත් පොත්වල ප්‍රතික්ෂේප කර තිබේ. ඒ මෙසේ යි. "රූප ලොකෙ ගන්ධාදිනං අභාවවාදී මතම්පිහි තත්ථ තත්ථ ආචරියෙහි පටික්ඛිත්ත මෙව "(රූප ලොකයෙහි ගන්ධාදින් නැතැයි කියන්නන්ගේ මතය ආචාර්යවරයන් විසින් ඒ ඒ තැනදී අහක දමන ලද්දක් මය) යන විභාවිනි වචනයෙන් පෙනේ" යනුයි

31 ආරුප්පාපනා මනෝ ධම්-මනෝ විඤ්ඤාණ ධාතවෝ
සාස්‍රවා නාස්‍රවා එතෙ-ත්‍රයෝ ශෙෂාසතු සාස්‍රවෝ

භාවය—මනොධාතු-ධම්ධාතු-මනොවිඤ්ඤාණ ධාතු යන මොවුහු ආරුප්‍ය ධාතුයෙහි ඉතිති. (සෙසු පඤ්චොස එහි නොවෙත්) මේ ධාතුත්‍රය ආශ්‍රව සහිතයෝ ද, ආශ්‍රව රහිතයෝ ද, වෙති. සෙසු පඤ්චොස් ධාතූහු සාශ්‍රවයෝ ම වෙති.

මනෝ ධම්මෝ මනොවිඤ්ඤාණ ධාතවෝ

විභාවනී:—මනොධාතු නම්, පඤ්චවාර වජ්ජන, සම්පටිච්ඡන යුගල යන සිත් තුනයි කියන ලදි.

සම්පටිච්ඡන චිත්තානි-පඨමා ද්විඤ්ඤානං තථා
මනෝ ධාතූතිකං නාම-වුච්චරෙ ඛාපි එකතෝ

ධම්මධාතු.

විභාවනී:—"කතමා තසමිං සමයෙ ධම්මධාතු හොති වෙදනා-ක්ඛන්ධෝ සඤ්ඤාක්ඛන්ධෝ සඞ්ඛාරක්ඛන්ධෝ. අයං තසමිං සමයෙ ධම්මධාතු හොති" යනු ධම්ම සඞ්ගණී පාළියි.

1-24 කාරිකාවට ලියූ විසතරය බලනු.

මනොවිඤ්ඤාණ ධාතු.

විභාවනී:—විපඤ්ච විඤ්ඤාණය, මනොධාතුත්‍රිකය, යන සිත් තෙළෙස හැර ඉතිරිව සිටි එකුන නවුති විභාගයෙන් සිත් සසැත්තෑව හෝ එකවිස සතක විභාගයෙන් එක්සිය අට හෝ මනොවිඤ්ඤාණධාතු නමි. දක්වන ලද මෑයි.

"ඉතෙ විපඤ්ච විඤ්ඤාණ-මනෝ ධාතූති යං සිතං
මනෝ විඤ්ඤාණ ධාතූති-තං සඞ්ඛං සමුදිරිතං"

"කතමා තසමිං සමයෙ මනෝ විඤ්ඤාණ ධාතු හොති යං තසමිං සමයෙ චිත්තං මනෝ මානසං හදයං පණ්ඩරං මනෝ මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධෝ තජ්ජා මනෝ විඤ්ඤාණධාතු අයං තසමිං සමයෙ මනෝ විඤ්ඤාණධාතු" යනු ධම්ම සඞ්ගණී පාළියි.

"චිත්ත සංඛ්‍යාත වූ මානස ම විශිෂ්ට විජානන කෘත්‍ය යෙන් යෙදෙන බැවින් විඤ්ඤාණ නාම වෙයි. සියලු සත්ව-තිර්ය්‍යග්ගතියෙහි ධාතු තාම්‍රද්‍ර මච් නුයි මනොවිඤ්ඤාණ ධාතු නාම

වන්නේයි. මනස්හු ගේ විඤ්ඤාණධාතුනු යි හෝ මනො විඤ්ඤාණධාතු නම් වන්නේ යි. කවර මනස්හු ගේ විඤ්ඤාණ යෙක් ද? කෙසේ සම්බන්ධ වන්නේ ද යත්? ඒ මනොධාතුව වනාහි මනස්හුගේ ම අනන්තර ප්‍රත්‍යයෙන් ඉපි ද, මනසට ම ප්‍රත්‍යය වේ නුයි මනසහට ම සම්බන්ධ වන්නීය යි දතයුතුයි'' යනු විශුද්ධිමාර්ග සන්නයි.

''මනොධාතු පන පඤ්චචාරා වජ්ජන-කුසලා කුසල විපාක සම්පටිච්ඡන වසෙන තයො ධම්මාති සංඛං ගච්ඡති. ධම්මධාතු තිණ්ණං අරූපක්ඛන්ධානං සොළසන්නං සුඛුම රූපානං අසංඛතාය ච ධාතුයා වසෙන විසති ධම්මාති සංඛං ගච්ඡති. මනො විඤ්ඤාණධාතු සෙස කුසලාව්‍යාකත විඤ්ඤාණ වසෙන ඡ සත්තති ධම්මාති සංඛං ගච්ඡති'' යනු මේ ධාතුත්‍රයේ වෙනස විශුද්ධිමාර්ගයේ එකස්ථානයේ පැහැදිලි කළ අයුරුයි.

සාස්‍රවා නාස්‍රවා.

විප්පනි:—52 වැනි පිටුව බලනු.

32 සවිතක්ක විචාරාති-පංච විඤ්ඤාන ධාතවඃ
අන්ත්‍යාස්ත්‍රයඃ ත්‍රිප්‍රකාරාඃ-ශෙෂා උභය වර්ජිතාඃ

භාවය:—පංච විඤ්ඤාන ධාතුහු විතක්ක – විචාර සහිතයෝ වෙත්. අන්තයෙහි වූ මනොධාතු – ධම්ධාතු – මනොවිඤ්ඤාන ධාතුත්‍රය ත්‍රි ප්‍රකාර වෙත්. සෙසු ධාතුහු උභය වර්ජිතයෝය.

සවිතක්ක විචාරාති

විප්පනි:—''කතමො තස්මිං සමයෙ විතක්කො හොති, යො තස්මිං සමයෙ තක්කො විතක්කො සංකප්පො අප්පනා ව්‍යප්පනා චෙතසො අභිනිරොපනා අයං තස්මිං සමයෙ විතක්කො හොති.

කතමො තස්මිං සමයෙ විචාරො හොති. යො තස්මිං සමයෙ චාරො විචාරො අනුවිචාරො උපවිචාරො චිත්තස්ස අනුසන්ධනතා අනුපෙක්ඛනතා අයං තස්මිං සමයෙ විචාරො හොති'' යනු ධම් සඟුණුයි.

විතක්ක නම්, චිත්තයාගේ ස්ථූලාවස්ථාවයි. **විචාර** නම්, චිත්තයාගේ සූක්ෂමාවස්ථාවයි. කියන ලදී. අභිධර්මකොශ-යෙහි ම, විතක්ක විචාරෞදාර්ය සූක්ෂමතෙ ඉති 2-32.

විතක්ක-විචාර දෙදෙනාගේ වෙනස අභිධර්මාර්ථසඞ්ග්‍රහ සන්නයේ මෙසේ විස්තර කරයි.

"ආරම්මණං විතක්කෙති සම්පයුත්ත ධම්මෙ අභිනිරොපෙතීති විතක්කො. සො සහජාතානං ආරම්මණාභිනිරොපන ලක්ඛණො.

යම්සේ ගම්වැසි කිසි පුරුෂයෙක් රාජවල්ලභාදි එකකු හෝ සබඳ මිත්‍රයකු හෝ නිසා රජගෙට වදී ද, එපරිද්දෙන් විතක්කය නිසා චිත්තය අරමුණට නැගෙන්නේ යි. එසේ වී නම්, අවිතක්ක චිත්තය තෙම කෙසේ අරමුණට නැගේද යත්? හෙද විතක්ක බලයෙන් ම අරමුණට නැගෙන්නේයි. යම්සේ ඒ පුරුෂ තෙම පෙර ගිය විරූ හෙයින් රාජ වල්ලභාදි කිසිවකු නැතිව ද, නිරාශඞ්කව රජගෙට වදී ද, එසේ ම මේ අවිතක්ක චිත්තය ද, පරිචය බලයෙන් ම විතක්කය නැතිව ද, අරමුණට නැගේ. මෙහි පරිචය නම්, සවිතක්ක චිත්තයාගේ නිරන්තර ප්‍රවෘත්ති වශයෙන් සන්තානයෙහි උපන් චිත්ත භාවනායි. තවද, මෙහි අතිකකුදු ඇති. වස්ත්වාලම්බන ඝර්ෂන බලයෙන් ස්වභාවයෙන් අවිතක්කද වූ පඤ්ච විඥානය ද, යට යට ධ්‍යාන භාවනා බලයෙන් චිතීය ධ්‍යානාදිහු ද, අරමුණට නැගෙත්.

ආරම්මණෙ තෙන චිත්තං විචරතීති විචාරො – සො ආරම්මණානුමජ්ජන ලක්ඛණො.

මේ විතක්ක විචාර දෙදෙනා අතුරෙහි විතක්කය විචාරයට වඩා ඖදාරික හෙයින් ද, විතක්කය තමා පූර්වඞ්ගම හෙයින්ද, ප්‍රථමඝණාභිඝාතය මෙන් චිත්තයා ගේ ප්‍රථමාභිනිපාතය විතක්ක නම් වෙයි. ඝණාභිඝාතයෙන් වූ අනුරාවය මෙන් අනුසඤ්චරණය විචාර නම් වේ.

තවද ආකාශයෙහි නැගෙනු කැමැති පක්ෂිහුගේ පක්ෂ වික්ෂෙපය මෙන් ද, ගන්ධානුබද්ධ සිත් ඇති භෘඞ්ගයාගේ පද්මාභිමුඛ්‍යපතනය මෙන් ද, විස්තාරවත් වූ චිත්තපරිස්පන්දනය විතක්ක නම් වෙයි. ආකාශයෙහි පැන නැංගාවූ පක්ෂිහුගේ පක්ෂප්‍රසාරණය මෙන් ද, පද්මාභිමුඛ්‍යපතිත භෘඞ්ගයාගේ පද්මයාගේ මතු භාගයෙහි පරිභ්‍රමණය මෙන් ද, චිත්තයාගේ නාතිපරිස්පන්ද වූ ශාන්ත ප්‍රවෘත්තිය විචාර නම් වේ."

"නාගසෙනත්ථෙරො පනාහ. ආකොටන ලක්ඛණො විතක්කො, යථා මහාරාජ භෙරි ආකොටිතා අථ පච්ඡා අනුරවති අනුසඤ්ඤයති, එවමෙව ඛො මහාරාජ යථා ආකොටනා එවං විතක්කො දඨ්ඨබ්බා යථා පච්ඡා අනුරවනා අනුසඤ්ඤයනා, එවං විචාරො දඨ්ඨබ්බා"ති

අපි ච යථා මලඝනිතං කංසභාජනං එකෙන හත්ථේන දළ්හං ගහෙත්වා ඉතරෙන හත්ථේන චුණ්ණතෙලවාලණ්ඩුපකෙන පරිමජ්ජන්තස්ස දළ්හගහණ හත්ථෝ විය චිත්තක්ඛණා. පරිමජ්ජන හත්ථෝ විය විචාරෝ.

තථා කුම්භකාරස්ස දණ්ඩප්පහාරෙන චක්කං භමයිත්වා භාජනං කරොන්තස්ස උපපීළන හත්ථෝ විය චිත්තක්ඛණා. ඉතෝ චිතෝ ච සඤ්චරණහත්ථෝ විය විචාරෝ.

තථා මණ්ඩලං කරොන්තස්ස මජ්ඣේ සන්නිරුම්භිත්වායිත කණ්ටකෝ විය අනිත්තරොපණා චිත්තක්ඛණා. බහි පරිබ්භමණ කණ්ටකෝ විය විචාරෝ" යනු අත්ථසාලිනී අට්ඨකථායි"

සැකෙවින් වනාහි, චිත්තය අරමුණෙහි නැඟන්නේ චිත්තකීය යි. චිත්තය අරමුණෙහි හසුරුවන්නේ විචාරය යි.

පංච විඤ්ඤාණ ධාතවඃ

විපත්තිඃ— චක්ඛු-ශ්‍රෝත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය විඤ්ඤාණ යන පස. මේ පංච විඤ්ඤාණ ධාතූහු සවිතක්කයෝ ද, සවිචාරයෝ ද, වෙත්.

අනන්‍යාසන්නඃ ත්‍රිප්‍රකාරඃ

විපත්තිඃ— මනොධාතු-ඛම්ධාතු-මනොවිඤ්ඤාණ-යන ධාතුත්‍රය සවිතක්ක සවිචාර-සවිතක්ක විචාර-අවිතක්ක සවිචාරය යන භෙදයෙන් තුන් වැදෑරුම් වෙත්.

ශෙෂා උභයවර්ජිතාඃ

විපත්තිඃ—සෙසු දශධාතූහු උභයවර්ජිතයෝ ය; හෙවත් අවිතක්ක අවිචාරයෝ ය.

३३ නිරූපණානුසම්මරණ - විකල්පාත් අවිකල්පකාඃ
මනඃ ව්‍යග්‍රා මානසි ප්‍රඥා - සමාහිතව මානසි සම්භවිඃ.

භාවිඃ:—ඔවුහු නිරූපණ (පරිච්ඡේදන) විකල්පයෙහින් ද, අනුස්මරණ විකල්ප හෙයින් ද, අවිකල්පකයෝ වෙත්.

මනස පිළිබඳ යම් අසමාහිත ප්‍රඥාවක් වේද, එය නිරූපණ විකල්ප නම්. මනස පිළිබඳ සමාහිතවූ හෝ අසමාහිත වූ සම්මා සතියක් ඇති නම්, එය අනුස්මරණ විකල්ප නම්.

34 සප්ත සාලම්බනාශ්චිත්ත-ධාතවෝදශ්ච ධර්මතාඃ
නවානුපාත්තනා සෙනා වාෂ්ටාව-ශබ්දයවර්ජනෝ නාවිධා

භාවය:—චිත්ත ධාතු හෙවත් විඥන ධාතු සත ද, ධර්ධාතුවෙන් එක් භාගයක් ද, ආලම්බන සහිතය. සේසු දශධාතූහු ද, ධර්ධාතුවෙන් ඉතිරි භාගය ද, ආලම්බන රහිතය.

ශබ්දය හා ඒ ආලම්බන අට ද, යන නවය අනුපාත්තය. සෙසු නවය අනුපාත්ත ද, නිරනුපාත්ත ද, වෙති.

නවානුපාත්තනා සෙනා වාෂ්ටාව ශබ්දයවර්ජනෝ

විභාවනී: – සප්ත විඥන ධාතූහු ද, ධර්ධාතුවෙන් අඩියක් ද, ශබ්ද ධාතුව ද යන නවය අනුපාත්තය හෙවත් ආලම්බන රහිත ය.

අන්‍යෝ නව විධා

විභාවනී:—පංචෙන්ද්‍රියයෝ ද, රූපාදි විෂය චතුෂ්කය ද, යන නවය සාලම්බන (=අනුපාත) නිරාලම්බන (=නිරනුපාත) ය යි දෙවැදෑරුම් වේ

35 සප්තවිධ්‍යං විවිධං ශෂා-රූපිණෝ නව භෞතිකාඃ
ධර්මී ධාතෝරෙක දේශයව-සංචිතා දශ රූපිණඃ

භාවය:—සප්තවිධ්‍යය දෙවැදෑරුම් වේ. සෙසු රූපි නව ධාතූහු භෞතිකයහ. ධර්ධාතූහුගේ එක් කොටසක් ද, භෞතිකය. දශ රූපිධාතූහු පරමාණු සංඝාතය හ.

සප්තවිධ්‍ය විවිධං

විභාවනී:—භෞතිකය-අභෞතිකය යි සප්තවිධ්‍යය දෙවැදෑරුම් මේ. එනී පෘථිව්‍යාදි සතර භෞතිකය. ඛර-සෙතහ-උෂ්ණ-ඊරණ යන සතර අභෞතිකය. (1-11 බලනු.)

ෂෂා රූපිණෝ නව භෞතිකාඃ

විභාවනී:—පංචෙන්ද්‍රියයෝ ද, සප්තවිධ්‍යය වර්ජිත අන්‍ය විෂයයෝ ද, යන නව රූපීහු භෞතිකයෝ වෙත්.

සංචිතා දශ රූපිණඃ

විභාවනී:—චක්ෂුරාදි පඤ්චෙන්ද්‍රියයෝ ද, රූපාදි පඤ්ච විෂයයෝ ද, යන දශ භෞතිකයෝ පරමාණු සංඝාත වූවාහු වෙත්. කියන ලද ඔය. අභිධර්ම කොෂයෙහි, (2-22)

"කායමෙෂාද්‍රව්‍යකෝ ශබ්දඃ-පරමාණු රතීන්ද්‍රියා
කායෙන්ද්‍රියඤ්ච කාව දුදේව්‍යා-දුභදුවේව්‍යාඃ පුරෙන්ද්‍රියා"

36 ජිනතති ජිද්‍යතෙ වෛව-බාහ්‍යං ධාතු චතුෂ්ටයම්
දහ්‍යතෙ තුලයත්‍යෙවං-විවාදෙ දගධෘ තුල්‍යයොඃ

භාවය:—බාහ්‍ය ධාතු සතර අතිකක් සිඳින්නේ ද, තෙමේ අන්‍ය යන්ගෙන් සිඳෙන්නේ ද වේ. තෙදින් දැවෙන්නේය. ගුරුත්ව යෙන් තුලනා කෙරේ. දගධෘ-තුල්‍ය විෂයයෙහි විවාද යෙක් ද, වේ.

ජිනතති ජිද්‍යතෙ

විප්පනි:—බාහ්‍ය ධාතුහු පරශු-දරු යන සංඥ ඇත්තාහු අතිකක් සිඳින්නාහු ද, තුමූ අන්‍යයන්ගෙන් සිඳෙන්නාහුද, වෙත්. "පරශු" යන සංඥ වූවාහු අතිකක් සිඳිත්. "දරු" සංඥ වූවාහු අන්‍යයන්ගෙන් සිඳෙත්.

බාහ්‍යං ධාතු චතුෂ්ටයම්

විප්පනි:-රූප-ගන්ධ-රස-ස්පර්ශ යන ධාතුහු බාහ්‍ය ධාතුහු නම් වෙත්

දහ්‍යතෙ තුලයත්‍යෙවං

විප්පනි:—ඔවුහු ජ්වලිත වූවාහු තෙජසිත් දැවෙත්. තොලනාර්හ වූවාහු ගුරුත්වයෙන් තොලනය වෙත්.

විවාදෙ දගධෘ තුල්‍යයොඃ

විප්පනි:—තෙජො ධාතුව ම දවන්නා ය යි ද, ගුරුත්වය ම තුල්‍යය යි ද, සම්හරු කියත්.

37 විපාකජෞපචයිකාඃ-පංචාධ්‍යාත්මං විපාකජඃ
න ශබ්දෙ ප්‍රතිඝා අෂ්ටෞ-නෛෂ්‍යන්දික විපාකජාඃ

භාවය:—පංචආධ්‍යාතමික ධාතුහු කර්මවිපාකජ ද, ඔෞපචයික ද, වෙත්. ශබ්දධාතුව විපාකජ නොවේ. සප්තවිඥාන ධාතුන් සහ ධර්මධාතුව ද, යන අෂ්ටධාතුහු අප්‍රතිඝය. නෛෂ්‍යන්දික විපාකයෙන් හටගත්තාහු වෙත්.

විපාකජෞපචයිකාඃ පංචාධ්‍යාත්මං

විප්පනි:—චක්ෂුරාදි පංච ආධ්‍යාත්මික ධාතුහු පූර්වකර්ම විපාක හෙතු වෙන් හටගත්තාහු වෙත්. ආහාරාදි හෙතුවෙන් සංචයන ස්වභාව ඇත්තෝ ද, වෙත්, වදරන ලද්දේ මැයි.

"කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා උප-චිතත්තා විපාකං චක්ඛුවිඤ්ඤාණං උප්පන්නං හොති, සොත සාණ ජිව්හා කායවිඤ්ඤාණං විපාකා මනොධාතු උප්පන්නා හොති සොමනස්ස සහගතා මනො විඤ්ඤාණධාතු උප්පන්නා හොති" යනාදින්. (විස්තර විශුද්ධි මාර්ගයෙහි ප්‍රතීත්‍ය සමුත්පාද නිදේශයෙහි දන්නේ ය.)

විපාකජඃ න ශබ්දඃ

විප්පනි:—ශබ්ද ධාතුව කර්ම විපාකජ නොවේ. හුදෙක් උපචයික ස්වභාවය.

අප්‍රතිඝා අෂ්ටෞ නෛෂ්‍යන්දික විපාකජාඃ

විප්පනි:—සප්ත විඥාන ධාතූහු ද, ධර්මධාතුව ද, යන් අට අප්‍රතිඝ යෝ ය. නෛෂ්‍යන්දික විපාකජයෝ ය; හෙවත් කර්මජ හෙතූන් ගේ විපාකයෙන් හටගත්තාහු නොවෙත්. කියන ලද මැයි.

"නෛෂ්‍යන්දිකානාං ස්වභාව ධර්මසර්මගතානාං හෙතූනාං" (නතු කර්මජ හෙතූනාං විපාකෙන ජාතාස්සන්ති)

38 ත්‍රිධාන්‍යෙ ද්‍රව්‍යවානෙකඃ-ක්ෂණිකාශවරමාසත්‍රයඃ චක්ෂුර් විඥාන ධාත්වොඃ ස්‍යාත්-පෘථක් ලාභඃ සභාපි ච

භාවය:—අන්‍ය ධාතූහු තෙ වැදැරුම් වෙති. එක ම ධර්මධාතුව ද්‍රව්‍ය වත් ය. අන්තිම ධාතුත්‍රය ක්ෂණික ය. චක්ෂුර් ධාතුව ද, චක්ෂුර් විඥාන ධාතුව ද, වෙන් වෙන්ව ද, එක්ව ද, ලැබේ.

ත්‍රිධාන්‍යෙ

විප්පනි-රූප-ගන්ධ-රස-ස්පර්ශ යන ධාතූහු විපාකජ - අප්‍රතිඝ-ඖපචයිකය යි තෙවැදැරුම් වෙත්.

ද්‍රව්‍යවානෙකඃ

විප්පනි—එක ම ධර්මධාතුව පමණක් සාරවත් බැවින් ද, විනාශ නො වන බැවින් ද, ද්‍රව්‍යවත් ය. කියන ලදී.

"එකො ධර්මධාතුරේවා'ස්ති වස්තු සත්‍යං සාරවත්ත්වාත් අවිනාශිත්ත්වාත්"

ඝණ්ඨාශෙවර මාඝත්‍රයඃ

ටිපනි: – මනෝ ධාතු-ධම්ම ධාතු-මනෝ විඤ්ඤාණ ධාතු යන ධාතුත්‍රය ඝණ්ඨිතය.

චක්ඛුර් විඤ්ඤාණ ධාතෙවාඃ ඝ්‍යාඞ්-ඝෘඨක් ලාඝඃ ඝඝාපි ච

ටිපනි:—චක්ඛුර් ධාතුව සහ චක්ඛුර් විඤ්ඤාණ ධාතුව එක්ව ද, චේන්ව ද, ලැබේ. කාම ධාතුවෙහි ඝනීභාදි අවස්ථායෙහි චක්ඛුර් විඤ්ඤාණ මාත්‍රය පමණි. විතීයාදි ධ්‍යානත්‍රයෙහි චක්ඛුර් විඤ්ඤාණ මාත්‍රයෙන් සාක්ෂාත් කෙරෙයි. අරූප ධාතුවෙන් චුත වූ සත්ත්වයා දෙකින් ම යුක්තාය ඉවත් චක්ඛුර් ධාතු චක්ඛුර් විඤ්ඤාණ ධාතූන්ගෙන් යුක්තය. අනන්තරා භවිකයෝ ද, අවිකලෙන්ද්‍රිය යෝ ය. (3. 9. බලනු)

"චක්ඛුර් ධාතු-රූපධාතු දෙදෙනා වනාහි චක්ඛු විඤ්ඤාණ යා ගේ නව ගැණීමට හෙතු වෙයි. චක්ඛු විඤ්ඤාණ ධාතුය යන මේ ධාතු තොමෝ ප්‍රත්‍යුත්පන්න ඵලය"

චක්ඛුස් ප්‍රසාදය, රූපාලම්බනය, ආලෝකය, මනසිකාරය යන මොවුන් නිසා **චක්ඛුර්විඤ්ඤාණය** උපදනේ ය.

"මේ අවලෝස් ධාතූන් අතුරෙන් චක්ඛුර් ධාතුව බෙර ඇසක් මෙන් දැක්ක යුත්තේය. රූප ධාතුව කඹිප්පුවක් මෙන් දැක්ක යුත්තේය. චක්ඛුර් විඤ්ඤාණධාතුව බෙරයෙන් නික්මෙන්නාවූ ශබ්දයක් මෙන් දැක්ක යුත්තේය.

එපරිද්දෙන් ම චක්ඛුර් ධාතුව කැටපතක් මෙන් දැක්ක යුත්තේය. රූප ධාතුව මුඛය මෙන් දැක්ක යුත්තේය. මුඛයෙහි ඡායාව මෙන් චක්ඛුර් විඤ්ඤාණ ධාතුව දැක්ක යුත්තේය; ඉවත් මුඛයෙහි තල කැලල් ලප ආදිය මෙන් දත යුත්තේය.

චක්ඛුර් ධාතුව උක්දඬු තලඇට මෙන් දැක්ක යුත්තේය. රූප ධාතුව යන්ත්‍ර චක්‍රයෂ්ටිය මෙන් ඉවත් උක්දඬු පෙළන යන්ත්‍රය හා තල මඬිනා මොහොල් දණ්ඩ මෙන් දැක්ක යුත්තේය. චක්ඛුර් විඤ්ඤාණධාතුව උක් පැණි තලතෙල් මෙන් දැක්ක යුත්තේය.

ඝට භාගයෙහි ඇත්තාවූ ගිනිගානා දණ්ඩ මෙන් චක්ඛුර් ධාතුව දැක්ක යුත්තේය. මධ්‍ය භාගයෙහි තුබූ ගිනිගානා දණ්ඩ මෙන් රූප ධාතුව දැක්ක යුත්තේය. ඒ දඬු දෙක එකට හැපීමෙන් හටගන්නා සියුම් ඉහිරී චක්ඛුර් විඤ්ඤාණ ධාතුව දැක්ක යුත්තේය.

මේ උපමාවන්ගෙන් නිර්ජීව වූ බෙර ඇස දඬු ආදීන්ගේ එක්වීමක් හෙවත් ගැටීමක් ඇති කල්හි නිර්ජීව වූ ශබ්දාදීන්ගේ හටගැණීම මෙන්, නිර්ජීව වූ චක්ෂුරූපාදීන් ගේ එක්-වීමෙන් නිර්ජීවවූ චක්ෂුර් විඥ්ඥාණාදීන්ගේ පැවැත්ම වේනුයි; හෙතුඵලයන්ගේ පරවාදීන්ගේ කල්පනාව මෙන් ආත්මයෙන් සිස් වූ ධාතුමාත්‍ර බව ද, කාරක වෙදකයන්ගේ වශයෙන් කර්මය කරන්නෙක් හෝ විපාකය විඳින්නෙක් හෝ අවිද්‍ය-මාන බව ද, මේ උපමාවන්ගෙන් දක්වන්නේයි" යනු චක්ෂුර් ධාතු-රූපධාතු-චක්ෂුර් විඥාන ධාතුන්ගේ විනිශ්චය විශුද්ධි-මාර්ග භාව සන්නයෙහි කී අයුරුයි.

39 ද්වාදශාධ්‍යාතමිකා රූපා-දිවර්ජ්‍යාඃ ධර්ම සංඥකඃ
සභාගඃ තත් සභාගොපි-ශෙෂො යොභ්‍යස්ව කර්මකාත්

භාවය: රූපාදි ෂඩ් ධාතුන් හැර චක්ෂුරාදී චාදශ ධාතුහු ආධ්‍යාතමිකයහ. ධර්ම ධාතුව සභාගය. අවශෙෂ ධාතුහු සභාග ද, තත්සභාග ද, වෙති. යම් ධාතුවක් ස්විය කර්මය නොකරන්නේ ද, එය තත් සභාග නම්.

චාදශාධ්‍යාතමිකා රූපාදිවර්ජ්‍යාඃ

විප්පනි:—චක්ෂුරාදී ඉන්ද්‍රිය ෂට්කය ද, චක්ෂුර් විඥානාදී ෂඩ්විඥාන යෝ ද, යන දොළොස් ධාතුහු ආධ්‍යාතමිකයහ. රූප-ශබ්ද ගන්ධ-රස-ස්පර්ශ යන ෂඩ් ධාතුහු බාහ්‍ය ධාතුහු නම් වෙත්. විභඞ්ග පාළියෙහි.

"චාදස ධාතුයො අජ්ඣත්තිකා, ඡ ධාතුයො බාහිරා" යනු වදාරන ලදේදේම ය.

සභාගඃ.

විප්පනි:—ස්විය කර්මය කරනු යේ සභාග නම්. සභාග නම්, සහ භජනය යි. ධර්මධාතුව සභාගය.

තත් සභාගොපි ශෙෂො

විප්පනි:—ධර්මධාතුව හැර සෙසු ධාතුහු සභාග ද, තත්සභාග ද, වෙති.

යො'භ්‍යස්වකර්මකාත්

විප්පනි:—යම් ධාතුවක් ස්විය කර්මය නො කෙරේ ද, එය තත් සභාග ය. ඉන්ද්‍රිය-විෂය-විඥානයන් ගේ ඔවුනොවුන් හා භජ නය සම්පූර්ණයෙන් නොපවත්නේ තත් සභාග යි.

40 දශ භාවනයා හෙයා:-පංච චාන්ත්‍යාසත්‍රයසත්‍රිධා
න දෘෂ්ටිහෙයං අක්ලිෂ්ටං-න රූපං නාප්‍ය ෂෂ්ටජම්

භාවය: – විෂයෙන්ද්‍රිය සංඛ්‍යාත දශරූපීහු ද, පංචවිඥානයෝ ද, ධ්‍යානාදි භාවනා හෙතුවෙන් දුරු කටයුත්තාහ. අන්ත්‍ය ධාතුත්‍රය තෙවැදැරුම් වේ. අක්ලිෂ්ටය ද, රූපය ද, පංච විඥානය ද, දෘෂ්ටිහෙය නොවේ.

අන්ත්‍යාසත්‍රයසත්‍රිධා

විප්පනී:-මනොධාතු – ධර්මධාතු – මනොවිඥාන ධාතු යන ධාතුත්‍රය දර්ශනහෙය-භාවනාහෙය-අහෙය-යනුවෙන් තෙවැදැරුම් වේ.

න දෘෂ්ටිහෙයං අක්ලිෂ්ටං න රූපං.

විප්පනී:—කාමාවචරය පටන් භවාග්‍රය දක්වා පෘථග්ජනත්වය ඇති නවභූමිය අක්ලිෂ්ටය. එය දෘෂ්ටිහෙය නොවේ. රූපය ද, කායික වාචසික කර්මය ද, දෘෂ්ටිහෙය නො වේ.

නාප්‍යෂෂ්ටජම්

විප්පනී:—සවැනි වූ මනස ද, චක්ෂුරාදිය ද, එයින් ම හටගත් චක්ෂුර් විඥානාදි පස ද, දෘෂ්ටිහෙය නොවේ.

41 චක්ෂුශව ධර්මධාතොශව-ප්‍රදෙශො දෘෂ්ටිරෂ්ටධා
පඤ්ච විඥාන සහජා-ධී න් දෘෂ්ටිරතීරණාත්

භාවය:—චක්ෂුස ද, ධර්මධාතුහු ගේ එක් ප්‍රදෙශයක් ද, චක්ෂුරාදි විඥාන ෂට්කය ද, යනුවෙන් දෘෂ්ටිය අට වැදැරුම් වේ. චක්ෂුරාදි පඤ්ච විඥානයන් සමග උපන් ප්‍රඥා තොමෝ දෘෂ්ටි නො වේ. අතීරණ හෙයිනි.

අතීරණාත්.

විප්පනී:—විෂයොපනිධ්‍යාන පූජික නිශ්චයාකර්ෂණය හෙවත් ආරම්මණය සිත්හි දැරීම පිළිබඳ නිමිත්ත ග්‍රහණය සංතීරණ නම්. එයින් වෙන් වූයේ අසංතීරණ නම් එය ම අතීරණ ය. අතීරණ හෙයින් ඒ ප්‍රඥා තොමෝ දෘෂ්ටි නො වේ.

"සම්මාතීරෙති යථා සම්පටිච්ඡිතං රූපං විමංසතීති සන්තීරණං" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි.

42 චක්ෂුඃ පශ්‍යති රූපාණි-සභාගං න තදාශ්‍රිතම්
විඥානං දෘශ්‍යතෙ රූපං-න කිලාන්තරිතං යතඃ

භාවය:—සභාග චක්ෂුස රූපයන් දකියි. එහෙත් තදාශ්‍රිත විඥානය නොදකියි. විඥානය ම දකියි. රූපය නොදකියි. යම් හෙයකින් රූපය අන්තර්ගිත ද, එබැවිනි.

මෙය වෛභාෂික මතයකි.

43 උභාභ්‍යාමපි චක්ෂුර්භ්‍යාං-දර්ශනං ශුද්ධ දර්ශනාත්
අප්‍රාප්තාර්ථාන්‍යක්ෂි මනඃ-ශ්‍රොත්‍රාණි ත්‍රය මන්‍යථා

භාවය:—ඇස් දෙකින් පිරිසුදු වශයෙන් දැක්ම වේ. නෙත්‍ර මනස්-ශ්‍රොත්‍රයෝ අප්‍රාප්තයෝ ය. ශෙෂත්‍රය අන් පරිද්දකින් වේ. (ප්‍රාප්තාර්ථයෝ ය.)

උභාභ්‍යාමපි චක්ෂුර්භ්‍යාං-දර්ශනං ශුද්ධ දර්ශනාත්

විප්පනි:—එක් ඇසකිනුදු දර්ශනය වේ. එහෙත් ඇස් දෙකින් පිරිසුදු ලෙස දර්ශනය වේ.

අප්‍රාප්තාර්ථාන්‍යක්ෂි මනඃ ශ්‍රොත්‍රාණි

විප්පනි:—නෙත්‍ර-මනස්-ශ්‍රොත්‍ර යන ඉන්ද්‍රියයෝ අරමුණ කරා නොඑළඹ විෂය ග්‍රහණය කරන හෙයින් අප්‍රාප්තාර්ථයෝ ය. රූප දර්ශනයෙහි ආලොකය ද, ශබ්ද ශ්‍රවණයෙහි අවකාශය ද, අවශ්‍ය බැවින් චක්ෂු-ශ්‍රොත්‍රයෝ අසම්ප්‍රාප්ත විෂයග්‍රාහීය යි ද, කියති. සම්හරු ශ්‍රොත්‍රය සම්ප්‍රාප්තග්‍රාහීය යි කියති. විශුද්ධිමාර්ග සන්නයෙහි මෙසේ විස්තර කරති.

"ඨානාන්තර විෂයෙහි දූ අධික විෂයෙහි දූ විඤ්ඤාණොත්පත්තියට හෙතු බැවින් චක්ෂුස් ශ්‍රොත්‍ර දෙදෙන අසම්ප්‍රාප්ත විෂය ග්‍රාහී වෙත්. ඉදින් අප්‍රාප්තග්‍රාහී වූ නම්, අක්ෂයෙන් විච්ඡින්න දෙශ විෂය ද, අක්ෂ ප්‍රමාණයට අධික ප්‍රමාණ විෂය ද, නොගන්නාහුයි යම්හෙයකින් දූර විෂය ද, ආත්මප්‍රමාණයෙන් අධික විෂයන් ද, ගන්නාහු ද, එහෙයින් අප්‍රාප්තග්‍රාහී වෙතියි දතයුත්තාහු යි. මෙම කීහ දිඝනාභ (දිඞ්නාභ?) පාදයෝ

සඞ්ඛාදී සම්ප්‍රයොගෙ ච
ගදිඡටං රූප ශබ්ද ඉතාා
ඉවඡිනන සෘටිවි ඥානං
තඉතෙතරසතඩ්ය බාඛකම්

අනිකෙකුදු ඉදින් චක්ඛුස සම්ප්‍රාප්තගොවර ග්‍රාහි වී නම්, සවිඥ ආධාර වූ සසම්භාර චක්ඛුස්හි වණ්ණය දක්නේ ය. ඇසැ ඇණලා කෙළවර දක්වන්නේසි. ඇස ඇහැ අදුන් දක්නේසි. වැලිදු ඒ නොදක්නේසි. චතුක්ඛිඔබයෙහි සසලාඤ්ඤනය දක්නේ සි. මේම කිහ.

"දූරෙපි පරශ්‍යාඉසි පඨුඤ්ඤෙනාතමනයඤ්ඤමිපෙපි
ඔවම්ණ්ව මක්ඛිත පඤ්ඤති ගඉඉහි කඋංකං න පඤ්ඤති" සි

සමහර කෙනෙක් ශ්‍රොත්‍රය ද, සම්ප්‍රාප්ත විෂය ග්‍රාහි යෙක්. ඉදින් ශ්‍රොත්‍රය සම්ප්‍රාප්ත ග්‍රාහි වී නම්, බහිද්ධා චිත්තජ ශබ්ද තපත්තිය නැති බැවින් හේ ශ්‍රොත්‍ර විඥානයට විෂය නොවන්නේ සි. පාඨයෙහිදු අව්ඉඉෂයෙන් ශබ්දයතනයාගේ ශ්‍රොත්‍රවිඥානයට අරමුණු බව කියන ලදි. අනිකෙකුදු ශබ්දය ප්‍රාප්තග්‍රාහි වී නම්, ඝ්‍රාණයෙහි ගන්ධය මෙන් සවාඤ්ඤ ප්‍රදෙශ යෙහි ම උපලභ්‍යමයත්. ශබ්දයාගේ දිග් දෙශව්‍යවස්ථාව නොවන්නේ සි. එහෙයින් ශබ්දය යම් තැනක උත්පන්න ද එතැන්හි ම සිටියේ ශ්‍රොත්‍රප්‍රථමයෙහි ආපාථයට යන්නේ සි. ඉදින් උත්පත්ති ස්ථානයෙහි සිට ම ශ්‍රොත්‍රප්‍රථමයෙහි ආපාථ යට ඒ නම් දුරසිටියවුන්. විසින් රජකාදි ශබ්දයෝ කුමක් නෙතින් කාලකින් අසනු ලැබේද්ද යත්? දූරාසන්නයට ශබ්දය ප්‍රකට වූ ක්‍රමයෙන් ග්‍රහණ විඉෂෂය වන හෙයිනි. යම්සේ දූරාසන්නයන්ට වචන ශබ්දය ප්‍රකට වූ ක්‍රමයෙන් ග්‍රහණ විඉෂෂයෙන් ආකාර විඉෂෂයන් ගේ ග්‍රහණය ද, අග්‍රහණය ද වේ. එසේ ම රජකාදි ශබ්දය ද ආසන්නයට ආදියෙහි පටන් අවසානය දක්වා ක්‍රමයෙන් ප්‍රකට වූ කල්හි දූරයට අවසාන යෙහි හෝ මධ්‍යයෙහි හෝ පිණ්ඩ වශයෙන් ප්‍රවෘත්තිය ප්‍රකට වූ කල්හි ශ්‍රොත්‍ර විඥාන විඳියෙන් මතුයෙහි ප්‍රවෘත්ති නිශ්චය ග්‍රහණය කරණ මනොවාර විඥානයන් ගේ විඉෂෂ යෙහි වහා ඇසිනා. කලෙකින් ඇසිනැයි අභිඉනය වේ. ඒ ශබ්දය වනාහි යම්තැනක්හි උපන්නේ ද, ඒ ශබ්දය ඉන්ද්‍රිය කොට ගෙන ඒ තැනැත්තාගේ විද්‍යමාන ඝ්‍රාණයෙහි ශ්‍රොත්‍ර ඥානය ඉපදවීමට සමත් නොවේ. ඉදින් ශබ්දයාගේ භූත ප්‍රථිඉදුග

යෙන් භාත්පසින් ප්‍රවෘත්තිය ගැන්නම්, ප්‍රතිසොඹොතපත්තිය කෙසේ ද යත්? අයශ්වඥානයට අයස්කාන්තය මෙන් දූරාසන්න වූ ශබ්දය තෙමේ අතීත් තැන ප්‍රතිසොඹොතපත්තියට ද, භාජන වලනයට ද, ප්‍රත්‍යය වෙයි දතයුතුයි"

අභිධර්මාචාර්ය සඞ්ඝරක්ඛිත සන්නයෙහි ශාරිපුත්‍ර, සඟරාජ නිමියෝ මෙසේ කියති.

"මෙහි චක්ෂුඃ ශ්‍රෝත්‍ර දෙදෙන සානන්තරිකග්‍රාහි හෙයින් **අප්‍රාප්තග්‍රාහිත්වඤ්ච ග්‍රාහිනඤ්චි** දතයුතු. සානන්තරිකග්‍රාහීහයි කියනුයේ චක්ෂුස්හු තමා කෙරෙන් විච්ඡින්නදෙශයෙහි තමහට අධික ප්‍රමාණ වස්තුතාරකාදිතුදු සප්ටිකාදින් ව්‍යවහිත ජපාකුසුමාදිතුදු ගන්නා හෙයින් ශ්‍රෝත්‍රය ද, තමා කෙරෙන් විච්ඡින්නදෙශස්ථ මෙඝ ශබ්දාදීන් ද, උදරවර්ති ආදීන් ව්‍යවහිත කුක්ෂි ශබ්දාදීන් ද, දන්නා හෙයින්.

සමහර ආචාර්‍යයී කෙනෙක් ශ්‍රෝත්‍රෙන්ද්‍රිය ද, ප්‍රාප්තග්‍රාහී ය යි යෙත්. එසේ වී නම්, බාහ්‍යයෙහි චිත්තජ්ශබ්දයනුදු උපදනා හෙයින් චිත්තජ ශබ්දය ශ්‍රෝත්‍රවිඥානයට විෂය නොව "න සද්දාය තාතං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෝ"යි සාමාන්‍ය යෙන් අරමුණු නොවෙයි යනුදු නැති. අතිකෙකුදු භඞ්ගය මෙන් සවප්‍රදෙශයෙහි උපලභ්‍යමාන බැවින් ශබ්දයාගේ දිග් දෙශව්‍යවස්ථා ද ඥානාවිය යුතු ශබ්දය උත්පත්තිස්ථානයෙහි ම සිට හමුවෙයි දතයුතු ලෙම කිහ.

චක්ඛු සොතං පනෙතෙසු – තොත සම්පත්ත ගාහකං
විඤ්ඤාණුප්පත්ති හෙතුත්තා – සානන්තරික ගොචරෙ

තථාහි දූරදෙසඨං – ඵලිකාදිනිරොධිතං
මඤ්ඤතඤ්චනකාදිනං – ඵණණං චක්ඛු උදිකඛති

ආකාසාදිගතෙ තච්ඡේ – චම්මා දනන්තරිතෙ පි ච
මඤ්ඤතා ච ඝනාදීනං – සද්දා සොතස්ස ගොචරා

ඝත්වා විසය දෙසත්තං – පරිඛා ගණ්හතීති චේ
අධිකාන විඛාතපි – තස්ස ගොචරා ගොචරා යිහා

කුතාසඛණිකතා තෙ මේ – යාසී ඉන්ද්‍රිය සඞ්ඛිතා
තාවතා ත්‍රිඤ්ඤාතාපි සඛිතුඛතා – ඔඝණිතා සද්දාවේ ත්‍රිඤ්ඤාතා

න සොසං ගොචරා ඡානානි – නනි සමඹානානි තෙ ඔහි
වුත්තානි අවිසයෙන – පාඨෙනං විසයා ච තෙ

ඡදිවෙනං මයං තෙත – සම්පං ඡයව ගණහති
අකනිඨණා නථා මුලං – පසෙසඡ්‍ය පමුඛස්ස ච

දිසා දෙස වවත්ථානං – සදදස්ස නා භවෙය්‍ය ච
සියා ච සදදවෙඩස්ස – සඤාඡණණා ඡථ පානානං

ධම් සතුණු අටුවාහි මෙසේ විසතර කරයි.

"එවං කම්මවිසෙසතො විසෙසවත්තෙසු ච එතෙසු චකඛු ඡානානි අපපණා විසයගහණාභානානි අත්තනතා නිස්සයං අනලලීන නිස්සයෙ එව විසයෙ විඤඤණ හෙතුත්තා, ඡාණ ජිවහාකායා සම්පත්ත විසයගහණාභානා. නිස්සය වසෙන වෙව සයඤව අත්තනතා නිස්සයං අලලීනතෙයෙව විසයෙ විඤඤණ හෙතුත්තා. අඞකථායං පන ආපාථගතත්තා ව ආරම්මණං සම්පත්තානං නාම, චන්දමණ්ඩල සුරිය මණ්ඩලානං නි වාචත්තා ළිස යොජනසහස්ස මත්ථකෙ ඨිතානං වණ්ණා චකඛුපථා දෙ ඡටෙති. සො දූරෙ ඨත්වා පඤඤය මානොපි සම්පත්තානාමෙව නාම. තණ්හාචරානා චකඛු ඡම්පත්ත ඡොචර මෙව නාම. දූරෙ රුක්ඛං ඡන්දනතානමපි රජකානඤව වත්ථං ධොවනතානං දූරතොව කාය විකාරෙ පඤඤයති සදදා පන ධාතුපරම්පරාය ආගනත්වා සොතං ඡටෙත්වා සණිකං වවත්ථානං ගවජ්ජතීති වුත්තං.

තත්ථ කිඤචාපි ආපාථගතත්තා ආරම්මණං සම්පත්තනතති වුත්තං. චන්දමණ්ඩලාදි වණ්ණා පන චකඛුං අසම්පත්තෙතා දූරෙ ඨිතොව පඤඤයති. සදෙදාපි සවෙ සණිකං ආගචෙඡය්‍ය, දූරෙ උපපන්නා විරෙන සුයෙය්‍ය. පරම්පර ඡවනායෙව ආගනත්වා සොතං ඡටවනෙතා අසුක දිසාය නාමාති න පඤඤයෙය්‍ය තසමා අසම්පත්ත ගොචරානෙව තානි. අති ආදි සමානානී වෙතානි. යථානි අති නාම ඔහි සිනිඛ සම්මජ්ජඤාන නාභිරමති. සඛකාරඤාන තීණ පණ්ණගහන වම්මිකානියෙව පන පවිසිත්වා නිපජ්ජනකාලෙ අභිරමති. එඤගහතං ආපජ්ජති. එව මෙතං චකඛුපෙතං විසමජ්ඣාසයං මංවිධසු සුවණ්ණඡිත්තාදිසු නාභිරමති. ඔලොකෙතුම්පි න ඉවජ්ජති. රූපවිත්ත පුපඵ ලතාවිවිත්තෙසුසෙව ඡක්ඛු අභිරමති. තාදිසෙසු හි ඨානෙසු චකඛුඤ්ච

අප්පහොන්තෙ මුඛම්පි විවරිත්වා ඔලොකෙතුකාමා හොන්ති. සුංසුමාරෙ පි බහි නික්ඛන්තො ගහෙතබ්බං න පස්සති. අක්ඛිනි නිම්මිලෙත්වා ව චරති. යදා පන ඛ්‍යාමසත මත්තං උදකං ඔගාහිත්වා බිලං පවිසිත්වා නිපන්නො හොති, තදා තස්ස චිත්තං එකග්ගං හොති, සුඛං සුපති. එවමෙව සොත-මෙපතං සිලජ්ඛාසයං ආකාස සන්නිස්සිතං කණ්ණච්ඡිද්ද-කූපකෙයෙව අජ්ඣාසයං කරොති, කණ්ණච්ඡිද්දාකාසොයෙව තස්ස සද්දසවණෙ පච්චයො හොති, අජටා කාසොපි වට්ටතියෙව. අන්තොලෙනසම්ං හි සජ්ඣායෙ කරිය මානෙ න ලෙනච්ඡදනං භින්දිත්වා සද්දො බහි නික්ඛමති, චාරවාත-පානච්ඡිද්දෙහි පන නික්ඛමිත්වා ධාතු පරම්පරායෙව ඝට්ටෙ-න්තො ගන්ත්වා සොතප්පසාදං ඝට්ටෙති, අථ තස්මිං කාලෙ අසුකො නාම සජ්ඣායතීති ලෙන පිඬෙ නිසින්නා ජානන්ති එවං සන්තෙ සම්පත්තගොචරතා හොති, කිං පනෙතං සම්පත්තගොචරන්ති? ආම සම්පත්තගොචරං යදි එවං දූරෙ භෙරි ආදිසු වජ්ජමානෙසු දූරෙ සද්දොති ජානනං භවෙ-ය්‍යාති? නො නභවති. සොතප්පසාදස්මිං හි ඝට්ටිතෙ දූරෙ සද්දො ආසන්නෙ සද්දො පරතීරෙ සද්දො ඔරිමතීරෙ සද්දොති යථා තථා ජානනාකාරො හොති, ධම්මතා එසාති කිං එතාය ධම්මතාය යතො යතො ඡිද්දං තතො තතො සවණං හොති. චන්දිම සුරියානං දස්සනං වියාති අසම්පත්ත-ගොචර මෙවෙතං"

ත්‍රය මන්‍යථා

විප්පනි:—ඝ්‍රාණ-ජිහ්වා-කාය යන ඉන්ද්‍රියයෝ සම්ප්‍රාප්ත විෂය ග්‍රහණය කරන්නෝය. එබැවින් ප්‍රාප්තාර්ථයෝ වෙත්.

44 ඝ්‍රාණාදිහිසත්‍රිහිසතුල්‍ය—විෂයග්‍රහණං මනම් චරමස්‍යාශ්‍රයො තීතඃ-පංචානාං සහජශ්ව තෛඃ

භාවය:—ඝ්‍රාණ-ජිහ්වා-කාය යන ඉන්ද්‍රියයන්ගෙන් සව පරමාණු තුල්‍යවූ ම විෂය ග්‍රහණය වේ සවැනි මනොධාතුවට අතීත විෂය ම අශ්‍රය වේ. අවශෙෂ චක්ෂුරාදි පංචෙන්ද්‍රියයන්ට ආශ්‍රය වූවාහු ඒ චක්ෂුරාදීන් හා සමකාලීන වූවෝ ම වෙත්.

තුල්‍ය විෂය ග්‍රහණං

විප්පනි:— 2–22 බලනු.

චරමස්‍ය

විප්පති - ෂට් ධාතූන්ගෙන් අවසාන වූ මනො ධාතුව, "චරමස්‍ය" යනුවෙන් හඳුන්වයි.

45 තදවිකාර විකාරිත්වාත්-ආශ්‍රය ශ්‍රවක්ෂුරාදයඃ
අතො'සාධාරණත්වාච්ච-තෙර විඥානං තථොච්‍යතෙ

භාවය:—ඒ චක්ෂුරාදීන්ගේ විපරිණාම හෙතුවෙන් චක්ෂුර් විඥානාදීන් ද, විකාරවන බැවින් චක්ෂුරාදිහු චක්ෂුර්විඥානාදීන්ගේ ආශ්‍රයෝය. විඥානයන් ස්වකීය ඉන්ද්‍රියයන් කරණ කොට ගෙන අන්‍යයන් හා අසාධාරණ බැවින් ද, චක්ෂුරාදීන් නිසා ම චක්ෂුර්විඥානාදිය කියන බැවින් ද, චක්ෂුරාදිහු චක්ෂුර් විඥානාදීන් ගේ ආශ්‍රයෝ වෙත්.

තදවිකාර විකාරිත්වාත්-ආශ්‍රය ශ්‍රවක්ෂුරාදයඃ

විප්පති:—"චක්ඛුධාතු රූපධාතුනි හෙතු චක්ඛු විඤ්ඤාණධාතුනි ඵලං" යනු විශුද්ධිමාගී ටිකා බැවින් චක්ෂු ධාතු-රූප ධාතු යනු චක්ෂුර් විඥාන ධාතුහුගේ හෙතුහු ය. චක්ෂුර් විඥාන ධාතුව එහි ඵලය වේ. චක්ෂුරාදීන්ගේ උත්පත්තියෙහි මාන්‍ද්‍යය ඇති කල්හි චක්ෂුර්විඥානාදීන්ගේ ද, මාන්‍ද්‍යය වේ.

චක්ෂුර් විඥානාදීන්ගේ උත්පත්තිය මෙසේය.

"චක්ඛු-රූපාලොක-මනසිකාරෙ පටිච්ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං.

සොත-සද්ද-විචර-මනසිකාරෙ පටිච්ච උප්පජ්ජති සොත විඤ්ඤාණං.

ඝාණ-ගන්ධ- වායු - මනසිකාරෙ පටිච්ච උප්පජ්ජති ඝාණ විඤ්ඤාණං

ජිවහා - රස - ආප - මනසිකාරෙ පටිච්ච උප්පජ්ජති ජිවහා විඤ්ඤාණං

කාය-ඵෙ ඵබ්බ-පඨවි-මනසිකාරෙ පටිච්ච උප්පජ්ජති කාය විඤ්ඤාණං

භවඞ්ග- මන-ධම්ම - මනසිකාරෙ පටිච්ච උප්පජ්ජති මනො විඤ්ඤාණනති"

චක්ඛුර් විඤ්ඤාණයාගේ උත්පත්තියෙහි රූප ආලෝක මනස්කාරාදිහු සාධාරණ හේතූහු වෙත්. චක්ඛුස එහි අසාධාරණ හේතුවය.

ශ්‍රෝත්‍ර විඤ්ඤාණයාගේ උත්පත්තියෙහි ශබ්ද-විවරාදිහු සාධාරණ හේතූහු වෙත්. ශ්‍රෝත්‍රය එහි අසාධාරණ හේතුවය. සෙස්ස ද මේසේ මැසි. කියන ලදි. විශුද්ධිමාගී ටිකාවෙහි,

"කාමං රූපාලොක මනසිකාරාදයෝ පී තස්ස විඤ්ඤාණස්ස කාරණං. තෙ පන සාධාරණ කාරණා, චක්ඛු අසාධාරණන්ති, අසාධාරණ කාරණෙනා'යං නිද්දෙසෝ යථා හෙරිසදෙදා යවංකුරෝ කී. තථාහි චක්ඛුපුඝලන්තරා-සාධාරණං. නීලාදි සබ්බරූප සාධාරණත්තා සාමිභාවෙන නිද්දිට්ඨං"

"චක්ඛුඤ්ච ප්‍රතීත්‍ය රූපානි චෝත්පද්‍යන්ත චක්ඛුර් විඤ්ඤානමිති වචනාදුභයාශ්‍රිතතෙ කිමර්ථං චක්ඛුර් විඤ්ඤානමිති ව්‍යපදෙශ ක්‍රියතෙ නරූපවිඤ්ඤාන මිත්‍යාහ යවාංකුරවත් සාධාරණ කාරණෙන ව්‍යපදෙශ ඉති චක්ඛුර්හි චක්ඛුර් විඤ්ඤානස්‍ය සාධාරණ කාරණම්. රූපාභං මනා විඤ්ඤාන-ස්‍යාපි කාරණමිති සාධාරණම්" යනු ඥෙය සපත්ති ටිකාහි.

"චක්ඛුධාතු තාව චක්ඛුවිඤ්ඤාණ ධාතුයා විප්පයුත්ත-පුරෙජාත-අත්ථි-අවිගත-නිස්සයාදීහි පච්චයානං වසෙන ඡහි පච්චයෙහි පච්චයෝ හොති.

රූපධාතු පුරෙජාත-අත්ථි - අවිගතාරම්මණ පච්චයානං වසෙන චතූහි පච්චයෙහි පච්චයෝ හොති.

එවං සොතවිඤ්ඤාණධාතු ආදිනං සොත ධාතු සද්ද ධාතු ආදයෝ පඤ්චන්නං පන නෙසං ආවජ්ජන මනොධාතු-අනන්තර - සමනන්තර - නත්ථි-වීගතානන්තරූප නිස්සය-වසෙන පඤ්චහි පච්චයෙහි පච්චයෝ හොති. තාපි පඤ්චපි සම්පටිච්ඡන මනොධාතුයා, තථා සම්පටිච්ඡන මනොධාතු සන්තීරණ මනෝ විඤ්ඤාණ ධාතුයා, සාව වොට්ඨපන මනෝ විඤ්ඤාණධාතුයා, වොට්ඨපන මනොවිඤ්ඤාණධාතු ව ජවන මනොවිඤ්ඤාණධාතුයා, ජවන මනොවිඤ්ඤාණධාතු පන

අනන්තරාය ජවන මනොවිඤ්ඤාණධාතුයා, නෙති වෙව පඤ්චහි ආසෙවන පච්චයෙන චාති ඡහි පච්චයෙහි පච්චයො හොති. එස තාව පඤ්චවාරෙ නයො.

මනොවාරෙ පන භවඞ්ග මනොවිඤ්ඤාණධාතු ආවජ්ජන මනොවිඤ්ඤාණ ධාතුයා, ආවජ්ජන මනොවිඤ්ඤාණධාතු ච ජවන මනොවිඤ්ඤාණ ධාතුයා, පුරිමෙහි පච්චයො හොති.

ධම්මධාතු පන සත්තන්නම්පි විඤ්ඤාණධාතූනං සහජාත අඤ්ඤ මඤ්ඤ-නිස්සය-සම්පයුත්ත-අත්ථි-අවිගතාදිහි බහුධා පච්චයො හොති.

චක්ඛුධාතු ආදයො පන එකවච්ච ධම්මධාතු එකච්චාය මනොවිඤ්ඤාණධාතුයා ආරම්මණ පච්චයාදිහිපි පච්චයා හොන්ති'' යනු මෙහි ප්‍රත්‍යය විනිශ්චය යි. විසාර විශුද්ධි-මාගීයේ ප්‍රතීත්‍ය සමුත්පාද නිර්දේශයෙන් දක්නේ ය.

හෙතුඵලයන්ගේ විකාරයෙහි ඵලයාගේ විකාරය ද, එහෙන් බැවින් චක්ෂුරාදීන්ගේ විකාරයෙහි චක්ෂුර් විඥානාදීන්ගේ ද, විකාරය වේ.

අසාධාරණත්වාත්.

විපනි:—චක්ෂුර් විඥාන ය චක්ෂුරින්ද්‍රිය හා **සාධාරණ** වේ. ශ්‍රොත්‍ර විඥානය, ශ්‍රොත්‍රෙන්ද්‍රිය හා සාධාරණ වේ. සෙසු ඉන්ද්‍රියයන් සමඟ **අසාධාරණ** වේ. සෙස්ස ද, මෙසේ යි.

තෙර් විඥානං තථොච්යතෙ

විපනි:—චක්ෂුරාදීන්ගේ ආශ්‍රයෙන් ම චක්ෂුර්විඥානාදිහු උපදිත්. මෙසේ විකාර-විකාරී බැවින් ද, අසාධාරණ බැවින් ද, චක්ෂුරාදිහු චක්ෂුර් විඥානාදීන්ගේ ආශ්‍රයයෝ වෙත්.

46 න කායස්‍යාධරං චක්ෂුඃ-ඌර්ධවං රූපං න චක්ෂුෂඃ
විඥානං චාස්‍ය රූපං තු - කායස්‍යෙවෙව සර්වතඃ

භාවය:—චක්ෂුරින්ද්‍රිය ශරීරයට නිම්නභූමික නොවේ. රූපය ද, චක්ෂුසට ඌර්ධවභූමික නොවේ. චක්ෂුර්විඥානයට රූපය ද. කයට රූප-විඥාන දෙක ද, හැම ලෙසින් ම විෂය වේ.

න කායසහ්‍යාධරං චක්ඛුං

විභාවනී— චක්ඛුරින්ද්‍රිය ශරීරයට නිම්නභූමික (=අවර) නොවේ. රූපය ද, චක්ඛුසට උඩර්ධවභූමික නොවේ. විභූමික වූ චක්ඛුර්-විඤ්ඤාණය; කාමාවචර ද, ප්‍රථමධ්‍යාන භූමික ද, වේ. උඩර්ධව-භූමික වූ රූපය ඉතා සියුම් බැවින් අවරභූමික වූ චක්ඛුසට [illegible] වේ. එසේම උඩර්ධවභූමික වූ විඤ්ඤාණය ද, අධරභූමික චක්ඛුසට විෂය නොවේ.

කාමාවචර චක්ඛුසට ප්‍රථමධ්‍යාන භූමික වූ චක්ඛුර් විඤ්ඤා-ණයක් නොවේ. කාමාවචර චක්ඛුර්විඤ්ඤාණයට සවභූමිකවූ ම රූපය ද, ප්‍රථමධ්‍යානභූමික චක්ඛුර්විඤ්ඤාණයට ප්‍රථමධ්‍යාන භූමික චක්ඛුරාශ්‍රිත සවභූමිකවූ ද, අධරභූමික වූ ද, රූපය විෂය වේ චතුර්ථධ්‍යානභූමික චක්ඛුරාශ්‍රිත චක්ඛුර් විඤ්ඤාණයට චතුර්ථධ්‍යාන භූමික රූපය ද, එයින් යට භූමීන්හි සියල්ල ද, විෂය වේ.

කායඝ්‍යාදීනි ච සවීසයානි

විභාවනී:—කායයට රූප විඤ්ඤාණ දෙක හැම අයුරින් ම විෂය වේ. කාමාවචර භූමික කායයට සවභූමික වූ ද, උඩර්ධවභූමික වූ ද, රූප-විඤ්ඤාණ දෙක විෂය වෙත්. ප්‍රථමධ්‍යාන භූමික කායයට ප්‍රථමධ්‍යාන භූමික විඤ්ඤාණය ම විෂය වේ

චිතීයාදී ධ්‍යානභූමික කායයාගේ විඤ්ඤාණය අධර භූමික ම ය. රූපය වනාහි චිතීය-තෘතීය ධ්‍යානභූමික කායයට සවභූමික ද, උඩර්ධවභූමික ද, අධරභූමිකද, වේ. චතුර්ථධ්‍යාන-භූමික කායයාගේ රූපය සව-අධර භූමික ය. එයින් උඩ රූපයක් නැති බැවිනි.

47 තථා ශ්‍රෝත්‍රඝ්‍රාණාංතු-සවිඤ්ඤාණමේව සවභූමිකම්
කාය විඤ්ඤාන මධරං-සඞ්ඛාරාඛ්‍ය නියතං මනඃ

භාවය:—ශ්‍රෝත්‍රය ද, එසේ ය. ඝ්‍රාණ-ජිහ්වා-කාය යන තිදෙනාට විෂය-විඤ්ඤාණ සියල්ල සවභූමික වේ. කාය විඤ්ඤාණය සවභූමික ද, සඞාධර භූමික ද, වේ. මනස අනියතය.

තථා ශ්‍රෝත්‍රං

විභාවනී:—ශ්‍රෝත්‍රෙන්ද්‍රිය ද, චක්ඛුරින්ද්‍රිය මෙන් ශරීරයාගේ අධර-භූමික නොවෙයි. ශ්‍රෝත්‍රෙන්ද්‍රියයෙන් උඩර්ධවභූමික වූ ශබ්ද විඤ්ඤාණයක් නැති. ශ්‍රෝත්‍රවිඤ්ඤාණයාගේ ආශ්‍රයයෙන් ශබ්දය ද, කායාශ්‍රයෙන් ශ්‍රෝත්‍රවිඤ්ඤාණ – ශබ්ද දෙක ද පවති. කායයට අධර භූමික වූ ශ්‍රෝත්‍රයක් නැත.

කාය-ශ්‍රෝත්‍ර-ශබ්දයෝ පඤ්ච භූමිකයෝ වෙත්. කාමාවචරය පටන් චතුර්ථධ්‍යානභූමිය අවසන් කොට ඇත්තාහු ද වෙත්. ත්‍රිභූමික වූ ශ්‍රෝත්‍ර විඥානය කාමාවචර ද, ප්‍රථමධ්‍යාන භූමික ද, වේ. කාය යම් භූමියක වේ ද, ඒ භූමිය පිළිබඳ වූ ද, එයින් උඩිවභූමිකවූ ද, ශ්‍රෝත්‍රය වෙයි. ඉන් අධර භූමික නොවේ. යම් භූමියක ශ්‍රෝත්‍රයක් වේ ද, ඒ භූමිය පිළිබඳ වූ ද, ඉන් අධර භූමික වූ ද, ශබ්දය එයට විෂය වේ උඩිව ශබ්දය විෂය නොවේ. **උඩිවභූමක ශබ්දයක් අධර භූමික ශ්‍රෝත්‍රයකින් කිසි දවසක අසිය නොහැක.**

විඥානය ද, ශබ්දය මෙන් ශ්‍රෝත්‍රයට උඩිව නොවේ. ශ්‍රෝත්‍ර විඥානයට ශබ්දය ද, කායයට ශ්‍රෝත්‍ර විඥාන ශබ්ද දෙක ම ද, සවිප්‍රකාරයෙන් විෂය වෙත්.

ත්‍රයාණාංතු සවිඤ්ඤාණමේව සභූමිකම්.

විපත්තිඃ—ඝ්‍රාණ - ජිහ්වා - කාය යන ඉන්ද්‍රියයන්ගේ විෂයයෝ ද, විඥානයෝ ද, **සභූමික වූවාහු ම වෙත්.**

කාය විඤ්ඤාණං අධරං සමං චාපි

විපත්තිඃ—කාය විඥානය සභූමික ද, සාධර භූමික ද, වේ. උඩිව භූමික නොවේ.

අනියතාං මනඃ

කායයාගේ අධරභූමික වූ චක්ෂු හෝ ශ්‍රෝත්‍රයක් නැතැයි නියමය ඇත ද, මනස පිළිබඳව එබඳු නියමයක් නැති.

48 පංචවාහ්‍යා විවිඤ්ඤාඃ-නිත්‍යා ධර්‍මා අසංස්කෘතාඃ
ධර්‍මාදර්‍ශේන්ද්‍රියං යෙ ච-මාදර්‍ශාධ්‍යාත්මිකාඃ සම්මතාඃ

කාරිකාඃ—පංචබාහ්‍ය ධාතූහු විවිඤ්ඤය වෙති. අසංස්කෘත ධර්මයෝ නිත්‍ය වෙති. ධර්මධාතුවෙන් අර්ථයක් ද, ජීවිතෙන්ද්‍රිය ද, පංච වේදනෙන්ද්‍රියයෝ ද, ශ්‍රද්ධාදි පංචෙන්ද්‍රියයෝ ද යන දෙළස ආධ්‍යාත්මික ධාතූහු යයි දන්නා ලදහ.

පංචවාහ්‍යා විවිඤ්ඤාඃ

විපත්තිඃ—ධර්මධාතුව හැර රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ යන පංච බාහ්‍ය ධාතූහු චක්ෂු ශ්‍රෝත්‍රාදීන් කෙරෙන් දැකීම් ආදී දැනීම් ඇතිකරන්. එබැවින් විවිඤ්ඤාඃ වේති.

නිත්‍යා ධර්මා අසංස්කෘතා:

විප්පනි:—නිර්වාණය, ප්‍රතිසංඛ්‍යානිරෝධය, සහ අප්‍රතිසංඛ්‍යා නිරෝධය ද, අසංස්කෘත ධර්මයෝ වෙති. එබැවින් නිත්‍යය. (54 වැනි පිටුව බලනු.)

ධර්මාදර්ශං ඉන්ද්‍රියං

විප්පනි:—"බාවිසතින්ද්‍රියානි චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝාණින්ද්‍රියං ජිවහින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සඞ්ඛින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං අනඤ්ඤාතංඤස්සාමිතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං" යනු විභඞ්ග පාළියෙහි වදාළ බැවින් චක්ෂුරින්ද්‍රිය පටන් ආඥාතාවින්ද්‍රිය කෙළවර කොට ඉන්ද්‍රියයෝ දෙවිස්සක් වෙත්.

මෙයින් ජීවිතෙන්ද්‍රිය ද, සුඛාදි පංච වෙදනෙන්ද්‍රියයෝද, ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය පංචකය ද, ආඥාතමාස්‍යාමීන්ද්‍රිය, ආඥින්ද්‍රිය, ආඥාතාවින්ද්‍රිය' යන ඉන්ද්‍රියයන් ගේ එක්භාගයක් දැයි මේ දොළස ධර්මධාතුවෙහි එක් භාගයෙක්හි ලා ගණිනු ලැබේ.

(73 වැනි පිටුව බලනු.)

ගෙ ච ද්වාදශාධ්‍යාතමිකා

විප්පනි:—චක්ෂුරාදි ඉන්ද්‍රිය පංචකය ද, විඥානෙන්ද්‍රිය පංචකය ද, මනින්ද්‍රිය ද, ආඥාතමාස්‍යාමීන්ද්‍රිය, ආඥින්ද්‍රිය, ආඥාතාවින්ද්‍රියයන්ගේ එක් භාගයක්ද, යන දොළස ආධ්‍යාතමික ධාතුහු නම් වෙත්.

ධාතුනිදේශය නිමි.

(ප්‍රථම කොශස්ථානය සමාප්තයි.)

පරමාර්ථ රත්නාවලි

ව්‍යාඛ්‍යා සහිත

අභිධර්ම කෝශයෙහි

ඉන්ද්‍රිය නිර්දේශ නම් වූ

විනීය කෝශස්ථානය.

විතීය කොශසථානය

——//——

ඉන්ද්‍රිය නිද්දේශය.

1 චතුන්නිවඤ්ඤිසු පංචන්නං-ආධිපච්චං වසයා කිල
චතුන්නීණං පංචන්නඤ්ච-සංකෙලෙස වෝදනාවසයා

භාවය:—චක්ඛුරාදි පංචෙන්ද්‍රියයන් ගේ ආධිපත්‍යය අටී සතරක වේ. මනස් ආදි චතුරින්ද්‍රියයන් ගේ ආධිපත්‍යය අටී දෙකක වේ. පංච වේදනෙන්ද්‍රියයන් ගේ ආධිපත්‍යය සංකෙලෙසයෙහි වේ. අවශෙෂ අෂ්ටෙන්ද්‍රියයන් ගේ ආධිපත්‍යය පරිශොධන යෙහි වේ.

චතුන්නිවඤ්ඤිසු පංචන්නාධිපච්චං

විපසනි: — 1 ආත්මභාව ශොභා 2 පරිරක්ෂණ 3 විඥාන 4 අසාධාරණ කාරණය යන අර්ථ සතරෙහි චක්ඛු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ ජිහ්වා-කාය යන පංචෙන්ද්‍රියයන් ගේ ආධිපත්‍යය වේ. මේ වෛභාෂික මතය යි.

මෙහි ආධිපත්‍ය නම්,

"ඉන්ද්‍රිය ප්‍රත්‍යය භාවය යි. ස්ත්‍රීන්ද්‍රිය පුරුෂෙන්ද්‍රියයන්ගේ ඉන්ද්‍රිය ප්‍රත්‍යය භාවය ගැන ද, තමන් තමන් ගේ ප්‍රත්‍යය වශයෙන් ප්‍රවර්තමාන වූ තත් සහිත සන්තානයෙහි අන්‍යාකාරයෙන් අප්‍රවර්තමාන ලිඛාදීන් විසින් අනුවර්තිනිය බව ආධිපත්‍යය නම් වේ" යනුද, "ආධිපත්‍යය නම් ඒකාධිපත්‍ය භාව ය යි මෙය කියන ලද්දේම වෙයි ඒ ආධිපත්‍යය, තම තමා ගේ කෘත්‍යයෙහිදු ඵලයෙහිදු වෙයි" යනු ද, විශුද්ධිමාර්ග සන්නයි.

"ඉස්සරියං පරමිස්සරියං කරොන්තීවෙව ඉන්ද්‍රියානි" යනුවෙන් ඉන්ද්‍රියයන් ගේ ආධිපත්‍යය ස්ථවිරවාදයෙහිද ඵහන්වයි.

චක්ඛුන්නිවඤ්ඤිසු පංචන්නං

විසඤ්ඤි:—චක්ඛු-පුරුෂ-ස්ත්‍රී-ජීවිත යන ඉන්ද්‍රිය සතර අර්ථක්‍රියෙක්හි, ආධිපත්‍යය දරයි. එනම්;

ස්ත්‍රීන්ද්‍රිය සහ පුරුෂෙන්ද්‍රිය:

සත්ත්වභෙද, (ලිඞ්ග භෙද) සත්ත්වවිකල්ප භෙද (ආකෘති භෙද) යන අර්ථවයෙහි ද,

ජීවිතෙන්ද්‍රිය; උත්පත්ති, සංධාරණය යන අර්ථවයෙහි ද

මනස්කර්මය: පනාහිව සම්බන්ධ, වශිභාවානුවර්තන යන අර්ථවයෙහි ද, අධිපති වේ.

සංඛ්‍යා'ඛ්‍යාතානාං සංඝකලාප ව්‍යවදානාර්ථඃ

විපත්ති:—සුඛ – දුඃඛ – සෞමනස්‍ය – දෞර්මනස්‍ය – උපෙක්ෂා යන පඤ්චේන්ද්‍රියයෝ සංඝකලාපයෙහි ආධිපත්‍යය කරත්.

ශ්‍රද්ධා–වීර්‍ය– සමෘති – සමාධි– ප්‍රඥා – ආඥාතමාඥාස්‍යාමීන්ද්‍රිය ආඥේන්ද්‍රිය–ආඥාතාවීන්ද්‍රිය යන අෂ්ටේන්ද්‍රියයෝ පරිශෝධනා–යෙහි ආධිපත්‍යය කරත්. මේ ඉන්ද්‍රියයන්ගේ ආධිපත්‍යය ලක්ෂණයි.

"මෙහි චක්ෂුරාදි පස් දෙන දර්ශනාදිභෙද වූ සඛකිය සඛකිය විඥානයෙහි ආධිපත්‍යය කරන හෙයින් ඉන්ද්‍රිය නම් වේ. සත්‍රී පුරුෂ ලිඞ්ගාදි භෙදයෙහි ඒඛ්‍යකීය කරන හෙයින් සත්‍රීන්ද්‍රිය පුරුෂෙන්ද්‍රිය නම් වෙත්. ජීවිතය සහජාත රූපා රූප ධර්මානුපාලනයෙහි ආධිපත්‍යය කරන හෙයින් ඉන්ද්‍රිය නම් වේ. මනස සම්ප්‍රයුක්ත ධර්මයන් කෙරෙහි ඒඛ්‍යකීය කරන හෙයින් ඉන්ද්‍රිය නම් වේ වේදනා පඤ්චකය සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ උපබ්‍රූහන මලාවිකරණාදියෙහි ඒඛ්‍යකීය කරන හෙයින් ඉන්ද්‍රිය නම් වේ. ශ්‍රද්ධාදි පඤ්චකය සද්දහනාදිවූ කෘත්‍ය වශයෙන් සහජාත ධර්මයන් කෙරෙහි ඒඛ්‍යකීය කරන හෙයින් ඉන්ද්‍රිය නම් වේ. අවශෙෂ ඉන්ද්‍රියත්‍රිකය ලොකොත්තර ප්‍රඥා කෘත්‍ය වශයෙන් කියන ලදි" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ව්‍යාඛ්‍යායි.[11]

2 සබ සඞ්ඛාරෙඛ්වාපලබ්ධා-ධිපත්‍යාදින්ද්‍රියාණි ඉච්චි සත්‍රීතෙව පුංසෙච්චාධිපත්‍යාත්-කායාත් හි පුරුෂෙන්ද්‍රියෙ

භාවය:—සඛකිය විෂයයන්ගේ උපලබ්ධිය ඇති කල්හි අධිපති වන හෙයින් මේ ඡවිතය ඉන්ද්‍රියයෝ නම් වෙත්. කායෙන්ද්‍රිය–යෙන් භින්නවූ පුං–සත්‍රී ඉන්ද්‍රියයන්ගේ ව්‍යවස්ථාපනාධිකාරය වේ එහෙයින් ඔවුන් (පුංසත්‍රී ඉන්ද්‍රියයන්) ගේ පෘථග්භූ–යත්වය වේ.

සබ්බසද්ධාදිඉන්ද්‍රියසලක්ඛණාදිකථා

විපත්ති:— සවකීය විෂයයන්ගේ උපලබ්ධිය ඇති කල්හිම චක්ෂුරා-දින්ගේ ආධිපත්‍යය වේ. මනුෂ්‍ය වූ කලි **සද්ධේන්ද්‍රියාදීන්ගේ ද, සතිඉන්ද්‍රියාදීන්ගේ ද,** නෙවත් ධර්ම ලක්ඛණාදීන්ගේ සහ රූප-ශබ්ද ලක්ඛණාදීන්ගේ උපලබ්ධිය ඇති කල්හි අධිපති වේ. මෙසේ අධිපති ලක්ෂණයෙන් යුක්තවූ බැවින් මොවුහු ඉන්ද්‍රියයෝ නම් වෙත්. දක්වන ලද මෑයි. විභාවිනී අට්ඨකථාහි,

"අධිපච්චසඞ්ඛාතෙන ඉස්සරියට්ඨෙනාපි එතානි ඉන්ද්‍රි-යානි, චක්ඛු විඤ්ඤාණාදිප්පවත්තියං හි චක්ඛාදීනං සිද්ධි-මාධිපච්චං, තස්මිං හි තික්ඛේ තික්ඛත්තා මන්දේ ච මන්ද-ත්තානි"

"චක්ෂුරින්ද්‍රියයා ගේ රූපාභිජානන යොග්‍යතා සංඛ්‍යාත රූපාවභාසන සාමර්ථ්‍යය නැති කල්හි කිසි කලෙක චක්ෂුර්-විඤ්ඤාණය හට දෙන කෘත්‍ය සම්භවය නො වේ. ශ්‍රොත්‍රේන්ද්‍රි-යාදියෙහිදු මෙම නය යි. මනින්ද්‍රියයාගේ සම්ප්‍රයුක්තයනට පූර්ඛගමභාවයෙන් වශවර්තනය වෙයි. තෙමේ අනුන් වශයෙහි නො පවති. තත් සම්ප්‍රයුක්තයන් වූ ඉන්ද්‍රියයෝ චෛතසික භාවයෙන් තත් වශයට ද තමන් තමන්ගේ ඉන්ද්‍රිය කෘත්‍යය සාධති. ඔවුන්ගේ වශයෙහි මනින්ද්‍රිය නො පවත්නේයි. "මේ වනාහි මනින්ද්‍රියයාගේ පූර්ඛගමතා නම් හැම තැන ම ඉන්ද්‍රිය පච්චය භාවන සාධෙ තබබං" යන අධිකාරය වැටෙයි දතයුතුයි" යනු විශුද්ධිමාර්ගී සන්නයි.

ඉන්ද්‍රියාණි

විපත්ති:—"කෝ පන නෙසං ඉන්ද්‍රියට්ඨෝ නාමාති ඉන්‍දලිඞ්ග-ට්ඨෝ ඉන්ද්‍රියට්ඨෝ ඉන්‍දදෙසිතට්ඨෝ ඉන්‍දට්ඨෝ ඉන්‍දදිට්ඨට්ඨෝ ඉන්ද්‍රියට්ඨෝ ඉන්‍දසිට්ඨට්ඨෝ ඉන්ද්‍රියට්ඨෝ ඉන්‍දජුට්ඨට්ඨෝ ඉන්ද්‍රියට්ඨෝ, සෝ සබ්බෝපි ඉධ යථායොගං යුජ්ජති. භග-වාහි සම්මා සම්බුද්ධෝ පරමිස්සරිය භාවතෝ ඉත්‍ථේ, කුසලා කුසලඤ්ච කම්මං කත්‍වෙමපුඤ්ඤසව් ඉස්සරියාභාවතෝ, තතෝ වෙත්‍ථ කම්මසඤ්ඤිතානි තාව ඉන්ද්‍රියානි කුසලාකුසල කම්මං උල්ලඞ්ඝන්ති තෙන ව සිට්ඨා නිති ඉන්‍දලිඞ්ගට්ඨෙන ඉන්‍ද-සිට්ඨට්ඨ න ව ඉන්ද්‍රියානි සබ්බා නෙව පඤ්ඤානි භගවතා යථාභූතතෝ පකාසිතානි අසිස්සබුද්ධානිවානි ඉන්‍ද දෙසි-තට්ඨෙන ඉන්‍දදිට්ඨට්ඨන ව ඉන්ද්‍රියානි තෙනෙව භගවතා,

මුනීන්ද්‍රේන කාරණේ ගොවරා සෙවනාය කාරණේ භාවනා සෙවනාය සෙවිතාරහීති ඉන්ද්‍රියට්ඨෙයෙනා පි ඉන්ද්‍රියානි අපි ච ආධිපච්ච ඝංඛාතෙන ඉස්සරියට්ඨෙනා පි එතානි ඉන්ද්‍රියානි වඤ්ඤු විඤ්ඤූණාදිප්පවත්තියං හි චක්ඛාදිනං සිද්ධං ආධිපච්චං තස්මිංතිකෙඛ තිකඛාණා. මඤ්ඤ මඤ්ඤතා නි'යනු විශුද්ධිම. ගීයි.

සත්‍රීත්ව පුංභාවත්ව වාධිපත්‍යාත්-කායාත් ස්ත්‍රී පුරුෂේන්ද්‍රියේ.

ස්ත්‍රීපුරුෂේන්ද්‍රියානි:—කායෙන්ද්‍රියයෙන් සිද්ධවූ සත්‍රීන්ද්‍රිය-පුරුෂෙන්ද්‍රියයෝ සත්‍රීත්වයෙහි සහ පුරුෂත්වයෙහි ද, අධිපති වෙති එබැවින් ඔවුන්ගේ පෘථග්ඉන්ද්‍රියත්වය වේ.

"ඉත්ථීනාමෙව ඉඤ්ජනං කාරෙතීති ඉත්ථින්ද්‍රියං, පුරිස භාවෙ ඉඤ්ජනං කාරෙතීති පුරිසින්ද්‍රියං" යනු බැවින් සත්‍රී පුරුෂ ලිඞ්ගාදි භෙදාගයන් ඵෙශවසී කරන හෙයින් සත්‍රීන්ද්‍රිය පුරුෂෙන්ද්‍රිය නාම්

"සත්‍රීන්ද්‍රිය පුරුෂෙන්ද්‍රියන්ගේ ඉන්ද්‍රිය ප්‍රත්‍යය භාවය ගැන ද, තමන් තමන්ගේ ප්‍රත්‍යය විශයෙන් ප්‍රවර්තමාන වූ තන් සන්තාන යෙහි අන්‍යාකාරයෙන් අප්‍රවර්තමාන ලිඞ්ගාදීන් දිසින් අත්‍යුත්කර්ෂය බව ආධිපත්‍ය නම් වේ. මේ අර්ථයෙහි **"ඉන්ද්‍රියානි පරමිස්සරියං කරොන්තීතිවච්ච ඉන්ද්‍රියානි"** යි ගන්නේ" යනු විශුද්ධි මාගී සන්නයි.

"තත්ථ කතමං ඉත්ථින්ද්‍රියං? යං ඉත්ථියා ඉත්ථිලිඞ්ගං, ඉත්ථි නිමිත්තං ඉත්ථි කුත්තං ඉත්ථාකප්පෝ ඉත්ථත්තං ඉත්ථි භාවෝ ඉදං වුච්චති ඉත්ථින්ද්‍රියං"

"තත්ථ කතමං පුරිසින්ද්‍රියං? යං පුරිසස්ස පුරිසලිඞ්ගං පුරිස නිමිත්තං පුරිසකුත්තං පුරිසාකප්පෝ පුරිසත්තං පුරිස භාවෝ ඉදං වුච්චති පුරිසින්ද්‍රියං" යනු විභඞ්ග පාළියි.

"ඉත්ථින්ද්‍රිය භාවේ මෝ තොමෝ සත්‍රීය යි දූනගන්නා ඤාණය හටගැණීමට හා ඉත්ථියා ශබ්දය හටගැණීමට ද හෙතු භාවය ලක්ෂණ කොට ඇත්තේය. මෝ තොමෝ සත්‍රීය යි ප්‍රකාශ කිරීම කෘත්‍ය කොට ඇත්තේ ය. සත්‍රී ලිඞ්ගය සත්‍රී නිමිත්තය සත්‍රී කෘත්‍යය සත්‍රී වෙශය යන මොවුන්ගේ හෙතු භාවයෙන් නුවණට අසුවූවාට වැටහෙන්—හේය මේ ශබ්ද ප්‍රවාහයන් නිමිත්ත වූ සත්‍රී භාවය කරණ කොට ගෙන සත්‍රීය සහ ඇඹුය හා මෙම් තොමෝ සත්‍රීය යි දූනගෙනයා ඤාණය ද හටගැණීමට හෙතු බැවින් සත්‍රීභාව

නම. සත්‍රින්ගේ අඞ්ගජාතය සත්‍රි ලිඞ්ග නම. සත්‍රින්ගේ කථාකිරීම් ආදියෙහි අව්‍යක්ත ශබ්දය හා ලිහිල් වූ අභිප්‍රාය ද සත්‍රි නිමිත්ත නම. සත්‍රින්ගේ අවිසද වූ යාම් ඊම් ඉදිම් සිටීම් ආදිය සත්‍රි කෘත්‍ය නම. සත්‍රින්ගේ අධඃ කාය විසද බව ය, ඌර්ධවකාය අවිසද බව ය, හස්ත පාද මුඛාදි අවයව යන්ගේ කුඩා බැව් සිහින් බැව් ආදිය සත්‍රි ආකල්ප නම. කුමක් හෙයින් කාරණ භාවය ප්‍රත්‍යුපස්ථානය යි කියේද යත්? ඒ සත්‍රි ලිඞ්ගාදිහු තුමූ කර්මාදි වූ තමන් තමන්ගේ ප්‍රත්‍යයෙන් හටගන්නාහු නොවෙද්ද යත්? එසේ උපදනා හු නමුදු සත්‍රිභාව සහිත වූ සන්තානයෙහි ම ඒ ඒ ආකාර-යෙන් උපදනා හෙයින් සත්‍රීන්ද්‍රිය ඔවුන්ට කාරණ වන හෙයින් සත්‍රි ලිඞ්ග සත්‍රි නිමිත්ත සත්‍රි කෘත්‍ය සත්‍රි ආකල්ප යන්ගේ හෙතු භාවය ප්‍රත්‍යුපස්ථානය හෙවත් ඵලය යි කියන ලදි. එසේ වූයේ නමුදු කුමක් හෙයින් ඉන්ද්‍රිය භාවය වදාළසේක්ද යත්? ජීවිතෙන්ද්‍රියාදින් මෙන් භාව දශකයෙහි හටගන්නාවූ රූපය අන්‍ය කලාපයෙහි හටගන්නාවූ රූප-යන්ට උපකාර වශයෙන් වදාළ සේක්ද යත්? සත්‍රි ලිඞ්ගාදින් කෙරෙහි ම කාරණ භාව සංඛ්‍යාත වූ අධිපති භාවයෙන් ඒ සත්‍රි භාවයාගේ ඉන්ද්‍රිය භාවය කියන ලද්දීය. ඉන්ද්‍රිය සහිත සන්තානයෙහි සත්‍රි ලිඞ්ගාදි ආකාරවත් වූ රූප ප්‍රත්‍යයන් අතික් ආකාරයකින් නුපදනා හෙයින් ද, සත්‍රි ග්‍රහණයට ඒ රූපයන්ගේ ප්‍රත්‍යය භාවයෙන් දැ යි මෙසේ ඉන්ද්‍රිය භාවය වදාළේ නමුදු කුමක් හෙයින් ප්‍රස්ථාන ප්‍රකරණයෙහි ඉන්ද්‍රියාදි ප්‍රත්‍යය භාවය නොවදාළ සේක් ද යත්?

යම් හෙයකින් වනාහි භාවදශකයෙහි වූ සත්‍රීන්ද්‍රිය ය රූපයන් උපදවන්නේත් නො වේද? රූපයන් පාලනය කරන්නේත් නොවේ ද? උපස්තම්භක වන්නේත් නොවේ ද? අන්‍ය කලාපගත රූපයන්ගේත් ජනක අනුපාලක උපස්ත-ම්භකයත් නොවේද? එසේ හෙයින් ස්වකීය කලාප ගත රූපයන්ට ජීවිතෙන්ද්‍රිය මෙන් ද, අන්‍ය කලාපගත රූපයන්ට ආහාරය මෙන් ද, ඉන්ද්‍රිය අස්ති අවිගත ප්‍රත්‍යය වන්නේය යි පාලියෙහි නො වදාරණ ලද්දේයි.

පුරිසෙන්ද්‍රිය තෙමේ මෙතෙම වනාහි පුරුෂයා ය යි දැනගන්නා ඥාණය හා පුරිස ශබ්දය ද, හටගැණීමට කාරණවන බව ලක්ෂණ කොට ඇත්තේයි. මෙතෙම වනාහි පුරුෂයා ය යි ප්‍රකාශ කිරීම කෘත්‍ය කොට ඇත්තේ යි. පුරුෂ

ලිඛනය පුරුෂ නිමිත්තකය පුරුෂ කෘත්‍යය පුරුෂ වෙශය යන මොවුන්ගේ කාරණ භාවය හුවණට අසිමුඛව වැටහෙන්නේයි මෙසේ ලක්ෂණාදිය ප්‍රකාශ කොට ඒ ඉන්ද්‍රියයන් දෙදෙනාගේ පිහිටීමට ආධාරස්ථාන වන් බව පහළ කටැවිව නොහොත් යම් ආ.යී කෙනෙක් තුමූ භාව රූපය ශරීරයා ගේ එක් ප්‍රදෙශයෙක පිහිටියේ යයි කීවාහු ද, ඒ ආචාරී වරයන් මගේ ඒ විවිධාන පිළිගැනීම ප්‍රකාශ කරනු පිණිස "තදුභයම්පි" යනාදිය කිහු (**තදුභයම්පි කායපසාදෙ චිය සකල සරීරං ඛ්‍යාපෙති මෙව**) ඒ සත්‍රීන්ද්‍රිය පුරුෂෙන්ද්‍රිය දෙදෙන වහාගි කාය ප්‍රසාදය හා මිශ්‍ර නොවන්නේ දැයි යන සැකය වළක්වනු පිණිස "නව කායපසාදෙන" යනු කීහ. (**නව කායපසාදෙන සිතොකාසෙ සිතන්ති වා අසිතොකාසෙ සිතන්තිවාති වත්තබ්බතං ආපජ්ජති**) ය්නු විශුද්ධිමාගී සන්නයි.

3. නිකාය සණ්ඨි සංකිලෙස-ව්‍යවදානාධිපත්‍යතඃ
ජීවිතං විතති ශ්‍රද්ධාදි-පඤ්චකෙන්ද්‍රියතා මතාඃ

භාවය:—ශරීරයාගේ සණ්ඨිය ඇති කල්හි ජීවිතෙන්ද්‍රියයාගේ ද, සංකිලෙශය ඇති කල්හි සුඛාදි පංච වෙදනෙන්ද්‍රියයන්ගේ ද, මල පරිශොධනයෙහි ශ්‍රද්ධාදි පංචෙන්ද්‍රියයන් ගේද, අධිපති භාවය දන්නා ලදහ.

නිකාය

විපති:— මෙහි "නිකාය" ශබ්දය ශරීරවාචිය.

ජීවිතං

විපති:—සහජ රූපානු පාලන ලක්ඛණං ජීවිතින්ද්‍රිය, තෙසං පවත්තන රසං, තෙසඤ්ඤෙව ඨපන පච්චුපට්ඨානං යාපයිතබ්බ භූත පදට්ඨානං, සඞ්ඛෙපතො පි ච අනුපාලන ලක්ඛණාදිමහි විධාතෙ අත්ථිකඛණෙයෙව තං සහජරූපානි අනුපාලෙති. උදකං විය උපලාදීනි යථාසකං පච්චයුපපන්නෙපි ච ධම්මෙ පාලෙති. ධාති විය කුමාරං. සයං පවත්තිත ධම්මසම්බන්ධෙනෙව පවත්තති; නියාමකො විය. න භඞ්ගතො උඩ්ඩං පවත්තති, අත්තනතො ච පවත්තයිතබ්බානං ච අභාවා න භඞ්ගක්ඛණෙ ඨපෙති සයං භිජ්ජමානා ඤා. ඛියමානො විය වට්ටිතෙලහොදිපසිඛං නව අනුපාලන-පුවත්තන-ඨපනානු භාව විරහිතං යථා වුත්තක්ඛණෙ තස්ස තස්ස සාධනතො ති දට්ඨබ්බං" යනු විශුද්ධිමාගීයි.

රූපි-අරූපි (=නාම) භෙදයෙන් ජීවිතින්ද්‍රිය දෙවැදෑරුම් වේ. වදාරන ලද්දේ මැයි. විභඞ්ග පාළියෙහි;

"තත්‍ථ කතමං ජීවිතින්ද්‍රියං? ජීවිතින්ද්‍රියං දුවිධෙන අත්‍ථි රූපං ජීවිතින්ද්‍රියං අත්‍ථි අරූප ජීවිතින්ද්‍රියං, තත්‍ථ කතමං රූප ජීවිතින්ද්‍රියං? යො තෙසං රූපිනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං ඉදං වුච්චති රූප ජීවිතින්ද්‍රියං.

තත්‍ථ කතමං අරූප ජීවිතින්ද්‍රියං? යො තෙසං අරූපිනං ධම්මානං ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං ඉදං වුච්චති අරූප ජීවිතින්ද්‍රියං. ඉදං වුච්චති ජීවිතින්ද්‍රියං"

"මේ ජීවිතෙන්ද්‍රිය රූප තෙමේ හාත්පසින් කර්ම්ජ රූපයන් ආරක්ෂා කිරීම ලක්ෂණ කොට ඇති හෙයින් කර්ම්ජ රූපයෝ තුමූ ජීවිතෙන්ද්‍රිය කරණකොට ගෙන ජීවත් වන්නාහු ය. පවත්නාහු ය. ඒ කර්ම්ජ රූපයන් හාත්පසින් ආරක්ෂා කිරීමෙහි ද, ඊශ්වර භාවයෙන් යුක්තවෙයි. ඒ විප්‍රකාර ශක්තියෙන් ජීවිතෙන්ද්‍රිය නම් වෙයි; කී නියායි. ඊට උපමා කවරයත්?

පියුම් දණ්ඩෙහි සිදුරු තුළ පිහිටියාවූ ජලය පදමපුෂ්පය වියලිය නොදී ආරක්ෂා කරන්නාක් මෙත් කර්ම්ජ රූපයන්ගේ එකුන්පණස් කුඩා චිත්තක්ෂණ කාලයක් මුළුල්ලෙහි පවත්නා නියායෙන් ආරක්ෂා කරන්නේයි. පෘථිවීශ්වර වූ රජතෙමේ රටවැස්සන් තමාගේ ඊශ්වර භාවය හෙතුකොට ගෙණ ආරක්ෂා කරන්නාක් මෙන් ජීවිතෙන්ද්‍රිය තෙමේ කර්ම්ජ රූපයන්ට තමාගේ ඊශ්වර භාවය කරන හෙයින් කර්ම්ජ රූපයෝද, ඒ ඊශ්වර භාවය කරන්නාහු කර්ම්ජ රූපයන් ආරක්ෂා කිරීමෙහි ඊශ්වර වූයේය යි කියති.

ඒ ජීවිතෙන්ද්‍රිය තෙමේ අනුභව කරන්නාවූ ද, කඩා කන්නාවූ ද, ලෝනාවූ ද, බොන්නාවූ ද, ආහාරය පැස වන්නාවූ ජඨරාග්නි සංඛ්‍යාත වූ තොජෝ ධාතුව හා සමග කෙශාග්‍ර ලොමාග්‍ර නඛාග්‍ර ශ්‍රෂ්ක වර්ෂයන් හැර අවශිෂ්ට වූ සියලු කර්ම්ජ ශරීරයෙහි පැතිර පවත්තේ ය" යනු විශුද්ධිමාර්ග භාව සන්නයි.

විභාති

විෂ්ෂනි:—සුඛ - දුඃඛ - සෞමනස්‍ය - උපෙක්ෂා, යන වෙදනෙන්ද්‍රිය පඤ්චකය.

සත්ත්ව සංඛ්‍යාත වූ ධර්මපුඤ්ජය ප්‍රබන්ධ වශයෙන් පවත්නේ මේ වෙදනෙන්ද්‍රියයන් නිසා කිලුටු වන්නේය. එසේ ඔවුන්ගේ සංක්ලේශය ඇති කල්හි සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ උපබ්‍රැහන-මලාවිකරණාදියෙහි අධිපති බැවින් සුඛාදීහු ඉන්ද්‍රියයෝ නම් වෙත්.

"තත්ථ කතමං සුඛින්ද්‍රියං? යං කායිකං සාතං කායිකං සුඛං කායසම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං කායසම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං වුච්චති සුඛින්ද්‍රියං.

තත්ථ කතමං දුක්ඛින්ද්‍රියං? යං කායිකං අසාතං කායිකං දුක්ඛං කාය සම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං කාය සම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා ඉදං වුච්චති දුක්ඛින්ද්‍රියං.

තත්ථ කතමං සොමනස්සින්ද්‍රියං? යං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතො සම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතොසම්ඵස්සජා සාතා සුඛා වෙදනා ඉදං වුච්චති සොමනස්සින්ද්‍රියං.

තත්ථ කතමං දොමනස්සින්ද්‍රියං? යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං චෙතො සම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං චෙතො සම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා ඉදං වුච්චති දොමනස්සින්ද්‍රියං.

තත්ථ කතමං උපෙක්ඛින්ද්‍රියං? යං චෙතසිකං නෙව සාතං නාසාතං චෙතො සම්ඵස්සජං අදුක්ඛ මසුඛං වෙදයිතං චෙතො සම්ඵස්සජා අදුක්ඛ මසුඛා වෙදනා ඉදං වුච්චති උපෙක්ඛින්ද්‍රියං."

යනු විභඞ්ග පාළියි.

ශ්‍රද්ධාදි

විෂ්ෂනි:— ශ්‍රද්ධා - වීර්ය - සමෘති - සමාධි - ප්‍රඥා - යන ඉන්ද්‍රිය පඤ්චකය.

සද්දහනාදි වූ කෘත්‍ය වශයෙන් සහජාත ධර්මයන් කෙරෙහි ඒශ්වර්‍ය කරන හෙයින් ශ්‍රද්ධාදිහු ඉන්ද්‍රියයෝ නම් වෙත්. අශ්‍රද්ධාදි ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩ පැවැත්වීම ද, සම්ප්‍රයුක්ත ධර්මයන් ප්‍රඤ්ඤා-ප්‍රඥාඛින-උපඤ්ඤා-සමාධින-දර්ශනාකාරාදියෙහි පැමිණවීම ද, කෘත්‍ය වන්නේහි වේදනෙන්ද්‍රියයන්ගෙන් කුලිඟට වූ නෝ වංචල වූ සිත ශ්‍රද්ධෙන්ද්‍රියාදීන් ව්‍යවදාපනය වේ නුයි වේදනෙන්ද්‍රියයන්ට අනතුරුව දෙසනා කරන ලදි.

"තත්ථ කතමං සද්ධින්ද්‍රියං? යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදෙ සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං ඉදං වුච්චති සද්ධින්ද්‍රියං

තත්ථ කතමං විරියින්ද්‍රියං? යෝ චෙතසිකෝ විරියාරම්භෝ නික්කමෝ පරක්කමෝ උය්‍යාමෝ වායාමෝ උස්සාහෝ උස්සොළ්හි ථාමෝ යිනි අසිථිල පරක්කමතා අනික්ඛිත්ත ඡන්දතා අනික්ඛිත්ත ධුරතා ධුරසම්පග්ගාහෝ විරියං විරියින්ද්‍රියං විරියබලං ඉදං වුච්චති විරියින්ද්‍රියං.

තත්ථ කතමං සතින්ද්‍රියං? යා සති අනුස්සති පටිස්සති සතිසරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති ඉදං වුච්චති සතින්ද්‍රියං

තත්ථ කතමං සමාධින්ද්‍රියං? යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරෝ අවික්ඛෙපෝ අවිසාහට මානසතා සමථෝ සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි ඉදං වුච්චති සමාධින්ද්‍රියං.

තත්ථ කතමං පඤ්ඤින්ද්‍රියං? යා පඤ්ඤා පජානනා විචයෝ පවිචයෝ ධම්මවිචයෝ සල්ලක්ඛණං උපලක්ඛණං පච්චුපලක්ඛණං පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤ පතොදෙ පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤා සත්ථං පඤ්ඤාපාසාදෙ පඤ්ඤා ආලොකෝ පඤ්ඤාඔභාසෝ පඤ්ඤා පජ්ජොතෝ පඤ්ඤාරතනං අමොහෝ ධම්මවිචයෝ සම්මාදිට්ඨි ඉදං වුච්චති පඤ්ඤින්ද්‍රියං"

යනු විභඞ්ග පාළියි.

4 නිබ්බාණදායකඤාණාභාව-ප්‍රකාශනෝ'ඩම්බර සුත්තං

අකාලඤ්ඤූ මාඤ්ඤ්‍යාම්‍ය-'ඤ්ඤාබ්‍රාහ්මණාදීන් ච

ඇවිස:- අඤ්ඤාතාවින්ද්‍රිය, ආඤ්ඤින්ද්‍රිය, සහ ඤාණාවිප්පයුත්ත ද, නිබ්බාණාදීන්හි මතු මතුවත්තෙහි ප්‍රතිලාභය ඇති කල්හි අවිප්පයුත්තවාසු ද, එහෙයින් ඉන්ද්‍රියයෝ නම් වෙත්.

අනාඥාත මාඥාස්‍යාමි (ඉන්ද්‍රිය)
(පාළි=) අනඤ්ඤාතඤ්ඤස්සාමි තින්ද්‍රිය)

විප්පනී:—"තත්ථ කතමං **අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියං?** යා තෙසං ධම්මානං අනඤ්ඤාතානං අදිඨානං අපත්තානං අවිදිතානං අසච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා-පෙ-අමොහො ධම්මවිචයො සම්මාදිඨි ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං ඉදං වුච්චති අනඤ්ඤාතඤ්ඤස්සාමි තින්ද්‍රියං"

යනු විභඞ්ග පාළියි. **අනාඥාත නම්, සංසාරයෙහි කිසිකලෙක නොදුටු විරූ චතුරාර්‍ය සත්‍යය හෝ නිර්වාණ යයි.** ඒ චතුරාර්‍ය සත්‍යය හෝ නිර්වාණය දනිමි යි පිළිපන්න හුගේ ඉන්ද්‍රිය අනාඥාත මාඥාස්‍යාමින්ද්‍රිය (අනඤ්ඤාතඤ්ඤස්සාමි තින්ද්‍රිය) නම් වේ. එනම්, සෝවාන් මාර්ග චිත්තයෙහි යෙදුණු ප්‍රඥා චෛතසිකය යි.

පුබ්බභාගෙ අනඤ්ඤාතං අමතං පදං චතුසච්ච ධම්මං වා ජානිස්සාමිති එවං පටිපන්නස්ස උප්පජ්ජනතො ඉන්ද්‍රියට්ඨ සම්භවතො ච අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියන්ති වුත්තං" යනු විභඞ්ග අටුවායි.

සත්කාය දෘෂ්ටි-විචිකිත්සා-ශීලව්‍රත පරාමාශ යන ත්‍රිවිධ සංයොජනයන් ප්‍රහාණය කිරීම සහ සම්ප්‍රයුක්ත ධර්මයන් ඒ ත්‍රිවිධ සංයොජනයන් ප්‍රහාණයට අභිමුඛ කිරීම ද, මෙහි කෘත්‍යය යි. මාර්ග චිත්තයෙහි යෙදුණු සත්තිස් බොධපාක්ෂිය ධර්මයන්ට ඊශ්වර භාවය කරන්නේ ය. **"අනඤ්ඤාතඤ්ඤස්සාමිති පවත්ත ජානන ලක්ඛණෙ ඉන්දට්ඨං කාරෙතීති අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රියං"** යනු එබැවින් කිහ.

ආඥා (ඉන්ද්‍රිය) (පාළි=අඤ්ඤින්ද්‍රිය)

විප්පනී:—තත්ථ කතමං **අඤ්ඤින්ද්‍රියං?** යා තෙසං ධම්මානං ඤාතානං දිඨානං පත්තානං විදිතානං සච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා-පෙ-අමොහො ධම්මවිචයො සම්මාදිඨි ධම්ම විචය සම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ග පරියාපන්නං ඉදං වුච්චති අඤ්ඤින්ද්‍රියං" යනු විභඞ්ග පාළියි.

"ආජානාති පඨම මග්ගෙන දිඨමරියාදං අනතික්කමිත්වා ජානාති අඤ්ඤා. අඤ්ඤායෙව ඉන්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං යනු විභාවිනී ටිකායි.

ආඥෙන්ද්‍රිය නම්, සෝවාන් මාර්ගයෙහි දක්නා ලද හෝ දන්නා ලද චතුරාර්ය සත්‍යය හෝ නිර්වාණය නො ඉක්මවා දන්නහු පිළිබඳ ඉන්ද්‍රිය යි. එනම්, සෝවාන් ඵල ඥානයෙහි පටන් අර්හත් ඥානය අවසන් වූ ෂඩ්විධ ඥානයෝ යි.

"අඤ්ඤින්ද්‍රියස්ස කාමරාග ව්‍යාපාදාදි තනුකරණප්පහානං චෙව සහජාතානඤ්ච අත්තනො වසානුවත්තාපනං" යනු විභඞ්ග අටුවා බැවින් උඩම්භාගිය සංයොජනයන් තුනී කිරීම හා ප්‍රහාණය ද, සහජාත ධර්මයන් තමාගේ වසඟයට පැමිණවීම ද, ආඥෙන්ද්‍රියයාගේ කෘත්‍යය වේ. මෙයින් කාම-රාග ව්‍යාපාදාදි සංයොජනයන් ගේ ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාණ කෘත්‍ය ඇති බව දක්වන ලද්දිය.

ආඥාතාවින්ද්‍රිය (පාළි=අඤ්ඤතා වින්ද්‍රිය)

"තත්ථ කතමං **අඤ්ඤතාවින්ද්‍රියං**? යා තෙසං ධම්මානං අඤ්ඤතාවීනං දිඨානං පත්තානං විදිතානං සච්ඡිකතානං සච්ඡිකිරියාය පඤ්ඤා පජානනා-පෙ-අමොහො ධම්මවිචයො සම්මාදිඨි ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ග පරියාපන්නං ඉදං වුච්චති අඤ්ඤතාවින්ද්‍රියං" යනු විභඞ්ග පාළියි.

"අඤ්ඤතාවිනො චතුසු සච්චෙසු නිට්ඨිතඤ්ඤාණ කිච්චස්ස ඉන්ද්‍රියං; අඤ්ඤතාවීනං වා චතුසු සච්චෙසු නිට්ඨිත කිච්චානං චත්තාරි සච්චානි ඤත්වා පටිවිජ්ඣිත්වා ඨිතානං ධම්මානං අබ්භන්තරෙ ඉන්දට්ඨයාධනෙන ඉන්ද්‍රියං' යනු ධර්ම සඟුණු අටුවායි.

"අඤ්ඤතාවිනො චත්තාරි සච්චානි පටිවිජ්ඣිත්වා ඨිතස්ස අරහතො ඉන්ද්‍රියං අඤ්ඤතාවින්ද්‍රියං" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ව්‍යාඛ්‍යායි.

අඤ්ඤතාවී නම්; චතුරාර්ය සත්‍යය හෝ නිර්වාණය බොධයේ කෙළවරට පැමිණි ක්ෂීණාශ්‍රවයන් වහන්සේ යි. උන්වහන්සේ පිළිබඳ ඉන්ද්‍රිය ආඥාතාවින්ද්‍රිය (=අඤ්ඤතා-වින්ද්‍රිය) නම් වේ.

"අඤ්ඤතාවින්ද්‍රියස්ස සබ්බ කිච්චෙසු උස්සුක්කප්පහාන-ඤ්චෙව අමතාභිමුඛභාවපච්චයතා ච සම්පයුත්තානන්ති" යනු විශුද්ධිමාර්ග බැවින් සියලු කෘත්‍යයෙහි උත්සාහ කිරීම හා

ප්‍රභාණය ද, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ස්වර්ණට අභිමුඛ භාවයට හෙතු බව ද, ආඥාතාවීන්ද්‍රිය ගේ කෘත්‍යය වන්නේ සියලු චතුස්සත්‍යාවබෝධය කොට නිමවන ලද කෘත්‍යය ඇත්තාවූ මහරහත්හු ගේ අඤ්ඤාතාවීන්ද්‍රිය විසින් අනික් කටයුතු කෘත්‍යයක් නැති බැවින් අමෘත මහා නිර්වාණ ධාතුවට අභිමුඛ වීමට හෙතුවන බව ද, සෙසු ඉන්ද්‍රියයන් ගේ මෙන් අනික් කෘත්‍යයෙක්හි නුපුරුදු බව ද, ඇත්තේ වෙයි. එහෙයින් අමෘත මහා නිර්වාණ ධාතුවට අභිමුඛභාවයට ප්‍රත්‍යය භාවය ද, වන්නේ යි" යනු විශුද්ධිමාගී භාව සන්නයි.

ඊ චිත්තාශ්‍රයඃ භාදවිකලපඃ – සජීවිතඃ සංඝාතඃ ඒව ච සමුහාරෝ ව්‍යඤ්ජනංච – යාවදේවභාවාදීන්ද්‍රියම්

භාවය:—විඤ්ඤාණයන් ගේ ආශ්‍රය ද, සත්ත්වභෙද කල්පනය ද, ශරීරසජීවි කල්පනය ද, සංඝෝලාශය ද, සමුහාරය ද, පාරිශුද්ධි ය ද, යන මොවුන්ගේ උපලබ්ධිය ඇති කල්හි ඉන්ද්‍රියත්වය වේ.

(විශුද්ධිමාගී සන්නයේ ඉන්ද්‍රිය නිද්දේශයේ 317 වැනි පිටුව බලනු)

චිත්තාශ්‍රයඃ

විභාවනි: චිත්තාශ්‍රයොපලබ්ධිය ලත් හෙයින් චක්ඛුරාදි ෂඩ් විඤ්ඤාණයෝ ඉන්ද්‍රිය නම් වූහ.

භාදවිකලපඃ

විභාවනි:—සත්ත්වභෙද කල්පනොපලබ්ධිය ලත් හෙයින් සත්‍රීන්ද්‍රිය–පුරුෂෙන්ද්‍රියයෝ එනම් වූහ.

සජීවිතඃ

විභාවනි:—ශරීරසජීවි කල්පනය නිසා ජීවිතෙන්ද්‍රිය නම් වී ය.

සංඝාතඃ

විභාවනි:—සුඛාදි පංච වේදනෙන්ද්‍රියයෝ සංඝෝලාශොපලබ්ධිය නිසා ඉන්ද්‍රිය වූහ.

සමුහාරඃ

විභාවනි:—ශ්‍රද්ධාදි පංචේන්ද්‍රියයෝ සමුහාරොපලබ්ධිය නිසා ඉන්ද්‍රිය වූහ.

ව්‍යවදාන

විජ්ඣනි:—අනාඥාත මාඥාස්‍යාම්‍යාදි ඉන්ද්‍රියත්‍රය පාරිශුද්ධ්‍යුපලබ්ධිය නිසා ඉන්ද්‍රිය නම් වූහ.

මේ දෙවිසි ඉන්ද්‍රියන්ගේ ඉන්ද්‍රියත්ව ක්‍රම නිදේශය අභිධර්ම කොෂයෙහි දැක්වූ අයුරුයි. මෙය විශුද්ධිමාර්ග සන්නයේ මෙසේ විස්තර කරයි.

"සකන්ධ පඤ්චකයෙහි යම් සත්ව ප්‍රඥප්තියක් වී ද, ඒ සත්වප්‍රඥප්තියට අජ්ඣත්තිකායතනයෝ සදෙන විශෙෂ නිශ්‍රයයෝ මෙත් නුයි ඔහු සදෙන පළමු කොට ආධිපත්‍යාර්ථය නිසා "චක්ඛුන්ද්‍රියං-පෙ-මනීන්ද්‍රියං"යි ආදියෙහි කියන ලදහු. මේ ආත්මභාවය තෙමේ මොවුන්ගේ වශයෙන් ස්ත්‍රිය පුරුෂය යන ව්‍යවහාරය ලැබෙයි දක්වන පිණිස භාවවය කියන ලදි. මේ උපාදින්න ධර්මයෝ යම් ධර්මයක් හෙතු කොට ගෙණ පවතිද්ද, මේ ධර්මය ඔවුන්ගේ ස්ථිතියට හෙතුය යි දක්වන පිණිස ජීවිතෙන්ද්‍රිය කියන ලදි. මේ සත්ව සංඛ්‍යාත ධර්ම පුඤ්ජය ප්‍රබන්ධ වශයෙන් පවත්නේ මේ වේදනාවන් කරණ කොට ගෙණ සකිලිටු වෙයි. දක්වන පිණිස වෙදනා පඤ්චකය කියන ලදි. ඒ සංක්ලෙශයෙන් විශුද්ධිය කැමැත්තනට ව්‍යවදාන සම්භාර දර්ශනය පිණිස ශ්‍රද්ධාදි පඤ්චකය කියන ලදි. සම්භූත සම්භාර ඇත්තවුන් මෙයින් ශුද්ධ වෙති. විශුද්ධි ප්‍රාප්ත වූවාහු නිර්ඥිත කෘත්‍ය ඇත්ත හු වෙති යි දක්වන පිණිස අනඤ්ඤාතඤ්ඤස්සාමිතීන්ද්‍රියාදි තුන්දෙන කියන ලදහු. හැම තැන ම ආධිපත්‍යාර්ථය නිසාය යන පදය යෙදිය යුතුයි. මෙපමණකින් අභිප්‍රේතාර්ථ සිද්ධිය වේනුයි සෙස්ස-වුන්ගේ අග්‍රහණය වෙදිතව්‍ය යි.

මෙ ම කිහ අභිධර්ම කොෂයෙහි

චිත්තාශ්‍රය සතදවිකල්ප
ස්ථිතිඃ සංක්ලෙශ එව ච
සම්භාරො ව්‍යවදානං ච
යාවතා තාව දිඤ්ද්‍රියම්" යි.

නොහොත් ප්‍රවෘත්තිනිවෘත්තීන්ට නිශ්‍රයාදිය දර්ශනය පිණිස මොහුම කියන ලදහු. අජ්ඣත්තිකායතනයෝ සදෙන විනාහි ප්‍රවෘත්තියට විශෙෂයෙන් මූල නිශ්‍රයෝ වෙති. වදාළේ මැයි "ඡස්සු ලොකෙ සමුප්පන්නො" යනාදි ඒ ප්‍රවෘත්තිය ගේ

නිෂ්පත්තිය ස්ත්‍රීන්ද්‍රිය පුරුෂෙන්ද්‍රිය දෙකින් ම වේ. භූයොවෘත්ති සත්වකායයා ගේ අභිනිර්වෘත්තිය විසභාග වස්තු සංරාගය නිමිත්ත කොට ඇති බැවින් වදාළේ මය. "තිණ්ණංඛො මහාරාජ සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති හොති මාතාච උතුනී හොති ගන්ධබ්බො ච පච්චුපඨිතො හොති මාතා පිතරො ච සන්නිපතිතා හොන්ති" යනාදිය වේ.

අවස්ථානය ජීවිතෙන්ද්‍රියයෙන් වෙයි. එයින් අනුපාලෙ තව්‍ය බැවිනි. එහෙයින් වදාළහ. "ආයුඨිති යපනා යාපනා" යනාදිය යි. උපභොගය වෙදනාවෙන් වෙයි. ඒ එසේ මැයි. වෙදනා වශයෙන් ඉෂ්ටාදි සර්ව විෂයොප භොගය වන බැවිනි වදාළේ ම ය." වෙදයති වෙදයතීති ඛො භික්ඛවෙ තස්මා වෙදනාති වුච්චති"යි මෙසේ ප්‍රවෘත්තියට නිශ්‍රය සමුත්පාද ස්ථිතිය සම්භොගය යන මොවුන් දක්වනු පිණිස චක්ෂුරින්ද්‍රියෙහි පටන් උපෙක්ඛින්ද්‍රිය දක්වා තුදුස් ඉඳුරෝ දෙසන ලදහුය. යම් සේ මොහු ප්‍රවෘත්තියට නිශ්‍රයයෝ වෙද්ද, එසේ ම සෙස්සෝ ද නිවෘත්තියට නිශ්‍රයයෝ වෙත්. විවට්ටය ඇසුරු කළහු විසින් නිර්වෘත්තීත වූ ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයෝ නිර්වෘත්තියට නිශ්‍රයයෝ වෙත්. උත්පාදය අනඤ්ඤතඤ්ඤස්සාමිතින්ද්‍රියෙන් දක්වන ලද්දේ වෙයි. ඒ අනඤ්ඤතඤ්ඤස්සාමිතින්ද්‍රිය නිර්වෘත්ති වශයෙන් පළමු කොට උපදනා හෙයිනි. අවස්ථානය අඤ්ඤින්ද්‍රියයෙන් දක්වන ලද්දේ වෙයි. උපභොගය අඤ්ඤතාවින්ද්‍රියෙන් දක්වන ලදි. අහීත් ඵල සුඛය මනා කොට අනුභව කරන හෙයිනි. ඒ එසේ මැයි ක්ෂීණාශ්‍රවයෝ විසවිත්වයෙන් නිබ්බුති සුඛය අනුභව කරති. මෙසේ මේ ඉන්ද්‍රියයෝ ම දෙශනා කරණ ලද්දහුය.

මෙපමණකින් යථාධිප්‍රෙතාර්ථ සිද්ධිය වන හෙයින් සෙසු ඉන්ද්‍රියයන් ගේ දෙශනා ක්‍රමය ද මොනවට වර්ණනා කරන ලද්දේ ය යි දතයුතු යි"

ඉන්ද්‍රියයන්ගේ දෙශනා ක්‍රමය පාළි අටුවා පොත්වල මෙසේ විස්තර කරති.

"තත්ථ අජ්ඣත්ත ධම්ම පරිඤ්ඤය අරිය භූමි පටිලාභො හොතීති අත්තභාව පරියාපන්නානි චක්ඛුන්ද්‍රියාදීනි පඨමං දෙසිතානි සො පන අත්තභාවො යං ධම්මං උපාදය ඉත්ථිති වා පුරිසොති වා සඞ්ඛං ගච්ඡති, අයං සො ති නිදස්සනත්ථං තතො ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ච සො දුවිධොපි ජීවිතින්ද්‍රිය

පටිබද්ධ වුත්තනිති ඤාපනත්ථං තතෝ ජීවිතින්ද්‍රියං යාව තස්ස පවත්තති, තාව එතෙසං වෙදයිතානං අනිවත්තියං ච කිඤ්චි වෙදයිතං සබ්බං තං දුක්ඛන්ති තතෝ සුඛින්ද්‍රියාදිනි තං නිරොධත්ථං පන එතෙ ධම්මා භාවෙතබ්බාති පටිපත්ති දස්සනත්ථං තතෝ සබ්බාදිනි ඉමාය පටිපත්තියා එස ධම්මෝ පඨමං අන්තනි පාතුභවතිති පටිපත්තියා අමොඝභාව දස්සනත්ථං තතෝ අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රියං, තස්සෙව ඵලත්තා තතෝ අනන්තරං භාවෙතබ්බත්තා ච තතෝ අඤ්ඤින්ද්‍රියං ඉතෝ පරං භාවනාය ඉමස්ස අධිගමෝ අධිගතෙ ච පන ඉමස්මිං නත්ථි කිඤ්චි උත්තරිං කරණීයන්ති ඤාපනත්ථං අරහත්ත පරමස්සාසභූතං අඤ්ඤාතාවින්ද්‍රියං දෙසිතන්ති අයමෙත්ථ කමෝ'' යනු විශුද්ධි.

ශාරීපුත්‍ර සඞ්ඝරාජ සවාමීහු ඉන්ද්‍රියයන්ගේ දෙශනා ක්‍රමය මෙසේ විස්තර කරති.

''මේ සත්‍ය ප්‍රඥප්තියට **විශෙෂ** නිශ්‍රය බැවින් ආධ්‍යාත්මික ආයතනයෝ ආදි කොට කියන ලදහ. මනින්ද්‍රිය වනාහි ආධ්‍යාත්මිකායතන භාව සාමාන්‍යයෙන් මොවුන් කෙරෙහි ම කියයුත්තේ ද, අරූපෙන්ද්‍රියයන් හා සමඟ එක් කොට දක්වනු පිණිස ජීවිතෙන්ද්‍රියට ඉක්බිති කොට කියන ලදී. ඒ මේ ප්‍රඥප්ති තොමෝ ස්ත්‍රීන්ද්‍රිය පුරුෂෙන්ද්‍රියයන්ගේ වශයෙන් සත්‍රී පුරුෂයයි යන **විභාගයට** යන්නීයයි දක්වනු පිණිස ආධ්‍යාත්මිකායතනයන්ට ඉක්බිති කොට භාවවය කියන ලදි. ඒ මේ උපාදින්න රූපධර්මයෝ මෙසේ ජීවිතෙන්ද්‍රියයා ගේ වශයෙන් **සිද්ධිනාශයි** දක්වනු පිණිස ඒ භාවවයට ඉක්බිතිව ජීවිතෙන්ද්‍රිය දක්වන ලදි. සව සංඥත වූ ධර්ම ප්‍රඥප්ති වශයෙන් පවත්තේ මේ වෙදනාවන් කරණ කොට ගෙන **කිලුටුවන්නෙයයි** දක්වනු පිණිස ඒ මනින්ද්‍රියට ඉක්බිති කොට වෙදනා පඤ්චකය දක්වන ලදි. ඒ වෙදනාවන් කරණ කොට ගෙන වනාහි විශුද්ධි කැමැත්ත වුන්ගේ **ව්‍යවදනයම** හෙතු දක්වනු පිණිස ඒ වෙදනා පඤ්චකයට ඉක්බිතිව ශ්‍රද්ධාදි පඤ්චකය කියන ලද. සම්භූතවූ ව්‍යවදන සම්භාර ඇත්තාහු ද, මොවුන් කරණ කොට ගෙන ශුද්ධවෙත්නුයි විශුද්ධියට පැමිණියහු නිෂ්ඨිතවූ කෘත්‍ය ඇත්තාහු ම වන්නාහයි දක්වනු පිණිස අනන්‍යයෙහි ලොකොත්තර ඥානයෝ හුන්දෙන කියන ලදහු මේ පමණකින් අභිප්‍රේත වූ අර්ථ සිද්ධනුයි සෙස්සවුන්ගේ නොගැන්මය යි මේ මොවුන් ගේ අනුක්‍රමයෙන් දෙශනාවට කාරණ ය යි දතයුතු''

6 ප්‍රවෘත්තෙ රාශ්‍රයොත්පත්ති - ස්ථිත්‍යුපභොගතො'ඵවා චතුර්දශ කථාන්‍යානි - නිවෘත්තා විඥ්‍රියාණ්ච

භාවය:—ප්‍රවෘත්තිහුගේ ආශ්‍රයයෙහි, උත්පත්තියෙහි, ස්ථිතියෙහි, උපභොගයෙහි, යෙදුණු ඉන්ද්‍රියයෝ චතුර්දශයක් වෙත්. අන්‍ය අෂ්ටෙන්ද්‍රියයෝ නිවෘත්තියෙහි යෙදුනාහු වෙත්.

ප්‍රවෘත්ති

විස්සනි:—මෙහි ප්‍රවෘත්තිය නම්, සංසාරයයි.

ආශ්‍රයඃ

විස්සනි:—චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ ජිහ්වා-කාය-මන යන ෂඩින්ද්‍රියයෝ ප්‍රවෘත්තිහුගේ හෙවත් සංසාරයා ගේ ආශ්‍රයයෙහි උපයුක්ත වූවාහු වෙත්.

උත්පත්ති

විප්පනි:—ප්‍රවෘත්තිහු ගේ උත්පත්තිය ස්ත්‍රින්ද්‍රිය - පුරුෂෙන්ද්‍රිය දෙදෙනාගෙන් වේ.

ස්ථිතිඃ

විස්සනි:—ජීවිතෙන්ද්‍රියයෙන් ප්‍රවෘත්තිහුගේ පැවැත්ම වේ.

උපභොගතො

විප්පනි:—සුඛ - දුඃඛ - සෞමනස්‍ය - දෞමනස්‍ය - උපෙක්ෂා යන පඤ්චෙන්ද්‍රියයන්ගෙන් ප්‍රවෘත්තිහුගේ උපභොගය වේ.

මෙසේ මේ තුදුස් ඉන්ද්‍රියයෝ ප්‍රවෘත්තියෙහි හෙවත් සංසාරයෙහි යෙදුනාහු වෙත්.

අන්‍යානි ඉන්ද්‍රියාණ් නිවෘත්තෞ

විස්සනි:—ශ්‍රද්ධා-වීර්ය - සමෘති - සමාධි - ප්‍රඥ - යන පංචෙන්ද්‍රියයෝ ද, අනාඥත මාඥස්‍යාම්‍යාදි ඉන්ද්‍රිය ත්‍රය ද, නිවෘත්තියෙහි හෙවත් නිර්වාණයෙහි ආශ්‍රය වූවාහු වෙත්.

මේ කාරිකාවෙන් දැක් වූ සියල්ල පිඩු කොට විශුද්ධිමාර්ග සන්නයෙහිදි පැරකුම්බා රජතුමා මෙසේ කියයි.

"මෙසේ ප්‍රවෘත්තියට නිශ්‍රය සමුත්පාදස්ථිතිය සම්භොගය යන මොවුන් දක්වනු පිණිස චක්ෂුරින්ද්‍රියෙහි පටන් උපෙක්ෂින්ද්‍රිය දක්වා තුදුස් ඉදුරෝ දෙසන ලදහු ය. යම්සේ

මොහු ප්‍රවෘත්තියට නිශ්‍රයයෝ වෙද්ද, එසේම සෙස්සෝ ද, නිවෘත්තියට නිශ්‍රයයෝ වෙත්. විවටය ඇසුරු කළහු විසින් නිවෘත්තිත වූ ශ්‍රද්ධාදි පඤ්චේන්ද්‍රියයෝ නිවෘත්තියට නිශ්‍රයයෝ වෙත්. උත්පාදය අනාඥාතඤ්ඤස්සාමීතීන්ද්‍රියයෙන් දක්වන ලද්දේ වෙයි. ඒ අනඤ්ඤාතඤ්ඤස්සාමීතීන්ද්‍රිය නිවෘත්ති වශයෙන් පළමුකොට උපදනා හෙයිනි අවස්ථානය අඤ්ඤින්ද්‍රිය යෙන් දක්වන ලද්දේයි. උපභොගය අඤ්ඤාතාවින්ද්‍රියෙන් දක්වන ලදි. අනීත්ඵල සුඛය මනාකොට අනුභව කරණ හෙයිනි. ඒ එසේ මැයි සෝණාශ්‍රවයෝ විසවිඩයෙන් නිබ්බුති සුඛය අනුභව කෙරෙති"

අනාඥාතමාඥස්‍යාමීන්ද්‍රියයෙන් **නිබ්බානයාගේ ආදිභාවය** ද, (උත්පත්තියද) ආඥෙන්ද්‍රියයෙන් **නිබ්බානයා** ගේ ස්ථිතිය ද, ආඥාතාවින්ද්‍රියෙන් **නිබ්බානස්ස භොගය** ද වේ. මෙසේ මේ අෂ්ටෙන්ද්‍රියයෝ නිවෘත්තියෙහි හෙවත් නිබ්බානයෙහි ආශ්‍රය-උත්පත්ති-ස්ථිති උපභොගයෙහි යෙදුනාහු වෙත්.

7 දුඃඛෙන්ද්‍රියං අසාතා යා - කායිකී වේදනා සුඛම්
සාතා ධ්‍යානෙ තෘතීයතු - මානසී සා සුඛෙන්ද්‍රියම්

භාවය:—සිතට පිළිකුල් වූ යම් ශාරීරික වෙදනාවක් වේ ද, එය දුඃඛෙන්ද්‍රිය නම්. සිතට අනුකූල වූ ශාරීරික වෙදනාව සුඛෙන්ද්‍රිය නම්. තෘතීය ධ්‍යානයෙහි උපදිනු ලබන මානසික සුඛ වෙදනාව ද, සුඛෙන්ද්‍රිය නම්.

දුඃඛෙන්ද්‍රියං

විපත්ති:—"තත්ථ කතමං දුක්ඛින්ද්‍රියං? යං කායිකං අසාතං කායිකං දුක්ඛං කායසම්ඵස්සජං අසාතං දුක්ඛං වෙදයිතං කාය සම්ඵස්සජා අසාතා දුක්ඛා වෙදනා ඉදං වුච්චති දුක්ඛින්ද්‍රියං" යනු විභඞ්ග පාළි බැවින් දුක්ඛ සහගත කාය විඤ්ඤාණ චිත්ත යෙහි යෙදුණු වෙදනා චෛතසිකය තමා හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන්ට ඊශ්වර භාවය කරණ හෙයින් දුඃඛෙන්ද්‍රිය නම් වේ.

සුඛෙන්ද්‍රියම්

විභාග:—"තත්ථ කතමං සුඛින්ද්‍රියං? යං කායිකං සාතං කායිකං සුඛං කාය සම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං කාය සම්ඵස්සජා සාතා සුඛා වෙදනා, ඉදං වුච්චති සුඛින්ද්‍රියං" යනු බැවින්

සුඛ සහගත කාය විඥාන චිත්තයෙහි යෙදුනාවූ වෙදනා චෛත සිකය තමා එක්ව යෙදුනා වූ චෛතසික ධර්මයන්ට ඊශ්වර භාවය කරන හෙයින් සුඛෙන්ද්‍රිය නම් වේ.

ධ්‍යානෙ තෘතියෙ තු චෛතසී සා සුඛෙන්ද්‍රියම්

විප්පනි:—"තතියජ්ඣාන සමඞ්ගිනො සුඛපටිසංවෙදනා භොගො නත්ථි, එවං සන්තෙපි යස්මා තස්ස නාමකායෙන සම්පයුත්ත සුඛං යං වා තං නාමකාය සම්පයුත්තං සුඛං තං සමුඬානෙ නස්ස යස්මා අතිපණීතෙන රූපෙන රූප කායො වුට්ඨො කායස්ස වුඬත්තා ඣානා වුට්ඨිතොපි සුඛං පටිසංවෙදෙය්‍ය. තස්මා එතමත්ථං දස්සෙන්තො සුඛං ච කායෙන පටිසං වෙදෙති" යනු විභඞ්ග අටුවාහි තෘතීයධ්‍යාන සමඞ්ගී පුද්ගල යාගේ සුඛය විස්තර කළ අයුරුයි.

තෘතීය ධ්‍යානයෙහි දී පූර්වයෙන් හටගත් සෞමනස්‍යෙන්ද්‍රිය ද, චතුර්ථධ්‍යානයෙහි දී සුඛෙන්ද්‍රිය ද, ප්‍රහීණ වේ.

"ස සුඛස්‍ය ච ප්‍රහාණාද් දුඃඛස්‍ය ච ප්‍රහාණාත් පූර්වං එව සෞමනස්‍ය-දෞර්මනස්‍යයොඃ අස්තංගමාද් අදුඃඛං අසුඛං උපෙක්ෂා සමෘති පරිශුද්ධං චතුර්ථං ධ්‍යානං" යනු නාලන්දිකා ටීකායි.

8 අන්‍යත්‍ර සා සෞමනස්‍යං-අසාතා චෛතසී පුනඃ දෞර්මනස්‍යං උපෙක්ෂාතු-මධ්‍යාභයෙ විකල්පනාත්

භාවය:—අන් තන්හි වූ ඒ මානසික වෙදනාව සෞමනස්‍යෙන්ද්‍රිය නම්. එහි ම අසාත වූ චෛතසික වෙදනාව දෞර්මනස්‍යෙන්ද්‍රිය නම්. සාත-අසාත මධ්‍යයෙහි වූ චෛතසික වූ හෝ කායික වෙදනාව විකල්පරහිත හෙයින් උපෙක්ෂෙන්ද්‍රිය නම්.

අන්‍යත්‍ර

කාම ධාතුවෙහි ද, ප්‍රථමධ්‍යානයෙහි ද, උපදිනු ලබන මධුර වූ මානසික වෙදනාව සෞමනස්‍යෙන්ද්‍රිය නම්.

සෞමනස්‍යං

විප්පනි:—"තත්ථ කතමං සොමනස්සින්ද්‍රියං? යං චෙතසිකං සාතං චෙතසිකං සුඛං චෙතො සම්ඵස්සජං සාතං සුඛං වෙදයිතං චෙතො සම්ඵස්සජා සාතා සුඛා වෙදනා ඉදං වුච්චති සොම නස්සින්ද්‍රියං" යනු විභඞ්ග පාළියි.

"පීති සොමනස්ස සම්පයොගතො අසාහනං මිනොා අස්සාති සුමනොා, සුමනස්ස භාවොා සොමනස්සං, සාත ලක්ඛණෙ ඉන්‍දවයං කාරෙතීති ඉන්‍ද්‍රියං; සොමනස්ස මෙව ඉන්‍ද්‍රියං සොමනස්සින්‍ද්‍රියං" යනු ධම්මසඞ්ගණි අට්ඨකථාය.

දෙඇටක් සොම්නස් සහගත චිත්තයෙහි යෙදුණු වෙදනා චෛතසිකය; ඒ චිත්තයෙහි යෙදුනා වූ අවශෙෂ ධර්‍මයන්ට ඊශ්වර භාවය කරණ හෙයින් සෞමනස්සින්‍ද්‍රිය නාම වේ.

අසාතා

විපත්ති:—"ඛුද්දකෙඛාන සාතං අසාතං සාතපටිසංවෙදනන්ති" යනු ධම්මසඞ්ගණි අට්ඨකථාය.

දෞර්මනස්‍යය

විපත්ති:—"තත්‍ථ කතමං දොමනස්සින්‍ද්‍රියං? යං චෙතසිකං අසාතං චෙතසිකං දුක්ඛං වෙදනා සම්පස්සජ්ජං අසාතං දුක්ඛං වෙදයිතං වෙතොා සම්ඵස්සජ්ජා අසාතා දුක්ඛා වෙදනා ඉදං වුච්චති දොමනස්සින්‍ද්‍රියං". යනු විභඞ්ග පාළිය.

දෙර්‍මනස් සහගත දෙසිතෙහි යෙදුණු දෙර්‍මනස් වෙදනා තොමෝ තමා හා සම්ප්‍රයුක්ත වූ අවශෙෂ ධර්‍මයන්ට ඊශ්වර භාවය කරණ හෙයින් දෞර්මනස්සින්‍ද්‍රිය නම් වේ.

උපෙක්ෂා

විපත්ති:—සාත-අසාත මධ්‍යයෙහි වූ චෛතසික වූද, කායික වූ ද, වෙදනා තොමෝ සාත-අසාත විකල්ප හෙයින් උපෙක්ෂෙන්‍ද්‍රිය නම් වන්නීය; යනු නාලන්දිකා ටීකාහි කියයි. 1. 33. බලනු.

"තත්‍ථ කතමං උපෙක්ඛින්‍ද්‍රියං? යං චෙතසිකං නෙව සාතං නාසාතං වෙදනා සම්ඵස්සජ්ජං අදුක්ඛ මසුඛං වෙදයිතං චෙතොා සම්ඵස්සජ්ජා අදුක්ඛමසුඛා වෙදනා ඉදං වුච්චති උපෙක්ඛින්‍ද්‍රියං" යනු විභඞ්ග පාළියි.

උපෙක්ෂා සහගත පස්පණස් චිත්තයෙහි යෙදුණු වෙදනා තොමෝ ඒ ඒ චිත්තයෙහි යෙදුනා වූ අවශෙෂ චෛතසික ධර්‍මයන්ට ඊශ්වර භාවය කරණ හෙයින් උපෙක්ඛින්‍ද්‍රිය නම් වේ.

විකල්ප නාම

විපත්ති:— 2-33 බලනු.

ඒ දස්සනාවතා'සෙඛසුත්තන්තෙ - නවින්ද්‍රියා'මලං කුසලේ
රූපාණි ජීවිතං දුක්ඛ - සාස්‍රවාණි නව මිධ,

භාවය: මනස් ආදි ඉන්ද්‍රිය නවය දර්ශන-භාවනා-අශෛක්ෂ යන මාර්ගත්‍රයෙහි දී නෙවැදෑරුම් වෙත්. ඉන්ද්‍රියත්‍රයයක් අනාශ්‍රව (=අමල) ය. රූපී වූ චක්ෂුරාදි පංචෙන්ද්‍රිය, ස්ත්‍රී-පුරුෂෙන්ද්‍රිය, ජීවිතෙන්ද්‍රිය, දුඃඛෙන්ද්‍රිය, උපෙක්ෂෙන්ද්‍රිය, යන දශය සාශ්‍රවය. සෙසු ඉන්ද්‍රිය නවය සාශ්‍රව ද, අනාශ්‍රව ද, වෙත්.

දර්ශනභාවනා අශෛක්ෂ පථෙ නවෙන්ද්‍රියාණි.

විවරණ: - 1 මෙහි දර්ශනමාර්ග හෙවත් දර්ශන මාර්ග නම්; සෝවාන්මාර්ග ඥානයයි දක්වන ලද මැයි. ධම්මසඞ්ගණි අටුවාහි,

"දස්සනෙනාති සොතාපත්තිමග්ගෙන; සොහි පඨමං නිබ්බාණං දස්සනමත්තා දස්සනන්ති වුච්චති, ගොත්‍රභු පන කිඤ්චාපි පඨමතරං පස්සති, යථා පන රඤ්ඤෝ සන්තිකං කෙනචිදෙව කරණීයෙන ආගතෝ පුරිසෝ දූරතොව රථිකාය චරන්තං හත්ථිඝණ්ඩඝතං රාජානං දිස්වාපි දිට්ඨෝ තෙ රාජාති පුථෝ දිස්වා කත්තබ්බ කිච්චස්ස අකතත්තා න පස්සාමීති ආහ. එව මෙව නිබ්බාණං දිස්වා කත්තබ්බස්ස කිලෙසප්පහාණස්ස අභාවා න දස්සනන්ති වුච්චති. තං හි ඤාණං මග්ගස්ස ආවජ්ජනට්ඨානෙ තිට්ඨති"

2 **භාවනා මාර්ග** නම්; සකෘදගාමී, අනාගාමී, අර්හත් යන මාර්ගත්‍රයයි දක්වන ලද මැයි. එහි ම;

"භාවනාසාති සෙඛ මග්ගත්තයං; සෙඛ මග්ගත්තයං හි පඨමමග්ගෙන දිට්ඨසමිං යෙව ධම්මෙ භාවනා වසෙන උප්පජ්ජති, න අදිට්ඨපුබ්බං කිඤ්චි පස්සති, තස්මා භාවනාති වුච්චති.

3 **අශෛක්ෂ** මාර්ග නම්; අර්හත් ඵලයයි.

"උපරිසික්ඛිතබ්බා භාවතො න සෙක්ඛාති **අසෙක්ඛා**; බුද්ධිප්පත්තා වා සෙක්ඛාතිපි **අසෙක්ඛා**; අරහත්ත ඵල ධම්මානං එතං අධිවචනං" යනු එබැවින් කිහ. (4-92 බලනු.)

නව ඉන්ද්‍රිය

1 මනස්-සුඛ-සෞමනස්‍ය- උපෙක්ෂා- ශ්‍රද්ධා- වීර්‍ය- සම්‍යක්-සමාධි-ප්‍රඥා යන ඉන්ද්‍රිය නවය, දර්ශන මාර්ගයෙහි පැමිණෙන්නා හුගේ අනාඥාත මාඥාස්‍යාමීන්ද්‍රිය වේ.

2 ඒ ඉන්ද්‍රිය නවය ම, භාවනා මාර්ගයෙහි හෙවත් සකෘදාගාමී අනාගාමී, අර්හත් යන මාර්ගඵල දී ආදෙන්ද්‍රිය වේ.

3 ඒ ඉන්ද්‍රිය නවය ම, අශෛක්ෂ මාර්ගයෙහිදී ආඥතාවින්ද්‍රිය වේ. (2. 4. සහ 2. 20.-22-බලනු.)

"මේ දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙන් චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ තුමූ කාමාවචර ධර්මයෝ මැසි. මනෝන්ද්‍රියාදී ඉන්ද්‍රියයෝ ද, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයෝ ද; කාමරූප අරූප ලොකොත්තර සඞ්ඛ්‍යාත වූ සතර භූමියෙහි ඇතුළත් වන්නාහු ය. සෞමනස්‍යෙන්ද්‍රිය තෙමේ කාමරූප අරූප සංඛ්‍යාත භූමින්ගේ වශයෙන් භූමිත්‍රයෙහි ඇතුළත් වන්නේය. අවසානයෙහි ඉන්ද්‍රියයෝ තුන්දෙන තුමූ ලොකොත්තර මැසි" යනු දෙවිසි ඉන්ද්‍රියයන්ගේ භූමිභෙදය විශුද්ධිමාර්ගී භාව සන්නයෙහි දැක් වූ අයුරු සි.

අමළං ත්‍රයම්.

අනාඥතමඤ්ඤස්‍යාමීන්ද්‍රිය– ආඥේන්ද්‍රිය ආඥතා වින්ද්‍රිය යන ඉන්ද්‍රියයෝ අනාශ්‍රවය. (2–20–22 බලනු.)

රූපාණි ජීවිතං දුඃඛ සාස්‍රවාණි

විසඳුම:—රූපස්කන්ධය ඇතුළත් වූ චක්ෂුරාදී ඉන්ද්‍රිය පංචකය ද, ස්ත්‍රී-පුරුෂ ඉන්ද්‍රිය දෙක ද, ජීවිතෙන්ද්‍රිය ද, දුඃඛ-උපෙක්ෂා ඉන්ද්‍රිය දෙක ද යන් දශය සාශ්‍රව වූවාහු ම වෙත්.

නවවිධා

විසඳුම:—මන-සුඛ-සෞමනස්‍ය-දෞර්මනස්‍ය-ශ්‍රද්ධා-වීර්‍ය – සමෘති-සමාධි-ප්‍රඥා යන නව ඉන්ද්‍රියයෝ සාශ්‍රව ද, අනාශ්‍රව ද, වෙත්.

10 විපාකෝ ජීවිතං වේධා-ඖදශානන්‍යෂට්කා දෘෂ්ටෙ දෞර්මනස්‍යාවච කථ්‍යතේඛිලං-සවිපාකං දශවිධා

සාර්ථය:— ජීවිතෙන්ද්‍රිය විපාක මාත්‍රයකි. අන්‍යයෙහි ඉන්ද්‍රිය අට ද, දෞර්මනස්‍යෙන්ද්‍රිය ද, හැර ඉතිරි තුළල දෙ වැදෑරුම් වේ. ඒ දෞර්මනස්‍යෙන්ද්‍රිය සවිපාකය. මනෝන්ද්‍රියාදි දශය දෙවැදෑරුම්ය.

ජීවිතං

විසඳුම:—ජීවන්ති තෙන තං සම්පයුත්තා ධම්මාති =ජීවිතං; අනුපාලන ලක්ඛණේ ඉන්ද්‍රියං කාරණතියි= ඉන්ද්‍රියං ජීවිතමේව ඉන්ද්‍රියං= ජීවිතින්ද්‍රියං; තං පවත්තන සඞ්ඛාතවිපාකසන්තාන

හොති, ලක්ඛණාදිනි පන අත්තනා අවිනිභුත්තානං ධම්මානං අනුපාලන ලක්ඛණං ජීවිතින්ද්‍රියං; තෙසං පවත්තන රසං තෙසංයෙව ඨපනපච්චුපට්ඨානං, යාපයිතබ්බ ධම්මපදට්ඨානං සන්තෙපි ච අනුපාලන ලක්ඛණාදිමහි විධානෙ අත්ථික්ඛණෙයෙව තං තෙ ධම්මෙ අනුපාලෙති උදකංවිය උපලාදිනී, යථාසකං පච්චයුප්පන්නෙපි ච ධම්මෙ පාලෙති ධාති විය [illegible], සයං පවත්තයිත්ථ ධම්මසන්තතිං පොට්ඨපෙති නියාමකො විය නාවං, න හඞ්ගතො උද්ධං පවත්තයති, අත්තනො ච පවත්තිතබ්බානන්දව අභාවා, න හඞ්ගක්ඛණෙ ඨපෙති, සයං භිජ්ජමානත්තා, ඛියමානො විය වට්ටිසිනෙහො දීපසිඛං, න ච අනුපාලනපවත්තනට්ඨපනානුභාව විරහිතං යථා වුත්තක්ඛණෙ තස්ස තස්ස සාධනතොති දට්ඨබ්බං" ඉති ධම්සඟණි අට්ඨවාසි.

බෙධා මාදහානභාජකා දෘශන

විපදනි:- ශ්‍රද්ධා-වීරි-සම්‍රති-සමාධි-ප්‍රඥ-අනාඥාතමාඥාස්‍යාමි-ආඥා ආඥාතාවි යන ඉන්ද්‍රිය අට හැර, චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය-මන-පුරුෂ-ස්ත්‍රී-සුඛ-දුඃඛ-සෞමනස්‍ය උපෙක්ෂා යන ඉන්ද්‍රිය දෙළස සවිපාකය, අවිපාකය යි දෙවැදෑරුම් වෙත්.

සෞමනස්‍යාවව සවිපාකං

විපදනි:— සෞමනස්‍යෙන්ද්‍රිය සවිපාකය.

දසම්ඛා

විපදනි:— මනස්-සුඛ-දුඃඛ-සෞමනස්‍ය - උපෙක්ෂා - ශ්‍රද්ධා - වීරි සම්‍රති-සමාධි-ප්‍රඥ-යන ඉන්ද්‍රිය දශය සවිපාකද, අවිපාක ද, වෙත්.

11 මනොන්‍ය ඛිතනි ශ්‍රද්ධාදි-කුශල ෂට්ඨකං මිඛා
සෞමනස්‍යං මනොන්‍යා ච-ඛිතනිසෙන්‍රඛානාදෙකඛා

භාවය:— මානසෙන්ද්‍රිය ද, සුඛාදි ඉන්ද්‍රිය සතර ද, ශ්‍රද්ධාදි පඤ්ච-කය ද, යන දශය දෙවැදෑරුම් වේ. (2-10 දශම්ඛා යනු භා සම්බන්ධයි

කුශලෙන්ද්‍රිය අටකි. සෞමනස්‍යය දෙවැදෑරුම් ය. මනස් ආදි පඤ්චකය තෙ වැදෑරුම් ය. සෙස්ස එක් ආකාර ම් වෙති.

මනොන්‍ය ඛිතනි ශ්‍රද්ධාදි

ඛිපදනි: 2-10 දශම්ඛා යනු බලනු.

කුශල මෂ්ටකය

ටිප්පනී:—ශ්‍රද්ධාදි පංචකය ද, අනාඥාතමාඥාස්‍යාම්‍යාදි ත්‍රය ද, යන අට කුශලෙන්ද්‍රියයෝ වෙති.

ඛිධා දෞර්මනස්‍යං

ටිප්පනී:—දෞර්මනස්‍යෙන්ද්‍රිය කුශල-අකුශල ය යි දෙවැදැරුම් වේ.

මනොන්‍යා ච විත්තිසෙත්‍රධා

ටිප්පනී:—මන-සුඛ-දුඃඛ-සෞමනස්‍ය-උපෙක්ෂා යන පංචෙන්ද්‍රිය-යෝ කුශල-අකුශල-අව්‍යාකෘතය යි තෙවැදැරුම් වෙත්.

අන්‍යදෙකධා

ටිප්පනී:—අවශිෂ්ට වූ චක්ෂුරාදි ඉන්ද්‍රිය පංචකය ද, ජීවිතෙන්ද්‍රිය ද, සත්‍රි පුරුෂෙන්ද්‍රිය ද යන අට එක් වැදැරුම් වේ. එනම් අව්‍යා-කෘත ය.

12 කාමාප්තං අමලං තිත්‍ථා-රූපාප්තං සත්‍රි පුමින්ද්‍රියෙ දුඃඛෙ ච තිත්‍ථා 'රූපාප්තං-සුඛෙ චාපොත්‍ය රූපි ච

භාවය:—අනාශ්‍රව ඉන්ද්‍රියත්‍රය හැර සෙසු එකුන්විසි ඉන්ද්‍රියයෝ කාමධාතුවෙහි වෙත් අමලත්‍රය ද, සත්‍රි-පුරුෂ-දුඃඛ-දෞර්මනස්‍ය ද, යන සප්තකය හැර සෙසු පසළොස් ඉන්ද්‍රියයෝ රූප ධාතුවෙහි වෙත්. රූපී ඉන්ද්‍රියයන් හැර සෙසු අෂ්ටෙන්ද්‍රියයෝ අරූප ධාතුවෙහි වෙත්.

අමලං

ටිප්පනී:-අනාඥාතමාඥාස්‍යාමි-ආඥා-ආඥාතාවි යන ඉන්ද්‍රියත්‍රය අනාශ්‍රවය; එහෙයින් අමල ය. මේ ඉන්ද්‍රියත්‍රය හැර සෙසු එකුන්විස්ස කාමාප්ත ය.

අරූපාප්තං සුඛෙ චා'පොත්‍ය රූපි ච

ටිප්පනී:—අමලත්‍රය ද, සත්‍රි-පුරුෂ-දුඃඛ-දෞර්මනස්‍ය යන ඉන්ද්‍රිය සප්තකය හැර අවශිෂ්ට වූ මනස් ජීවිත-උපෙක්ෂා-ශ්‍රද්ධා-වීර්‍ය සමෘති-සමාධි-ප්‍රඥා යන අෂ්ටෙන්ද්‍රියයෝ අරූපධාතුවෙහි වෙත්.

කාමාපතං-රූපාපතං-අරූපාපතං

ටිප්පනි:--භූමිතොති චක්ඛු සොත ඝාණ ජිවහා කාය ඉත්ථි පුරිස සුඛ දුක්ඛ දෞමනස්සිඤ්ඤියානි චෙත්ථ කාමාවචරානෙව මනිඤ්ඤිය ජීවිතිඤ්ඤිය උපෙක්ඛිඤ්ඤියානි සද්ධා විරිය සති සමාධි පඤ්ඤිඤ්ඤියානි ච චතුභූමිපරියාපන්නානි සොම-නස්සිඤ්ඤියං 'කාමාවචර රූපාවචර ලොකුත්තරවසෙන භූමිත්තය පරියාපන්නතං අවසානෙ තිණ්ණි ලොකුත්තර-නෙවාති." යනු විශුද්ධිමාර්ගයේ ඉඤ්ඤියයන්ගේ භූමිතිදේශය දැක්වූ අයුරුයි.

13 මනො විත්තිත්‍රයං ත්‍රෙධා-විහෙයා දුම්නස්කතා
නව භාවනයා පංච-න හෙයාන්‍ය පි නත්‍රය ම්

භාවය: මනෙන්ද්‍රිය ද, වෙදනාත්‍රය ද, ත්‍රිවිධ වේ. දෞමනසෙන්ද්‍රිය විහෙය ය. ඉන්ද්‍රිය නවයක් භාවනාවෙන් දුරු කටයුතුය. ඉන්ද්‍රිය පඤ්චකයක් ද, යලි ඉන්ද්‍රියත්‍රයයක් ද, අහෙය ය.

මනො විත්තිත්‍රයං ත්‍රෙධා.

ටිප්පනි:—මනෙන්ද්‍රිය ද, සුඛ-සෞමනස්‍ය-උපෙක්ෂා යන ඉන්ද්‍රිය=ත්‍රය ද. දෘෂ්ටිහෙය-භාවනා හෙය-අහෙය යනුවෙන් තෙවැ-දැරුම් වේ.

විහෙයා දුම්නස්කතා

ටිප්පනි:—දෞමනස්‍යෙන්ද්‍රිය දෘෂ්ටි-භාවනා දෙකින් දුරුකටයුතුය.

නව භාවනයා

ටිප්පනි:- චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය-ස්ත්‍රී පුරුෂ-ජීවිත-දුඃඛ යන ඉන්ද්‍රිය නවය භාවනාවෙන් දුරු කටයුතුය.

"දුඃඛ භින්නානි හ්‍යෂ්ටෞ න කලිඤ්ඤානි, දුඃඛ ච න මනො ජාතං, සර්වාණි ච නිත්‍යං සමලානි" යනු නාලන්දික ටිකායි.

පංච න හෙයානි අපි න ත්‍රයම්.

ටිප්පනි:—ශ්‍රද්ධාදි පංචෙන්ද්‍රියය ද; අනාඥාතමාඥාස්‍යාම්‍යාදි ත්‍රය ද, යන අෂ්ටෙන්ද්‍රියයෝ අකලිඤ්ඤ බැවින් අහෙය වෙත්,

ඉන්ද්‍රියයන් ගේ හෙයා'හෙයත්වය විභඞ්ග පාළියෙහි මේසේ දෙශනා කරන ලද්දේය.

"පණ්ණරසින්ද්‍රියා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා දෙමනස්සින්ද්‍රියං සියා දස්සනෙන පහාතබ්බං සියා භාවනාය පහාතබ්බං, ජි ඉන්ද්‍රියා සියා දස්සනෙන පහාතබ්බා, සියා භාවනාය පහාතබ්බා සියා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා, පණ්ණරසින්ද්‍රියා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බ හෙතුකා දෙමනස්සින්ද්‍රියං සියා දස්සනෙන පහාතබ්බ හෙතුකං සියා භාවනාය පහාතබ්බ හෙතුකං, ජිඉන්ද්‍රියා සියා දස්සනෙන පහාතබ්බ හෙතුකා සියා භාවනාය පහාතබ්බ හෙතුකා සියා නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බ හෙතුකා"

14 කායමභව දෙව ඉපාතෙ සව-ලෂ්‍යතෙ තොප
පාදුතෙකා:
තෙනා ඉඩි වා සපත වාඥේ වා-ඉඩ්රූපජීවක
මුත්තතම

භාවය:—සවිපාක වූ කායෙන්ද්‍රිය-ජීවිතෙන්ද්‍රිය දෙක කාම ධාතුවෙහි ලැබෙති. සවන, සත්වන, අටවන හෝ ඉන්ද්‍රියයෝ උපපාදුකයන් සමග සවිපාක වෙත්. රූප ධාතුවෙහි හට සවිපාක ඉන්ද්‍රියයෝ වෙත්. ආරූප්‍ය ධාතුවෙහි එක ම ජීවිතෙන්ද්‍රිය සවිපාකය.

උපපාදුක (පාළි=ඔපපාතික)

විපති:—කල්පාරම්භයෙහි උපදිනු ලබන සත්ත්වයෝ උපපාදුක නමැයි නාලන්දිකා ටිකාහි කියයි.

"නිර්මිතව පෙනී යන්නාවූ දෙව් බඹුන් ආදි සත්හු ඔපපාතිකයෝ නම් වෙත්" යනු විශුද්ධි මාගී සන්නයි.

"උපපාතෙ තෙසං අත්ථි ඔපපාතිකා. මෙහි උප ශබ්දය විශිෂ්ට වාචී හෙයින් උත්කෘෂ්ට ගති පරිදෙව්ද විශෙෂයෙන් විශිෂ්ට වූ උපපාතය ගන්නා ලදි. "අභිරූපස්ස කඤ්ඤූ" දතබ්බා යනු මෙනි" යනු ශාරිපුත්‍ර සඞ්ඝරාජ වවතා සි.

"වතස්සො ඛො ඉමා සාරිපුත්ත යොනියො කතමා වතස්සො? අණ්ඩජා යොනි ජලාබුජා යොනි සංසෙදජා යොනි ඔපපාතිකා යොනි-පෙ-ඉදඛා අනාරම්භිකා එකච්චෙ ච මනුස්සා, එකච්චෙ ච විනිපාතිකා අයං වුච්චති සාරිපුත්ත ඔපපාතිකා අත්ථි" යනු මහා නිදානාදි සූත්‍රයි

තත්ථ අණ්ඩෙජාතා=අණ්ඩජා ජලාබුම්හි ජාතා=ජලාබුජා, සංසෙදෙ ජාතා=සංසෙදජා, **විනා එතෙහි කාරණෙහි උප්පතිත්වා විය නිබ්බත්තාති = ඔපපාතිකා.**

එත්ථ ච පෙතලොකෙ තිරච්ඡානෙ මනුස්සෙසු ච අණ්ඩජාදයො චතස්සො පි යොනියො සම්භවන්ති. මනුස්සෙසු පනෙත්ථ කෙචිදෙව ඔපපාතිකා හොන්ති මහා පදුම කුමාරාදයො විය, අණ්ඩජාපි කොන්තපුත්තා චෙභාතික ථෙරා විය, සංසෙදජාපි පදුම්ගබ්භෙ නිබ්බත්ත පොක්ඛරසාති බ්‍රාහ්මණ පදුමවති දෙවී ආදයො විය කෙචිදෙව හොන්ති. යෙභුය්‍යෙන පන මනුස්සා ජලාබුජාව. පෙතෙසු පි නිජ්ඣාම තණ්හික පෙතානං නිච්චදුක්ඛාතුරතාය කාමසෙවනා නත්ථි තස්මා තෙ ගබ්භසෙය්‍යකා න හොන්ති. ජාලාවන්තතාය න තාසං කුච්ඡියං ගබ්භො සණ්ඨාති තස්මා තෙ ඔපපාතිකායෙව සංසෙදජාතායපි අසම්භවතො, අවසෙස පෙතා පන චතුයොනිකාපි හොන්ති යථා ච එවං යක්ඛා පි සබ්බචතුප්පද පක්ඛිජාති දිඝජාති ආදයොපි සබ්බෙ චතුයොනිකායෙව, **සබ්බ නෙරයිකා ච චාතුම්මහාරාජිකතො පට්ඨාය උපරි දෙවා ච ඔපපාතිකායෙව,** භුම්මදෙවා පන චතුයොනිකාව හොන්ති, තත්ථ දෙව මනුස්සෙසු සංසෙදජ ඔපපාතිකානං අයං විසෙසො, සංසෙදජා මන්ද දහරා හුත්වා, නිබ්බත්තන්ති **ඔපපාතිකා සොළස වස්සුද්දෙසිකා හුත්වා**" (නිබ්බත්තන්ති) යනු සාරාත්ථ දීපනී විනය ටිකා යි.

විසතර අභිධර්ම කොශයෙහි 3. 9 බලනු.)

සඞ්රූපෙසු

විප්පනී:—රූපධාතුවෙහි චක්ෂුරාදි පසද, ජීවිතෙන්ද්‍රිය ද, සවිපාකය

15 නිරොධයත්‍යුපරමො-නාරූප්‍යෙ ජීවිතං මනඃ
උපෙක්ෂාං චෛව රූපෙෂ්ටෞ-කාමෙ දශ නවාෂ්ට වා.

භාවය:—අරූපධාතුවෙහි මරණය; ජීවිත, මන, උපෙක්ෂා, යන ඉන්ද්‍රියත්‍රය නිරොධ කරයි. රූප ධාතුවෙහි චක්ෂුරාදි අට වැනසෙයි. කාම ධාතුවෙහි දශයක් හෝ නවයක් හෝ අටක් හෝ ඉන්ද්‍රියයන්ගේ විනාශය වෙයි.

නිරොධයති

විප්පනී:—"ආරූප්‍යධාතෞ මෘත්‍යුඃ ජීවිත-මන-උපෙක්ෂෙති ත්‍රයං නිරොධ යති" යනු නාලන්දිකා ටිකායි

කාමේ දශනවාඤ්ච වා.

කාම ධාතුවෙහි එකවර හෝ ක්‍රමයෙන් හෝ මරණය වේ එකවර මරණයෙහි ඉන්ද්‍රිය අටක් හෝ නවයක් හෝ දශයක් අලිංග-එකලිංග-උභයලිංග අපෙක්ෂාවෙන් වැන සෙයි.

10 ක්‍රම මෘතෞ යූ ට්‍රියාම්-ඉමය ගට්ක්‍රු ගැට් ට්
නවාපතිඋත්තය ඵලඅනාගා-සකදාගම නවෙන්ද්‍රියෝ

භාවය: ක්‍රම මරණයෙහි වනාහි ඉන්ද්‍රිය සතරක් නිරුඛ කරත්. ශුභ-මරණයෙහි හැම තන්හි ඉන්ද්‍රිය පසක් විද්‍යමානය. ශ්‍රොතාපත්ති අනිත් ඵලප්‍රාප්තිය ඉන්ද්‍රිය නවයකින් වේ. සකෘ-දුගාමි අනාගාමි ඵලප්‍රාප්තිය ඉන්ද්‍රිය සතකින්-අටකින් හෝ නවයකින් වේ.

ක්‍රම මෘතෞ තු චත්වාරි

විපාකනී: -ක්‍රම මරණයෙහි පළමු කොට කාය-ජීවිත-මන උපෙක්ෂා යන චතුරින්ද්‍රියයෝ නිරුඛ වෙත්. "ක්‍රම මෘතෞ තු ප්‍රාක් කාය - ජීවිත - මන-උපෙක්ෂින්ද්‍රියාණි නිරුද්ධ්‍යන්තෙ" යනු ටීකායි

ශුභෙ සේන්ද්‍රි පංච ච

විපනී: ශුභ-මරණයෙහි හැම තන්හි ශ්‍රද්ධාදි පංචෙන්ද්‍රියයෝ විද්‍යමාන වෙත්.

නවාපති රනන්‍ය ඵලෙෂාං

විපනී: - ශ්‍රොත ආපත්ති ඵලප්‍රාප්තිය මන-උපෙක්ෂා-ශ්‍රද්ධා-විර්‍ය සමෘති-සමාධි-ප්‍රඥ-අන ඥතමාඥස්‍යාමි-ආඥ යන ඉන්ද්‍රිය නව යෙන් වේ.

අනන්‍ය (අනිත්) ඵල ප්‍රාප්තිය; මන-සෞමනස්‍ය යන ඉන්ද්‍රියවය් ද, (සුඛා පෙක්ෂා අන්‍යතෝ [illegible] සමාධි ප්‍රඥා යන පංඤේන්ද්‍රියය ද, ආඥේන්ද්‍රිය අඤ්ඤා [illegible] ද, යන නවයෙන් වේ.

සකෘණාං නවෙන්ද්‍රියාණි

විපනී:—ලඛ්ධඃශ්‍රොතාපත්ති [illegible] (=ආකුලීන [illegible] ඵල බඛ්ධ ශ්‍රොතාපත්ති [illegible] (=මධ්‍යපරාක්‍රමය) යනුවෙන් සකෘදාගාමී පුද්ගලයෝ දෙදෙනෙක් මෙහි,

එයින් **ආනුපුබ්බික** පුද්ගලයා ගේ ශ්‍රොතාපත්ති ඵල ලාභය මත-උපෙක්ඛා-ශ්‍රද්ධා-සති සමාධි-ප්‍රඥා යන ඉන්ද්‍රිය සප්තකයෙන් හෝ; ආඥෙන්ද්‍රිය ඇතුළු අෂ්ටෙන්ද්‍රියයන් ගෙන් හෝ වේ.

තුණ්හා විනරාග පුද්ගලයා ගේ ඵල ලාභය මේ අෂ්ටෙන්ද්‍රිය යෙන් සහ අනාඥාතඥාස්‍යාමීන්ද්‍රිය ඇතුළු ඉන්ද්‍රියනවයෙන්වේ.

අනාගාමී පුද්ගලයා ද, **ආනුපුබ්බික විනරාග** සේ දෙවැදෑරුම් වේ.

ආනුපුබ්බික අනාගාමී පුද්ගලයා නම්, සකෘදාගාමී ඵල ප්‍රාප්තයා ය. **විනරාග අනාගාමී පුද්ගලයා** සකෘදාගාමී ඵලයට පැමිණියේ නො වේ.

ආනුපුබ්බික අනාගාමී පුද්ගලයා, ආනුපුබ්බික සකෘදාගාමී පුද්ගලයා මෙන් සප්තෙන්ද්‍රියයන්ගෙන් හෝ අෂ්ටෙන්ද්‍රියයන් ගෙන් ඵල ප්‍රාප්ත වෙයි.

විනරාග අනාගාමී පුද්ගලයා, භූයෝ විතරාග සකෘදා-ගාමී පුද්ගලයාමෙන් නවෙන්ද්‍රියයෙන් ඵල ප්‍රාප්ත වෙයි.

(ආර්‍ය පුද්ගල විභාගය සවැනි කොශස්ථානයෙහි විස්තර වේ.)

ස්ථවිර වාදයෙහි සෝවාන් පුද්ගලයෝ සුවිසි වැදෑරුම් වෙති. සකෘදාගාමීහු දෙළොස් වැදෑරුම් වෙති. අනාගාමීහු අටසාළිස් වැදෑරුම් වෙති. රහත්හු දෙළොස් වැදෑරුම් වෙති. දක්වන ලද මැයි මනෝරථ පූරණී අඞ්ගුත්තර නිකාය අටුවාහි,

"ඉමස්මිං පන ඨානෙ ඨත්වා **චතුවීසති සොතාපන්නා මාදස සකදාගාමිනො අට්ඨචත්තාලීස අනාගාමිනො මාදස ච අරහන්තො කථිතා**"

ඉමස්මිං හි සාසනෙ සඩ්ඛුරං පඤ්ඤුඛුරන්ති වෙ ඛුරානි. දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤුදයෝ චතස්සො පටිපදා. තත්ථෙකො සඩ්ඛුරෙන අත්තිවිසිට්ඨා සොතාපත්ති ඵලං පත්වා එකමෙව භවං නිබ්බත්තෙත්වා දුක්ඛස්සන්තං කරොති; අයං එකබීජී. සො පටිපදානං වසෙන චතුඛ්ඩ්ධො හොති. යථා වෙස එවං පඤ්ඤුඛුරෙන අත්තිවිඤ්ඤාපිනි අට්ඨ එකබීජිනො තථා ඉඞ්ගාලං ඉඞ්ගාලා සරන්තක්ඛකතු පරඞ්ගාවානි ඉඞ්ගි චතු බිඳුනි ඉඞ්ගාලකඞ්ගානාම්.

තිසු පන විමොක්ඛෙසු සුඤ්ඤතා විමොක්ඛෙන සකදා-ගාමි භූමිං පත්තා චතුන්නං පටිපදානං වසෙන චත්තරො සකදාගාමිනො. අනිමිත්ත විමොක්ඛෙන පත්තා චත්තාරො. අප්පණිහිත විමොක්ඛෙන පත්තා චත්තාරොති ඉමෙ චාදස සකදාගාමිනො.

අවිහෙසු පන තයො අන්තරා පරිනිබ්බායි, එකො උපහච්ච පරිනිබ්බායි, එකො උඩං සොතො අකනිඨ ගාමිති පඤ්ච අනාගාමිනො. තෙ අසංඛාර පරිනිබ්බායිනො පඤ්ච, සසංඛාර පරිනිබ්බායිනො පඤ්චාති දස හොන්ති. තථා අතප්පාදිසු අකනිඨෙසු පන උඩං සොතො නත්ථි. තස්මා තත්ථ චත්තාරො සසංඛාර පරිනිබ්බායි, චත්තාරො අසංඛාර පරිනිබ්බායීති අඨ. ඉමෙ අඨ චත්තාලිස අනාගාමිනො.

සථා පන සකදාගාමිනො තථෙව අරහන්තො චාදස වෙදිතබ්බා.''

අභිධර්මකොශයෙහි 6–34 බලනු.

17 අභීත්වස්‍යෙකාදශහිඃ—උක්තං එකස්‍ය සම්භවාත් උපෙක්ෂා ජීවිත මනො-යුක්තො වාස්‍යාං ත්‍රයාන්විතඃ

භාවය:—අභීත්හුගේ ඵලප්‍රාප්තිය ඉන්ද්‍රිය එකොළොස අතුරෙන් එකකින් වේ ය යි කියන ලදි. උපෙක්ෂා-ජීවිත-මනස් යන ඉන්ද්‍රියත්‍රයෙන් එකකින් යුක්ත වූයේ ඉතිරි දෙකින්ද යුක්ත වූයේ ම වේ.

එකාදශහිඃ

විස්තරය:—මන - උපෙක්ෂා - ශ්‍රද්ධා - වීර්ය- සමෘති - ප්‍රඥා - සමාධි-සෞමනස්‍ය අනාඥාතමාඥාස්‍යාමි-ආඥා-ආඥාතාවි යන එකොළොස් ඉන්ද්‍රියයන්ගෙන් එකක ගේ අභීත්හුගේ ඵල සම්භවය වෙයි.

උපෙක්ෂා ජීවිත-මනො
යුක්තො වාස්‍යාං ත්‍රයාන්විතඃ

විස්තරය:—උපෙක්ෂා-ජීවිත-මන යන ඉන්ද්‍රියයන්ගෙන් එකකින් යුක්තවූයේ ඉතිරි දෙකින් ද, යුක්තවූයේ වේ.

1 ආරූප්‍ය ධාතුවෙහි සත්ත්වයාගේ චක්ෂු-ශබද-ඝ්‍රාණ-ජිහ්වේන්ද්‍රියයන්ගේ අභාවය වේයි.

2 ආරූප්‍ය ධාතුවෙහි කායෙන්ද්‍රියයාගේ ද, අභාවය වේයි.

3 රූපි-අරූපි ධාතූන්හි සත්‍රි - පුරුෂෙන්ද්‍රියයන්ගේ ද, අභාවය වේ.

4 පෘථග්ජනයා චතුර්ථ-මිතීය භූමීන්හි ද, ආරූප්‍යයෙහි ද, උපන්නේ සුඛෙන්ද්‍රිය වංචිත වේ

5 පෘථග්ජනයා චතුර්ථ-තෘතීයධ්‍යාන භූමීන්හි ද, ආරූප්‍ය යෙහි ද, උපන්නේ සෞමනස්‍යෙන්ද්‍රිය වංචිතය,

6 රූපි-අරූපි ධාතූන්හි සත්ත්වයාගේ දුඃඛාභාවය වේ.

7 වීතරාගිභව දෞර්මනස්‍යයාගේ අභාවය වේ.

8 ජිතත කුශල මූලයාභව ශ්‍රද්ධාදී පංචේන්ද්‍රියයන්ගේ අභාවය වේ.

9 පෘථග්ජනයා හෝ අහීත් පුද්ගලයා හෝ ආඥාස්‍යාමීන්ද්‍රිය රහිතය.

10 පෘථග්ජනයා ද, සත්‍ය දෘෂ්ටිමාර්ගයට පැමිණි පුද්ගලයා ද, අහීත් පුද්ගලයා ද, ආඥෙන්ද්‍රිය රහිතය.

11 පෘථග්ජනයා ද, ශෛක්ෂ පුද්ගලයා ද, ආඥාතාවීන්ද්‍රිය රහිතය.

12 චතුර්භිඃ සුඛ කායාභ්‍යාං-පංචභිශ්චක්ෂුරාදිමාන්
සෞමනසයි දුඃඛී තු සප්තභිඃ සත්‍රීන්ද්‍රියාදිමාන්

භාවය:—සුඛ-කාය-ඉන්ද්‍රිය දෙකින් එකකින් යුක්තවූයේ; ඉන්ද්‍රිය සතරකින් ද, චක්ෂුරාදි එක ඉන්ද්‍රියකින් සහ සෞමනස්‍යෙන්ද්‍රියයෙන් යුක්ත වූයේ; ඉන්ද්‍රිය පංචකයකින් ද, දුඃඛෙන්ද්‍රිය යෙන් යුක්තවූයේ ඉන්ද්‍රිය සතකින් ද, සත්‍රි-පුරුෂෙන්ද්‍රිය යන්ගෙන් එකකින් යුක්ත වූයේ; ඉන්ද්‍රිය අටකින් ද, යුක්ත වූයේ ය.

චතුර්භිඃ සුඛ කායාභ්‍යාං සෞමනසයි

විප්පනි:—සුඛ-කාය ඉන්ද්‍රිය දෙකින් එකකින් යුක්තවූයේ; (සෞමනස්‍ය?) ජීවිත මන-උපෙක්ෂා යන ඉන්ද්‍රිය සතරින් යුක්ත ය.

පංචභිශ්චක්ෂුරාදිමාන්

විප්පනි:—චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය යන පංචෙන්ද්‍රියයන් ගෙන් එකකින් හෝ සෞමනස්‍යෙන්ද්‍රියයෙන් යුක්තවූයේ, සෞමනස්‍ය ජීවිත-මන-උපෙක්ෂා-කාය යන ඉන්ද්‍රිය පඤ්චක යෙන් යුක්තය.

දුඃඛි තු සප්තභිඃ

විප්පනි:—දුඛෙන්ද්‍රියයෙන් යුක්ත වූයේ; දුඃඛ-ජීවිත-මන-කාය සුඛ-සෞමනස්‍ය-උපෙක්ෂා යන සප්තෙන්ද්‍රියයෙන් යුක්තය.

සත්‍රීන්ද්‍රියාදිමාන් (අෂ්ටභිඃ) (3-19)

විප්පනි:—සත්‍රීන්ද්‍රියයෙන් හෝ පුරුෂෙන්ද්‍රියයෙන් හෝ යුක්ත වූයේ; දුඃඛ-ජීවිත-මන-කාය-සුඛ-සෞමනස්‍ය-උපෙක්ෂා-සත්‍රී (පුරුෂ) යන අෂ්ටෙන්ද්‍රියයන්ගෙන් යුක්තය.

ශ්‍රද්ධාදි එක ඉන්ද්‍රියකින් යුක්ත වූයේ; එයින් අන්‍යවූ ජීවිත මන-උපෙක්ෂා-කාය යන චතුරින්ද්‍රියයෙන් යුක්තය.

19 (අෂ්ටභිඃ) එකාදශභි-රාඥ්‍ඥතාවි සාන්වයඃ
ආඥ්‍ඥස්‍යාමින්ද්‍රියො පෙතඃ-ත්‍රයොදශභිරන්විතඃ

භාවය:—ආඥ්‍ඥ-ආඥ්‍ඥතාවි ඉන්ද්‍රියයන්ගෙන් එකකින් යුක්ත වූයේ ඉන්ද්‍රිය දශයකින් යුක්ත වූයේය. ආඥ්‍ඥස්‍යාමින්ද්‍රියයෙන් යුක්ත වූයේ ඉන්ද්‍රිය තෙළෙසකින් යුක්ත වූයේය.

අෂ්ටභිඃ

විප්පනි:—2-18 වැනි කාරිකාව හා සම්බන්ධයි.

දශභිරාඥ්‍ඥතාවි සාන්වයඃ

විප්පනි:—ආඥෙන්ද්‍රියයෙන් හෝ ආඥ්‍ඥතාවින්ද්‍රියෙන් යුක්ත වූයේ; ජීවිත- මන - සුඛ - සෞමනස්‍ය-උපෙක්ෂා-ශ්‍රද්ධා-වීර්‍ය-සමෘති-සමාධි-ප්‍රඥ යන දශ ඉන්ද්‍රියයන්ගෙන් යුක්ත වූයේය.

ආඥාඥ්‍යාමීන්ද්‍රියයෙපෙතෘ ත්‍රුණ්‍යාදශගි රන්විනෘ

විභාවනි:—ආඥාඥ්‍යාමීන්ද්‍රියයෙන් යුක්ත වූයේ; එය ද ඇතුළු ජීවිත-මන-කාය-සුඛ-දුඃඛ-සෞමනස්‍ය - උපෙක්ෂා - ශ්‍රද්ධා - වීර්‍ය - සමෘති-සමාධි-ප්‍රඥ යන ඉන්ද්‍රිය තෙළෙසින් යුක්ත වූයේ ය.

20 කාය විඡීවිත මනෘ-ඝඩ්ගෙලෙපනීෘ ශුභෘතාඛගිෘ
ආරූප්‍යෙසු තථා ඛාලා-උපෙක්ෂායුම්නෘ ශුභෙනෘ

භාවය:—නිෘ ශුභ පුද්ගලයා කාය-වේදනා පඤ්චකය-ජීවිත-මන යන අෂ්ටෙන්ද්‍රියයන්ගෙන් යුක්තය. ආරූප්‍ය ධාතුවෙහි උපන් පෘථග්ජනයෝ ශුභෙන්ද්‍රියයන් සමග උපෙක්ෂා-ජීවිත මන යන අෂ්ටෙන්ද්‍රියයන්ගෙන් යුක්ත වෙති.

කාය විඡීවිත මනෘ

විභාවනි:—කාය - සුඛ - දුඃඛ - සෞමනස්‍ය - දෞර්මනස්‍ය-උපෙක්ෂා (=පඤ්ච වේදනෙන්ද්‍රිය) ජීවිත-මන යන ඉන්ද්‍රිය අට.

නිෘශුභෙනෘ

විභාවනි: නිෘශුභ නම් උච්ඡින්න-කුශල මූලයා ය.

ශුභෙනෘ

විභාවනි:—ශ්‍රද්ධා-වීර්‍ය-සමෘති-සමාධි-ප්‍රඥ යන පඤ්චෙන්ද්‍රියයෝ ශුභ නම් වෙත්.

21 සඞ්ඛුහිරෙකොභ-ඕංශන්‍යාමල වර්ජිතෙනෘ
ලිඛිතෘ රාඛ්‍යාසෞ ලිඞ්ගෙඛ-කෘ'මලවය වර්ජිතෙනෘ

භාවය—:ලිඛිත පුද්ගල තෙමේ අනාශ්‍රව ඉන්ද්‍රියත්‍රය හැර ඉතිරි සියලු එකුන් පිසි ඉන්ද්‍රියයන්ගෙන් යුක්තය. රාගයෙන් අවමුක්ත ආර්‍ය පුද්ගල තෙමේ අනාශ්‍රව ඉන්ද්‍රියවය ද, ලිඞ්ගෙන්ද්‍රියයන් ගෙන් එකකින් ද, යුක්තය.

අමල

විභාවනි:—අනාශ්‍රව මාඥාඥ්‍යාමීන්‍යාදි ඉන්ද්‍රියත්‍රය.

ලිඛිතෘ

විභාවනි:— ස්ත්‍රී ලිඞ්ගයෙන් සහ පුරුෂ ලිඞ්ගයෙන් යුක්තවූ උභතොව්‍යඤ්ජනකයා.

පරමාණු නිද්දේසය

22 කාමේසුපි දව්‍යතෝ සද්දෝ-පරමාණු රන්ධ්‍රගෝ
කායෙන්ද්‍රියා නවද්‍රව්‍යා-දසද්‍රව්‍යා සෙසින්ද්‍රියා

භාවය:-ද්‍රව්‍ය පරමාණුව කාමධාතුවෙහි ශබ්දායතන රහිත වූයේ ද, ඉන්ද්‍රිය ප්‍රවේශයට නුසුදුසු වූයේ ද, අෂ්ට ද්‍රව්‍යයෙන් යුක්තය. ශබ්දායතන රහිතවූ කායෙන්ද්‍රිය, නවද්‍රව්‍යයෙන් යුක්තය. ශබ්දායතන කායෙන්ද්‍රිය රහිත චක්ෂුරාදි ඉන්ද්‍රියයකින් යුත් පරමාණුව, දශ ද්‍රව්‍යයෙන් යුක්තය
(3-35 සහ 3-86 බලනු.)

අෂ්ට ද්‍රව්‍යතෝ

විභාවනී:—පෘථිවී-අප්-තෙජස්-වායු යන සතර මහා භූතයෝ ද, ගන්ධ-රස-රූප-ඕජස් යන සතර භෞතිකයෝ ද, අෂ්ට ද්‍රව්‍යයෝ වෙත්.

පරමාණු

විභාවනී:—මෙයින් ද්‍රව්‍ය පරිමාණුව ගත්තේය කාල පරමාණුව කුදු ඇති බැවිනි. "පෘථිව්‍යාදි භූත චතුෂ්ටයානං ද්‍රව්‍යණු කානාමවයවිං" යනු තාලපත්‍රණයි. (3-86 විස්තර බලනු).

නවද්‍රව්‍ය

විභාවනී:—මහාභූත සතර ද, භෞතික සතර ද, සප්‍රතිඝව්‍යය ද, නව ද්‍රව්‍ය නමි.

දශද්‍රව්‍ය

විභාවනී—පූර්වෝක්ත නවය ද, චක්ෂුරාදි ඉන්ද්‍රිය ද, දශද්‍රව්‍ය නමි.
(විඤ්ඤත්ති)

චේතනා නිද්දේශය

23 චිත්ත චෛතසා සහජාවස්‍යාං-යථිං සංඛාරා ත
ලක්ඛණෙණං
ඝාපෙත්‍වා ච පංචධා චේතනා-විභාවුව්‍යාදි භෙදතෝ

භාවය:—ඒ කාම ධාතුවෙහි චිත්ත-චේතන (=චෛතසික)යෝ එක්ව ම වෙත්. සියලු ධර්මයෝ සංඛාර ලක්ෂණයන්ගෙන් යුක්ත වෙත් සත්ත්ව සංඛ්‍යාවෙහි ගත් සංඛාර ධර්මයෝ සම්ප්‍රයුක්ත ධර්මයෝ ය, යේ යෙ ධම්මා මිත්‍රධුම්ම්‍යාදි ධර්මයන් පස් වැදෑරුම් වෙති.

චිත්ත චෛත්තා සහෙව.

විප්පති:—"චිත්තමත්ථමාත්‍රග්‍රාහී, චෛත්තා විශෙෂාමස්ථාග්‍රාහිණඃ සුඛාදයඃ" යනු ශ්‍රී ධර්මෝත්තරාචාර්‍ය මතයි.

"අස්‍යාං කාමධාතෞ චිත්ත-චෛත්තාඃ සහෙව භවන්තීන පෘථග් ස්ථිතිකාඃ" යනු නාලන්දිකා ටීකායි.

"රූපාදි ආරම්මණං චිත්තෙතති විජානාතීති=චිත්තං මෙහි නිශ්‍රය සමනන්තරාදි ප්‍රත්‍යයන් ඇතිකල්හිදු ආලම්බන යන් නැතිවැ චිත්තයා නොඋපදනා හෙයින් චිත්තයාගේ ආලම්බන විජානන ලක්ෂණත්වය ම කියන ලදි. මෙයින් "චිත්තය නිරාලම්බනිකය" යන වාදින්ගේ මතය ප්‍රතික්ෂිප්තයි.

චිත්තෙතති වා එතෙන සම්පයුත්ත ධම්මාති=චිත්තං, නොහොත්, චිත්තන මත්තා=චිත්තං, සිතීම් මාත්‍රය චිත්ත නම් වේ එසේ මැයි ස්වභාව ධර්ම නම් වූ යම් මේ ස්වරූප යෙක් ඇද්ද, හෙතෙමේ ස්වකීය ස්වකීය ප්‍රත්‍යය වූ පරිද්දෙන් ප්‍රවෘත්ති මාත්‍රයෙක් ම ය. එසේ හෙයින් සියලු පරමාර්ථ ධර්ම යන් ගේ භාව සාධනය ම නිෂ්පර්‍යාය හෙයින් ම ලැබෙයි. කර්තෘ කරණ වශයෙන් නිර්වචනය වනාහි පර්‍යාය කථාය යි දතයුතු. එසේ හෙයින් ධර්මයන් ගේ ස්වකීය ස්වකීය කෘත්‍ය යෙහි ආත්මප්‍රධානත්ව සමාරෝපණයෙන් කර්තෘත්වය ද, තදනු කූලත්වයෙන් සහජාත ධර්ම සමූහයෙහි කර්තෘත්ව සමාරෝපණ යෙන් ප්‍රතිපාදනය කටයුතු ධර්මයාගේ කරණත්වය ද, පරියා යෙන් ලැබෙන්නේ ය. එසේ පර්‍යාය වූ කර්තෘ කරණ වශයෙන් නිර්දෙශය වනාහි ධර්ම ස්වභාවයෙන් විනිර්මුක්ත වූ කර්තෘ ආදිහු ගේ අභාවය ප්‍රකාශ කරනු පිණිස ය යි දතයුතු.

විචිත්‍ර කරණෘද්‍යර්ථයෙනුදු චිත්ත නම් වේ කියන ලද මැයි.

"විචිත්ත කරණා චිත්ත-මත්තනො චිත්ත තාය වා
චිතං කම්ම කිලෙසෙහි චිතං තායති වා තථා
චිනොති අත්ත සන්තානං-විචිත්තාරම්මණත්ති වා"යි

චෙතසි භවං තදායත්ත වුත්තිතායාති=චෙතසිකං, මෙහි චිත්තයා නැතිව සියලු චෛතසිකයෝ ම ආලම්බන ග්‍රහණ යට අසමර්ථයහ. චිත්තයා නැති කල්හි සර්වප්‍රකාරයෙන් නො උපදනා හෙයිනි. චිත්තය වනාහි සමහර චෛතසික

යකු නැතිව ද, අරමුණෙහි පවතිනුයි චෛතසිකයා චිත්තා යත්ත වෘත්ති නම් වේ. එසේ හෙයින් ම වදාරන ලදි "මනො පුබ්බඞ්ගමා ධම්මා"යි. මෙයින් සුඛාදීන් ගේ අවේතනත්ව නිත්‍යත්ව යනාදීන් ගත් විප්‍රතිපත්තීහු ප්‍රතික්ෂිප්තයහයි දතයුතු. **චෙතසි නියුත්තං චෙතසිකං** කියා හෝ දතයුතු. යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි.

සර්වං සංස්කෘත ලක්ෂණෙණ:

විප්පනි:—රූප – චිත්ත – චෛත්ත – චිත්ත විප්‍රයුක්ත යන සියලුම සංස්කෘත ධර්මයෝ ජාති–ස්ථිති–ව්‍යය–ක්ෂය යන සංස්කෘත ධර්ම යන් පිළිබඳ ලක්ෂණයන්ගෙන් ද, ජාති–ජරා–ස්ථිති–අනිත්‍යතා යන අනුලක්ෂණයන්ගෙන් ද, යුක්තය කියන ලදි.

අභිධර්ම කෝශයෙහි ම, 2–46

"ලක්ෂණානි තථා ජාති–ජිරා ස්ථිති රනිත්‍යතා
ජාති ජාත්‍යාදයස්තෙෂාං-තෙෂ්ට ධර්මේක වෘත්තය:"

"තීණ්මාණ් භික්ඛවෙ සඞ්ඛතස්ස සඞ්ඛත ලක්ඛණානි. කතමානි තීණ් උප්පාදො පඤ්ඤායති වයො පඤ්ඤායති ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති, ඉමානි ඛො භික්ඛවෙ තීණ් සඞ්ඛතස්ස සඞ්ඛත ලක්ඛණානි" යනු අඞ්ගුත්තර නිකාය තික නිපාතයි.

ප්‍රාප්‍යාවා

විප්පනි:—මෙහි "වා" ශබ්දය ප්‍රාප්‍යාශ්‍රය නිදේශය පිණිස යි සංස්කෘත ධර්මයන් විෂයෙහි සත්ත්ව සංඛ්‍යාතයන් ගේ සමීප යට යම් ධර්ම කෙනෙක් එළඹුනාහු වෙත් ද, ඔවුහු ප්‍රාප්‍යාශ්‍රය සහිතයෝ ය. අන්‍යයෝ ප්‍රාප්‍යාශ්‍රය සහිතයෝ නොවෙත්.

පංචධා චෛත්තා මහාභූම්‍යාදි භෙදතඃ

විප්පනි:—චෛත්තයෝ (පාළි=චෙතසික) මහාභූම්‍යාදි භෙදයෙන් පස්වැදෑරුම් වෙති. එනම්;

1 මහාභූමික (=සර්ව චිත්තග)
2 කුශල මහා භූමික (=සර්වකුශල චිත්තග)
3 ක්ලෙශ මහා භූමික (=සර්ව ක්ලිෂ්ට චිත්තග)
4 අකුශල මහාභූමික (=සර්ව අකුශල චිත්තග)
5 පරිත්‍ර ක්ලෙශ මහා භූමික (=ක්ෂුද්‍රානුශය භූමික) යනුවෙති.

(විස්තර මතු සඳහන් වේ)

21 වේදනා චෙතනා සඤ්ඤා ඵස්සා සමානා එතේ ධම්මා සම්පයුත්තා නාම. ඒකුප්පාදා ඒකනිරෝධා ද්වේනානාරම්මණේසු ලබ්භන්ති. ඒකවත්ථුකා ඒකාලම්බණා ච වේදනාදයෝ.

භාවිත:—වෙදනාදි දෙය සියලු චිත්ත භූමීන්හි සමඟ උපදින්නෝ (=මහා භූමිකයෝ) වෙත්,

වේදනා

විභාග:—සුඛ-දුඃඛ-නා සුඛ නොවදුඃඛ යනුවෙන් ත්‍රිවිධ ය. .

"සුඛ දුඃඛ පෙතබා වසෙන තිවිධා වේදනා **වේදනා** නාම" යනුවෙන් විභාවිනී ටීකාහි කියයි. 1-14 කාරිකාවට ලියූ විපජනිය බලනු. 71 වැනි පිටුව.

2. චේතනා

"චේතෙති අත්තනා සම්පයුත්ත ධම්මේ ආරම්මණේ අභිසන්දහති සඞ්ගණ්හාති සඞ්ඛරණේ වා ව්‍යාපාර මාපජ්ජතීති **චේතනා**" යනු බැවින් සවකෘත්‍ය පරකෘත්‍ය සාධක වූ ප්‍රධාන ශිෂ්‍යයා මෙන් තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් සවකීය සවකීය කෘත්‍යයෙහි යොදනුයේ **චේතනා**හි ධර්ම සතුණු අවුවාහි මෙසේ විසතර තරති.

"චෙතයතීති= **චේතනා**; සඳ්ධිං අත්තනා සම්පයුත්ත ධම්මේ ආරම්මණේ අභිසන්දහතීති අත්ථෝ; සා චෙතසික ලක්ඛණා, චෙතනා භාව ලක්ඛණාති අත්ථෝ; ආයූහන රසා, චතු භූමක චෙතනාහි තෙ චෙතසික ලක්ඛණා නාම නත්ථි. සබ්බා චෙතසික ලක්ඛණාව; ආයූහන රසතා පන කුසලා කුසලෙසු එව හොති කුසලා කුසල කම්ම ස්‍යුහනාධිඨානංහි පඨමා සෙස සම්පයුත්ත ධම්මානං එක දෙස මත්ත මෙව නිවචං හොති, චෙතනා පන අතිරෙක උස්සාහා අතිරෙක වායාමා දලුණුස්සාහා දිගුණවායාමා, තෙනාහු පොරාණා ථෙරිය සභාව සණ්ඨිතා ව පනෙසා චෙතනාති; ථෙරියෙනති, ඛෙත්ත සාමි වූචචති, යථා ඛෙත්තසාමි පුරිසෙ පඤ්ච පණාණාස බලි පුරිසෙ ගහෙත්වා කුසිස්සාමීති එකතෙ ඛෙත්තං ඔතරති, තස්ස අතිරෙකෙ උස්සාහෙ අතිරෙකෙ වායාමෙ, දිගුණෙ උස්සාහෙ දිගුණෙ වායාමෙ හොති, නිරන්තරං ගණ්හථාති ආදීනි වදති, සීඝං ආවිඤ්ඡති, තෙසං සූරභත්ත ගන්ධ මාලාදීනි ථානාති, මඤ්ඤා සම්මානං හරති, එවං සම්පදමිදං වෙදිතබ්බං; ඛෙත්තසාමි පුරිසෙ විය චිත්තාදිගු, දිගුණෙ උස්සාහෙ පඤ්ච පණාණාස බලි පුරිසෙ විය චිත්තාදිගු දිගුණෙ උස්සාහෙ පඤ්ච පණාණාස කුසලා

ධම්මා, ඛෙත්තසාමි පුරිසස්ස දිගුණුස්සාහ දිගුණ වායාම කරණ කාලො විය කුසලා කුසල කම්මායූහනට්ඨානං පත්වා චෙතනාය දිගුණුස්සාහො දිගුණ වායාමො හොති, එවමස්සා අ යූහනරසතා වෙදිතබ්බා. සා පනෙසා සංවිදහන පච්චු-පට්ඨානා, සංවිදහමානාහි අයං උපට්ඨාති සකිච්ච පරකිච්ච සාධකා ජෙට්ඨ සිස්ස මහා වඩ්ඪකී ආදයො විය, යථාහි ජෙට්ඨ සිස්සො උපජ්ඣායං දුරතොව ආගච්ඡන්තං දිස්වා සයං අධිය මානො ඉතරෙපි දරකෙ අත්තනො අත්තනො අජ්ඣයන කම්මෙ පවත්තයති, තස්මිංහි අධියිතුං ආරද්ධෙ තෙපි අධි යන්ති, තදනුවත්තිතාය- පෙ- එවමෙසාපි අත්තනො කිච්චෙන ආරම්මණෙ වත්තමානා අඤ්ඤෙපි සම්පයුත්ත ධම්මෙ අත්තනො අත්තනො කිරියාය පවත්තෙති, තස්සාහි අත්තනො කිච්චං ආරද්ධාය තං සම්පයුත්තාපි ආරභන්ති, තෙන වුත්තං සකිච්ච පරකිච්ච සාධකා ජෙට්ඨසිස්ස මහා වඩ්ඪකී ආදයො වියාති, අච්චායික කම්මානුස්සරණා දිසු ච පනායං සම්පයුත්තානං උස්සහනභාවෙන පවත්තමානා පාකටා හොතීති වෙදිතබ්බාති"

3. සංඥා

විස්තී:—"සංඥාව වනාහි ආලම්බන ස්වභාව හැඳිනීම ලක්ෂණ කොට ඇත්තීය. ඒ කෙසේදයත්? සංඥා තොමෝ වනාහි සුදුය රතුය නිල්ය කසාවන්ය යනාදි ඒ ඒ ආලම්බනයන්ගේ සලකුණු ගැනීම් මාත්‍රයකින්ම අරමුණ හඳුනයි. එසේද වුවත් කුමක් හෙයින් සුදුවූයේ ද? කුමක් හෙයින් රතුවූයේ ද? යනාදි වශයෙන් ඒ ඒ ආලම්බන ලක්ෂණයන් ගේ උත්පත්ති නොදනී-කුමක් මෙන් ද යත්? ළදරුවෙක් පළමුකොට අං ඇත්තා වූ ගවයකු දැක මැතියෙති! මූ කවර සතෙක් දැයි විචාළ කල්හි පුත! මූ ගවයායයි මව උත්තර දෙයි. ඉක්බිති ඒ ළදරු තෙමේ මෙබඳු අං දෙකක් ඇත්තා වූ සත්ත්වයා ගවයායයි හැඳින ගනී. එතකුදු වුවත් ඒ ගවයා ගව දෙන ගෙන් හටගන්නේ ද? අස්වෙළඹකගෙන් හටගන්නේ ද? ඇතින්නියකගෙන් හටගන්නේ ද? මේ මහා පෘථිවියෙන් හැර ගන්නේදැයි විශෙෂයක් නොදනී. එහෙයින් මේ සංඥා තොමෝ නැවත දුටු කල්හි හැඳින ගන්නා පිණිස සලකුණක් ගෙන ම හැඳින ගන්නේ වෙයි. නොහොත් සංඥාව වඩුවෙකුට බඳු උපමා ඇත්තේ වෙයි. වඩුවෙකුට කෙසේ සමාන වන්නේ ද යත්? පෙතලි රූපාදිය කපන්නා වූ වඩු

තෙමේ පළමුකොට දණ්ඩක් ගෙන රූපයක් කපනු කැමැතිව දැලි නුල් ආදියෙන් මෙතැන්හි හිස වෙයි; මෙතැන්හි අත් පා ආදිය වෙයි; යනාදීන් සලකුණු කිරීම් මාත්‍රයක් කරයි එතකුදු වුවත් ඒ රූපය නොනිමියේ වෙයි. එසේ ම සංඥාව ද, නිල පීතාදි සලකුණු ගැනීම් මාත්‍රයක් කොට අරමුණු හැඳි නීම් මාත්‍රයක් කෙරෙයි අංඇති ගවයකු දුටු ළදරු තෙමේ ඒ ගවයා කවර හෙතුවකින් හටගත්තේ ද? යන බව හෝ රූපයක් ඉදිකරනු කැමැති වඩු තෙමේ සලකුණු කිරීම් මාත්‍රයක් විනා ඒ රූපයාගේ සටහන් වෙන් නොකළ හැකි වාක් මෙන් ද, මේ සංඥාව සලකුණක් කොට අරමුණ හැඳි නීම් මාත්‍රයක් කරයි. සංඥාවට විඥාණය එකතු වූ කල්හි ගවයා ගවදෙනගෙන් උපන්නේයයි දැනගන්නාක් මෙන් ම මේ නාමරූප ධර්මයන්ගේ විශෙෂ හැඳින ගැනීම කෙරෙයි.

ඒ සංඥා විඥාන දෙකට ප්‍රඥාව එක් වූ කල්හි ඒ ගවයා අසවල් ජාතියෙහි ගවයෙක් ය, මෙබඳු ජව ඇත්තා වූ වර්ගයක යනාදි විවිධාකාර දැනගන්නාක් මෙන් සංඥා විඥානයට ප්‍රඥාව එක් වූ කල්හි මේ නාම රූප දෙක අනිත්‍යය දුඃඛය අනාත්මය යි යනාදි අනෙක ප්‍රකාරයෙන් දැන මාර්ගඵලාධිගමය පවා එළවිය හැකි වෙයි. ගවයකු නුදුටුවාවූ ළදරු තෙමේ පළමු ගවයා දුටු දවස්හි ඒ ගවයාගේ අංදෙක ගවයා බවම සලකුණය යි දැන හැඳින ගත්තාට පසු නැවත ගවයා දුටු දවසක ඒ අංදෙක සලකුණක් කොට ගැනීම වන්නේ ද? නොවන්නේදැයි සැකයක් ඉපදිය යුතු වෙයි ඉදින් පළමු දවස්හි ඒ අරමුණ දැක සංඥාව උපන් කල්හි නැවත නැවතත් ඒ අරමුණ දුටු කල්හි සංඥාවගේ ඉපදීම නිෂ්ප්‍රයොජන දෝහෝයි සැක කටයුතු වෙයි. එසේ සැක නොසිතිය යුත්තේ යි. යම් වස්තුවක් දවසකට දහස්වරක් දුටුයේ නමුදු පළමුවාරයෙහි ගන්නා වූ සලකුණෙන් දෙවෙනි වාරයෙහි හැඳිනීම සිඬ කෙරෙයි. දෙවෙනි වාරයෙහි ගන්නා වූ සලකුණෙන් තුන්වෙනි වාරයෙහි හැඳිනීම සිඬ කෙරෙ යි. මෙසේ පළමු පළමු ගන්නා ලද සංකෙතයෝ නැවත නැවත දුටු කල්හි හැඳිනීමට ප්‍රත්‍යය වෙති. එහෙයින් සංඥාවන්ගේ කිසි නොලැබීමක් නොවන්නේයි" යනු අභිධර්මාර්ථ සංග්‍රහ විස්තර භාව සන්නයි.

(1-14 බලනු. 72 වැනි පිටුව.)

4. ඡන්දඃ

ටීප්පනි:—"ඡන්දඃ විකිර්ෂා" යනු බැවින් කරනු කැමැත්ත ඡන්ද නම්. "ඡන්දෝති කත්තුකම්‍යතා යෙතං අධිවචනං; තස්මා සො කත්තු කම්‍යතා ලක්ඛණො, ඡන්දො ආරම්මණ පරියෙසන රසො, ආරම්මණෙන අත්ථිකතා පච්චුපට්ඨානො, තදෙවස්ස පදට්ඨානං, ආරම්මණස්ස ගහණෙවායං වෙතසො හත්ථප්ප-සාරණං වීය දට්ඨබ්බො" යනු විභඞ්ග අටුවායි

"ඡන්දො කාමො" යනාදියෙහි තෘෂ්ණාව ද, "ඡන්දං ජනෙති වායමති" යනාදියෙහි වීර්‍ය ද, ඡන්දය යි කියනු ලැබේ එයින් නිවර්තනය පිණිස "කත්තුකම්‍යතායෙතං අධි වචනං"යි කියන ලදී. -පෙ- චෛතසික ධර්මයන් සාලම්බනික බැවින් කරණු කැමැති බව නම්, ආලම්බිතු කාමතා මුඛ යෙන් ම වේනුයි එයින් නිවර්තනය පිණිස **ආලම්බණකර-ණෙච්ඡා ලක්ෂණ ඡන්දය කත්තුකාමතා ලක්ෂණය යි** කියන ලදී එහෙයින් ම "පරියෙසන රසො ආරම්මණෙන අත්ථි-කතා පච්චුපට්ඨානො"යි කියන ලදී. මේ ඡන්දය වනාහි යම්-නිෂ්ටාවකින් තමන්ගේ අරමුණ සෙවීම කෘත්‍ය කොට ඇත්තේ වේ ද, ඒ නිෂ්ටාවෙන් ම සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අරමුන සෙවීම ද, වන්නේ මැයි එක් අරමුණක් ඇති බැවින් ඒ ඡන්ද කරණකොට ගෙණ ඒ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ අරමුණ සෙවීම කෘත්‍යවන්නේ මැයි එහෙයින් කිහ. "ආරම්මණග්ගහණෙ වායං වෙතසො හත්ථප්පසාරණං වියාති දට්ඨබ්බො"යි දැන වස්තු පරිත්‍යාග වශයෙන් පවත්නා දැන වෙතනාවෙහි ඡන්දය "ආරම්මණෙන අත්ථිකතා" යනු කෙසේයින් වීය යත්? ශරය විදුනා දුනුවායා ශරයෙහි කරණ පරීක්ෂාවක් මෙන් දැන වෙතනාවෙහි ඡන්දය ද ආලම්බණ පරිත්‍යාග ක්‍රමයෙන් කැමතිම වේ. මෙතෙම කුසලයෙහි උපන්නේ **කුසලච්ඡන්දයයි** කියනු ලැබේ. යොනිසො මනසිකාර සමුත්ථාන බැවිනි." යනු විශුද්ධිමාර්ග සන්නයි.

"මේ (ලොභය හා) ඡන්දය ද, අරමුණු ගැණීම් මාත්‍රයක් කැමැති වෙයි. ලොභය වනාහි විශෙෂයෙන් ඒ අරමුණෙහි ගිජුව ඇලෙයි. එහෙයින් මේ ඡන්ද චෛතසිකය කළාල පැදුරෙක්හි දමන ලද්දා වූ වඳුරු ලහටුවකට බඳු උපමා ඇති වෙයි. නැවත ඒ කැබිලිති හා වඳුරු ලහටුව ද, කළාල පැදු රෙන් ගනු කැමති කල්හි කැට කැබිලිති ආදිය පහසුවෙන්

අවිලාගත කැකි ළඟයි. වඳුරු ලඟටුව වගාගි නැවත ඒ කළාල යෙන් නොගත කැකි පරිද්දෙන් ඇලියෙයි. එබැවින් මේ දෙදෙනාගේ විඝඝය කැට කැඩිලිති හා වඳුරු ලඟටුව මෙන් ද, අවබොධ කටයුතුය" යනු අනිඛම්මාඤ්ඤ සඞ්ග්‍රහ භාව සන්නයි.

5. සපඤ්ඤි

විපඤ්ඤි:—ඉන්ද්‍රිය-විඝය-ඉන්ද්‍රිය විඝය ඤාන මෙවුන්ගේ එකිහුත අවසථා තොමෝ සපඤ්ඤි නම්. කියන ලදි. නාලන්දිකා ටීකාහි, **"ඉන්ද්‍රිය විඝය නම්ඤාන සඞ්ඛාත නාවසථා සපඤ්ඤි"**යි.

ඵුසති නි= ඵස්සා; සවායං ඵුසන ලකඛණෝ, සඞ්ඝට්ටන රසෝ, සන්නිපාත පච්චුපට්ඨානෝ, ආපාථගත විසය පදට්ඨානෝ; අයං හි අරූප ධම්මෙ පි සම්පයුත්තෙ ආරම්මණෙසු ඵුසනා කාරෙනෙව පවත්තතීති ඵුසන ලකඛණෝ, එත දෙසනෙව අනලලිඞ මාතොපි රූපං විය චක්ඛු සදෙදා විය ච සොතං චිත්තං ආරම්මණඤ්ච සඞ්ඝට්ටෙතීති සඞ්ඝට්ටන රසෝ, චක්ඛු රම්මණ සඞ්ඝට්ටනතොව උප්පජ්ජනතා සම්පත්ති අපෙනපි රසෙන සඞ්ඝට්ටන රසොති වෙදිතබ්බා; වුත්තඤෙචතං අට්ඨකථායං, 'චතු භූමක ඵස්සා නො ඵුසන ලකඛණෝ නාම නත්ථි, සඞ්ඝට්ටන රසෝ පන පඤ්ච වාරිකොව හොති. පඤ්චවාරිකස්සහි ඵුසන ලකඛණොතිපි සඞ්ඝට්ටන රසොතිපි නාමං, න සඞ්ඝට්ටන රසෝ"ති: ඉදඤ්ච වත්වා ඉදං සුත්තං ආහතං. "යථා මහාරාජ! දෙ මෙණ්ඩා යුජ්ඣෙය්‍යුං, යථා එකෝ මෙණ්ඩෝ එවං චක්ඛු දට්ඨබ්බං, යථා දුතියෝ මෙණ්ඩෝ එවං රූපා දට්ඨබ්බං, යථා **තෙසං සඞ්ඝාතෝ එවං ඵස්සා** දට්ඨබ්බෝ, එවං ඵුසන ලකඛණෝ ච ඵස්සෝ සඞ්ඝට්ටන රසෝ ච; යථාව මහාරාජ දෙ සම්මා වජ්ජෙය්‍යුං දෙ පාණිකා වජ්ජෙය්‍යුං, යථා එකෝ පාණි එවං චක්ඛුං දට්ඨබ්බං, යථා දුතියෝ පාණි එවං රූපං දට්ඨබ්බං, යථා තෙසං සඞ්ඝාතෝ එවං ඵස්සෝ දට්ඨබ්බෝ, එවං ඵුසන ලකඛණෝව ඵස්සෝ සඞ්ඝට්ටන රසොව"ති විත්ථාරෙ." යනු ධම්මසඞ්ගණි අටුවාහි.

ඵුසති නි= ඵස්සා සවායං ඵුසන ලකඛණෝ; අයං හි අරූප ධම්මොපි සම්පයුත්තෙ ආරම්මණෙ ඵුසනාකාරෙනෙව පවත්තති, සා චස්ස ඵුසනාකාරප්පවත්ති අතිබ්‍යත්තා දක්ඛිණෙය්‍යානං පඤ්ඤාචක්ඛුනෝ පරස්ස චත්තුපඤ්ඤාදීහි විය දට්ඨබ්බා" යනු විභාවිනි ටීකාහි.

"හිතති සපශී කරන රූ රූස් සෙයින් ආලම්බනයෙහි සපශීකාරයෙන් උපදනා වූ සපශීය" යනු ශාරීපුත්‍ර සඞ්ඝරාජ වචනයි. 1-10 බලනු (65 වැනි පිටුව.)

6 මතිඃ

විස්තරි:—ධර්මයන් ගේ විනිශ්චය ප්‍රඥා නම්. මති යනු එයට ම අතික් නමකි. කියන ලදි.

"ධර්මාණාං විනිශ්චය එව ප්‍රඥා 'පර පර්යායො මතිඃ

1. 2. බලනු. (50 වැනි පිටුව.)

7 ස්මෘති.

විස්තරි:—අනුභූත වස්තුව පිළිබඳ නොමුළා වූ සිහිය ස්මෘති නම් කියන ලදි. නාලන්දිකා ටිකාහි,

"අනුභූතස්‍යා 'සම්ප්‍ර මෝෂඃ ස්මෘතිඃ"

"සරණං-සති අසම්මොසො සා සම්පයුත්ත ධම්මානං සාරණ ලක්ඛණා" යනු විභාවිනී ටිකායි.

"සා පනෙසා අපිලාපන ලක්ඛණා ච සති උපග්ගණ්හන ලක්ඛණා ච, යථාහි රඤ්ඤො භණ්ඩාගාරිකො දසවිධං රතනං ගොපයන්තො සාරං පාතං රාජානං ඉස්සරිය සම්පත්තිං සල්ලක්ඛාපෙති සාරාපෙති, එවමෙව සතිකුසලකම්මං සල්ලක්ඛාපෙති; තෙනාහ ථෙරො නාග සෙනො "යථා මහාරාජ! රඤ්ඤො පරිණායක රතනං රඤ්ඤො හිතාහිතං ජානාති, ඉමෙ රඤ්ඤො හිතා ඉමෙ අහිතා ඉමෙ උපකාරා ඉමෙ අනුපකාරාති, තතො අහිතෙ අපනුදති හිතෙ උපගණ්හාති, එවමෙව ඛො මහාරාජ! සති උප්පජ්ජමානා හිතාහිතානං ධම්මානං ගතයො සමන්තෙ සති ඉමෙ ධම්මා හිතා ඉමෙ ධම්මා අහිතා ඉමෙ ධම්මා උපකාරා ඉමෙ ධම්මා අනුපකාරාති, තතො අහිතෙ ධම්මෙ අපනුදති, හිතෙ ධම්මෙ උපගණ්හාති, එවමෙව ඛො මහාරාජ උපග්ගණ්හන ලක්ඛණා සති"ති,

අපරො නයො, අපිලාපන ලක්ඛණා සති, අසම්මොහන රසා, ආරක්ඛ පච්චුපට්ඨානා, විසයාභිමුඛිභාව පච්චුපට්ඨානා වා, පිර සඤ්ඤා පදට්ඨානා කායාදි සතිපට්ඨාන පදට්ඨානා වා ආරම්මණෙ දළ්හං පතිට්ඨිතත්තා පන එසිකා විය චක්ඛුවාරාදි රක්ඛණතො දොවාරිකො විය ච දට්ඨබ්බා." යනු ධර්ම සඞ්ඝණ්ඩ අටුවායි.

8. මනස්කාරඃ

විප්පනි:—විෂයයෙහි චිත්තයාගේ ආවර්ජනය (=අවධාරණය) මනස්කාර නම්. කියන ලදී නාලන්දිකා ටීකාහි,

"විෂයෙ චෙතස ආවර්ජනං (=අවධාරණං) මනස්කාරඃ, මනඃ කරොත්‍යාවර්ජයති වා"

කරණං කාරො, මනස්මිං කාරො=මනසි කාරො-සො චෙතසො ආරම්මණෙ සමත්තාභාර ලක්ඛණො" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ ව්‍යාඛ්‍යායි.

ආරම්මණ පටිපාදක-විථිපටිපාදක-ජවන පටිපාදකය යනුවෙන් මනස්කාරය තෙවැදෑරුම් වේ. ධම්ම සඞ්ගණී අටුවාහි එය මෙසේ විස්තර කරති.

"කිරියා කාරො. මනස්මිං කාරො **මනසිකාරො; පුරිම-**මනතො විසදිසං මනං කරොතීතිපි=මනසිකාරො; **ස්වායං ආරම්මණ පටිපාදකො විථිපටිපාදකො ජවනපටිපාද-කොති** තිප්පකාරො, තත්ථ ආරම්මණ පටිපාදකො මනස්මිං කාරොති **මනසිකාරො**; සො සාරම්මණ ලක්ඛණො, සම්ප යුත්තානං ආරම්මණෙ සම්පයොජන රසො, ආරම්මණාභි මුඛ භාව පච්චුපට්ඨානො, සඞ්ඛාරක්ඛන්ධ පරියාපන්නො, ආරම්මණ පටිපාදකත්තෙන සම්පයුත්තානං සාරථි විය දට්ඨබ්බො.

විථිපටිපාදකොති පන පඤ්චවාරාවජ්ජනස්සෙතං අධිවචනං. **ජවනපටිපාදකොති** මනොවාරා වජ්ජනස්ස"

"මනසිකාරය වනාහි අරමුණ සිත්හි කිරීම ලක්ෂණ කොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? ආජානිය සෛන්ධව අශ්වයන් දෙදෙනකු යොදන ලද රථ වාර්යයාට බඳු උපමා ඇති යෙයි. ඒ ආජානීය අසුන් දෙදෙනකු යොදන ලද රථයෙහි රථාවාර්ය තෙමේ ඒ අසුන් දෙදෙනා එක සමව යාම නිතර සිත්හි කොට බලාහිදිනේ වෙයි. එපරිද්දෙන් ම මනසි-කාර නමැති රථාවාර්ය තෙමේ ආජානීය අසුන් නමැති සපශ්‍රීදී වූ ඒ ඒ චෛතසික ධර්මයෝ අරමුණෙහි වැද ගැණීම් ආදී වූ ඒ ඒ කාත්‍යය ඉදිරිපසු නොවී එකවිට සිද්ධ කරන් නාහුදැයි බලාහිදින්නේ වෙයි." යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ භාව සන්නයි.

"විතක්කයා සහජාත ධම්මයන් අරමුණට නැඟීම් සභාව කොට ඇති බැවින් සහජාත ධම්මයන් අරමුණෙහි බහා ලන්නක්හු මෙන් වන්නේය. චෙතනා තොමෝ ආලම්බන ග්‍රහණයෙන් යථාරුඩව ධම්මයන් අරමුණෙහි ලා තොමෝ යොදන්නී බල නායකයන්හු මෙන් වන්නීය. මනසිකාරය තෙම සහජාත ධම්මයන් ආලම්බනාභි මුඛ කොට මෙහෙයන හෙයින් ආජානෙය අශ්වයන් මෙහෙයන්නා වූ සාරථියන්හු මෙන් වන්නේයි" යනු විතක්ක-විචාර-මනසිකාරයන් ගේ වෙනස පැහැදිලි කළ ශාරීපුත්‍ර සඞ්ඝරාජ වචනයි.

9 අධිමුච්චතිඃ

විභාවනී:—නිශ්චය වශයෙන් දැරීම අධිමුච්චති නමි. "යථා නිශ්චයං ධාරණා'ධිමුච්චතිඃ" යනු නාලන්දිකා ටීකායි.

"අධිමුච්චනං=අධිමුච්චනා, සෝ සන්නිට්ඨාන ලක්ඛණෝ අසංසප්පනාරසෝ, නිච්ඡය පච්චුපට්ඨානෝ, සන්නිට්ඨාතබ්බ පදට්ඨානෝ, ආරම්මණෙ නිච්චල භාවෙන ඉන්ද්‍රියෝ විය දට්ඨබ්බා" යනු ධම් සඟුණු අටුවායි.

"නොසතිටුහන්හු ගේ ප්‍රාණවධාදියෙහි හෝ දුනාදි යෙහි හෝ ප්‍රවෘත්තිය නොවන බැවින් නොසතිටුහන් යම් තම් ප්‍රකාර අරමුණෙහි නිශ්චයනය අධිමුච්චන නම.

පඤ්චවාරයෙහි ව්‍යවස්ථාපනය හා අධිමුත්තියහි කියනු ලබන අධිමොක්ෂය හා නානත්ව කිමයත්? ව්‍යවස්ථාපනය ජවනයට නිසිසෙයින් සතිටුහන් කෙරෙයි. ශ්‍රද්ධාව හදහන විසින් සතිටුහන් කෙරෙයි. අධිමොක්ෂය ම තමන් ගේ සභාව විසින් සතිටුහන් කෙරෙයි" යනු විශුද්ධිමාගී සන්නයි.

"අධිමොක්ෂ චෛතසික තෙමේ අරමුණු නිශ්චය කිරීම ලක්ෂණ කොට ඇත්තේයි ඊට උපමා කවර යත්? අධිකරණ නායක මහාමාත්‍යයෙකුට බඳු උපමා ඇතිවේ. අධිකරණ නායක මහාමාත්‍ය තෙමේ රාජනීති ලෝකනීති ධම්මනීතියෙහි පාරප්‍රාප්ත වූ බැවින් අධිකරණ නායක විනිශ්චය කාර ධුරය ලැබෙයි එබඳු අධිකරණ නායක තෙමේ යම් අධිකරණයක් ඇසූ කෙණෙහි ම මෙබඳු අපරාධයක් කළ තැනැත්තේ මෙබඳු දඬුවමක් ලැබිය යුත්තේයයි කියා මහා ඇසූ මාත්‍රයකින් ම විනිශ්චය කට හැකි වෙයි. එපරිදෙන් ම මේ අධිමොක්ෂ චෛතසික යම් සිතක සෙදුණු කල්හි එම්

මේ අරමුණ නිල් පැහැය ඇත්තේ ය. මෙය සුදු පැහැය ඇත්තේ ය. යනාදි වශයෙන් අරමුණෙහි ඇත්තා වූ තත්ත්වාකාරය තමා හා එක්ව යෙදුනා වූ චිත්ත චෛතසික ධර්මයන්ට ද, නියමකර දෙන්නේ වෙයි. මේ අධිමොක්ෂ තෙමේ විචිකිච්ඡාවට ප්‍රතිපක්ෂ වෙයි එහෙයින් අධිමොක්ෂය දෙරබාව සවිකරන්නා වූ ටැඹකට බඳු උපමා ඇති වෙයි. එහෙයින් අධිමොක්ෂය නිශ්චල වූ දෙරබාව සවිකරන්නා වූ ටැඹක් මෙන් ස්ථිරව පිහිටයි විචිකිච්ඡාව එහි සවිකරන්නා වූ දෙරබාවක් මෙන් නිතර ම චඤ්චල ගතියෙන් පවත්නේ ය. තවද නගරචාරය තහවුරු වීම පිණිස සොළොස් රියන් තැන් පොළොව කැණ නගරචාර එලිපත සවිකරනු පිණිස සිටුවන්නා වූ මහටැඹකට බඳු උපමා ඇත්තේය යි යනු සමහර ආචාර්යවරයින් ගේ මතයි. එහෙයින් අධිමොක්ෂය ඉන්ද්‍රඛීලයක් මෙන් ද, සප්‍රශ්‍රාදි චෛතසිකයන්ගෙන් යුක්ත වූ චිත්තය නගරචාරයෙහි එලිපතට බඳු උපමා ඇතිවෙයි. යම්සේ ඒ නගරචාරයෙහි එලිපත එසිකාස්තම්භය හෙතු කොට ගෙණ නොසැලි පවත්නේ වේ ද, එපරිද්දෙන් සසම්ප්‍රයුක්ත වූ චිත්තය ද අධිමොක්ෂය හෙතු කොට ගෙණ අරමුණෙහි අරමුණ විනිශ්චය කරගැනීම් වශයෙන් ස්ථිරව පවත්නේය යි දතයුතු" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ භාව සන්නයි.

10. සමාධිඃ

නොසිඳිනා අයුරින් චිත්තයා ගේ එකාරම්මණයෙක්හි ප්‍රවෘත්තිය සමාධි නම්. කියන ලදි.

"අවිච්ඡිත්ත රූපෙණ චිත්තස්සෙකාලම්බනෙ ප්‍රවෘත්තිඃ සමාධිඃ"

"ආරම්මණෙ චිත්තං සමං ආධියති සම්මා වා ආධියති සමාධාන මත්තමේව වා එතං චිත්තස්සාති සමාධි සො අවිසාර ලක්ඛණො. අවික්ඛෙප ලක්ඛණො වා සහජාතානං සම්පිණ්ඩන රසො නහාතිය චුණ්ණානං උදකං විය උපසම පච්චුපට්ඨානො විසෙසතො සුඛ පදට්ඨානො නිවාතෙ දීපච්චිනං ඨිති විය චෙතසො ඨිතීති දට්ඨබ්බො" යනු විශුද්ධි මාගී ?

"ආරම්මණෙ චිත්තං සමං ආධියති" යනුවෙන් සමාධි ඇති පුද්ගල හෝ සමාධිය ම අවිසෙපප ලක්ෂණ වශයෙන් සම්කොට සිත්හු අරමුණෙහි තබානුයි "සමමා වා ආධියති"යි අවිසාර ලක්ෂණ වශයෙන් මනා කොට තබයි හෝ "සමාධාන මත්තමෙව වා එතං චිත්තස්සා"ති අරමුණෙහි සිත්හු මනා කොට පිහිටීම පමණක්නුයි හෝ සමාධි නම් වේ. අවිසාර ලක්ෂණාදිය ද, වැලිවට මෙන් නොවිසිරිය දෙන ලකුණ ඇත්තේ යි. "අවිසාරො අත්තනො එව අවිසරණ සභාවෙ අවිකෙඛපො සමපයුත්තානං ධම්මානං අවිකඛිත්තතා යෙන සම්පයුත්තා අවිකඛිත්තා හොන්ති සො ධම්මො අවිකෙඛපො" යනු ටිකායි. "අවිසාර ලකඛණා යනුවට සම්පිණ්ඩන රසො"යි කිහු. "අවිකෙඛප ලකඛණෙ" යනුවට "උපසම පච්චුපට්ඨානො"යි කිහු. අව්යුපශම ලක්ෂණ වූ වික්ෂෙපයට ප්‍රතිපක්ෂ බැවින් චිත්තයා ගේ ව්‍යුපශමනාකාරයෙන් වැට-හෙන්නේය යන අර්ථයි. සුඛ වීරහිතවූ ද, සමාධි ඇති බැවින් "විසෙසතො"යි කිහු, "යෙහුය්‍යෙන" යන අර්ථයි. "සුඛිනො චිත්තං සමාධියති"යි- කී බැවින් "සුඛ පදඨානො"යි කිහු. "දිපච්චිනං සීති විය" යනු සභාව වශයෙන් කිහු. යනු සන්නයි. "දීපච්චි නිදස්සනෙන සන්තානජිති භාවං සමාධිස්ස දස්සෙති" යනු ටිකායි.

"පාමොක්ඛ ලකඛණෙ ච සමාධි අවිකෙඛප ලකඛණෙ ව, යථා හි කූටාගාර කණ්ණිකා සෙස දබ්බ සම්භාරානං ආබන්ධනා තො පමුඛා හොති, එවමෙව සබ්බකුසල ධම්මානං සමාධි විත්තන ඉජ්ඣනතො සබ්බසමපි තෙසං ධම්මානං සමාධි පාමොක්ඛා හොති, තෙන වුත්තං "සෙය්‍යථාපි මහාරාජ! කූටාගාරස්ස යා කා චි ඔපානභියො සබ්බා තා කූටඞගමා හොන්ති කූටනින්නා කූටසමොසරණා, කූටං තාසං අග්ගමක්ඛායති, එව මෙව බො මහාරාජ! යෙ කෙචී කුසලා ධම්මා සබ්බ තෙ සමාධි නින්නා හොන්ති සමාධිපොණා සමාධි පබ්භාරා, සමාධි තෙසං අග්ගමක්ඛායතී"ති. යථා ච සෙනඞ්ගං පත්වා රාජා නාම යස්මි යස්මි සෙනා ඔසීදති තං තං ඨානං ගච්ඡති, තස්ස ගත ගතට්ඨානෙ සෙනා පරිපූරති, පරසෙනා භිජ්ජිත්වා රාජානමෙව අනුවත්තති, එව මෙව සහජාත ධම්මා නං විකඛිපිතුං විසකිරිතුං අපපදුනනතා සමාධි අවිකෙඛප ලකඛණෙ නාම හොතීති. අපරෙ පන නාහු, අයං ඒකග්ගතාසෙඛාභූතා සඛිතා සමාධි නාම අවිසාර ලකඛණෙ අවිකෙඛප ලකඛණෙ වා. සහජාත ධම්මානං සම්පිණ්ඩිත

රසෝ නහානීය චුණ්ණානං උදකං විය, උපසම පච්චුපට්ඨානෝ, සද්ධණ පච්චුපට්ඨානෝ වා, සමාහිතෝ යථාභූතං පජානාති පස්සතීතිනි වුත්තං. විසෙසතෝ සුඛ පදට්ඨානෝ නීවාතෙ දිපච්චීනං පිති විය වෙතසෝ පීතිති දට්ඨබ්බා" යනු ධම්මසඞ්ගණි අට්ඨකථාසි.

විසාර විශුඞ්ඩි මාගීයෙන් දන්නේය.

25 ශ්‍රද්ධා'ප්‍රමාදඃ ප්‍රශ්‍රබ්ධි-රුපෙක්ෂා හ්‍රීරපත්‍රපා
මූලමය ඔවිකිංසා-විර්‍යං ච කුශලෙ සදෘ

භාවිය:—ශ්‍රද්ධාදී දශය **කුශලචෛතසිකයෝ** වෙත්.

1 ශ්‍රද්ධා

දීපනි:—"**චිත්තස්‍ය විශුද්ධිඃ ශ්‍රද්ධා**" යනු ටිකා බැවින් සිත්හි පිරිසුදු බව ශ්‍රද්ධා නමි.

"සද්දහනති එතාය සයං වා සද්දහති, සද්දහන මත්තමෙව වා එසාති සද්ධා; සා සද්දහන ලක්ඛණා, ඔකප්පන ලක්ඛණා වා; පසාදන රසා, උදකප්පසාදක මණි විය; පක්ඛන්දන රසා වා, ඔසුත්තරණෙ විය; අකාලුසිය පච්චුපට්ඨානා, අධිමුත්තති පච්චුපට්ඨා වා; සම්ඛය්‍ය වත්ථුපදට්ඨානා, සම්මප්පධාණාදි සොතාපත්තියඞ්ගප්පදට්ඨානා වා, හත්ථෙ චිත්තබීජානි විය දට්ඨබ්බා" යනු විශුඞ්ඩි මාගීයි.

"සද්දහනති එතාය" යනුවෙන් සද්දහන ක්‍රියාවෙහි පවත්නා ධම්මයන්ට එහි ආධිපත්‍යයෙන් ශ්‍රද්ධාව ගේ ප්‍රත්‍යය බව දක්වත්. ඒ ශ්‍රද්ධාව ගේ ධම්මයන්ට එසේ ප්‍රත්‍යය බවක් ඇති කල්හි "පුග්ගලා සද්දහති" යන ව්‍යවහාරය වේ. සද්දහනති, 'පහදිත්නුයි (කම්ඵල සම්බන්ධ්‍ය හදහත්නුයි) සද්දහන ලක්ඛණා, පහදනා ලකුණු ඇත්තී යි. (සද්දහන. සම්බය්‍ය වත්ථුනෝප පත්තිය්‍යයනං තං ලක්ඛණං එතීසෝති සද්දහන ලක්ඛණා"යි හන්නේ. ඔකප්පන ලක්ඛණා, අරමුණට වැදසිටීනා ලකුණු ඇත්තී යි අනුපවිසිත්වා එව මෙතනති කප්පන ලක්ඛණා යන අර්ථයි. සද්දහන ලකුණ ම "පසාදන රසා"යි සම්ප්‍රයුක්ත ධම්මයන් පහදවන කෘත්‍යය කිහු. ඔකප්පන ලකුණ ම "පක්ඛන්දන රසා"යි අරමුණට විදහා කෘත්‍ය කිහු. "ඔසුත්තරණෙ විය" යනු ඔඝාකාන්තීන

රජ ආදීන් ශ්‍රද්ධාවෙන් සඞ්ඝාතරණය කළ සැටි කීහු. සපරිපන්ථ වූ ඝංවතුරු පිණිනන තන්හි දෙපස්හි සිටි මහාජනා එතර මෙතර කරණුවට පළමුකොට බස්නා සුර පුරුෂයකු මෙන් දුනාදි පින් කරණ තන්හි ශ්‍රද්ධා පෙරදැරිව වදනා කෘත්‍ය ඇති බැවින් හෝ "ඔසුතතරණෙ වීය"යි කීහු. අකාලූසිය පච්චුපට්ඨානා, අකලිණ්ඩ අනාවීලව වැටහෙන්නේ සි. "අධිමුත්ති පච්චුපට්ඨානා" යනුයෙහි ප්‍රසාද කටයුතු තන්හි ප්‍රසාදයට විපරීතවූද, අකුසල්වූද, අශ්‍රද්ධිය මිථ්‍යා ඞිමුක්ති නම් වෙයි තත් ප්‍රතිපක්ෂ වූ ප්‍රසාද භූත වස්තුගත නිශ්චය අධිමුක්ති නම් වෙයි. යෙවාපනකාධිමොක්ෂය නොවේ, කියන ලද ලක්ෂණවයට යථාසංඛ්‍යයෙන් ද "පච්චුපට්ඨානං" යනු යොදනු. සඩ්ඛ්‍යය වස්තු පදට්ඨානං; රතනත්‍රය, කර්මය, කර්ම ඵලය ද යන හැදිනිය යුතු වස්තු අන්‍යන් කරුණු කොට ඇතියේ සි. (ශ්‍රද්ධාවට වස්තු නොවන නීවරණාදින් ප්‍රතිෂේධ කළා වෙත්. "සඩ්ඛ්‍ධම්මසවණාදි" යනුයෙහි ආදි ශබ්දයෙන් සප්පුරිසසංසෙවන යොනිසෝ මනසිකාර ධම්මානුධම්ම පටිපත්ති යන ස්‍රෝත ආපත්ත්‍යඞ්ගයෝ ගන්නා ලදහු "භත්ථ චිත්ත බිජානි" යනුවෙහි කුසල ධර්මග්‍රහණයෙහි අතක්කු මෙන් ශ්‍රද්ධා සම්පත්ති සම්ප්‍රදානයෙහි චිත්තයක් මෙන් අමෘත කෘෂිඵල ඵලනයෙහි බීජයක් මෙන් ද ගතයුතු. "සඩ්ධාහත්ථෝ මහානාගෝ"යි කී බැවින් ශ්‍රද්ධාව අත් බව දනයුතු වේ,

"හත්‍ථදස්සනස්ත්දපි ව දට්ඨව්‍යා. යථා න ග්‍රණ්හාති (?) ශ්‍රද්ධා හස්තාදස්තස් තථායම්‍ධ ධම්ම්‍ය ග්‍රණ්හාති (?) "සඩ්ධ චිත්තං පුරිසස්ස සෙට්ඨං"යි බැවින් ශ්‍රද්ධාව ධන බව දනයුතුයි ධනවෙක්‍යා කෘපණෙ. යථා සමඩ්ධිකාය විද්ධා භවති ශ්‍රද්ධා ධනෙන හීනස්තථා සම්පඩ්ධෝ භවති ධම්මේ වා" "සඩ්ධා බීජං තපෝ වුට්ඨී"හි කී බැවින් ශ්‍රද්ධාව බීජ බව දනයුතුයි." "බීජා දසතෝ න භවති යවාංකුරාවක්ෂිතිතලෙපිස්ති කෘෂෙට ශ්‍රද්ධා බීජාදසතෝ නෘතෙ භවති කුසල මූලම්" යනු විශුද්ධිමාර්ග සන්නයි. (විසාර ධම්මසඟ්ණි අට්ඨවාති ද, සූත්‍රනිපාත අට්ඨවාති කසිභාරවාජ සූත්‍ර වණ්ණනායෙහි ද, දක්නේශ.)

2. අප්‍රමාදඃ

විපදනී:—"කුශලානාං ධම්මාණාං භාවනා'ප්‍රමාදඃ" යනු ටීකා බැවින් කුශල ධර්මයන් වැඩීම අප්‍රමාද නාම්.

3. ප්‍රශ්‍රබ්ධි

විභාවනි:—සිත්හි සැහැල්ලු බව ප්‍රශ්‍රබ්ධි නම් "චිත්ත ලඝුතා ප්‍රශ්‍රබ්ධිඃ" යනු ටිකාහි.

"පස්සම්භන්ති එතාය තෙ ධම්මා විගත දරථා භවන්ති සම්භාසපප්පත්තාති=පස්සද්ධි" යනු ධම් සතුණු අටුවා බැවින් වෙදනා-සංඥා-සංස්කාර යන සස්කන්ධත්‍රයයා ගේ දරථ නම් වූ ඔඝධත්‍යාදි කෙලශයෝ ද, විඥානස්කන්ධයා ගේ දරථ නම් වූ ඔඝධත්‍යාදි කෙලශයෝ ද සන්සිඳීමට පැමිණෙත්නුයි. (කාය චිත්ත) ප්‍රශ්‍රබ්ධි (=පස්සද්ධි) නම්

නාලන්දිකා ටිකාවට අනුව ප්‍රශ්‍රබ්ධිය ස්ථවිර වාදයෙහි චිත්ත ලඝුතාව සහ සාධාරණය. ස්ථවිර වාදයෙහි ලඝුතාව වෙන ම චෛතසිකයකි. පස්සද්ධිය වෙන ම චෛතසිකයකි. කාය-චිත්ත ලඝුතාවයෝ පින මිදුධ නීවරණ නමැති බර බහා තබති.

4 උපෙක්ඛා.

විභාවනි:—චිත්තයාගේ ද, ධර්මයාගේ ද, සමතා නම් වූ අනාභොගය උපෙක්ඛා නම්. **"උපෙක්ඛා චිත්තස්ය ධර්මස්ය ච සමතා=නානොගඃ"** යනු ටිකාහි.

"සා හි සුඛ දුක්ඛාකාරපපවත්තිං උපෙක්ඛිතබ්බාකාර සණ්ඨිතත්තා තෙනාකාරෙන පවත්තතීති උපෙක්ඛා" යනු ධම් සතුණු අටුවාහි.

5. හ්‍රීඃ

විභාවනි: මෛත්‍රී-කරුණා-මුදිතාදි ගුණයන්හි ගෞරවය, බිය සහිතව පැවැත්ම හ්‍රී නම්. "මෛත්‍රී කරුණා මුදිතාදි ගුණෙෂු ගෞරවං සභය වසවත්තිතා හ්‍රී" යනු ටිකාහි

6. අපත්‍රප්‍යඃ

විභාවනි:—අණුමාත්‍රවූ ද, වරදෙහි බිය දක්නා සුලු බව අපත්‍රප්‍ය නම්. "අණුමාත්‍රෙෂ්වවද්‍යෙෂු භයදර්ශිතා අපත්‍රප්‍යා" යනු ටිකාහි.

හ්‍රී-අපත්‍රප්‍යඃ (හිරි-ඔත්තප්ප) දෙදෙනා ගේ විශ්‍රණාය ඩීඝුඩිමාගීයෙහි මෙහෙම් විස්තාර කරයි.

"කායෙ දුච්චරිතාදිම්හි හිරියතීති හිරි, ලජ්ජායෙතං අධිවචනං; ඔතප්පති භයෙව ඔත්තප්පතීති ඔත්තප්පං, පාපතො උබ්බේජනස්සෙතං අධිවචනං, තත්ථ පාපතො ජිගුච්ඡන ලක්ඛණා හිරි, උත්තාසන ලක්ඛණං ඔත්තප්පං; ලජ්ජාකාරෙන පාපානං අකරණ රසා හිරි, උත්තාසා කාරෙන ඔත්තප්පං; වුත්තප්පකාරෙනෙව ච පාපතො සඞ්කොචන පච්චුපට්ඨානා එතා, අත්තගාරව පරගාරව පදට්ඨානා; අත්තානං හරුං කත්වා හිරියා පංපං ජහති කුලවධූ විය; පරං හරුං කත්වා ඔත්තප්පෙන පාපං ජහති වෙසියා විය; ඉමෙ පන දෙව ධම්මා ලොකපාල-කාති දට්ඨබ්බා,"

—

"හිරි තොමෝ පාපධර්මයන් ගැර්හයක් මෙන් දක්නී පිළිකුල් කෙරේනුයි "පාපතො ජිගුච්ඡන ලක්ඛණා හිරි"යි කිහු. ඔත්තප්පය ඔවුන් උතුසුමක් මෙන් බලන්නේ එසින් උත්‍රාසයෝ කෙරේනුයි භයවන ආකාරයෙන් පවතීනුයි "උත්තාස ලක්ඛණං ඔත්තප්පං"යි කිහු භය තුණෙක් වේ **ස්‍රාසභය-ඔත්තාප්ප භය** කියූ නිහතභය ය යි තමා අතුරෙහි ඡන්ද ඇත්නට සටමින් උපදනා ප්‍රතිභය ම **ස්‍රාසභය** නම් සංවෙග බහුලය හට මෙහි මේ අයුතු ඇතැයි සංවෙග භය වශයෙන් උපදනා **කුණභය** කියූ නිහතභය නම්. වරදෙහි භය ඇතියහට වරද බලමින් සිටිනා ඔතපම **ඔත්තාබ්බ භය** නම්.

"අකරණ රසා" යනුයෙහි අකරණ නම්, අවීතිවශයෙන් හිරි හා ඔතප් මැයි "උත්තාසාකාරෙන පාපානං අකරණ රසං ඔත්තප්පං" කි නිසායි. "වුත්තප්පකාරෙන" විළි කරණ ආකාරයෙන් හා භය වන ආකාරයෙන් "අත්තගාරව පදට්ඨානා" යනුයෙහි අජ්ඣත්ත සමුට්ඨාන බැවින් ද, ආතම්ධිපති බැවින් ද, හිරිතොමෝ ආතම ගෞරවය ආසන්න කාරණා කොට ඇත්තී ය. බහිද්ධා සමුට්ඨාන බැවින් ද, ලොකාධිපති බැවින් ද, ඔත්තප්පය පර ගෞරවය ආසන්න කාරණ කොට ඇත්නේයි. එම අර්ථය අතිශයින් ප්‍රකට කරනු පිණිස "අත්තානඤ්ච" යනාදිඝ කියන ලදි. හිරිඔතපුන් ගේ අජ්ඣත්ත සමුට්ඨානාදිභාව ද, ඒ ඒ තන්හි ප්‍රකට බැවින් කියන ලදි. මෙම කිහ. සත්ත්වයෙහි හිරිය බලවත් තන්හි ඔත්තප්පය අව්‍යවහාරික වෙයි. ඔත්තප්පය බලවත් තන්හි ත් අව්‍යවහාරික වෙයි. මේ හිරි ඔතප්පුන්ගේ විභාගේ කිසිකෙලෙහි අනාපත්තිකර විප්‍රකෘතාභාග තෙතාවෙහි හිරිය වූ ලජ්ජාවෙහි ඉහත් දුප්පා හැඩුහා වූ පාපෙහයක් ඉහත්

නැත්තේ යි. "ලොකපාලකා" යන මෙහි "වෙ මෙ භික්ඛවෙ සුක්කා ධම්මා ලොකං පාලෙන්ති" යන සූත්‍ර පදය ද, අත්තාධිපති ලොකාධිපති භාවයනුදු යෙදේ. සො අත්තානං යෙව අධිපතිං කරිත්වා සො ලොකං යෙව අධිපතිං කරිත්වා" යන සූත්‍ර පදයනුදු [illegible] සැර දැක්විය [illegible]" යනු විශුද්ධිමාර්ග සන්නයි. (විස්තර ජාතකට්ඨකථායෙහි දෙවධර්ම ජාතකයෙහි දක්නේ ය.

7-8 මූලද්වයං

විප්පනී:—මූලවය නම්; අලොභය-අවෙෂය යන කුසල් මූල් දෙකයි.

9 අවිහිංසා.

විප්පනී:—කරුණාව ම අවිහිංසා නම්.

10 වීර්‍යං

විප්පනී:—චිත්තයා ගේ උත්සාහය වීර්‍ය නම්.

26 මොහඃ සමාදඃ කෞසිද්‍යං-අශ්‍රාද්ධ්‍යං සත්‍යාන මුද්ධතිඃ සවීද්‍ය කලිඝෙට අකුශලෙ-ත්වාහ්‍රීක්‍ය මනපත්‍රපා

භාවය:—මොහාදිහු ක්ලෙශ මහාභූමිකයෝ වෙත් ආහ්‍රීක්‍ය (=අහිරික) අනපත්‍රපා (=අනොත්තප්ප) යනු අකුශල මහා භූමිකයෝ වෙත්.

1 මොහඃ

විප්පනී:—මොහය නම් නොදැනීමයි "**මොහොඤ්ඤානම්**" යනු ටිකායි. මුය්හන්ති තෙන, සයං වා මුය්හති, මුය්හන මත්ත මෙව වා තන්ති මොහො. මොහො චිත්තස්ස අන්ධභාව ලක්ඛණො අඤ්ඤාණ ලක්ඛණො වා, අසම්පටිවෙධ රසො, ආරම්මණ සභාවච්ඡාදන රසො වා, අසම්මා පටිපත්ති පච්චුපඨානො, අන්ධකාර පච්චුපඨානො වා, අයොනිසො මනසිකාර පදට්ඨානො, සබ්බාකුසලානං මූලන්ති දඨබ්බො" යනු විශුද්ධි මාර්ගයි.

3 කෞසිද්‍යං

විප්පනී:—කුශල ධර්මයන්හි අනුත්සාහය කෞසිද්‍ය නම්.

4 අශ්‍රාද්ධ්‍යං

විප්පනී: -"ශ්‍රද්ධා" යනු බලනු (2. 19)

5 ස්ත්‍යානං

විප්පනී:—අකම්ණ්‍ය ස්වභාවය ස්ත්‍යාන (=ඵින) නම් "තත්ථ ඵිනනතා ඵිනං. තත්ථ ඵිනං අනුස්සාහ ලක්ඛණං, විරිය විනොදන රසං. සංසීදන පච්චුපඨානං" යනු විශුද්ධි මාර්ගයි

"තත්ථ කතමං ඵිනං? යෘ චිත්තස්ස අකල්‍යතා අකම්ම ඤ්ඤතා ඔලීයනා සලලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ඵිනං ඵියනා ඵියිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති ඵිනං" යනු විභඞ්ග පාළියි.

ආහ්‍රික්‍ය මන පත්‍රපා

විප්පනී:—"නාහිරීයති න ලජ්ජීයතීති අහිරිකො. පුග්ගලො චිත්තං තං සම්පයුත්ත ධම්ම සමුදයො වා. අහිරිකස්ස භාවො අහිරික්කං"යි කියයුත්තෙහි එක් කකාරයකට ලොප් කොට "අහිරිකං"යි කියන ලදී. -පෙ-අලජ්ජනා කාරෙන පාපානං කරණ රසං අහිරිකං අනුත්තාසා කාරෙන අනොත්තප්පං වුත්තප්පකාරෙනෙව පාපතො අසංකොචන පච්චුපඨානානි අඤ්ඤානි පරෙසුච අගාරව පදඨානානි ගාමසූකරස්ස විය අසුචිතො කිලෙසා සුචිතො අජිගුච්ඡනා අහිරිකෙන හොති සලභස්ස විය අඞ්ගිතො පාපතො අනුත්තාසො අනොත්තප්පෙන හොති" මෙසේ උක්ත ප්‍රතිපක්ෂ වශයෙන් විස්තරය වෙදිතව්‍යයි.

නාහ්‍රිප්ජුගුපසතෙ පාපා
දමෙධ්‍යාදිව සූකරඃ
සල භොගෙනරිවෙ තස්මා
නත්‍ර සන්ති න පත්‍රපා"

යනු විශුද්ධි මාර්ග සන්නයි.

(2-25) ශ්‍රීඃ අපත්‍රපා යනු බලනු.

27 ක්‍රොධො'පනාහ ශාඨ්‍යෙෂ්‍යා—ප්‍රදාස ම්‍රක්ෂ මත්සරාඃ
මායා මදෙ විතිංශෙති—පරිත්ත කෙලශ භූමිකාඃ

භාවය:—ක්‍රොධාදි දශය පරිත්ත (=අල්පක) කෙලශ භූමිකා වෙත්

1-2 ක්‍රෝධ සූත්‍රය

විස්තර:—කිපීම ලක්ෂණ කොට ඇති නවවිධ ආඝාත වස්තූන් ගෙන් හටගත්තේ **ක්‍රෝධයයි** එය නැවත නැවත කිපීම් වශයෙන් පැවැත්තේ **උපනාහයයි** එනම්, **ඛිඩ්ඩාපදචරියායි.**

"තත්‍ථ කතමෝ **කොධෝ**? යෝ කොධෝ කුජ්ඣනා කුජ්ඣිතත්තං දෝසෝ දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා විරොධෝ පටිවිරොධෝ චණ්ඩික්කං අසූ-රොපෝ අනත්තමනතා චිත්තස්ස අයං වුච්චති **කොධෝ** තත්‍ථ කතමෝ උපනාහෝ? පුබ්බකාලං කොධෝ අපරකාලං **උපනාහෝ.** යෝ එවරූපෝ උපනාහෝ උපනයනා උපනයිතත්තං ආඨපනා ඨපනා සණ්ඨපනා අනුසංසන්දනා අනුපබන්ධනා **දළහික්‍ඛම්මං කොධස්ස** අයං වුච්චති **උපනාහෝ**" යනු විභඞ්ග පාළියි.

"තත්‍ථ කුජ්ඣනා ලක්ඛණෝ **කොධෝ.** සෝ නවවිධ ආඝාත වත්ථු සමාවෝ, අක්කොසිජි මං අවධි මහනි ආදිනා පුනප්පුනං කුජ්ඣනා වසෙන චිත්තං පරියොනන්ධනෝ **උපනාහෝ.** උභයම්පි පටිඝොයෙව, සෝ පවත්තිනා නත්තනෝ සිනිද්ධා වුත්තෝ. **සකිං උප්පජ්ජනා කොධෝ කොධෝයෙව, බහුකම්පි උපනාහෝ** වුත්තං වෙතං **පුබ්බකාලෙ කොධෝ අපරකාලෙ උපනාහෝති**" යනු සාරත්‍ථ දීපනී ටීකායි.

3 ශාඨ්‍ය

විපත්ති:—තමන් වෙත අවිද්‍යමාන ගුණ ප්‍රකාශ කිරීම ලක්ෂණ කොට ඇති කෛරාටික භාවයෙන් උපදිනු ලබන්නේ ශාඨ්‍ය නම්. අවිද්‍යමාන ගුණ පැවසීම කෛරාටික කමයි. විදරණ ලදී. තත්‍ථ කතමං **සාඨෙය්‍යං**? ඉධෙකච්චෝ සඨෝ හොති පරිසඨෝ යං තත්‍ථ සඨං සඨතා කක්කරතා කක්ක-රියං පරික්ඛත්තතා පරික්ඛත්තියං ඉදං වුච්චති **සාඨෙය්‍යං**" කෛරාටික තැනැත්තේ ආනන්ද මත්සර්‍යයා මෙනි. කියන ලදී.

"කෙරාටිකෝ හි පුග්ගලෝ ආනන්ද මච්ඡෙරං චිය හොති, ආනන්ද මච්ඡෙරං හාවි සප්පමුඛ මච්ඡරා ලා එකා මච්ඡ ජාති. අයං කිර මච්ඡරානං නඩිතුඨං දස්සති, සප්පාහං ඛිප්‍රභාවං සබ්බෝ අනන්ත ජාතාදෙකුං එවමෙව්

කෙරාටිකො පුග්ගලො යං යං සුත්තන්තිකංවා ආභිධම්මිකංවා උපසඞ්කමති, තං තං එවං වදති, අහං තුම්හාකං අන්තෙවාසි. තුම්හෙ මය්හං අනුකම්පකා නාහං තුම්හෙ මුඤ්චාමීති එවමෙතෙ සගාරවො අයං අම්හෙසු සප්පතිස්සොති මඤ්ඤිස්සන්ති, තස්ස එවං කෙරාටික භාවෙන උප්පජ්ජමානං සාඨෙය්‍යං'' යනු විනය ටිකායි.

4 ඊෂ්‍යා

විෂ්පති:—මෙරමා සැප නො ඉවසනුයේ ඊෂ්‍යා යි. "**පරෙසං සක්කාරාදිනි ඛියමානා උසූයමානා ඉස්සා**'' යනු විනය ටිකායි.

"**තත්ථ** කතමා ඉස්සා? යා පරලාභ සක්කාර ගරුකාර මානන වන්දන පූජනාසු ඉස්සා ඉස්සායනා ඉස්සායිතත්තං උසූයා උසූයනා උසූයතත්තං අයං වුච්චති ඉස්සා'' යනු විභඞ්ග පාළියි.

5 ප්‍රදාස (පාළි=පලාස)

විෂ්පති:—යුගග්‍රාහය (=සම කොට ගැන්ම) **ප්‍රදාස** නම්

"**තත්ථ** කතමො **පළාසො**? 'යො පළාසො පළාසායනා පළාසාහාරො විවාදඨානං යුගග්ගහො අප්පටි නිස්සග්ගො අයං වුච්චති. **පළාසො** යනු විභඞ්ග පාළියි.

"**පරස්ස** ගුණෙ දස්සිත්වා අත්තනො ගුණෙහි සමෙ **කරොතිති** අත්ථො. සො පන බහුස්සුතොපි පුග්ගලෙ අජ්ඣොත්ථරිත්වා ඊදිසස්ස වෙ බහුස්සුතස්ස අනියතා ගති තව වා මම වා කො විසෙසො රත්තඤ්ඤූ චිර පබ්බජිතෙ පුග්ගලෙ අජ්ඣොත්ථරිත්වා ත්වම්පි ඉමස්මිං සාසනෙ පබ්බජිතො අහම්පි පබ්බජිතො ත්වම්පි සීලමත්තෙ ඨිතො අහම්පිති ආදිනා නයෙන උප්පජ්ජමානො **යුගග්ගාහො**. යුගග්ගාහ ලක්ඛණෙහි පලාසො'' යනු එහි ම කිහ.

6 මුක්ෂ (පාළි=මක්ඛ)

විෂ්පති:—කළ උපකාර මක්නුයේ (ගුණ) මකු නම් වේ.

"**තත්ථ** කතමො **මක්ඛො**? යො මක්ඛො මක්ඛියනා මක්ඛයිතත්තං නිඨුරිය කම්මං අයං වුච්චති **මක්ඛො**? යනු විභඞ්ග පාළියි.

අගාරියස්ස අනගාරියස්සවා සුකත කරණ විනාස නො මක්ඛො, අගාරියො පි හි කෙනවි අනුකම්පකෙන දළිද්දො සමානො උච්චෙ ඨානෙ ඨපිතො අපරෙන සම යෙන කිං තයා මය්හං කතන්ති තස්ස සුකත කරණං විනාසෙති.

අනාගාරියො පි සාමණෙර කාලතොප්පභුති ආචරියෙන වා උපජ්ඣායෙන වා චතුහි පච්චයෙහි උද්දෙස පරිපුච්ඡාදි හි ච අනුග්ගහෙත්වා ධම්මකථා නය පකරණ කොසල්ලාදිනි සික්ඛාපිතො අපරෙන සමයෙන රාජ රාජමහාමත්තාදිහි සක්කතො ගරුකතො ආචරියුපජ්ඣායෙසු අවිත්තිකතො චරමානො අයං අම්හෙහි දහරකාලෙ එවං අනුග්ගහිතො සංවඩ්ඪිතො ච, අථ ච පනිදානි නිස්සිනෙහො ජාතොති වුච්චමානො කිං මය්හං තුම්හෙහි කතන්ති තෙසං සුකත කරණං විනාසෙති තස්සෙ සො පුබ්බකාරිතා ලක්ඛණස්ස ගුණස්ස විනාසනො උදක පුඤ්ඤනීයා විය සරීරානුගත උදකානි පුඤ්ඤන්තො මක්ඛො තථා හි සො පරෙසං ගුණානං මක්ඛනට්ඨෙන මක්ඛොති වුච්චති'' යනු සාරත්ථ දිපනී ටිකායි.

7 මත්සරා

විප්පනි: ස්ව සම්පත් සැඟවීම ස්වභාව කොට ඇත්තේ මාත්සර්යයි. ''මච්ඡරස්ස භාවො මච්ඡරියං මා ඉදං අච්ඡරියං අඤ්ඤෙසං හොතු මය්හ මෙව හොතුති පවත්තං වා මච්ඡරියං තං අත්තසම්පත්ති නිගුහන ලක්ඛණං'' යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි.

''තත්ථ කතමං මච්ඡරිය? පඤ්ච මච්ඡරියානි ආවාස මච්ඡරියං කුල මච්ඡරියං ලාභ මච්ඡරියං වණ්ණ මච්ඡරියං ධම්ම මච්ඡරියං, යං එවරූපං මච්ඡෙරං මච්ඡරායනා, මච්ඡරාය තත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චකතා පග්ගහිතත්තා චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං යනු විභඞ්ග පාළියි.

මෙහි ආවාස නම්; ආරාමය හෝ පිරිවෙණ හෝ ඔවරකය හෝ රාත්‍රිස්ථාන දිවාස්ථානාදි තැන්ය. කුල නම්; උපස්ථායක කුලය හෝ ඥාති කුලයයි. ලාභ නම්; ප්‍රත්‍යය ලාභයයි, වණ්ණ නම්; ශරීර වර්ණය හෝ ගුණ වර්ණය යි. ධර්ම නම්

පර්‍යාප්ති ධර්මය හෝ ප්‍රතිවේධ ධර්මයයි. "ඉමෙසු පඤ්චසු මච්ඡරියෙසු ආවාසමච්ඡරියෙන තාව යක්ඛො වා පෙතො වා හුත්වා තස්සෙව ආවාසස්ස සඞ්කාරං සීසෙන උක්ඛිපිත්වා විචරති.

කුලමච්ඡරියෙන තස්මිං කලෙ අඤ්ඤෙසං දුනමානා-දිනි කරොන්තෙ දිස්වා භින්නං වතිදං කුලං මමාති චින්ත යතො ලොහිතම්පි මුඛතො උග්ගච්ඡති. කුච්ඡිවිරෙචනම්පි හොති, අන්තානිපි ඛණ්ඩා ඛණ්ඩානි හුත්වා නික්ඛමන්ති.

ලාභ මච්ඡරියෙන සඞ්ඝස්ස වා ගණ්ස්ස වා සන්තකෙ ලාභෙ මච්ඡරායිත්වා පුග්ගලික පරිභොගං විය පරිභුඤ්ජිත්වා යක්ඛො වා පෙතො වා මහා අජගරො වා හුත්වා නිබ්බත්තති.

සරිර වණ්ණ ගුණවණ්ණ මච්ඡරියෙන පරියත්ති ධම්ම මච්ඡරියෙන ච අත්තනො ච වණ්ණං වණ්ණෙති පරෙසං වණ්ණෙ කිං වණ්ණො එසොති තං තං දොසං විදන්තො පරියත්ති ධම්මඤ්ච කස්සචි කිඤ්චි අදෙන්තො දුබ්බණ්ණො වෙ ච එළමූගො ච හොති.

අපි ච ආවාස මච්ඡරියෙන ලොහගෙහෙ පච්චති. කුලමච්ඡරියෙන අප්පලාභො හොති. ලාභ මච්ඡරියෙන ගුළ නිරයෙ නිබ්බත්තති වණ්ණ මච්ඡරියෙන භවෙ නිබ්බත්තස්ස වණ්ණො නාම නහොති ධම්ම මච්ඡරියෙන කුක්කුළ නිරයෙ නිබ්බත්තති" යනු ධම් සඟුණු අටුවායි.

මෘදු මාත්සර්‍යය **වෙවිච්ඡා** නම්. ස්තබ්ධ මාත්සර්‍යය **කදරිය** නම්.

8 මායා.

ටිප්පනි: සිය දොස් වැසීම ලක්ෂණ කොට ඇති වඤ්චනික ස්වභාවය **මායා** නම්. කියන ලදී.

වඤ්චනික චරිය භූතා **මායා**. සා සක දොස පටිච්ඡාදන ලක්ඛණා, තථාහි යා අත්තනො විජ්ජමාන දොස පටිච්ඡා-දන තො චක්ඛුමොහ **මායා** වියාති මායාති වුච්චති"

විභඞ්ග පාළියෙහි මෙසේ විදරන ලදී

"තත්ථ කතමා **මායා**? ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදන හෙතු පාපිකං ඉච්ඡං පනිදහති, මා මං ජඤ්ඤාති ඉච්ඡති මා මං ජඤ්ඤාති සංකප්පෙති, මා මං

ජඤ්ඤාති වාචං භාසති, මා මං ජඤ්ඤාති කායෙන පරක්කමති යා එවරූපා මායා මායාවීතා අච්චාසරා වඤ්චනා නිකති විකකිරණා පරිහරණා ගුහණා පරිගුහණා ඡාදනා පටිච්ඡාදනා අනුත්තානි කම්මං අනාවි කම්මං වොච්ඡාදනා පාපකිරියා අයං වුච්චති මායා.

9 මදෙ.

විප්පති:—ජාත්‍යාදින් නිසා මත්වීම් ස්වභාවය මද නම්. කියන ලද මැයි. "ජාති ආදිං පටිච්ච මජ්ජනාකාරො මදෙ" යි

"තත්ථ කතමො මදෙ? යො මදෙ මජ්ජනා මජ්ජිතත්තං මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමෝ ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස අයං වුච්චති මදෙ" යනු විභඞ්ග පාළියි.

මදය නම්, අර්ථ වශයෙන් මානය මැයි. කියන ලදී.

"සොපි අත්ථතො මානො එව" යි 'සො පන ජාතිමදෙ ගොත්තමදෙ ආරොග්‍යමදෙ යොබ්බනමදෙ ජීවිතමදෙ ලාභමදෙ සක්කාරමදෙ ගරුකාරමදෙ පුරෙක්ඛාරමදෙ පරිවාරමදෙ භොගමදෙ වණ්ණමදෙ සුතමදෙ පටිභානමදෙ රත්තඤ්ඤුමදෙ පිණ්ඩපාතිකමදෙ අනවඤ්ඤත්තිමදෙ ඉරියාපථමදෙ ඉඩිමදෙ යසමදෙ සීලමදෙ ඣානමදෙ සිප්පමදෙ ආරොහමදෙ පරිනාහමදෙ සණ්ඨානමදෙ පාරිපූරිමදෙ ති අනෙක විධො" යනු බැවින් ජාත්‍යදින් අනෙක ප්‍රකාරය. (විස්තරය සාරාර්ථ දීපති විනය ටිකාහි දක්නේය 225 පිටුව.)

10 විහිංසා

විප්පති:—**අවිහිංසා** බලනු. (2-25.)

පරිත්ත කෙලශ භූමිකා:

විප්පති:—අල්ප කෙලශ භූමින්හි පිහිටි බැවින් ක්‍රොධාදි දශය පරිත්ත කෙලශ භූමිකයෝ වෙත්. "ක්ෂුද්‍රකාණාං මලානාං භූමිෂු ස්ථිතත්වෙන් පරිත්ත කෙලශ භූමිකා උව්‍යන්තෙ" යනු ටිකාහි.

28 සවිතක්ක විචාරත්වාත්-කුශලෙ කාම වෙතසි
ඩා විංශති ශෛවතසිකාඃ-කෞකෘත්‍යමධිකං ක්වචිත්

භාවය: - විතක්ක-විචාර ප්‍රවෘත්ති ස්වභාව හෙයින් කුශල කාම ධාතු වෙහි සියලු කල්හි දෙවිසි වෛතසිකයෝ වෙත්. කෞකෘත්‍ය යාගේ අධිකත්වයෙන් සමහර කලෙක තෙවිස්සක් ද වෙත්.

සවිතක්ක විචාරත්වාත්

විස්සනි:— 1-32 කාරිකාව බලනු. (98 වැනි පිටුව)

ඩාවිංශතිශෛවතසිකාඃ

විස්සනි: - විතක්ක-විචාර දෙදෙනා සමග වෙදනාදි දශය ද' (2-24) ශ්‍රද්ධාදි දශය ද, (2-25) දෙවිසි වෛතසිකයෝ නම් වෙත්.

කෞකෘත්‍ය

විස්සනි: — කළා වූ දුශ්චරිතයත්, නොකළා වූ සුචරිතයත් උදෙසා උපන් විපිළිසරය කෞකෘත්‍ය නම් වේ.

"කුච්ඡිතං කතං කුකතං කතාකත දුච්චරිතං සුචරිතං. "යං මයා අකතං තං කුකතං"යි නො කරන ලද දෙයටත් ලොකයා කුකතය යි ව්‍යවහාර කෙරෙත්. මෙතැනැ වනාහි කෘතාකෘත දුශ්චරිත සුචරිත අරභයා උපන් විප්‍රතිසාර චිත්තය කුකත නම් වේ. තස්ස භාවො කුක්කුච්චං තං කතා කත දුච්චරිත සුචරිතානු සොචන ලක්ඛණං"යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි.

"දුසබ්‍යං විය දඞ්ඛබං"යි කෞකෘත්‍යය දුසභාවය මෙන් දත යුතුය. මෙය විස්තර කරන විශුද්ධිමාර්ග සන්නයේ මෙසේ කියති.

"යම්සේ දුස භාවය ඇති කල්හි දුසයා පරායත්ත වේ ද, එසේ ම කුක්කුච්චය ඇති කල්හි තත් සමන්විතයා තමාගේ ධර්මතාවෙන් කුශලයෙහි පවත්නට අසමර්ථවේ ද, එහෙයින් දුසව්‍යයක් මෙන් දත යුතුය යන අර්ථයි මෙම කීහ. ටීකාවෙහි "පරායත්තතා හෙතුතාය දුසබ්‍යං විය දඞ්ඛබං. යථාහි දුසබ්‍යෙ සති දුසො පරායත්තො හොති එවං කුක්කුච්චෙ සති තං සමඞ්ගි නාහි සො අත්තනො ධම්මතාය කුසලෙ පවත්තිතුං සක්කොති"

29 ආවෙණිකෙත්ව කුශලෙ-දෘෂ්ටියුක්ත ච විංශතිඃ
ක්ලෙශෙශවතුර්භිඃ ක්‍රොධාද්‍යෛඃ-කෞකෘත්‍ය
නෛක විංශතිඃ

භාවය: අවිද්‍යාවෙන් සහ මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්ත වූ අකුශල චිත්ත යෙහි චෛතසික විස්සකි. සිව්වැදෑරුම් ක්ලෙශයන්ගෙන් එකකින් හෝ ක්‍රොධාදීන් එකකින් හෝ කෞකෘත්‍යයෙන් හෝ යුක්තවූයේ චෛතසික එක් විස්සකි.

ආවෙණික

විප්පනි:—අවිද්‍යා සහගත චිත්තය **ආවෙණික** චිත්ත නම්.

දෘෂ්ටිඃ

විප්පනි: ශීලයෙහි සහ ව්‍රතයෙහි සැකය නම් වූ මිථ්‍යාදෘෂ්ටිය මෙහි දෘෂ්ටි නම්.

විංශතිඃ

විප්පනි: මහා භූමික චෛතසික දශය ද, ක්ලෙශ මහා භූමික චෛතසික සය ද, කුශල මහා භූමික චෛතසික දෙක ද, විතර්ක-විචාර දෙක ද යන විස්ස.

ක්ලෙශෙශවතුර්භිඃ

විප්පනි:—**රාග-ප්‍රතිඝ-මාන-විචිකිත්සා** යන සිව් වැදෑරුම් ක්ලෙශ යන්ගෙන් එකකින්.

ක්‍රොධාද්‍යෛඃ

විප්පනි:—2-27 කාරිකාව බලනු. (17 වැනි පිටුව)

එකවිංශතිඃ

විප්පනි:—පූර්වෝක්ත විස්ස ද, ක්‍රොධ-උපනාහ-ශාඨ්‍ය-කෞකෘත්‍යා දීන් එකක්දැයි යන එක් විසි චෛතසිකයෝ.

30 නිවෘත්තෙත්‍යටාදශාන්‍යත්‍ර-ටාදශාව්‍යකෘතෙ මතාඃ
මිද්ධං සර්වා විරුඬත්වා-දසති යත්‍රාධිකං භවෙත්

භාවය:—නිවෘත්ත චිත්තයෙහි අටළොස් චෛතසිකයෝ ද, අව්‍යා කෘතයෙහි දෙළොස් චෛතසිකයෝ ද, වෙත්. මිද්ධය සියල්ල සහ අවිරුද්ධ බැවින් එය යුක්තවූයේ ද, එකල්හි අධිකයක් වන්නේය; හෙවත් එකුන්විස්සක් සහ තෙළෙසක් වන්නේය.

නිවෘත්ත

විප්පනි:—ක්ලෙශයන්ගෙන් වැසුණු චිත්තය **නිවෘත්ත** නම්.

අෂ්ටාදශෘති.

විප්පනි:—මහාභූමික චෛතසික දශය ද, ක්ලෙශ භූමික චෛතසික සය ද, විතර්ක-විචාර දෙක ද, යන අටළොස.

මාදශ

විප්පනි:—මහාභූමික චෛතසික දශයත්, විතර්ක-විචාර දෙකත් යන දෙළස.

මිද්ධං

විප්පනි:—මිද්ධය නම්, අලස බවයි. "**මිද්ධං ආලස්‍යං**" යනු ටීකායි. "මිද්ධනතා, කළකිරෙන බවය" යනු විශුද්ධිමාර්ග සන්නයි. "මිද්ධං අකම්මඤ්ඤතා ලක්ඛණං, ඔනහනරසං, ලීනතා පච්චුපට්ඨානං, පචලායික තිඤ්ඤපච්චුපඨානං වා" යනු විශුද්ධිමාර්ගයි.

මිද්ධනම්; වෙදනාදි ස්කන්ධත්‍රයයාගේ අකර්මණ්‍ය භාවයයි.

ස්ත්‍යාන-මිද්ධ දෙදෙනාගේ විශෙෂය අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයෙහි මෙසේ විස්තර කරති.

"**තත්ථ කතමං ථීනං යා චිත්තස්ස අකල්ලතා අකම්මඤ්ඤතා**"

"**තත්ථ කතමං මිද්ධං යා කායස්ස අකල්ලතා අකම්මඤ්ඤතා**" යනාදීන් මේ ස්ත්‍යාන මිඩ දෙදෙනාගේ නිර්දේශය ප්‍රවෘත්ත හෙයින් "කායස්ස" යන මේ සාමාන්‍ය වචනයෙන් රූපකායයාගේ ද, අකර්මණ්‍යත්වය මිද්ධ නම් වේනුයි. ඔහුගේ රූපත්වය පැමිණෙන්නේ වේ ද යත්? නොපැමිණෙන්නේයි. කුමක් හෙයින් ද යත්? ඒ ඒ ස්ථානයෙහි ආචාර්යවරුන් විසින් කාරණ දක්වා ප්‍රතික්ෂේප කළ හෙයිති. එසේ මැයි. මිඩවාදී මත නිෂෙධය පිණිස අ ච ර්යයන් විසින් අනෙකප්‍රකාරයෙන් විස්තර කරන ලද මේ මතු කියන්නේ සඞ්ග්‍රහයයි.

කෙවී මිධමිති රූපඤති-වදතෙන තං නාසුජ්ජති
සනානත්තබබසු වුත්තනයතා-කාමච්ඡන්දාදයෝ විය

පහාතබබසු අකඩාතං-මෙතං නීවරණෙසු කි
රූපතතු න පහාතබබ-මිකඩාතං දස්සනාදිනා

න තුමහං නිකඩතව රූපං-ජහථෙතනති පාඨතතා
පතෙසය භාව ළදතොපි-ගමපි රූපසස දිසසති

තසථ නබබිසයච්ඡන්ද-රාගතාති පකාසිතා
භාවය:—කාමධාතුගත සිත් පසකින් අනිවෘතාව්‍යාකෘතය ද, එයට අනතුරුව සිත් සතක් ද, උපදී. කුශල චිත්තයා කෙරෙන් රූප ධාතුවෙහි සිත් එකොළොසක් ද, එයට අනතුරුව සිත් සතක් ද, උපදී. කුශල චිත්තයා කෙරෙන් රූප ධාතුවෙහි සිත් එකොළොසක් ද, එයට අනතුරුව සිත් නවයක් ද, උපදී.

සප්ත චිත්තානි තදනන්තරම්

විප්පනී:—කාමධාතුගත සිත් සතරක් ද, රූප ධාතුගත සිත් දෙකක් ද, ආරූප්‍යධාතු ගත නිවෘතාව්‍යාකෘතය ද, යන සිත් සත,

එකාදශ ශුභාද්‍රූපෙ

විප්පනි:—ආරූප්‍යධාතුවෙහි අනිවෘතාව්‍යාකෘතය හැර සෙසු සියල්ල.

තත්තව සමන්තරම්

විප්පනි:—ආරූප්‍ය අනිවෘත ව්‍යාකෘතය ද, කාමධාතුගත කුශල නිවෘතා ව්‍යාකෘතය ද, හැර සෙස්ස.

69 අෂ්ටභ්‍යෝ නිවෘතං තස්මාත්-ෂට්ක මනිවෘතං ත්‍රයාත් තතඃ ෂට්කමියං නීති-රාරූප්‍යෙපි ශුභාත්තව

භාවය:—රූපධාතුවෙහි අෂ්ට චිත්තයන්ගෙන් නිවෘතාව්‍යකෘත චිත්තය වේ. එයින් ෂට් චිත්තයෝ වෙත් චිත්තත්‍රයෙන් අනිවෘතා ව්‍යාකෘත ය වේ. එයින් සිත් සයක් වේ. ආරූප්‍ය ධාතුවෙහි ද, මේ ක්‍රමය ම වේ.

අෂ්ටභ්‍යඃ

විප්පනි:—කාමක්ලිෂ්ට චිත්තවයය ද, ශෛක්ෂා ශෛක්ෂ චිත්තවය ය ද, හැර සෙස්ස.

ෂට්කං

විප්පනි:—රූපධාතුගත චිත්තත්‍රය ද, කාම ධාතුගත කුශල-අකුශල නිවෘතාව්‍යාකෘතය යන චිත්තත්‍රය ද, ෂට් චිත්තයෝ නම් වෙත්.

ෂට්කං

විප්පනි:—රූපධාතුගත චිත්තත්‍රය ද, කාමධාතුගත අකුශල නිවෘතාව්‍යාකෘතය ද, යන සිත් දෙක ද, ආරූප්‍ය නිවෘතා ව්‍යාකෘතය ද, යන සිත්සය.

ඉයං නීතිරාරූප්‍යෙපි

විප්පනි:—ආරූප්‍ය ධාතුවෙහි ද, මේ ක්‍රමය ම වේ. එහිදු අනිවෘත ව්‍යාකෘතයන්ගෙන් මෙන් චිත්තත්‍රයයෙන් චිත්තයෝ උපදිත්.

ශුභාත්තව

විප්පනි:—කාම කුශල - කාමරූප - අනිවෘතාව්‍යාකෘත යන සිත් තුන හැර සෙසු නව චිත්තයෝ කුශල චිත්තයන්ගෙන් උපදිත්.

70 චිත්තානි නවධාවත් ඡධිධානිවඅනාක්

සපඤ්ඤ කත්තබ්බා

සෛක්ෂං චතුෂ්ඨිඃ එතඤ්ඤාතපංචා සෛක්ෂං තු

පංචකාත්.

භාවිය:—ඉව් චිත්තයන් කෙරෙන් කුශල චිත්තය උපදි. නිවෘත ව්‍යාකෘතයෙන් සපත්ත චිත්තයෝ උපදින්. සිත් සතරකින් සෛක්ෂය ද, එසින් සිත් පසක් ද, (උපදි)

ඡධිධානත්

විපත්ති—ආරූප්‍ය ධාතුගත චිත්තත්‍රය ද, රූප කුශල චිත්තය ද, අනාශ්‍රව චිත්තද්වය ද, යන සය.

සපඤ්ඤ

විපත්ති:—නිවෘතාව්‍යාකෘතයෙන් ආරූප්‍ය ත්‍රයය ද, රූප කුශල චිත්තය ද, කාමකලිඹට චිත්තවර්ජය ද, රූපකලිඹවය ද, යන සපත්ත චිත්තයෝ උපදින්.

සෛක්ෂං චතුෂ්ඨිඃ

විපත්ති—.සෛක්ෂ කුශල-කාම්-රූප-ආරූප්‍ය යන සිත් සතරින් සෛක්ෂ චිත්තය උපදි.

පංචකාත්

විපත්ති:—සෛක්ෂ-අසෛක්ෂ-කුශල කාම – රූප – ආරූප්‍ය යන පසින් අසෛක්ෂය වේ.

71 තඤ්ඤාවත්තබ්බානි චිත්තානි-වාදඤ්ඤානි ඉංඝන්ති:
ඹිඹා නිබ්බා ප්‍රාණයාඛිඤ්ඤා පපත්තී ලාභිකං ඤුඤම්.

භාවිය:—ඒ අසෛක්ෂයන්ගෙන් සිත් සතරක් ද, දෙළොසක් ද, උපදි. ඒ සියල්ල විස්සකි කුශල චිත්තය ප්‍රාණොඝික උපපත්ති ලාභිකයයි දෙපරිදි කොට බෙදූ, (අනතුරු කාරිකාව හා සම්බන්ධයි)

තඤ්ඤාවත්තබ්බානි චිත්තානි

විපත්ති:—අසෛක්ෂ + කුශල (කාම රූප ආරූප්‍ය) යන සතර

වාදඤ්ඤ

විපත්ති: කාම්කුශල (කාම රූප ආරූප්‍ය) කුශල නිවෘතාව්‍යාකෘත අනිවෘතාව්‍යාකෘත සෛක්ෂ අසෛක්ෂ (අනාශ්‍රව 2)

ඹිඹා නිබ්බා ප්‍රාණඤ්ඤාඛිඤ්ඤා පපත්තී ලාභිකං ඤුඤම්

විපත්ති: තෙධාතුක කුශල චිත්තය ප්‍රාණොඝිකය, උපපත්ති ලාභිකයයි දෙවැදෑරුම් වේ. ප්‍රාණඤ්ඤ ගිහි ඤාණ; ඤුඤතත ඤාණං නි. එඤඤතත් ලාභිඤ ඤම් ඤතම්ඤෙන් ලබා ඉදුඤඤම්,

72 විපාකජෛර්යාපථික-ශෛල්පස්ථානික නිර්මිතම්
චතුර්ධා ව්‍යාකෘතං කාමෙ-රූපෙ ශෛල්පික වර්ජිතම්

භාවය:—විපාකජ - ඓර්යාපථික - ශෛල්පස්ථානික - නිර්මිතය යි කාමධාතුවෙහි ව්‍යාකෘත චිත්තය සිව් වැදැරුම් වේ. රූපධාතුවෙහි ශෛල්පස්ථානිකය හැර තෙවැදැරුම් වේ.

තානි විංශතිං (2-71)

විස්තරය:—කාමධාතුවෙහි 1. ප්‍රායොගික 2 උපපත්ති ලාභික 3 අකුශල 4 නිවෘතාව්‍යාකෘත 5 විපාකජ 6 ඓර්යාපථික 7 ශෛල්පස්ථානික 8 අභිඥා ඵල යන සිත් අට ද,

රූපධාතුවෙහි 1 ප්‍රායොගික 2 උපපත්තිලාභික 3 නිවෘතාව්‍යාකෘත 4 විපාකජ 5 ඓර්යාපථික 6 අභිඥාඵල (=නිර්මිත) යන සිත් සය ද,

ආරූප්‍ය ධාතුවෙහි, 1 ප්‍රායොගික 2 උපපත්ති ලාභික 3 නිවෘතාව්‍යාකෘත 4 විපාකජ යන සිත් සතර ද,

1 ශෛක්ෂ 2 අශෛක්ෂ යන අනාශ්‍රව සිත් දෙක දැයි යන මොවුහු විංශති චිත්තයෝ වෙත්.

73 කලිෂ්ටෙ ත්‍රෛධාතුකෙ ලාභ:-ෂණ්ණාං ෂණ්ණාං
ඉයෝ: ගුහෙ
ත්‍රයාණාං රූපජේ ශෛක්ෂ-චතුර්ණාං තස්‍ය චාධිකෙ

භාවය:—ත්‍රෛධාතුන්හි කලිෂ්ට චිත්තයෙහි ලැබීම සය, සය සහ දෙක බැගින් වේ. රූප ධාතුවෙහි තුනකගේ ද, ශෛක්ෂයෙහි සතරකගේ ද, වේ. ඒ ශෛක්ෂයාගේ අධිකයෙහි ද, වේ.

කලිෂ්ටෙ ත්‍රෛධාතුකෙ ලාභ: ෂණ්ණාං ෂණ්ණාං ඉයෝ:

විස්තරය:— 1 කාම ධාතුවෙහි කලිෂ්ට චිත්තයෙහි සිත් සයක් ලැබේ. එනම්; කාම කුශල + අකුශල + නිවෘතාව්‍යාකෘත රූප + ආරූප්‍ය නිවෘතා + ශෛක්ෂ යන සයයි.

2 රූපධාතුවෙහි ද, එසේ ම සිත් සයක් ලැබේ. එනම්; කාම නිවෘතාව්‍යාකෘත + ආරූප්‍යාපත - රූපධාතුගත කුශල නිවෘතාව්‍යාකෘත අනිවෘතාව්‍යාකෘත + ආරූප්‍ය ගත නිවෘතා ව්‍යාකෘත + ශෛක්ෂ යන සිත් සයයි.

3 ආරූප්‍ය ධාතුවෙහි සිත් දෙකක් ලැබේ. එනම්; ආරූප්‍ය නිවෘතාව්‍යාකෘත + ශෛක්ෂ යන දෙකයි.

ස්ථවිර වාදයෙහි කාමභූමි-රූපභූමි-අරූපභූමි යනුවෙන් උගන්වන භූමිත්‍රය මෙහි **"ත්‍රෛ ධාතු"** නමින් ගත්හ. ස්ථවිර වාදයෙහි "භූමි" ශබ්දය ද, වෛභාෂික වාදයෙහි "ධාතු" ශබ්දය ද, බෙහෙවින් යෙදිණ. ස්ථවිර වාදයෙහි කාම භූමිහු **එකොළොසක්** වෙත්. එහෙත් වෛභාෂික වාදයෙහි **දශයකි.** ස්ථවිර වාදයෙහි රූපභූමිහු **සොළසකි.** එහෙත් වෛභාෂික වාදයෙහි සතළොසකි. අරූපභූමීන් පිළිබඳව කිසිවෙනසක් නැති. කියන ලදි.

"නරක ප්‍රෙත තිර්යක්ෂ්වා-මානුෂාඃ ෂඩ්දිවෞකසඃ
කාම ධාතුඃ ස නරක-විපහෙදෙන විංශතිඃ

ඌර්ධවං සපත දශ ස්ථානො-රූප ධාතුඃ පාඨක් පාඨක්
ධ්‍යානං ත්‍රිභූමිකං තත්‍ර-චතුර්ථං ත්‍වෂ්ට භූමිකම්

විස්තර 3-1. බලනු. (225 වැනි පිටුව)

ත්‍රෛභූමක-වට්ට-ලෞකික නාමයන්ගෙන් ද, හඳුන්වන ඒ ත්‍රෛධාතූන් අතර ස්ථවිර වාදයෙහි කාමාවචර චිත්තයෝ **සූපණයක්** වෙති. රූපාවචර චිත්තයෝ **පසළොසක්** වෙති. අරූපාවචර චිත්තයෝ **දෙළසක්** වෙති. සියල්ල අසූ එකකි. ලොකොත්තර සිත් අටකි.

ශුභෙ ත්‍රයාණාං රූපජේ

විප්පනි:—රූප ධාතුවෙහි කුශල චිත්තයෙහි සිත් තුනක් ලැබේ. එනම්; කුශල + නිවෘතා ව්‍යාකෘත කාම + රූප යන තුනයි.

ශෛක්ෂේ චතුර්ණාං

විප්පනි:—ශෛක්ෂ ප්‍රථම චිත්තය විඳිනු ලබන කල්හි සිත් සතරක් ලැබේ. එනම්,

ශෛක්ෂ + අනිවෘතාව්‍යාකෘත - කාම + රූප + ආරූප්‍ය කුශල යන සතරයි.

තස්‍යවාධිකෙ

විප්පනි:—ඒ ශෛක්ෂ චිත්ත ලාභය අන්‍ය චිත්තයන් විඳිනු ලබන කල්හි වේ.

ඉන්ද්‍රිය නිදේශය නිමි.

(විතීය කොශස්ථානය සමාප්තයි.)

පරමාර්ථ රත්නාවලී

ව්‍යාඛ්‍යා සහිත

අභිධර්ම කෝශයෙහි

ලෝකධාතු නිර්දේශ නම් වූ

තෘතීය කෝශස්ථානය.

තෘතීය කොශස්ථානය

—//—

ලොකධාතු නිදේශය.

---

1 නරක ප්‍රෙත තිර්යක්ෂ්වා-මානුෂාඃ සඩ් දිවෞකසඃ
කාමධාතුඃ ස නරක-විපභෙදෙන විංශතිඃ

භාවය:—නරක-ප්‍රෙත-තිරීක් - මානුෂ-සදිව්‍යලොක යන දශය කාම ධාතු නම්. එය නරක-විපභෙදයෙන් විස්සක් වේ.

නරක

විපපති:—"**පාපිනාං යාතනස්ථානම්**" යනු සංස්කෘත කොෂ ග්‍රන්ථාගත "**නරක**" ශබ්දයාගේ විග්‍රහයි.

"**අපුඤ්ඤෙ නෙතිති නරකො**" යනු පාළි ග්‍රන්ථාගත විග්‍රහයි. පව් කළවුන් පැමිණෙන ස්ථානය **නරක** නම්.

ප්‍රෙත

විපපති:—"**නරකස්ථ ප්‍රාණී**" යනු මෙහි ප්‍රෙත ශබ්දාර්ථයි.

"**පකට්ඨෙන සුඛතො ඉතො ගතාති = පෙතා**" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි. සර්වප්‍රකාරයෙන් සැපයෙන් පහවූවෝ **ප්‍රෙතයෝ** නම් වෙත්.

ප්‍රෙතයන් ගේ රූප ලක්ෂණය පද්මොත්තර ඛණ්ඩයෙහි මෙසේ කියයි.

"විකරාලමුඛං දිනං-පිශඞ්ගනයනං භෘශම්
ඌර්ධවමූර්ධවජ කෘෂණාඞ්ගං-යම දූත මිවා පරම්

වලජ්ජිහ්වඤ්ච ලම්බොෂ්ඨං-දිශ්ජ්ඩ්‍ය ශිරාකුලම්
දිශ්ඛාඞ්ග්‍රිං ශුෂ්ක තුණ්ඩඤ්ච-ගත්තාක්ෂං ශුෂ්ක පඤ්ජරම්"

තිරියෙදවා

විපත්ති:—"උඩං අනුගඡනත්වා තිරියං අඤ්ඤිතා ගතා වඩ්ඪිතාති තිරච්ඡානා, දෙවමනුස්සාදයෝ විය උඩං දිසං අහුත්වා තිරියං දිසාති අත්ථෝ" යනු විනය ටීකාහි. දිව්‍ය මනුෂ්‍යාදීන් මෙන් උඩු අහස දක්නොහැකි සර්පයි දිසාවලට යිරිසන්හු සාමී වෙත්.

මානුෂා:

විපත්ති:— **"මනොජීතෝ මානුෂෝ"** යනු බැවින් මනුහුගෙන් උපන්නෝ මනුෂ්‍ය (=මානුෂ) යෝ නම් වෙත්.

සමාධි-ශූරතා-බ්‍රහ්මචරියාදි ගුණයන්ගෙන් උතුකෘෂ්ට වූ සිත් ඇති නිසා හෝ, ලොභා'ලොභාදි ධර්මයන්ගෙන් උතුසන්න වූ සිත් ඇති නිසා හෝ මනුෂ්‍යයෝ නම් වෙත්. දක්වන ලදි.

මනස්ස උස්සන්නතාය=මනුස්සා, සති සූරභාව බ්‍රහ්මචරිය යොග්‍යතාදි ගුණවසෙන උපචිත මානසා උක්කට්ඨ ගුණ චිත්තා, කෙ පන තෙ, ජම්බුදීපවාසිනෝ සත්තා විසෙසා, තෙනාහ භගවා, "තීහි භික්ඛවෙ ඨානෙහි ජම්බුදීපිකා මනුස්සා උත්තරකුරුකෙ මනුස්සෙ අධිගණ්හන්ති දෙවෙ ච තාවතිංසෙ, කතමෙහි තීහි, **සූරා සතිමන්තා ඉධ බ්‍රහ්මචරියවාසා ති.**" තථාහි බුද්ධා භගවන්තෝ පච්චෙක බුද්ධා අග්ගසාවකා මහා සාවකා චක්කවත්තිනෝ අඤ්ඤෙ ච මහානුභාවා සත්තා තත්ථෙව උපපජ්ජන්ති. තෙහි සමාන රූපාදිතාය පන සඞ්ඛං පරිත්තදීපවාසීහි ඉතර මහාදීප වාසිනොපි මනුස්සාත්වෙව පඤ්ඤපිංසූති එකෙ, අපරෙ පන භණන්ති ලොභාදීහි ච අලොභාදීහි ච සහිතස්ස මනස්ස උස්සදතාය මනුස්සා, යෙහි සත්තා මනුස්ස ජාතිකා, තෙසු විසෙසතෝ ලොභාදයෝ අලොභාදයෝ ච උස්සදා, තෙ ලොභාදි උස්සදතාය අපාය මග්ගං අලොභාදි උස්සදතාය සුගති මග්ගං නිබ්බානගාමී මග්ගං ච පූරෙන්ති, තස්මා ලොභාදීහි ච අලොභාදීහි ච සහිතස්ස මනස්ස උස්සදතාය පරිත්තදීපවාසීනි සඞ්ඛං චතුමහාදීපවාසිනෝ සත්ත විසෙසා මනුස්සාති වුච්චන්ති, ලොකියා පන මනුනෝ අපච්චභාවෙන මනුස්සාති වදන්ති, මනු නාම පඨම කප්පිකෝ ලොක මරියාදය ආදිහුතෝ හිතාහිත විධායකෝ සත්තානං පිතුට්ඨානියෝ යෝ සාසනෙ මූහාසම්මතොති වුච්චති,

පච්චක්ඛතො පරම්පරාය ච තස්ස ඔවාදානු සාසනීගං සීතා පුත්ත සදිසතාය මනුස්සා මානුසාති ච වුච්චන්ති, තතො එව ඉතෙ මානවා මනුජාති ච වොහරියන්ති" යනු සාරාර්ථ දීපනී විනය ටීකායි.

ෂඩ්දිවෞකසඃ

විපත්ති:—චාතුම්මහාරාජ කා-ත්‍රායස්ත්‍රිංශ-යාම-තුෂිත-නිර්මාණරති පරනිර්මිත වශවර්තීති යන සදිව්‍ය ලොකය.

කාම ධාතුඃ

විපත්ති:—නරකලොකය - ප්‍රෙතලොකය-තිරිසන් ලොකය- මනුෂ්‍ය ලොකය සහ සදිව්‍ය ලොකය ද, යන දශය කාම ධාතු නම්. සථවිර වාදයෙහි අසුරනිකාය ද, ඇතුළුව කාම භූමිහු එකොළොසක් වෙත්.

සනරක් විපහෙදෙන විංශතිඃ

විපත්ති:—ඒ දශ වැදෑරුම් කාම ධාතුව නරක-විපහෙදයෙන් විස්සක් වේ සඤ්ජීව-කාලසූත්‍ර-සංඝාත-රෞරව-තපන-ප්‍රතාපන අවීචි යන අට මහා නරකය ද, ජම්බුවිපය-පූර්වවිදෙහය-අවරගොදනීය-උත්තර කුරු යන චතුර් මහා විපද, සදිව්‍ය ලොක ද, ප්‍රෙත-තිරිසන් ලොක දෙක දැසි යන සියල්ල කාම ධාතූහු නම් වෙත්. ඒ ගණනින් විස්සකි.

සථවිර වාදයෙහි වනාහි අට මහා නරකය ම එක ම භූමිය කි.

චාතුර්මහා විපය ද, එක ම භූමියකි. සදිව්‍ය ලොකය භූමි සයකි. ප්‍රෙත-තිරිසන්-අසුර සතුවෙන් භූමිත්‍රයකි. සියල්ල එකොළොසකි. දඹදිව් වැස්සන් හා රූප වශයෙන් සමාන බැවින් පූර්ව විදෙහ-අපරගොයාන-උත්තරකුරු දිවසින් වැස්සන් ද, මනුෂ්‍යත්වයෙන් සලකන ලදි.

අසුර භූමිය නම්, පෙතාසුර භූමිය යි. එහි දෙවා සුරා දිහු නො හැණෙත්. තිරිසන් ප්‍රෙතයන්ගේ ප්‍රභෙදයක් නැති.

"මේහි වනාහි තිරශ්චීනයොති ප්‍රෙත විෂය ග්‍රහණ යෙන් තිරශ්චීනයන්ට හා ප්‍රෙතයන්ට එබඳු වූ පරිච්ඡින්න වූ අවකාශයක් නැති හෙයින් සකාත්මයන්ගේ ම ග්‍රහණ ය.

නොහොත් ඔහු අරණ්‍ය පවිතාදි වූ යම් තැනෙක්හි නිබඳ වාසය කෙරෙද්ද, එබඳු වූ වාසස්ථානයාගේ වශයෙන් අවකාශය යි දතයුතු.

න සුරතති ඉස්සරිය කිලාති න දිබ්බන්තීති අසුරා, පෙතාසුරා, දෙවාසුරා පන න සුරා. සුරාපටිපක්ඛාති = අසුරා

මෙහි වනාහි අසුර ශබ්දයෙන් ප්‍රෙත අසුරයන්ගේ ම ග්‍රහණය යැ. **තාවතිංසෙසු දෙවෙසු වෙපචිත්ති සුරාගතා''** යි ආචාර්යයන් තමන් විසින් වෙපචිත්ති අසුරයන් තව්තිසා වැසි දෙවියන් කෙරෙහි අන්තර්ගත කොට කීම කැමැති හෙයිති[1] යනු අභිධර්මාර්ථ සංග්‍රහ සන්නයි.

2. ඌර්ධවං සප්ත දශස්ථානො-රූපධාතුඃ පෘථක් පෘථක් ධ්‍යානං ත්‍රි භූමිකං තත්‍ර-චතුර්ථං ත්වෂ්ට භූමිකම්.

භාවය:—කාම ධාතුන්ගෙන් උඩ සප්ත දශස්ථානයන්ගෙන් යුක්ත වූයේ රූප ධාතු නම් වේ එය ද, වෙන් වෙන්ව එක් එක් ධ්‍යානයට භූමිත්‍රයකි. චතුර්ථධ්‍යානය වනාහි භූමි අටකින් යුක්තය.

ඌර්ධවං

විප්පති:—"පඨමජ්ඣාන භූමි ච පරනිම්මිත වසවත්ති භූමිතො උපරි පඤ්ච පඤ්ඤාස සත සහස්සඬ සහස්ස යොජනෙ සමතලෙ ආකාසෙ තිඨති'' යනු සුචිත්තා ලඞ්කාරයෙහි ආ බැවින් ප්‍රථමධ්‍යාන භූමිය ද, පරනිම්මිත වශවත්ති දිව්‍ය ලොකයෙන් මත්තෙහි පණස්පස් ලක්ෂ අට දහසක් යොදුන් ගිය තන්හි ආකාශයෙහි සමතලයෙහි පිහිටා සිටින්නේ වෙයි. චිතිය ධ්‍යාන භූමිත්‍රය ද, ප්‍රථමධ්‍යාන භූමිය මත්තෙහි පණස් පස් ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි සමතල වූ ආකාශයෙහි පිහිටා සිටින්නේ වෙයි. තෘතීය ධ්‍යාන භූමිත්‍රය ද, චිතියධ්‍යාන භූමියෙන් මත්තෙහි පණස් පස් ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි සමතල වූ ආකාශයෙහි පිහිටා සිටින්නේ වෙයි. තෘතීය ධ්‍යාන භූමිත්‍රය ද, චිතියධ්‍යාන භූමියෙන් මත්තෙහි පණස් පස් ලක්ෂ අට දහසක් යොදුන් ගිය තන්හි සමතල වූ ආකාශයෙහි පිහිටා සිටින්නේ වෙයි. තෘතීය ධ්‍යාන භූමිත්‍රය ද, චිතියධ්‍යාන භූමියෙන් මත්තෙහි පණස් පස් ලක්ෂ අට දහසක් යොදුන් ගිය තන්හි

වෙහපඵල අසඤ්ඤසත්ත යන භූමිවය සමතල ආකාශ යෙහි පිහිටා සිටින්නේ වෙයි. වෙහපඵලය මත්තෙහි පණස්පස් ලක්ෂ අට දහසක් යොදුන් ගිය තන්හි අවිහ භූමිය ද, අවිහ භූමියෙන් එපමණ මත්තෙහි අතප්‍ය භූමිය ද, අතප්‍ය භූමියෙන් එපමණ මත්තෙහි සුදස්ස භූමිය ද, සුදස්ස භූමියෙන් එපමණ මත්තෙහි සුදස්සි භූමිය ද, සුදස්සි භූමියෙන් එපමණ මත්තෙහි අකනිටා භූමිය ද, පිහිටා සිටින්නේ වෙයි."

සප්තදශස්ථානෝ

විප්පනි:—බ්‍රහ්ම කායික – බ්‍රහ්ම පුරෝහිත – මහාබ්‍රහ්ම – පරිත්තාභ අප්‍රමාණාභ – ආභස්වර – පරිත්ත ශුභ – අප්‍රමාණ ශුභ – ශුභ කෘත්ස්න – අනභ්‍රක – පුණ්‍යප්‍රසව – බෘහත්ඵල–අවෘහ–ඇතප සුදෘශ–සුදශීන–අකනිෂ්ටය යන සතළොස. ස්ථවිර වාදයෙහි රූප භූමිගත බ්‍රහ්මලොක සොළසකි.

එනම්;

බ්‍රහ්මපාරිසජ්ජ – බ්‍රහ්මපුරෝහිත – මහා බ්‍රහ්ම –පරිත්තාභ අප්පමාණාභ –ආභස්සර – පරිත්ත සුභ – අප්පමාණ සුභ – සුභ කිණ්හ – වෙහප්ඵල – අසඤ්ඤසත්ත – අවිහ – අතප්ප – සුදස්ස සුදස්සි–අකනිට්ඨය යන සොළස යි.

මෙහි ඇති වෙනස නම්; වෛභාෂික වාදයෙහි දක්නා අනභ්‍රක–පුණ්‍යප්‍රසව බ්‍රහ්මලොකද්වය ස්ථවිරවාදයෙහි නො දැක්වීමත්, ස්ථවිර වාදයෙහි උගන් වන අසඤ්ඤසත්තය, වෛභාෂික වාදයෙහි නො උගැන් වීමත් පමණකි.

පෘථක් පෘථක් ධ්‍යානං ත්‍රිභූමිකං

විප්පනි: -එක එක ධ්‍යානයකට භූමිත්‍රය බැගින් ධ්‍යානත්‍රයට භූමි නවයක් ඇතුළත් වේ. මෙහි ස්ථවිර වාදය හා කිසි වෙනසක් නැති.

1. බ්‍රහ්මකායික
2. බ්‍රහ්ම පුරෝහිත
3. මහා බ්‍රහ්ම

} ප්‍රථමධ්‍යාන භූමි

4. පරිත්තාභ
5. අප්‍රමාණාභ
6. ආභස්වර

} විතීය ධ්‍යාන භූමි

7. පරිත්ත ශුභ
8. අප්‍රමාණ ශුභ
9. ශුභ කෘත්ස්න

} තෘතීය ධ්‍යාන භූමි

චතුර්ථං ත්වෂ්ට භූමිකම්

විප්පනි:—චතුර්ථධ්‍යානය භූමි අටකින් යුක්තය. එහෙත් ස්ථවිර වාදයෙහි චතුර්ථධ්‍යානය සප්ත භූමියකින් යුක්තය. ඒ මෙසේයි.

වෛභාෂික වාදය		ස්ථවිර වාදය.	
10 අනභ්‍රක		10 වෙහපඵල	චතුර්ථ ධ්‍යාන භූමි
11 පුණ්‍ය ප්‍රසව		11 අසඤ්ඤ සත්ත	
12 වෘහත්ඵල		12 අවිහ	
13 අවෘහ		13 අතප්ප	
14 ආතප		14 සුදස්ස	
15 සුදෘශ		15 සුදස්සි	
16 සුදර්ශන		16 අකනිඨ	
17 අකනිෂ්ට			

3 ආරූප්‍ය ධාතුරස්ථානඃ-උපපත්‍යා චතුර්විධඃ
නිකායං ජීවිතං චාත්‍ර-නිශ්‍රිතා චිත්ත සන්තතිඃ

භාවය:—ආරූප්‍යධාතුවෙහි ස්ථාන භෙදයක් නැති. උත්පත්ති ක්‍රමයෙන් එහි භෙද සතරක් වේ. මේ ආරූප්‍ය ධාතුවෙහි විඥාන සන්තානයාගේ නිකාය - ජීවිතෙන්ද්‍රිය සභාගතාව ඇති කල්හි චිත්ත සන්තතිය ආශ්‍රය කරන ලද්දිය,

ආරූප්‍ය ධාතුඃ

විපත්තිඃ—"මේ ශරීරය ඇති කල්හි දඩු මුගුරු අවි ආයුධාදිය හෙණ කයින් සිඳවිය යුතු වූ ප්‍රාණඝාතාදි දුශ්චරිතයන් හා මුඛය ඇති කල්හි මුසවා කිම් ආදි වචී දුශ්චරිතයන් ද, කරන්නාවූ [illegible] උපදී. එහෙයින් සත්ත්වයාගේ සංසාර දුකට මුල් හෙතුව මේ රූපය යි සලකා "ඛිරූපං ඛිරූපං" යනුවෙන් රූපයට නිදු කොට රූපධ්‍යාන නිකාන්තිය හැර අරූපධ්‍යාන නිකාන්තිය උපදවා අරූපධ්‍යානය උපදවයි"

"මෙහි අරූපධ්‍යාන උපදවනු කැමැති යොගාවචර තෙම රූපය නිසා දණ්ඩාදාන – ශස්ත්‍රාදාන – කලහ – විග්‍රහ විවාද යන මොවුන් ගේ චක්ෂුශ් ශ්‍රොත්‍ර රොගාදි ආබාධ සහස්‍රයන්ගේ ද, වශයෙන් කරජකායයෙහි ආදීනව දැක මෙහි ආදීනව ආරූප්‍යයෙහි සම්‍ප්‍රකාරයෙන් නැතැයි රූපයා ගේ සමතික්‍රමණය පිණිස පරිච්ඡින්නාකාස කසිණය හැර පඨවිකසිණාදි වූ නවකසිණයන් අතුරෙන් එක්තරා කසිණයෙක්හි චතුර්ථධ්‍යාන උපදවා ඒ ධ්‍යානයට අරමුණු වූ කසිණ රූපයෙහි උද්‍වෙග ඇතිව ඒ එයින් දුරුවනු කැමැත්තේ පඤ්ච ප්‍රකාරයකින් පුරුදු කරන ලද වශිතා ඇතිව ප්‍රගුණ වූ රූපාවචර චතුර්ථධ්‍යානයෙන් නැගී මා විසින් කලකිරෙන ලද මේ රූපය අරමුණු කරන්නේ ය යි කියා ද, ආසන්න සෞමනස්‍ය සංඛ්‍යාත ප්‍රතිපක්ෂයා ඇත්තේය යි කියා ද, ශාන්ත විමොක්ෂ හෙයින් ඕදාරිකයයි කියා ද, ඒ ධ්‍යානයෙහි ආදීනව දක්නේය. දැක එහි නිකාන්තිය දුරු කොට ආකාසානඤ්චායතන ශාන්ත හෙයින් මනසකාර කොට ඒ කසිණ චක්‍රවාට පරිච්ඡින්න කොට හෝ තමා කැමති යම් කවිටලයකට හෝ පතුරුවා එයින් සපෘෂ්ටවූ ආකාශය අරභයා "ආකාසෝ ආකාසෝ" යි ද, "අනන්තෝ ආකාසෝ අනන්තෝ ආකාසෝ" යි ද නැවත නැවත මනසකාර කරන්නාහට නීවරණයෝ ප්‍රහීණ වෙති. උපචාරය හා සමඟ චිත්තය මනාකොට පිහිටන්නේය. එම නිමිත්තය නැවත නැවත මනසකාර කරන්නාහට නීවරණයෝ ප්‍රහීණවෙති. උපචාරය හා සමඟ චිත්තය මනාකොට පිහිටන්නේය. එම නිමිත්තය නැවත නැවත ආසෙවනය කරන්නාහට පඨවිකසිණාදියෙහි රූපාවචර නිමිත්තය මෙන් ආකාශවිඤ්ඤය කොට ආකාසානඤ්චායතනා

චිත්තය පිහිටන්නේයි. මෙබඳු පූර්වභාගයෙහි කාමාවචර චිත්තයෝ පරිකර්මාදි නාමයෙන් තුන්දෙනෙක් හෝ සතර දෙනෙක් හෝ උපෙක්ෂා වෙදනා සම්ප්‍රයුක්ත වූවාහුම වෙති. සතරවැනිව හෝ පස්වැනිව අරූපාවචර චිත්තය උපදනේයි.'' යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි.

ආරූප්‍ය ධාතුනම්, ආකාසානඤ්චායතනාදි සතරයි. එහි ආකාසානඤ්චායතනයට කසිණුග්ඝාටිමාකාශය අරමුණු වන්නේය. එනම්; කිසුණු ඉගුළු අහසයි. කසිණා ලොකය යම් තැනෙක පතුරුවන ලද්දේ ද, ඒ ආලොකය ඉවත් වූ කල ලැබෙන අහස කිසුණු ඉගුළු අහසය. විඤ්ඤාණඤ්චා යතනයට ආකාසානඤ්චායතන චිත්තය අරමුණු වන්නේය. ආකාසානඤ්චායතන චිත්තයාගේ අභාවය ආකිඤ්චඤ්ඤා යතනයට අරමුණු වන්නේය. ආකිඤ්චඤ්ඤායතන චිත්තය නෙවසඤ්ඤානාසඤ්ඤා යතනයට අරමුණු වේ විස්තර මතු සඳහන් වේ.

අස්ථානඃ

විස්තරී:—''ඒ සතර භූමිහු ද, අකනිට්ඨ භූමියෙන් මත්තෙහි යොදුන් පණස්පස් ලක්ෂ අසූ දහසකින් මත්තෙහි ආකාසා-නඤ්චායතන භූමිය පිහිටා තිබේ. සෙසු භූමිහු තිදෙන ද එපමණ දුරින් පිහිටා තිබෙන්නාහුයයි සමහරු කියත් සමහර ආචාර්යවරයෝ වනාහි සතර භූමිය සමානව පිහිටා තිබේයයි කියත්'' යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ භාව සන්නයි.

''ආරූප්‍ය ධාතෞ තෘතියෙ'ත්තිමෙව ස්ථානභෙදෙ නාසති'' යනුවෙන් ආරූප්‍ය ධාතුවෙහි තෘතිය-චතුර්ථ භූමීන්හි ස්ථාන භෙදයක් නැතැයි නාලන්දිකා ටිකාහි කියයි.

උපපත්‍යා චතුර්විධඃ.

විස්තරී:—උපපත්ති ක්‍රමයෙන් ආකාශානන්ත්‍යායතන - විඥානා-නන්ත්‍යායතන - ආකිංචන්‍යායතන - නෛවසංඥා නාසංඥා යතන යනුවෙන් අරූප ධාතූන්ගේ සිව්වැදෑරුම් භෙදයක්වේ.

I ආකාශානන්ත්‍යායතන (=ආකාසානඤ්චායතන)

නාස්ස අන්තොති=අනන්තං- උත්පාදාදි අන්ත රහිත බැවින් ද, අනන්ත වශයෙන් සර්වරණය වන බැවින් ද, මොහට අන්තයෙක් නැත්හුයි අනන්ත නම් වේ,

ආකාසඤ්ච තං අනන්තඤ්චාති ආකාසානන්තං. කසිණුග්ඝාටි මාකාසො. "අනන්තා කාසං"යි කියයුතුතන්හි "අග්‍යාගිතො" යනාදියෙහි මෙන් විශෙෂණයාගේ පරනිපාත වශයෙන් "ආකාසානන්තං"යි කියන ලදි. ස්වාර්ථයෙහි ණප්‍රත්‍යය කොට "ආකාසානන්තමෙව ආකාසානඤ්චං"යි වේ. තදෙව ආයතනං සම්පයුත්ත ධම්මස්ස ඣානස්ස අධිට්ඨානට්ඨෙන දෙවානං දෙවායතනං වියාති ආකාසානඤ්චායතනං.

කිසුණු ඉගුළු වූ ආකාශයම ආකාසානඤ්චායතන නම් වේ. යම්සේ පඨවි කසිණය අරමුණු කොට උපන් ධ්‍යානය පඨවිකසිණයයි කියනු ලැබේ ද, එසේම ආකාසානඤ්චායතනයයි කියන ලද කිසුණු ඉගුළු වූ ආකාශයෙහි ප්‍රවෘත්ත වූ අර්ජිණප්‍රාප්ත ප්‍රථමාරූප්‍ය චිත්තය ද, ආකාසානඤ්චායතනය යි කියනු ලැබේ. නොහොත් **ආකාසානඤ්චං ආයතනං අස්සාති=ආකාසානඤ්චායතනං"** යනු ශාරිපුත්‍ර සඞ්ඝරාජ වචනයි.

"ආකාසානඤ්චායතන භූමිය" යනු ආකාශ කසිණය හැර නව කසිණයන්ගෙන් යම්කිසි කසිණයකින් උපදවාගන්නා ලද ප්‍රතිභාග නිමිත්ත නොහොත් කසිණාලොකය පතුරුවා උගුළුවා ගන්නා ලද කසිණුග්ඝාටි මාකාශයෙහි උපදවන ලද්දවූ ප්‍රථමාරූප්‍ය කුශල චිත්තයාගේ විපාක වශයෙන් අකණිටා බ්‍රහ්මලොකයෙන් මත්තෙහි යට කියන ලද්දවූ දූරප්‍රමාණ ආකාශයෙහි පහළවී පවත්නා **සතර නාමස්කන්ධයයි.** නොහොත් ප්‍රථමාරූප්‍ය සඞ්ඛ්‍යාත සතර නාමස්කන්ධයන් විසින් මිරිසිඳ ගන්නා ලද්දවූ ආකාශය ආකාශානඤ්චායතන භූමි නමු" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ භාවසන්නයි.

2 විඥානානන්ත්‍යායතන (=විඤ්ඤාණඤ්චායතන)

"විඤ්ඤාණමෙව අනන්තං විඤ්ඤාණන්තං. පඨමාරූප්ප විඤ්ඤාණං." ඒ ප්‍රථමාරූප්‍ය විඥානය ද, උත්පාදාදි අන්ත ඇත්තේ ද, අන්තවූ ආකාශයෙහි පවත්නා හෙයින් තමා අරභයා ප්‍රවෘත්ත වූ භාවනාවගේ උත්පාදාදි වශයෙන් අන්තයක් නොගෙන අනන්ත සඵරණ වශයෙන් පවත්නා හෙයින් ද, අනන්තයයි කියනු ලැබේ "විඤ්ඤාණාන්තමෙව විඤ්ඤාණඤ්චං" ආකාරයට ග්‍රස්ව ද, නකාරයහට ලොප් ද කොට විඤ්ඤාණඤ්ච කියා වේ. සෙස්ස යටකි පරිද්දෙන් දතයුතු. නොහොත් "දුතියාරූප්ප විඤ්ඤාණෙන අඤ්චිතබ්බං පාපුණිතබ්බන්ති විඤ්ඤාණඤ්චං. තදෙව ආයතනං දුතියා රූප්පස්ස අධිට්ඨානත්තාති විඤ්ඤාණඤ්චායතනං"

මෙහි විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදවනු කැමැති යොගාවචර තෙම පස් ආකාරයකින් ආකාසානඤ්චායතන සමාපත්තියෙහි පුරුදු කරණ ලද වශිතා ඇත්තේ මේ සමාපත්ති තොමෝ ආසන්නාරූපා වචරධ්‍යාන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තියසි ද, විඤ්ඤාණඤ්චායතනය මෙන් නොම ශාන්තයයි කියා ද, ආකාසානඤ්චායතනයෙහි ආදීනව දැක එහි නිකාන්ති දුරුකොට විඤ්ඤාණඤ්චායතනය ශාන්ත හෙයින් මනසිකාර කෙරෙයි. ඒ ආකාශ සඵරණකොට සිටියා වූ විඤ්ඤාණය "විඤ්ඤාණං විඤ්ඤාණං"යි කියා නැවත නැවත මනසිකාර කරන්නාහට එම නිමිත්තයෙහි නැවත නැවත චිත්තය හසුරුවන්නාහට නීවරණයෝ විෂ්කම්භිත වෙති. සමාධිය එහි ම පිහිටන්නේය. එම නිමිත්තය නැවත නැවත ආසෙවන වශයෙන් බහුල කරන්නාහට ආකාශය විෂය කොට ආකාසානඤ්චායතනය මෙන් ආකාශයෙහි පතළා වූ විඤ්ඤාණ විෂය කොට විඤ්ඤාණඤ්චායතන චිත්තය පිහිටන්නේ යි" යනු අභිධම්මාචාර්‍ය සඞ්ග්‍රහ සන්නසි.

3. ආකිංචඤ්ඤායතන (=ආකිඤ්චඤ්ඤායතන)

"නාස්ස පඨමා රූපපස්ස කිඤ්චනං අපමත්තකං අනත්ථිභෝ භඞ්ගමත්තකම්පි අවසිට්ඨා අත්ථීති අකිඤ්චනං අකිඤ්චනස්ස භාවෝ ආකිඤ්චඤ්ඤං පඨමාරූපප විඤ්ඤාණ භාවෝ. ත්‍යදව ආයතනං අස්ස සම්පයුත්ත ධම්මස්ස තතියා රූපක්ඛානස්සාති ආකිඤ්චඤ්ඤායතනං"

"මෙහි නෛතීයාරූප්‍යය උපදවනු කැමැත්තා වූ යොගාවචර තෙමේ යටකී පරිද්දෙන් පඤ්චවශිතා ප්‍රාප්ත වූයේ මේ සමාපත්ති තොමෝ ආසන්න ආකාසානඤ්චායතන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තියසි ද, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය මෙන් ශාන්ත නොවන්නියසි කියා ද, විඤ්ඤාණඤ්චායතනයෙහි ආදීනව දක්නේය. දැක එහි නිකාන්ති දුරු කොට ආකිඤ්චඤ්ඤායතන ශාන්ත හෙයින් මනසිකාර කොට විඤ්ඤාණඤ්චායතනයට අරමුණු වූ ආකාසානඤ්චායතන විඤ්ඤාණයාගේ අභාවය "නත්ථි නත්ථි" කියා හෝ "සුඤ්ඤං සුඤ්ඤං" කියා හෝ "ඛි චිත්තං ඛිචිත්තං" කියා හෝ නැවත නැවත මනසිකාර කරන්නාහට ඒ නිමිත්තයෙහි ම චිත්තය හසුරුවන්නාහට නීවරණයෝ විෂ්කම්භිත වෙති. සමාධිය එහි පිහිටන්නේය. උපචාරය හා සමග විඤ්ඤාණය සම්භාවිත වන්නේය. මෙම නිමිත්තය නැවත නැවත ආසෙවනය කරන්නාහට බහුලකරන්නාහට ආකාශයෙහි පතළා වූ මහග්ගත විඤ්ඤාණයෙහි විඤ්ඤාණඤ්චා

යතනය මෙන් ආකාශය එරණය කොට ප්‍රවෘත්ත වූ මහද්ගත විඥාණයා ගේ සුඤ්ඤ ධි චිත්තය නාස්තිත්වය විෂය කොට ආකිඤ්චඤ්ඤායතන චිත්තය පිහිටන්නේ යි. මෙහිදු අර්ථණාක්‍රම යට කී පරිද්දෙන් දතයුත්තේ යි. එහි අර්ථණා චිත්තය උපන් කල්හි ඒ යොගාවචර තෙමේ චිතියා රූප්‍ය විඥානයා ගේ අපගම සංඛ්‍යාත වූ අභාවය ම දකිමින් වසන්නේ යි" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි.

4. නෙවසංඥානා සංඥායතන (=නෙවසඤ්ඤානාසඤ්ඤායතන)

"**නෙවස්ස සඤ්ඤා න අසඤ්ඤාතති නෙවසඤ්ඤා නාසඤ්ඤං චතුත්ථා රූප්පක්ඛානං** නෙවසඤ්ඤා නාසඤ්ඤා මෙව ආයතනං මනායතන ධම්මායතන පරියාපන්නත්තාති නෙව සඤ්ඤා නාසඤ්ඤායතනං. නොහොත් සඤ්ඤාඑව පටුසඤ්ඤා කිච්චකරණෙ අසමත්ථතාය නෙව සඤ්ඤා උණ්ණෙහාදකෙ තෙජෝ ධාතු විය සුඛුම වසෙන විජ්ජමානතො න අසඤ්ඤාති=නෙව සඤ්ඤා නාසඤ්ඤා"යි කියන ලදී. නෙව සඤ්ඤා නාසඤ්ඤායෙව ආයතනං අස්ස සම්පයුත්ත ධම්මස්ස ඛ්‍යාන්ස්ස නිස්සෙයාදි භාව තොති නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං"

"මෙහි චතුර්ථාරූප්‍ය විඥානය හැවියටි යොගාවචර තෙමේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙහි පුරුදු කරන ලද පඤ්චවශිතා ඇත්තේ මේ සමාපත්ති තොමෝ ආසන්න විඤ්ඤාණඤ්චායතන සංඛ්‍යාත ප්‍රතිපක්ෂයන් ඇත්තියයි ද, නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනය මෙන් ශාන්ත නොවන්නීය යි කියා ද, ආකිඤ්චඤ්ඤා යතනයෙහි ආදිනව දක්නේ ය. දැක නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනයෙහි ආනිසංස දැක ආකිඤ්චඤ්ඤායතනයෙහි නිකාන්තිය දුරුකොට නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ශාන්ත හෙයින් මනස්කාර කොට චිතියා රූප්‍ය විඥානයාගේ නාස්තිත්වය විෂය කොට ප්‍රවෘත්ත වූ ආකාසානඤ්චායතන චිත්තය "**සන්ත මෙතං පණ්ත මෙතං**" කියා නැවත නැවත ආවර්ජනා කරන්නාහට එම නිමිත්තයෙහි චිත්තය නැවත නැවත හසුරුවන්නාහට නීවරණයෝ විෂ්කම්භිත වෙත්. එහි ම සමෘතිය පිහිටන්නීය. උපචාරය හා සමග චිත්තය සමාහිත වන්නේයි මෙසේ ඒ නිමිත්තය ආ සෙවනය බහුලී කරණය කරත් කරත් විඤ්ඤානා පගමය විෂය කොට උපන් ආකිඤ්චඤ්ඤායතනය මෙන් ආකිඤ්චඤ්ඤායතන සංඛ්‍යාත චතුඃස්කන්ධ විෂය කොට නෙව සඤ්ඤා නාසඤ්ඤායතන චිත්තය පිහිටන්නේයි මෙහිදු අර්ථණා ක්‍රම යට කී පරිද්දෙන් දතයුතු" යනු ශාරීපුත්‍ර සඞ්ඝරාජ වචනයි.

"නෙවසඤ්ඤා නාසඤ්ඤා" යන පදයෙහි අර්ථය නම්; ඖදාරික වූ සංඥාවක් ද, නැත්තේය. සංඥා නොමෝ නැත්තේත් නොවෙයි. යන අර්ථයි. නෙවසඤ්ඤා නාසඤ්ඤා යනුවෙන් සංඥාව ප්‍රධාන කොට වදාළේ නමුදු **"නෙවවිඤ්ඤාණං නාවිඤ්ඤාණං" "නෙව එසෝ නාඑසෝ"** යනාදීන් මෙහි විද්‍යමාන වූ සම්පිස් ධර්මයන් ගේ ග්‍රහණ අර්ථ දතයුතුයි.

නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යාන චිත්තයෙහි විද්‍යමාන වූ චිත්ත-චෛතසික ධර්මයෝ වනාහි විදර්ශනා වඩන්නාවූ යොගාවචර භික්ෂූන්ගේ තීක්ෂ්ණ භාවනාවට අරමුණු නොවෙත්. කුමක් හෙයින ය‍ත්? ඉතා සියුම් බැවිනැයි දතයුතුයි. මේ චිත්තයෙහි විද්‍යමානවූ ධර්මයන්ගේ සභාව දැක්වීමට මතු ප්‍රකාශ වන උපමාවෝ දතයුත්තාහු ය. ඒ කෙසේ ය‍ත්? උපාධ්‍යායන් හා සමග අන්තෙවාසිකයා ද, දිසී මාර්ගයෙහි යන්නාවූ කල්හි පෙරටුව හියාවූ අන්තෙවාසිකයා ඉදිරි මාර්ගයෙහි සවල්ප දියත්තක් දැක සමාමිනි! වඳින් මුදව ජලය ඇත්තේය යි කී කල්හි උපාධ්‍යාය තෙමේ ඇවැත්නි! එසේ වී නම්, ජල සාටිකා ගණුවසි පැන් සනඟම්හයි කී කල්හි සමාමිනි! ජලය නැතැයි කියයි. මේ උපමාවෙහි වහන් තෙමෙන පමණ සවල්ප දියත්තක් ඇති හෙයින් ජලයයි කිහ. නැවත නහන පමණ ජලයක් නැති හෙයින් ජලය නැතැයි කිහ. එපරිද්දෙ විඳර්ශනාවම **ගොචර විෂය කුතු වූ සවු සංඥාවක් නැති හෙයින් නෙවසඤ්ඤා කියා ද, සංඥාව හාත්පසින් නැත්තේත් නොවන හෙයින් න අසඤ්ඤා කියා ද, ව්‍යවහාර කරත්. -පෙ- නෙවසඤ්ඤා නාසඤ්ඤා යන්න පදයාගේ සඤ්ඤාව ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි.** යන අර්ථය තේරුම් ගත යුතුයි" යනු අභිධර්මාර්ථ සංග්‍රහ භාව සන්නයි.

නිකායං ජීවිතං චාත්‍ර-නිස්‍රිතා චිත්ත සන්තතිඃ

විපණිඃ—සත්ත්ව නිකායයෙහි ද, ජීවිතෙන්ද්‍රියයෙහි ද, සභාගතාව ඇති කල්හි විඤ්ඤාණ සන්තතිය ආශ්‍රය කරන ලද්දිය. එහි ශරීරාදිය නැත.

§ නරකාදි ඝනාභෙමාඛ්‍යා-ඔකාඃ සඤ්ඤාදයෝපු තාඃ
අකලිඹං ව්‍යාකෘතා ඒව-ඉතඤ්ඤාකඛ්‍යා නාඤ්ඤාඝඛිඃ

භාවිඃ—මේ ධාතුත්‍රයෙහි නරකය ආදි සවිකිය නාමයන්හෙත් කියන ලද පඤ්ච ගතියහු වෙත්. ඒ ගතියහු ද, අකලිඹට ව්‍යාකෘතයෝ මේ වෙත් සඤ්ඤා නිවාසඝඛ්‍ය ද, අඤ්ඤාඝඛ්‍ය ද, ඉතීත්‍රිය ඇසුරුවන් නොවෙත්.

නරකාදීස්වනාමෝක්තා ගතයඃ පඤ්ච

විප්පනි:—නරක-ප්‍රෙත-තිරිසන්-මනුෂ්‍ය-දිව්‍ය යනුවෙන් ගතීහු පස් දෙනෙක් වෙත්. කුශල-අකුශල කර්මයන් කළවුන් විසින් යායුතු බැවින් ගති නම් විය.

අඤ්ඤිකයෝ ද, උත්තරාපථකයෝ ද, අසුරකාය සමඟ ගතිසඟක් ගත්හ. ස්ථවිර වාදයෙහි මෙන් ම වෛභාෂික වාදයෙහි ද, අසුරකාය ගතිසඞ්ඛ්‍යාවෙහි ලා නො ගත්හ. අසුරකායයෙහි කාලකඤ්ජක අසුරයෝ ප්‍රෙත ගතියෙහි ද, වෙපචිත්ති අසුරයෝ දෙව ගතියෙහි ද, ඇතුළත් වෙති.

(3-1 බලනු)

අක්ලිෂ්ටාව්‍යාකෘතා එව

විප්පනි:—ඒ පඤ්චගතීහු විපාක වශයෙන් අක්ලිෂ්ට ව්‍යාකෘතයෝ ම වෙත්.

සත්ත්වාක්ඛ්‍යා නාන්තරාභවඃ

විප්පනි:—නව සත්ත්වාවාසයෝ ද, අන්තරාභවය ද, ගති සංඛ්‍යා-වෙහි ඇතුළත් නොවෙති. (සත්ත්වාවාස 3-6 ද, අන්තරාභව 3-10 ද, බලනු)

5 නානාත්වකාය සංඥාශ්ව-නානා කායෛක සංඥිනඃ
විපර්යා වෛවක කාය-සංඥාශ්වා රූපිණ්‍ය ත්‍රයඃ

6 විඥානස්ථිතයඃ සප්ත-ශෙෂං තත්පරිභෙදවත්
භවාග්‍ර සංඥිසත්ත්වාශ්ව-සත්ත්වාවාසා නවස්මාතාඃ

භාවය:—නානාත්වකාය නානාත්වසංඥි ද, නානාත්වකාය එකත්ව සංඥි ද, විපර්යාශ වශයෙන් ලැබෙන එකකාය සංඥීහු ද, අරූපී භූමිත්‍රය ද, සප්ත විඥානස්ථිතීහු වෙත්. සෙස්ස විඥාන භෙදයෙන් පවතී. භවාග්‍රය ද, අසංඥිසත්ත්වයෝ ද, යන මොවුහු නවසත්ත්වාවාසයෝය සි දන්නා ලදහ.

විඥානස්ථිතයඃ සප්ත

විප්පනි:— 1. නානාත්වකාය නානාත්වසංඥි 2. නානාත්වකාය එකත්වසංඥි 3. එකත්වකාය නානාත්වසංඥි, 4 එකත්වකාය එකත්වසංඥි, 5. ආකාශානන්ත්‍යායතන, 6. විඥානානන්ත්‍යායතන, 7. ආකිඤ්චන්‍යායතන යන සත විඥානස්ථිතීහු වෙත්.

මෙහි විඥානය නම්; ප්‍රතිසන්ධි විඥානය යි. අන්‍ය දර්ශන යන්හි ජීව ශබ්දයෙන් ව්‍යවහාර වනුයේ මේ විඥානය යි.

"නානත්තකාය නානත්ත සඤ්ඤිහු නම් කවරහ යත්?

සදෙව් ලෝ වැසි දෙවියන් හා මිනිසුන් හා විනිපාතිකයන් හා සමහර ප්‍රෙත කෙනෙකුන් ඇතුළුව මොහු හැම දෙන "නානත්තකාය නානත්ත සඤ්ඤිහු" නම් වෙත්.

නානත්තකාය එකත්ත සඤ්ඤිහු කවරහ යත්?

සතර අපාය ද, හීන වශයෙන් වඩන ලද ප්‍රථමධ්‍යාන බ්‍රහ්ම පාරිසද්‍යය ද, මධ්‍යම වශයෙන් වඩන ලද ප්‍රථම ධ්‍යාන බ්‍රහ්ම පුරොහිතය ද, උත්කෘෂ්ට වශයෙන් වඩන ලද ප්‍රථමධ්‍යාන මහා බ්‍රහ්මය ද, යන මොහු හැම "නානත්තකාය එකත්ත සඤ්ඤිහු" නම් වෙත්.

එකත්තකාය නානත්ත සඤ්ඤිහු කවරහ යත්?

හීන-මධ්‍යම-ප්‍රණීත වශයෙන් වඩන ලද ඉතිය ධ්‍යාන තල වූ පරිත්තාභය ද, අප්පමාණාභය ද ආභස්සරය ද, යන මොහු හැම එකත්තකාය නානත්ත සඤ්ඤිහු නම් වෙත්.

එකත්තකාය එකත්ත සඤ්ඤිහු කවරහ යත්?

හීනාදි වශයෙන් වඩන ලද තෘතීයධ්‍යාන තල තුනවූ පරිත්තසුභය ද, අප්පමාණසුභය ද, සුභ කිණ්ණකය ද; චතුර්ථ ධ්‍යාන තල වූ වෙහප්ඵලය ද, පඤ්චසුඛාවාසය ද, යන මොහු හැම එකත්තකාය එකත්ත සඤ්ඤිහු නම් වෙත්.

මෙසේ විභාග කළාවූ සතර තැන හා ආකාසානඤ්චායතනාදිවූ යටකී අරූප තුන හා මේ සත් තැන සත්ත විඤ්ඤාණට්ඨිති නම් වේ. සෙස සත්තාවාස නම්; නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනයි. මෙසේ දක්වන ලද සියලු තන්හි නාමය පවතී.

රූපය වනාහි කාමභව රූපභව දෙක්හි ද, අණ්ඩජාදි වූ සිව් යොනියෙහි ද, මනුෂ්‍යාදි වූ පස් ගතියෙහි ද, නානත්තකාය නානත්තසඤ්ඤි යනාදි පළමු සිව් විඥානස්ථිති යෙහි ද, පළමු විඥානස්ථිති සතර ද, අසඥ තලයද, යන පඤ්ච සත්ත්වාවාසයෙහි ද, පවතී" යනු විශුද්ධි මාර්ග සන්නයි.

සප්ත විඥානස්ථිතීන්ගේ විස්තරය වීමති විනොදනී ටීකාහි මෙසේ විස්තර කරයි.

"සත්ත විඤ්ඤාණට්ඨිතියො ති තථා තථා සමුප්පන්නා පජා යෙව වුච්චන්ති. නානත්තකායා නානත්තසඤ්ඤිනො නානත්ත කායා එකත්තසඤ්ඤිනො එකත්තකායා නානත්ත සඤ්ඤිනො එකත්තකායා එකත්ත සඤ්ඤිනො හෙට්ඨිමා ච තයො ආරුප්පාති ඉමා සත්තවිධා පජා යෙව. විඤ්ඤාණං තිට්ඨති එත්ථාති-විඤ්ඤාණට්ඨිතියො නාම.

තත්ථ නානත්තංකායා එතෙස මත්ථීති=නානත්ත කායා, නානත්තාසඤ්ඤා එතෙසන්ති නානත්තසඤ්ඤිනො, සඤ්ඤා සීසෙනෙත්ථ පටිසන්ධි විඤ්ඤාණං ගහිතං එස නයො සෙසෙසුපි.

තත්ථ සබ්බෙ මනුස්සා ඡ කාමාවචර දෙවා ච නානත්ත කායා නානත්ත සඤ්ඤිනො නාම, තෙසං හි අඤ්ඤ මඤ්ඤං විසදිසතාය නානා කායා පටිසන්ධි සඤ්ඤාච නවවිධතාය නානා.

තිසු පඨමජ්ඣාන භූමිසු බ්‍රහ්මකායිකා චෙව චතුසු අපායෙසු සත්තා ච නානත්තකායා එකත්ත සඤ්ඤිනො නාම. තෙසු හි බ්‍රහ්මපාරිසජ්ජාදිනං තිණ්ණම්පි සරීරං අඤ්ඤ මඤ්ඤං විසදිසං පටිසන්ධි සඤ්ඤා පන පඨමජ්ඣාන විපාක වසෙන එකාව. තථා ආපායිකානම්පි තෙසං පන සබ්බෙසං අකුසල විපාකා හෙතුකා ච සටිසන්ධි සඤ්ඤා.

දුතියජ්ඣාන භූමිකා ච පරිත්තාභ අප්පමාණාභ ආභස්සරා එකත්තකායා නානත්ත සඤ්ඤිනො නාම. තෙසං හි සබ්බෙසං එකප්පමාණො ච කායො පටිසන්ධි සඤ්ඤා පන දුතිය තතිය ජ්ඣාන විපාක වසෙන නානා හොති.

තතියජ්ඣාන භූමියං පරිත්තසුභාදයො තයො චතුත්ථජ්ඣාන භූමියං අසඤ්ඤ සත්ත චජ්ජිතා වෙහප්ඵලා පඤ්ච සුඩාවාසා ති නවසු භූමිසු සත්තා එකත්තකායා එකත්ත සඤ්ඤිනො නාම, ආභා නානත්තෙන පන සබ්බත්ථ කාය නානත්තං න ගය්හති. සණ්ඨාන නානත්තෙනෙව ගය්හතීති.

අසඤ්ඤ සත්තා විඤ්ඤාණා භාවෙන විඤ්ඤාණට්ඨිති සඞ්ඛං න ගච්ඡන්ති. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං පන යථාසඤ්ඤාය එවං විඤ්ඤාණස්සාපි සුඛුමත්තා නෙව විඤ්ඤාණං නාවිඤ්ඤාණං තස්මා පරිබ්‍යත්ත විඤ්ඤාණකිච්චවන්තෙසු විඤ්ඤාණට්ඨිතිසු න ගය්හති. තස්මා සෙසානි ආකාසානඤ්චායතනාදිනි තීණියෙව ගහිතානි. තෙහි සඞ්ං ඉමා සත්ත විඤ්ඤාණට්ඨිතියො ති වෙදිතබ්බා."

සාරත්ථ දීපනී චීනය ටීකාහි මෙසේ විස්තර කරයි.

"සබ්බෙ මනුස්සා ඡ කාමාවචරා ච දෙවා එකච්චෙ ච විනිපාතිකා නානත්තකායා නානත්ත සඤ්ඤිනො ති වුච්චන්ති, අපරිමාණෙසු චක්කාවාළෙසු හි අපරිමාණානං මනුස්සානං වණ්ණ සණ්ඨානාදිවසෙන චෙපි එක සදිසා නත්ථි, යෙපි කත්ථචි යමක භාතරො වණ්ණෙන වා සණ්ඨානෙන වා එක සදිසා හොන්ති, තෙසම්පි ආලොකිත විලොකිත කථිත භාසිත ගමන-ඨානාදිහි විසෙසො හොති යෙව, පටිසන්ධි සඤ්ඤා ච තෙසං තිහෙතුකා පි දුහෙතුකා පි අහෙතුකා පි හොති තස්මා සබ්බෙපි මනුස්සා නානත්තකාය නානත්ත සඤ්ඤිනො, එකච්චෙ විනිපා-තිකාපන චතු අපාය විනිම්මුත්තකා උත්තරමාතා යක්ඛිනී පියඞ්කර මාතා ධම්මගුත්තාති එවමාදයො දඞ්බ්බා, එතෙසං හි ඔදාත කාලමඞ්ගුරච්ඡවිසාම වණ්ණාදි වසෙන චෙව කිසථූල රස්ස දීඝාදිවසෙන ච කායො නානා හොති, මනුස්සානං විය දුහෙතුක තිහෙතුකා හෙතුකවසෙන පටිසන්ධිසඤ්ඤාපි තෙ පන න දෙවා විය මහෙසක්ඛා කපණමනුස්සා විය අප්පෙසක්ඛා දුල්ලභ ඝාසච්ඡාදන දුක්ඛපීළිතා විහරන්ති, එකච්චෙ කාලපක්ඛෙ දුක්ඛිතා ජුණ්හපක්ඛෙ සුඛිතා හොන්ති, තස්මා සුඛ සමුස්සයතො විනිපාතිතත්තා, සුඛසමුස්සයතො විනිපාතො එතෙසං අත්ථිති විනිපාතිකා ති වුත්තා, සතිපි දෙවභාවෙ දිබ්බ සම්පත්තියා අභාවකො යෙ පනෙත්ථ තිහෙතුකා තෙසං ධම්මා භිසමයො පි හොති, පියඞ්කරමාතා හි යක්ඛිනී පච්චුස සමයෙ අනුරුඬ-ත්ථෙරස්ස ධම්මං සජ්ඣායතො සුත්වා;

"මා සද්දං කරි පියඞ්කර-භික්ඛු ධම්මපදානි භාසති
අපි ධම්මපදං විජානිය-පටිපජ්ජෙම හිතාය නො සියා
පාණෙසු ච සඤ්ඤමාම සෙ-සම්පජාන මුසා න භණාමසෙ
සික්ඛෙම සුසීලමත්තනො-අපි මුච්චෙම පිසාච යොනියා"ති

එවං පුත්තකං සඤ්ඤාපෙත්වා තං දිවසං සොතාපත්තිඵලං පත්තා උත්තරමාතා පන භගවතො ධම්මං සුත්වා සොතාපන්නා ජාතා, එව මිමෙපි කායස්ස චෙව පටිසන්ධිසඤ්ඤාය ච නානත්තා නානත්තකායා නානත්ත සඤ්ඤිනො ත්වෙව සංඛං ගච්ඡන්ති.

බ්‍රහ්මපාරිසජ්ජ බ්‍රහ්ම පුරොහිත මහාබ්‍රහ්ම සඞ්ඛාතා පන හීන මජ්ඣිම පණීත භෙදභින්නෙන පඨමජ්ඣානෙන නිබ්බත්තා බ්‍රහ්මකායිකා චෙව චතුසු අපායෙසු සත්තා ච නානත්තකායා එකත්ත සඤ්ඤිනොති වුච්චන්ති එතෙසු හි බ්‍රහ්මකායිකෙසු බ්‍රහ්ම පුරොහිතානං කායො බ්‍රහ්මපාරිසජ්ජෙහි පමාණතො විපුලතරො හොති.

මහාබ්‍රහ්මානං කායෝ පන බ්‍රහ්මපුරෝහිතානං පමාණතෝ විපුලතරෝ හොති, කාමඤ්ච තෙසං පභාවසෙන කායෝ තෙසංම තෙසී මෙනි උළාරතරෝ හොති, තං පන ඉධ අප්පමාණං, තථාහි පරිත්තාභාදීනං පරිත්ත සුභාදීනං ච කායෙ සති පභා වෙමත්තෙන එකන්ත වසෙනෙව ච්ඡට්ඨියතීති එකන්තකායාතෙව තෙ වුච්චන්ති. එව මිමෙ බ්‍රහ්මකායිකා කායසන්නානත්තා පඨමජ්ඣාන විපාක වසෙන පන පටිසන්ධිඤ්ඤ්ඤ්

පරිත්ත සුභාදිසු අකනිට්ඨ පරියොසානාසු නවසු භූමීසු සත්තා එකත්තකායා එකත්ත සඤ්ඤිනොති ගහෙතබ්බා, අසඤ්ඤසත්තා පන විඤ්ඤාණාභාවා එත්ථ ඝටිතං න ගච්ඡන්ති, තථා හි අනුපපන්නා බුද්ධේ තිට්ඨායතනෙ පබ්බජිතා වායොකසිණ පරිකම්මං කත්වා චතුත්ථජ්ඣානං නිබ්බත්තෙත්වා තතො වුට්ඨාය ධිවියසං ධිවියසං විපස්සන්තා තාහි අභාවමායෙව ඤත්වා, විපස්සං ඔතිණ්ණාය වධ බන්ධනාදි පච්චයං දුක්ඛං උප්පජ්ජති. විත්තෙන අසති නාමෙ තනති ඛත්තිං රූපං උප්පාදෙත්වා අපරිහීනජ්ඣානා කාලං කත්වා රූප පටිසන්ධි වසෙන අසඤ්ඤ භවෙ නිබ්බත්තන්ති, යොස්ස ඉරියාපථො මනුස්ස ලොකෙ පණිහිතො අහොසි, සොතෙන ඉරියාපථෙන නිබ්බත්තෙත්වා පඤ්ච කප්පසතානි සිතොවා නිසින්නොවා නිපන්නොවා හොති එවං චිත්ත විරාගභාවනා වසෙන තෙසං තත්ථ විඤ්ඤාණුප්පත්ති න හොතීති විඤ්ඤාණාභාවතො විඤ්ඤාණඨිතිං තෙන භජන්ති නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනං පන යථෙව සඤ්ඤාය එවං විඤ්ඤාණස්සාපි සුබුමත්තා විඤ්ඤාණට්ඨිතිසු සඞ්ගහං නගච්ඡති. තං හි සඤ්ඤාය විය විඤ්ඤාණස්සාපි සඞ්ඛාරවසෙසං සුබුමභාවප්පත්තත්තා පරිබ්‍යත්ත විඤ්ඤාණකිච්චා භාවතො නෙව විඤ්ඤාණං නෙව සබ්බසො අවිඤ්ඤාණං හොතීති නෙව විඤ්ඤාණා විඤ්ඤාණං, තස්මා පරිපුණ්ණ විඤ්ඤාණ කිච්චවන්තීසු විඤ්ඤාණට්ඨිතිසු සඞ්ගහං නගච්ඡති. තස්මා විනිපාතිකෙහි සද්ධිං ඡ කාමාවචරා දෙවා මනුස්සා ච නානත්තකායා නානත්ත සඤ්ඤිනො, පඨමජ්ඣාන භූමිකා අපාය සත්තා ච නානත්තකායා එකත්ත සඤ්ඤිනො, දුතියජ්ඣාන භූමිකා එකත්තකායා නානත්ත සඤ්ඤිනො, තතියජ්ඣාන භූමිකා අසඤ්ඤ සත්තං වජ්ජෙත්වා සෙසා චතුත්ථජ්ඣාන භූමිකා ච එකත්තකායා එකත්ත සඤ්ඤිනොති, ඉමා චතස්සො විඤ්ඤාණට්ඨිතියො නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනං වජ්ජෙත්වා ආකාසානඤ්චා යතනාදි හෙට්ඨිමා රූපත්තභාවෙන සද්ධිං සත්ත විඤ්ඤාණට්ඨිතියොති වෙදිතබ්බා"

නාම-කාය දෙදෙනා ගේ භෙද භෙදය අනුව ලැබෙන සත්ත විඤ්ඤාණ ස්ථිතීන් ගේ පූර්ව ප්‍රභෙද සතර නාලන්දිකා ටීකාව මෙසේ විස්තර කරයි.

I කායෙ සංඤ්ඤාං ච පහදෑ, යථා මනුෂ්‍යාඃ, කාමධාතෙෆ්‍ව චාතුම්මහාරාජිකාදයඃ ෂඩ් දෙවාඃ, රූපධාතෙෆ්‍ව ප්‍රථමධ්‍යානෙ බ්‍රහ්මපුරොහිත මහාබ්‍රහ්ම සහාගත දෙව, එතෙෂාං නවානං ලොකානාං සත්ත්වාඃ කායතො නානත්වෙ පරස්පරං භින්නාඃ.

2 කායෙ නානා, පරංනාමති එකඃ, සථා ප්‍රථමධ්‍යානෙ බ්‍රහ්මකායිකාඃ.

3 විපර්‍යයාත් පූර්ව්‍ය නාමති නානා කායා එකඃ; යථා ආභස්වරා දෙවාඃ.

4 නාමති එකඃ කායෙ ච එකඃ; යථ ශුභකෘත්ස්නා දෙවාඃ

ශෙෂං තත්පරි හෙදවත්.

විප්පනි:—මෙහි "ශෙෂය" නම්; නරක - තිර්‍යක් - ප්‍රෙත - යන අපායත්‍රය සහ නෛවසංඥා නාසංඥායතනයයි. එහි විඥාන යා ගේ විනා නාම-කාය දෙදෙනා ගේ හෙදයක් නැත. අපායයෙහි දුඃඛ වෙදනාවෙන් ද, චතුර්ථධ්‍යානයෙහි අසංඥි සමාපත්තියෙන් ද, භවාග්‍රයෙහි නිරෝධ සමාපත්තියෙන් ද, විඥානය නසන ලද්දේය යි ටීකාහි කියයි.

"නෙවසඤ්ඤා නාසඤ්ඤායතනං යථෙව සඤ්ඤාය එවං විඤ්ඤාණස්සාපි සුඛුමත්තා නෙව විඤ්ඤාණං නාවිඤ්ඤාණං තස්මා විඤ්ඤාණට්ඨිතිසු න වුත්තං" යනු මනොරථ පූරණී අටුවායි.

භවාග්‍ර

විප්පනි: — 2-43 බලනු. (198 වැනි පිටුව)

අසංඥි සත්ත්වාශ්ව

විප්පනි: — "අසංඥි සත්ත්ව භූමිය යනු "සඤ්ඤා විරාග භාවනා නිබ්බත්ත රූපසන්තති මත්තත්තා නත්ථි සඤ්ඤා මුඛෙන වුත්තා අවසෙසා රූපක්ඛන්ධා ච එතෙසන්ති අසඤ්ඤා" යනු නිර්වචන බැවින් "සඤ්ඤාරොගා සඤ්ඤාගණ්ඩ." යනා දීන් සංඥාව ගේ නො-ඇලුනාවූ භාවනා වශයෙන් හටගත් තා වූ රූප කලාප මාත්‍රයක් ඇති බැවින් ද, සංඥාශීර්ෂයෙන් කියන ලද්දාවූ සතර අරූපස්කන්ධයන් මොවුන්ට නැති හෙයින් ද, අසංඥ නම් වෙත්. ඒ වෙහපඵල-අසඥ සත්ත්ව භූමිද්වයෙහි වාසය කරන්නා වූ බ්‍රහ්මයන් ගේ විශෙෂය නම්; ධ්‍යාන ලාභී වූ ද, ධ්‍යාන ලාභී නොවූ ද, පඤ්චම ධ්‍යාන ලාභී වූ ආර්‍ය-අනාර්‍ය දෙකොට්ඨාසය උපදනා භූමිය වෙහපඵලය යි කියා ද; කර්ම වාදී - ක්‍රියාවාදී තීර්ථකයන්

විසින් සංඥාවෙහි නො ඇළුණා වූ වායො කසිණයා ගේ වශයෙන් උපදවන ලද පඤ්චම ධ්‍යානයා ගේ විපාකයෙන් රූප මාත්‍රයක් හටගන්නා භූමිය අසංඥ සත්ත්ව භූමි නම් ද වේ"

"ඔහු යම් ඊර්ෂාපථයකින් මෙහිදී මියෙද්ද එම ඉරියව්වෙන් එහි උපදනාහයි දතයුතු"

"වෙහප්ඵලාපි චතුන්ථ විඤ්ඤාණට්ඨිතිමෙව භජන්ති. **අසඤ්ඤසත්තා විඤ්ඤාණා භාවා එක්ඨ සඞ්ගහං නගච්ඡන්ති** සත්තාවාසෙසු ගච්ඡන්ති. සුඩාවාසා විවට්ට පක්ඛෙ ඨිතා, න සබ්බකාලිකා කප්පසත සහස්සම්පි අසඞ්ඛෙය්‍යම්පි බුඩසුඤ්ඤෙ ලොකෙ න උප්පජ්ජන්ති. ධම්මචක්කප්පවත්තිස්ස භගවතො ඛන්ධාවාර සදිසා හොන්ති. තස්මා නෙව විඤ්ඤාණ ට්ඨිතිං චතුන්ථ සත්තාවාසං භජන්ති" යනු මනොරථ පූරණී අටුවායි.

සත්ත්වාවාසා නව

විපත්ති:— 1. නානාත්වකාය නානාත්වසංඥි, 2. නානාත්වකාය එකාත්වසංඥි, 3. එකාත්වකාය නානාත්වසංඥි, 4. එකාත්වකාය එකාත්වසංඥි 5. අසංඥසත්ත්ව 6. ආකාශානන්ත්‍යායතන, 7. විඥානානන්ත්‍යායතන. 8 ආකිංචන්‍යායතන, 9. නෛව සංඥ නාසංඥායතන යන නවය

විදාරන ලද්දේ මැයි. සඞ්ගිති සූත්‍රයෙහි;

නව සත්තාවාසා සන්තාවුසො සත්තා **නානත්ත-කායා නානත්ත සඤ්ඤිනො** සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. අයං **පඨමො සත්තාවාසො** සන්තාවුසො සත්තා **නානත්තකායා එකත්ත සඤ්ඤිනො** සෙය්‍යථාපි දෙවා බ්‍රහ්මකායිකා පඨමාභි නිබ්බත්තා අයං **දුතියො සත්තාවාසො** සන්තාවුසො සත්තා **එකත්තකායා නානත්ත සඤ්ඤිනො** සෙය්‍යථාපි දෙවා ආභස්සරා අයං **තතියො සත්තාවාසො** සන්තාවුසො සත්තා **එකත්තකායා එකත්ත සඤ්ඤිනො,** සෙය්‍යථාපි දෙවා සුභකිණ්හා අයං **චතුත්ථො සත්තාවාසො,** සන්තාවුසො සත්තා අසඤ්ඤිනො අප්පටි සංවෙදිනො, සෙය්‍යථාපි දෙවා අසඤ්ඤසත්තා අයං **පඤ්චමො සත්තාවාසො** සන්තාවුසො සත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා, අනන්තො ආකාසොති,

ආකාසානඤ්චායතනුපගා, අයං **ඡඨො සත්තාවාසො** සත්තාවුසො සත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති **විඤ්ඤාණඤ්චායතනුපගා** අයං **සත්තමො සත්තාවාසො** සත්තාවුසො සත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චිති **ආකිඤ්චඤ්ඤායතනුපගා** අයං **අඨමො සත්තාවාසො** සත්තාවුසො සත්තා සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම **නෙවසඤ්ඤා නාසඤ්ඤායතනුපගා** අයං **නවමො සත්තාවාසො**"

වසතු කාමය නිසා ම මේ සත්ත්වාවාසයන්හි වෙසෙත්. කියන ලදි. නාලන්දිකා ටීකාහි; "**සත්ත්වානාං ආවාසා, යත එසු සත්ත්වා වසතු කාමතයා එව වසන්ති**"

"**සත්තා ආවසන්ති එත්ථාති = සත්තාවාසා, සත්ත නිකායා. අත්ථතො තථා පවත්තා පජා එව. ඉධ සඞ්ඛාර ලොක භාවෙන ගයහන්තිති වෙදිතබ්බා**" යනු විමති විනොදනී ටීකායි.

"නානත්තකාය නානත්තසඤ්ඤීය නානත්තකාය එකත්තසඤ්ඤීය එකත්තකාය නානත්තසඤ්ඤීය එකත්තකාය එකත්තසඤ්ඤීය යට අරූප ලොක තුණය යන මේ **සත් වැදැරුම් තලය සත්ත්වයන්ගේ විඤ්ඤාණය සිටිනා අර්ථයෙන් සප්ත විඤ්ඤාන ස්ථිතිහු නම් වෙත්.** ඔවුන් අතුරෙන් අනෙකප්‍රකාර වූ ශරීරයන් ඇත්තාවූ ද, අනෙකප්‍රකාර ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඇත්තාවූ ද, සත්ත්ව සමූහය නානත්තකාය නානත්තසඤ්ඤී නම් වෙයි. මෙහි සංඥා ශීර්ෂයෙන් හෙවත් සංඥාව ප්‍රධාන කොට ගැණීමෙන් ප්‍රතිසන්ධි විඤ්ඤාණය ගන්නා ලද්දේයි. සෙසු සත්වකායෙහි ද මේ ක්‍රමයෙන් අර්ථ ගත යුතුයි.

ඔවුන් අතුරෙන් සියලු මනුෂ්‍යයන් සා කාමාවචර දෙවියෝත් නානත්තකාය නානත්තසඤ්ඤී නම් වෙත්. ඔවුන්ගේ ශරීරයෝ වනාහි ඔවුනොවුනට විසදෘශ වන හෙයින් වෙනස් කාය ඇත්තාහු වෙති. ප්‍රතිසන්ධි විඤ්ඤාණයත් නව වැදැරුම් වන හෙයින් නානත්ත සඤ්ඤී නම්. ප්‍රථමධ්‍යාන තල තුනෙහි වාසය කරන්නාවූ බ්‍රහ්මකායිකයන් හා සතර අපායෙහි සත්වයෝත් නානත්තකාය එකත්තසඤ්ඤී නම්. කුමක් හෙයින යත්? ඔවුන් අතුරෙන් බ්‍රහ්මපාරිෂද්‍යාදි

තුන්තල වාසි බ්‍රහ්මයන්ගේ ශරීරය ඔවුනොවුන්ට විසදෘශ වෙයි ප්‍රතිසන්ධි සංඥාව වනාහි ප්‍රථමධ්‍යාන විපාක වශයෙන් එකක් ම වන්නිය. සතර අපාය වාසීන්ගේ ද, ශරීරය හා සංඥාවත් එසේම ය. ඒ අපාය වාසි සියලු සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය අකුශල විපාක අහෙතුක චිත්තය ම වෙයි. විතියධ්‍යාන භූමියට ඇතුළත් වූ පරිත්තාභ-අප්ප-මාණාභ ආභස්සර යන තුන්තල වාසීහු එකත්තකාය නානත්තසඤ්ඤී නම. ඒ තුන්තල වාසීවූ සියලු බඹුන්ගේ ම ශරීරය එක්වන් ප්‍රමාණ වෙයි. ප්‍රතිසන්ධි සංඥාව වනාහි විතියධ්‍යාන විපාක තෘතීය ධ්‍යාන විපාක වශයෙන් නානා ප්‍රකාර වෙති. තෘතීය ධ්‍යාන භූමියෙහි ඇතුළත් වූ පරිත්ත සුභය අප්පමාණ සුභය සුභකිණ්ණය යන තුන්තල වාසීහු චතුර්ථධ්‍යාන භූමියෙහි ද, අසංඥසත්වතලය වර්ජිත කොට ඇත්තාවූ වෙහප්ඵල තලය පඤ්චසුඩාවාස භූමිය යන නව වැදැරුම් භූමියෙහි සත්වයෝ එකත්තකාය එකත්ත සඤ්ඤී නම් වෙති ශරීරාලොකයාගේ නානත්වය කරණ කොට ගෙන සියලු තන්හි කාය නානත්වය නො ගන්නා ලැබේ සණ්ඨාන නානත්වයෙන් ම ගන්නා ලැබේ. අසංඥ සත්වයෝ වනාහි විඤ්ඤාණය නැති බැවින් විඤ්ඤාණස්ථිති සංඛ්‍යාවට නොයන්නේයි. නෙව සඤ්ඤා නාසඤ්ඤා යතනය වනාහි යම්සේ සංඥාව සියුම් වේ ද, එපරිද්දෙන්ම විඤ්ඤා-ණය ද තත් සම්ප්‍රයුක්ත අවශෙෂ ධර්මයෝ ද, සියුම් බැවින් නෙව විඤ්ඤාණ නාවිඤ්ඤාණ නම් වන්නේයි එසේ හෙයින් හාත් පසින් දක්ෂ වූ විඤ්ඤාණ කෘත්‍යවත් වූ විඤ්ඤාණ ස්ථිතීන් අතුරෙහි ඇතුළත් කොට නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනය නොගන්නා ලැබේ එසේ ම විදර්ශනා භාවනාවට ද. ඒ සත්වාවාසය අරමුණු නො වන්නේයි. එතකුදු වුවත් මනායතන ධර්මායතනයෙහි ඇතුළත් වූ සියුම් වූ සතර නාමස්කන්ධයක් ඇති හෙයින් සතර නාම-ස්කන්ධයට ඇතුළත් වන්නේයි. නව සත්වාවාසයෝය යනු යට කියන ලද සප්ත විඤ්ඤාණස්ථිතිහු ම අසංඥ සත්ව නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සංඛ්‍යාත වූ සත්වාවාසයන් දෙදෙනා හා සමග සත්වයන් ගේ ආවාසස්ථාන වන හෙයින් නවසත්වා වාසය සත්ත්වනිකාය යි ව්‍යවහාර කරත්" යනු විශුද්ධිමාර්ග සන්නයි.

නව සත්ත්වාවාස			සප්තවිඥානස්ථිති	
1	ෂට්කාමාවචර දෙවිවරු මනුෂ්‍යයෝ විනිපාතිකයෝ [illegible]	—	නානාත්වකාය නානාත්ව සංඥ	1
2	සතර අපායගත සත්ත්වයෝ බ්‍රහ්ම පාරිසද්‍ය බ්‍රහ්මයෝ බ්‍රහ්ම පුරෝහිත ,, මහා බ්‍රහ්ම ,,	—	නානාත්වකාය එකාත්ව සංඥ	2
3	පරිත්තාභ ,, අප්පමාණාභ ,, ආභස්සර ,,	—	එකාත්වකාය නානාත්ව සංඥ	3
4	පරිත්ත සුභ ,, අප්පමාණ සුභ ,, සුභ කිණ්හ ,, වෙහප්ඵල ,, අවිහ ,, අතප්ප ,, සුදස්ස ,, සුදස්සි ,, අකනිඨ ,,	—	එකාත්වකාය එකාත්ව සංඥ	4
5	අසඤ්ඤසත්ත			
6	ආකාසානඤ්චායතන	—		5
7	විඤ්ඤාණඤ්චායතන	—		6
8	ආකිඤ්චඤ්ඤායතන	—		7
9	නෙවසඤ්ඤානාසඤ්ඤායතන			

7 - අනිච්චාවසානං නාණන්ත්‍ය-චතස්‍රඃ සඤ්ඤාඃ පුනඃ
චතුරඃ ආස්‍රවා සකඛ්‍යාඃ-සඞ්ඛ්‍යාවෙව කෙවලම්

භාවයඃ—යම් තැනෙක්හි නො කැමැත්තෙන් විසිමක් වේ ද, ඒ අන්‍යයෝ සත්ත්වාවාසයෝ නොවෙත්. නැවත සඤ්ඤා සතරක් වෙත්. ආශ්‍රව සහිත වූ සතර සකඛ්‍යයෝ සඤ්ඤා භූමියෙහි ම වෙත්.

අනිච්චාවසානං නාණන්ත්‍ය

විසඳනි:— බඹනාගාරගත සත්ත්වයන් මෙන් අපායවල වසන සත්ත්වයෝ එහි නො කැමැත්තෙන් වසත්. එබැවින් අපාය භූමිහු සත්ත්වාවාස සඞ්ඛ්‍යායෙහි නො ගැණෙත් යනු සර්වාස්තිවාදයි. එහෙත් ස්ථවිර වාදයෙහි සතර අපායවල වසන සත්ත්වයෝ නානත්තකාය එකත්ත සඤ්ඤී සත්ත්වාවාසයෙහි ඇතුළත් වෙති.

දක්වන ලදි. ඒ්මති විනොදනී ටීකායි;

'තිසු පඨමජ්ඣාන භූමිසු බ්‍රහ්මකායිකා වෙව චතූසු **අපායෙසු සත්තාච** නානත්තකායා එකත්ත සඤ්ඤිනෝ නාම"

චතස්‍රඃ සඤ්ඤායඃ පුනඃ

විපසනි:—නැවත ද **1 රූපූපග 2. වෙදනූපග 3 සංඥූ-පග 4 සංඛාරූපග** යනුවෙන් විඥානස්ථිතිහු සතරක් වෙත්. වදරන ලද්දේ මැයි;

"රූපූපායං වා ආවුසො විඤ්ඤාණං තිට්ඨමානං **තිට්ඨති,** රූපා රම්මණං රූපප්පතිට්ඨං නන්දූපසෙවනා වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති. වෙදනූපායං වා-පෙ-සඤ්ඤූපායං වා -පෙ- සඞ්ඛාරූපායං වා ආවුසො විඤ්ඤාණං තිට්ඨමානං **තිට්ඨති.** සඞ්ඛාරාරම්මණං සඞ්ඛාරප්පතිට්ඨං නන්දූපසෙවනං වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති"

මෙහි **රූපූපග විඤ්ඤාණස්ථිතිය** නම්; පඤ්චවොකාර භවයෙහි රූප්පකඛ්ධය ඇසුරු කොට පවත්නා අභිසංඛාර විඤ්ඤාණයයි එහි ම වෙදනා සකඛ්ධය ඇසුරු කොට පවත්නා විඤ්ඤාණය **වෙදනූපග විඤ්ඤාණස්ථිතිය** යි සංඥූඛකඛ්ධය ඇසුරු කොට පවත්නා විඤ්ඤාණය **සංඥූඛපග - විඤ්ඤාණ-ස්ථිතියි.** සංඛාරඛකඛ්ධය ඇසුරු කොට පවත්නා විඤ්ඤාණය **සංඛාරූපග විඤ්ඤාණස්ථිතිය** යි. අභිසංඛාර විඤ්ඤාණයෙහි පෙරැත් සිතෙහි පැවැත්වීම ප්‍රත්‍යය වූ අරමුණු විෂයයන් මේ විඤ්ඤාණ ස්ථිතිහු විදරන ලදහ.

චත්තාරඃ ඝාස්‍රවාඃසකන්ධාඃ සඛන්ධාඒව

විභඞ්ගනි:—ආශ්‍රව සහිත වූ රූප – වේදනා – සංඥ – සංස්කාර යන සතර කඳයෝ සවකීය සවකිය භූමියෙහි ම වෙත්.

8 විඥානං නාසතිනිඃ ප්‍රොක්තං–චතුඃ ෂෂ්ඨාවිඝතු සංග්‍රහෂ
චතස්‍රෝ යෝන යඃසත්ත්‍ව–ඝතඛාතා මණ්ඩජාදයඃ

භාවඝඃ—හුදෙක් විඥානස්ථිතිය යි නො වදරන ලදී. සඛ්‍රහ යෙහි වනාහි අන්‍ය සතරකි. සත්ත්‍වයන් ගේ අණ්ඩජාදි යොනීහු සතරක් වෙත්.

[ෂඩවලං] විඥානං නාස්ථිතිඃ ප්‍රාක්තං

විභඞ්ගනි: –පූර්වොක්ත සතර විඥානස්ථිතිහු ක්ෂෙත්‍රමෙන් ද, විඥානය එහි බීජය මෙන් ද, වදරන ලදි. ඒ විනා හුදු විඥානය ස්ථිති යක් මෙන් නොවදරන ලදි. මේ විඥාන ස්ථිතින්ගෙන් තොරව විඥානය නො පවත්නේයයි කි අයුරුයි.

චතුඃ ෂෂ්ඨාවිඝතු සංග්‍රහෂ.

විභඞ්ගනි:— 1 විඥානය සප්ත විඥානස්ථිතීන්හි සඛඃගීතය; එහෙත්; සතර විඥානස්ථිතීන්හි එය සඛ්‍රහ නොවේ.

2 විඥානය හැර අපාය ගතිකයන් ගේ සකඛ සතර ද· චතුර්ථ ධ්‍යානය ද, භවාග්‍රය ද, සතර විඥාන ස්ථිතීන්හි සඛඃගීතය.

3 රූප–වේදනා–සංඥ – සංස්කාර යන සකඛ සතර සප්ත විඥාන ස්ථිතින්හි ද, සතර විඥානස්ථිතීන්හි ද, සඛඃගීතය.

4 අන්‍ය ධර්මයෝ (අපායගත සත්ත්‍වයන් ගේ විඥාන ය ද, අනාශ්‍රව ධර්මයෝ ද,) සප්ත විඥානස්ථිතීන්හි හෝ සතර විඥාන ස්ථිතින්හි සඛ්‍රහ නොවෙත්.

මෙසේ විඥානය ගේ සඛ්‍රහයෙහි සතර කෙළවරකි.

චතස්‍රෝ යෝනඃසත්ත්‍ව·ඝතඛාතාඃමණ්ඩජාදයඃ.

විභඞ්ගනි:—අණ්ඩජ–ජරායුජ–සංසේදජ–උපපාදුක යනුවෙන් සත්ත්‍වයන් ගේ යොනීහු සතරක් වෙත්. වදරන ලද්දේ මැයි; "චතස්සෝ ඛෝ ඉමා සාරිපුත්ත! යෝනියඃ, කතමාචතස්සෝ? අණ්ඩජා යෝනි, ජලාබුජා යෝනි, සංසෙදජා යෝනි, ඕපපාතිකා යෝනි"

මෙහි "යොනි" ශබ්දය සාකඩ භාගාර්ථය යි විනය ටීකාහි කියයි.

"යොනි"ති බඩ්ඩ ඝකාඛාසස්ස කාරණස්සපි පසාව මිගහංසස්සපි නාමං" "චතසෙසා නාගයොනියා චතසෙසා සුපණ්ණ යොනියොති" එත්ථ බඩ්ඩ කොඨාසො යොනි නාම. "අයොනි හෙසා භූමිජ ඵලස්ස අධිගමායාති" එත්ථ කාරණං" නවාහං බ්‍රාහමණං බ්‍රූමි යොනිජං මාති සඞ්ඛවන්ති එත්ථ පසාව මගෙහා ඉධ පන බඩ්ඩඝකාටඨාසෙ යොනීති අධිපෙපතො ඝචන්ති නාඝ ඝන්තා අම්ඝසිතාපි සම්භවජාතිනාඝ මීඝසිනා හොන්තීති = යොනී. සං ඝත අපථනා අණ්ඩාදි උපපත්තිඨාන විසිඨෙ බඩ්ඩානං භාඝ සො පවත්තති විසෙසෙසා. තත්ථ අණ්ඩෙජාතා=අණ්ඩජා, ජලාබුම්හි ජාතා= ජලාබුජා, සංසෙදෙ ජාතා= සංසෙදජා, විනා එතොහි කාරණෙහි උපපත්තිඨා විය නිබ්බත්තාති=ඔපපාතිකා' යනු විනය ටීකායි.

9 චතුඞ්ඛානරතියීසඤ්ඣ-නාරකා උපපාදුකා
අනතරා භව දෙවාඝව-ප්‍රෙතා අපි ජරායුජා

භාවය:—මනුෂ්‍යයෝ ද, තිරශ්චීනයෝ ද, සතරාකාරයෙන් ම උපදිත්. නෙරයිකයෝ ද, අනන්තර භවිකයෝ ද, දෙවියෝ ද, උපපාදුකයෝම වෙත්. ප්‍රෙතයෝ; ජරායුජයෝ ද, උපපාදුකයෝ ද, වෙත්.

චතුඞ්ඛානර තියීසඤ්ඣ

විපනී:—මනුෂ්‍යයෝ ද, තිරශ්චීනයෝ ද, අණ්ඩජ - ජරායුජ සංසෙවජ - උපපාදුක යන සතරාකාරයෙන් ම උපදිත්. නාලන්දිකා ටීකාවෙහි මෙය මෙසේ විස්තර කරයි.

එහි මනුෂ්‍යයන් අතර;

1 ශෛල- උපශෛල නම්හු ද, මිගාරමාතෘ වූ විශාඛාවගේ දෙතිසක් පුත්‍රයෝ ද, පංචාල රජුගේ පන්සියයක් පුත්‍රයෝ ද, අණ්ඩජයෝ ය.

2 (මේ හැර) මනුෂ්‍යයෝ ජරායුජයෝය.

3 මක්ඛාතා - චාරු - උපචාරු - කපොතපාලිනි - ආම්‍රපාලි (=අම්බපාලි) ආදිහු සංසෙවජයෝය.

4 කල්පාරම්භයෙහි උපදිනු ලබන සත්ත්වයෝ උපපාදුකයෝය.

තිරශ්චීනයන් අතර;

1 පක්ෂි - සරිසෘපා (=සිරිංසපා) දිහු අණ්ඩජයෝ ය.

2 සිව්පා සත්තු ජරායුජයෝය.

3 මතකුණා (=මකුණු) දිහු සංස්වේදජයෝය.

4 වර්ෂාරම්භයෙහි උපදනා ශලභාදිහු (=පලහැටි) ද, නාග ගරුඩයෝ ද, උපපාදුකයෝය.

නාරකා උපපාදුකාඃ

විප්පනී:—නරකයෙහි උපදිනු ලබන සියලු ම සත්ත්වයෝ උප-පාදුකයෝ වෙත්.

අන්තරාභව දෙවාශ්ව

විප්පනී:—අන්තරා භවිකයෝ ද, දෙවියෝ ද, උපපාදුකයෝ ම ය. ඔවුහු අණ්ඩජ-ජරායුජ-සංස්වේදජයෝ නොවෙත්.

(මිළඟ කාරිකාව බලනු.)

ප්‍රෙතා අපි ජරායුජාඃ

විප්පනී:—ප්‍රෙතයෝ ජරායුජයෝ වෙත්. කාරිකාගත "අපි" ශබ්දයෙන් ප්‍රෙතයෝ උපපාදුකයෝ ද, වෙත් ය යි කියයි. මේ දක්වන ලද්දේ පූර්වෝක්ත කාරිකාවට ටිකාවෙහි දැක්වූ විස්තරය යි.

I අණ්ඩජ

විප්පනී:— **"යෙ ඛො තෙ සාරිපුත්ත, සත්තා අණ්ඩකොසං අභිනිබ්භිජ්ජ අභිනිබ්භිජ්ජ ජායන්ති අයංවුච්චති සාරිපුත්ත අණ්ඩජායොනි"** යනු වදාළ බැවින් යම් සත්ත්ව කෙනෙක් අණ්ඩකොෂය බිඳ උපදිත් ද, මේ **අණ්ඩජයොනිය** යි කියනු ලැබේ. එනම්; බිජුවටින් උපදනා පක්ෂි සර්පාදිහු වෙත්, **"අණ්ඩ ජාතාති = අණ්ඩජා"** යනු විග්‍රහයි.

"අණ්ඩජාඃ පක්ෂිණාඃ සර්පාඃ-නක්‍රා මත්ස්‍යාශ්ව කච්ඡපාඃ
යානි චෛව ප්‍රකාරාති - ස්ථලජාන්‍යෞදකානි ච"

යනු මනු වචනයි, (මනුස්මෘති 1-43)

2 ජරායුජ

විප්පනි:—"යෙ ඛො නෙ සාරිපුත්ත සත්තා වත්ථිකොසං අභිනිබ්භිජ්ජ අභිනිබ්භිජ්ජ ජායන්ති අයං වුච්චති සාරිපුත්ත ජලාබුජායොනි" යනු වදාළ බැවින් යම් සත්ත්ව කෙනෙක් ගර්භාසය නම් වූ වස්තිකොෂය බිඳගෙන උපදිත් ද, එය ජලාබුජයොනි ය යි කියනු ලැබේ. "ජලාබුම්හි ජාතා = ජාලාබුජා" යනු විග්‍රහයි.

"ජරං ජීරණං භෙදං යාති උපෙතීති = ජලාබු. ජල වුච්චති කලලං තං ආවුණාති පටිච්ඡාදෙතීති = ජලාබුං යනු බැවින් දිරිමට හෝ භෙදයට පැමිණෙනුයේ ජලාබු නම්. ජල නම් වූ කලල රූපය වසන්නේනු යි හෝ ජලාබු නම්. එයින් උපන්නේ ජලාබුජයි

සංස්කෘතයෙහි ජරායු නම්; ගැබ වෙළා සිටින සමයි. ගර්භාසය – කලල යනු ද, තත් පර්‍යාය ශබ්දයි. එහි උපන්නේ ජරායුජයි. "ජරායෞ ජායතෙති = ජරායුජඃ" යනු විග්‍රහයි.

මහා භාගවතයෙහි මෙසේ කියයි.

"යාතු චර්මාකෘතිඃ සුක්ෂ්මා – ජරායුඃ සා. නිගද්‍යතෙ
ශුක්‍ර ශොණ්ත යොර්යොග–ස්තත්‍ර සංජායතෙ යතඃ
තත්‍ර ගර්භො භවෙත් යස්මාත්–තෙන ප්‍රොක්තො
ජරායුජඃ"

මනුස්මෘතියෙහි මෙසේ කියයි.

"පශවශ්ව මෘගා ශෛවව–ව්‍යාලා ශෛවාභයතො දතඃ
රක්ෂාංසි ච පිශාචාශ්ව–මනුෂ්‍යාශ්ව ජරායුජාඃ"

3 සංසේදජ (=සංසෙදජ)

විප්පනි:—යෙ ඛො නෙ සාරිපුත්ත සත්තා පූතිමච්ඡෙවා ජායන්ති පූති කුණපෙ වා පූති කුම්මාසෙ වා චන්දනිකාය වා ඔලිගල්ලෙ වා ජායන්ති අයං වුච්චති සාරිපුත්ත සංසෙදජායොනි" යනු වදාළ බැවින් යම් සත්ත්ව කෙනෙක් කුණු මසෙහි හෝ කුණු මෘත ශරීරයෙහි හෝ කුණු බොජුන්හි හෝ හම් දොර හවරවළු හෝ උපදිත් ද, එය සංසෙදජ යොනි නම්.

"සංසෙදෙ ජාතාති = සංසෙදජා" යනු විග්‍රහ වාක්‍යයි." "කමල කුහර ගබ්භමලාදි සංසෙදට්ඨානෙසු ජාතා= සංසෙදජා" යනු විභාවිනී ටිකායි. සංස්වෙදජයන් හඳුන්වමින් මනුස්මෘතියෙහි (1-45) මෙසේ කියයි.

"ස්වෙදජං දංශ මශකං—යුකා මක්ෂික මතකුණම්
ඌෂ්මණ ශෙවාපජායන්තෙ-සච්චාන්‍යත් කිංචිදිදෘශම්

මෙහි "ස්වෙද"ය නම්; පාර්ථිව ද්‍රව්‍යයන් ගේ තාපයෙන් හටගත් කෙලදයයි; හෙවත් තෙත් ගතියයි.

4 උපපාදුක (=ඔපපාතික)

විප්පති:—"දෙවා නෙරයිකා එකච්චෙ ච මනුස්සා එකච්චෙ ච විනිපාතිකා අයං වුච්චති සාරිපුත්ත ඔපපාතිකායොති" යනු වදාළ බැවින් දෙවියෝ ද, නෙරයිකයෝ ද, සමහර මනුෂ්‍යයෝ ද, සමහර විනිපාතිකයෝ ද, **ඔපපාතිකය** යි කියනු ලැබෙත්. මෙහි දෙව නාමයෙන් බ්‍රහ්මයෝ ද ගැනෙත්.

අණ්ඩජ – ජලාබුජ – සංසෙදජ යන තුන් ආකාරයෙන් වෙනස් ව පහළවන්නෝ **ඔපපාතිකයෝ** නම් වෙත්.

"වෙගෙන ආගන්ත්වා උප්පතිතා වියාති=ඔපපාතිකා"
යනු විග්‍රහයි.

"තත්ථ දෙව මනුස්සෙසු සංසෙදජ ඔපපාතිකානං අයං විසෙසො. සංසෙදජා මන්ද දහරා හුත්වා නිබ්බත්තන්ති. ඔපපාතිකා සොළස වස්සුද්දෙසිකා හුත්වා මනුස්සෙසු හි භූම්ම දෙවෙසු ච ඉමා චතස්සො පි යොනියො ලබ්භන්ති, තථා තිරච්ඡානෙසු සුපණ්ණ නාගාදිසු වුත්තං හෙතං.

"තත්‍ර භික්ඛවෙ අණ්ඩජා සුපණ්ණා අණ්ඩජෙව නාගෙ හරන්ති. න ජලාබුජෙ, න ඔපපාතිකෙ"ති. චාතුම්මහාරාජික තො පට්ඨාය උපරි දෙවා ඔපපාතිකායෙව. තථානෙරයිකා පෙතෙසුපි චතස්සො පි ලබ්භන්ති" යනු සුමඞ්ගල විලාසිනී අටුවායි.

2-14 කාරිකාව බලනු (145 වැනි පිටුව)

10 මෘත්‍යුපපත්ති භවයෝ-රන්තරා භවිතීහ යඃ
ගම්‍ය දෙශානු'පෙතත්වාත්-නොපපනෙතාන්තරා භවඃ

භාවය:—මෘත්‍යු භවයෙන් අනතුරුව ද, උත්පත්ති භවයෙන් පෙරටුව ද, යම් භවයක් වේ ද, එය අන්තරා භවය යි. යා යුතු තැනට නො පැමිණි හෙයින් උපන්නේ නොවේ.

මෘත්‍යුපපත්ති භවයෝ:

විප්පනි:—මරණය මෘත්‍යු භවය යි. උත්පත්තිය උත්පත්ති භවයයි. මේ අතර වූ භවය අන්තරා භවය යි. භව දෙකකට අතර වූ බැවින් එනම් වීය. එය පූර්ව ශරීරය අත්හැරීම ද, අන්‍ය ශරීරයක් ගැනීම ද, අතර පිහිටියේ ය. "**පූර්ව ශරීරා ත්‍යක්තවා ශරීරාන්තර ග්‍රහණාත් ප්‍රාක් යො භවඃ ස්ථිතිඃ යොන්තරාභවඃ**" යනු නාලන්දිකා ටීකායි.

ගම්‍ය දෙශානු පෙතත්වාත්.

විප්පනි:—අන්තරා භවිකයා යා යුතු තැනට පැමිණියේ නොවේ. හෙවත් ප්‍රතිසන්ධිය ලැබුයේ නොවේ.

අන්තරාභවඃ

විප්පනි:—ස්ථවිර වාදයෙහි අන්තරා භවය නො පිළිගනී. උදානට්ඨ කථායෙහි ද පඤ්චප්පකරණට්ඨකථායෙහි ද, අන්තරාභවය විවෙචනය කරයි. බුද්ධ දෙශනාවේ සමහර සූත්‍රයන්හි දක්නා "**උභයමන්තරෙන - අන්තරාභව පරිනිබ්බායි - සම්භවෙසි-ගන්ධබ්බ**" යන පදයන් නුනුවණින් ගෙන අන්තරාභව වාදයට බැසගත් බැස පූර්වෝක්ත අටුවාවන්හි දක්නේය. පඤ්චප්පකරණට්ඨකථායෙහි දක්නා පරිදි අන්තරා භවය පිළිගත්තෝ පූර්වශෛලීය-සම්මිතීය යන නිකායිකයෝය. අභිධර්මකොශය සර්වාස්තිවාදීන් ගේ කෘතියක් බැවින් ඔවුන් විසින් ද, අන්තරාභවය පිළිගන්නා ලද බැව් පෙනේ. අන්තරා භවය බුදුරජාණන් වහන්සේ විසින් ද, වදාළ බැව් අභිධර්ම කොශයේ කාරිකා කිපයකින්ම දක්වයි. අභිධර්මකොශයේ අන්තරාභවය විද්‍යමාන බවට පෙන්වන සියලුම සාධක උදාන අටුවාහි ද, කථාවත්ථු අටුවාහි ද, ඛණ්ඩනය කරන ලදී. බුද්ධ ධර්මය පිළිබඳව නානා නිකායිකයන් ඇති වීමට හෙතුව අන්තරාභව වාදයෙන් ම පැහැදිලි වේ. බුද්ධ දෙශනාව ස්ථවිරවාදීහු එක් විධියකට ද, අන්‍ය නිකායිකයෝ අන්විධියකට ද, තේරූහ. අන්තරා භවය පිළිබඳ මිතය ඛණ්ඩනය කරමින් උදාන අටුවාහි මෙසේ කියයි.

යෙ පන "උභය මන්තරෙනා"ති * **පදං ගහෙත්වා අන්තරා භවං** නාම ඉච්ඡන්ති. තෙසං තං මිච්ඡා. අන්තරාභවස්ස හි භාවො අභිධම්මෙ පටික්ඛිත්තො යෙව. **අන්තරෙනාති** වචනං පන විකප්පන්තර දීපනං තස්මා අයමෙත්ථ අත්ථො. නෙව ඉධ න හුරං උභය මන්තරෙන පන න අඤ්ඤවිධානං අත්ථීති.

යෙපි ච † **අන්තරාපරිනිබ්බායි- I සම්භවෙසී ති** ච ඉමෙසං සුත්තපදානං අත්ථං අයොනිසො ගහෙත්වා අත්ථි යෙව අන්තරා භවොති වදන්ති. තෙපි යස්මා අවිහාදිසු තත්ථ තත්ථ ආයුවෙ මජ්ඣං අනතික්කමිත්වා අන්තරා අග්ගමග්ගාධිගමෙන අනවසෙස කිලෙස පරිනිබ්බාණෙන පරිනිබ්බායතීති අන්තරා පරිනිබ්බායී. න අන්තරා භව භූතොති පුරිමස්ස සුත්තපදස්ස අත්ථො. පච්ඡිමස්ස ච යෙ භූතා එවං න භවිස්සන්ති තෙ ඛිණාසවා පුරිමපදෙ භූතාති වුත්තා, තබ්බිරුද්ධතාය **සම්භවෙසීනෙ**ති= **සම්භවෙසිනො, අප්පහීණ** භවසංයොජනත්තා සෙඛා පුථුජ්ජනා ච චතුසු වා යොනිසු අණ්ඩජ්ජලාබුජ සත්තා යාව අණ්ඩකොසං වත්ථිකොසඤ්ච න භින්දන්ති තාව **සම්භවෙසී** නාම. අණ්ඩකොසතො වත්ථි කොසතො ච බහි නික්ඛන්තා **භූතා** නාම. සංසෙදජ ඔපපාතිකා ච පඨම චිත්තක්ඛණෙ සම්භවෙසී නාම. දුතිය චිත්තක්ඛණතො පට්ඨාය භූතා නාම, යෙන වා ඉරියා පථෙන ජායන්ති යාව තතො අඤ්ඤං න පාපුණන්ති තාව සම්භවෙසිනො, තතො පරං භූතාති අත්ථො. තස්මා නත්ථීති පටික්ඛිපිතබ්බා' සති හි උජුකෙ පාළි අනුගතෙ අත්ථෙ කිං අතිද්ධාරිත සාමත්ථි යෙන අන්තරාභවෙන පරිකප්පිතෙන පයොජනන්ති?

---

* තතො ත්වං බාහිය න තෙන, යතො ත්වං බාහිය න තෙන තතොත්වං බාහිය න තත්ථ යතො ත්වං බාහිය න තත්ථ තතො ත්වං බාහිය නෙවිධ න හුරං උභයමන්තරෙන එසෙවන්තො දුක්ඛස්සාති.

උදානපාළි 1-10.

† සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරා පරිනිබ්බායි හොති,
අඞ්ගුත්තර නිකාය. 3-4-7.

I භූතා වා සම්භවෙසී වා සබ්බෙ සත්තා භවන්තු සුඛිත තත්තා.
සුත්තනිපාත 1-4 5.

යෙ පන සන්තානවසෙන වත්තමානානං ධම්මානං අවිච්ඡේදෙන දෙසන්තරෙසු පාතුභාවො දිට්ඨො, යථා තං විගි ආදි අවිඤ්ඤාණක සන්තානෙපි, එවං සවිඤ්ඤාණක සන්තානෙපි අවිච්ඡේදෙන දෙසන්තරෙසු පාතුභාවෙන භවිතබ්බං, අයඤ්ච නයො සති අන්තරාභවෙ යුජ්ජති, න අඤ්ඤථාති යුත්තිං වදන්ති.

තෙන ගි ඉද්ධිමතො චෙතො වසිප්පත්තස්ස චින්තානුගතිකං කායං අධිඨහන්තස්ස ඛණෙන බ්‍රහ්මලොකතො ඉධූපසඞ්කමනෙ ඉතොවා බ්‍රහ්මලොකගමනෙ යුත්ති වත්තබ්බා, යදි සබ්බත්ථෙව අවිච්ඡින්න දෙසෙ ධම්මානං පවත්ති ඉච්ඡිතා, යදිපි සියා ඉද්ධි මන්තානං ඉද්ධි විසයො අවින්තෙය්‍යොති තං ඉධාපි සමානං, කම්ම විපාකො අවින්තෙය්‍යොති වචනතො. තස්මා තං තෙසං මති මත්තමෙව; අවින්තෙය්‍ය සභාවා ගි සභාව ධම්මා. තෙ කත්ථච් පච්චය වසෙන විච්ඡින්න දෙසෙ පාතුභවන්ති, කත්ථච් අවිච්ඡින්න දෙසෙ, තථා ගි මුඛඝොසා දිගි පච්චයෙහි අඤ්ඤස්මිං දෙසෙ ආදාස පබ්බත දෙසාදිකෙ පටිබිම්බ ඝොසාදිකං පච්ච යුප්පන්නං නිබ්බත්තමානං දිස්සති, තස්මා න සබ්බං සබ්බත්ථ උපනෙතබ්බන්ති අයමෙත්ථ සංඛ්ඛෙපො, විත්ථාරොපන පටිබිම්බස්ස උදාහරණභාවසාධනාදිකො අන්තරාභව කථා විචාරො කථාවත්ථුප්පකරණස්ස ටිකාය ගහෙතබ්බො'.

අන්තරාභවය විද්‍යමාන බවට කාරිකා කීපයකින් ම සාධක දක්වනු ලැබේ.

11 ව්‍රිති සන්තාන සාධ්‍යාද්-අවිච්ඡින්නභවොද්භවඃ ප්‍රතිබිම්බං අසිද්ධත්වාත්-අසාම්‍යාච්චාතිදර්ශිනම්

භාවය:—ව්‍රිගි සන්තතිය (=විපරපුර) නොසිඳි පවත්නා ස්වභාව ඇත්තාක් මෙන් භවොත්පත්තිය ද, අවිච්ඡින්නය; හෙවත් නොසිඳි පවත්නේය. ප්‍රතිබිම්බය පිළිබඳ දෘෂ්ටාන්තය අසිද්ධ හෙයින් ද, අසාම්‍ය හෙයින් ද, අතිදර්ශිනය.

ව්‍රිති සන්තාන සාධ්‍යාද් - අවිච්ඡින්න භවොද්භවඃ

විප්පනි:—මෙය විවරණය කරමින් නාලන්දිකා ටිකාගි මෙසේ කියයි

වියෙන් ගොයම ද, ගොයමෙන් විය ද, හටගන්නේ ය. මේ දෙක අතර සිඳීමක් නැත. ඉදින් එහි අතරතුර සිඳීමක් වෙයි නම්; සන්තතියක් නැත. එ සේම මෘත්‍යු භවයත් උත්පත්ති භවයත් (=මරණය සහ ඉපදීම) අතර විච්ඡේදයක්

(=සිදීමක්) නොවියයුතුය එසේ මේ දෙක අතර සිදීමක් වේ නම්; උත්පත්තිය සි කිය නොහැක. ඉදින් මෘත්‍යුභවයත් උත්පත්ති භවයත් අතර වූ අන්තරාභවය නැත්නම්; එහි විවේදය වේ. එසේ නම්; උත්පත්තිය සි කිය නොහැක. **"ඝණඛ්‍ය සන්තානා විසදිසදෙසෙත්, න නාසසෙසමුපපත්තිනිති චිකඤ්ඡං ශක්‍යම්"** යනු නාලන්දිකා ටිකායි.

ප්‍රතිබිම්බං

විසජ්ජනි:—බිම්බ-ආදර්ශී දෙදෙනා ගේ සන්තානයෙන් ප්‍රතිබිම්බය. හටගනී. එහෙත් එහි බිම්බ-ආදර්ශී දෙදෙනා ගේ සම්බන්ධියක් නැත. එසේම මෘතශරීර-උත්පද්‍යමාන ශරීර දෙදෙනා ගේ ද, අන්තරා භවය පිළිබඳ අපෙක්ෂාවක් නැත්තේය මේ ප්‍රතිබිම්බ දෘෂ්ටාන්තය දන්වා අන්තරා භවය සම්භර ආචාර්‍ය වරු නොපිළිගනිති.

අසිඤ්ඩාත් අසාම්‍යෙවා නිදර්ශනම්.

විසජ්ජනි:—පූර්වෝක්ත ප්‍රතිබිම්බ දෘෂ්ටාන්තය බණ්ඩනය කරන වසුබන්ධු ආචාර්‍යයෝ එය අසිඤ්ඩයයි ද, අසාම්‍යයයි ද, කියති.

"කදිදං ප්‍රතිබිම්බං න දෘෂ්ටාන්ත රූපෙණ ගෘහීතුං ශක්‍යම්; යතෝ වර්ණ සන්නිශ්‍රයස්‍යෙව ප්‍රතිබිම්බං භවති, න වර්ණ විරහිතස්‍ය විඥාන සන්තානස්‍යෙති, මයෝ සාධ්‍යෝදාහරණයෝ සාම්‍යමපි නාසති" යනු ටිකායි.

ඒ ප්‍රතිබිම්බය දෘෂ්ටාන්ත සදරූපයෙන් ගත නොහැක. ප්‍රතිබිම්බය වර්ණ සන්නිශ්‍රිතයා ගේම විනා වර්ණ විරහිත විඥාන සන්තානයා ගේ ප්‍රතිබිම්බයක් නැත. එබැවින් එය අසිඩය. සාධ්‍ය-උදාහරණ දෙදෙනා ගේ සමානත්වයකුදු නැත. මෙහි **සාධ්‍යධර්මී; අන්තරා භවයයි. උදාහරණය ප්‍රතිබිම්බයයි.**

මෙහි සථවිරවාද මතය විශුද්ධිමාර්ගයේ විසතර කරන ලදි. ඒ අනුව ලියූ භාවසන්නය මෙසේ ය.

"මෙසේ ප්‍රතිසන්ධි විඤ්ඤාණ පූර්ව භවයෙන් මේ භවයට නොඒම ද, පූර්ව භවයෙහි ඇතුළත් වූ හෙතුන්හෙන් මේ භවයෙහි ප්‍රතිසන්ධි විඤ්ඤාණය හටගැන්ම ද, යන මේ කාරණ යෙහි ප්‍රතිරූපවාදීහු උදාහරණයෝ වෙති. එකාන්තයෙන් ආදර්ශයාගේ සම්බන්ධය වත් ඉතිරින් එකසිය හෝමින්

එකක් බව ද, නැත්තේය. එකට සම්බන්ධ වන හෙයින් නානත්වය හෙවත් වෙනස් බව ද, නැත්තේ යි.

ශබ්ද ප්‍රතිරූවාදින් ගේ ප්‍රත්‍යය ප්‍රත්‍යුත්පන්න බව ඇත්තෙනිදු පරම්පරා වශයෙන් බැඳීම අප්‍රකට හෙයින් ඒ ශබ්ද ප්‍රතිරූවාදින් ගේ එකත්ව නානත්වාදිය ව්‍යවහාර නොකොට පූර්ව භවයෙන් මෙහි නොඒම හා අනිත හෙතුවෙන් හටගන්නා බව ප්‍රකාශ කරණු කැමැතිව මතු පහළ වන ච්ඡන්තරය දක්වූයේයි. මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයා ගේ පූර්ව භවයෙන් මේ ප්‍රත්‍යක්ෂ භවයට නොඒමෙහි ද, අනිත භවයෙහි ඇතුළත් වූ හෙතූන් කරණකොට ගෙන මේ භවයෙහි හටගැණීමෙහි ද, ප්‍රතිරූවය ප්‍රදීපය මුද්‍රාවය ප්‍රතිබිම්බය යන මොවුන් ගේ ආකාර ඇත්තා වූ කරණ සංඛ්‍යාත උපමාවෝ තුමූ උදාහරණයෝ වෙති. ඒ එසේ මැයි. ප්‍රතිරූවය ප්‍රදීපය මුද්‍රාවය ඡායාවය යන මොවුහු තුමූ මූල් වූ ශබ්දය මූල් වූ පහනය මුද්‍රාචක්‍රය පුරුෂයාය යන හෙතුහු කාරණා කොට ඇත්තාහු නම්‍ය හටගත් තැනින් අන්‍ය වූ මූල්ශබ්දාදින් ඇත්තා වූ ස්ථානයට නොගොස් මූල් ශබ්දාදින් ගේ හටගැණීමෙන් පූර්වයෙහි නැති බැවින් ඒ ප්‍රතිරූවාදින් ගේ හටගැණීමට හෙතු වන්නාක් මෙන් මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණ තෙමේ ද, කර්මාදි හෙතු ධර්මය විද්‍යමාන වූ ස්ථානයට ගොස් ඒ කර්මාදියම හෙතු කොට ඇත්තේ නොවෙයි. ප්‍රතිරූපය මූල් ශබ්දය හෙතු කොට ඇත්තේ වෙයි. ප්‍රදීපය අනික් ප්‍රදීපාන්තරයකට හෙතු වෙයි. මුද්‍රා චක්‍රය ලක්ෂණයට හෙතු වෙයි. ඡායා තොමෝ කැටපත් ආදියට මුදුන අභිමුඛවීම ආදිය හෙතු කොට ඇත්තේ වෙයි මූල් ශබ්දාදි හෙතූන්ගේ පිහිටි ස්ථානයට නොගොස් මූල් ශබ්දාදිය හෙතු කොට ඇත්තාහු වෙති. කුමක් හෙයින ය‍ත්? ඒ මූල් ශබ්දාදින් ගේ හටගැණීමෙන් පූර්වයෙහි නැති හෙයිනි එපරිද්දෙන්ම මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය ද කර්මාදි හෙතුව පිහිටි ස්ථානයට ගොස් ඒ කර්මාදියම හෙතු කොට ඇත්තේ නොවෙයි. කුමක් හෙයින ය‍ත්? ඒ කර්මාදින් ගේ හටගැණීමෙන් පූර්වයෙහි නැති බැවිනි. ඒ ප්‍රතිරූවාදිහු තුමූ මූල් ශබ්දාදිය පිහිටි ස්ථානයට නොගොස් ඒ මූල් ශබ්දාදියම හෙතුකොට ගෙණ හටගන්නාක් මෙන් මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය ද, කර්මාදි හෙතුව හටගන්නා වූ පූර්වභවයෙන් මේ ප්‍රත්‍යුත්පන්න භවයට ආයේද නොවෙයි. කුමක් මෙන් ද ය‍ත්? ප්‍රතිරූවාදිහු තුමූ

ශබ්දදිය පැවැති ප්‍රදෙශයෙන් නොඑන්නාක්හු මෙති ඒ පූර්ව භවයෙහි කර්මාදි හෙතුවෙන් තොරව නොද උපදනේ ද වෙයි. කුමක්මෙන් ද යත්? ශබ්දදියෙන් තොරව ප්‍රතිරූ-වාදීහු නූපදනාක්හු මෙති යන අර්ථයි.'

19 සඉඑකකතු ඛයා භාවාත්-නිස්සත්තාභාවත් මිඉහෙතුජාත් කබළීඅාකත'වාසති ගතිඛීඃ-පඑඑඛ්වාකතාඃ ගන්ථසූත්‍රාඃ

භාවය:-එක් තැනෙක්හි දෙදෙනකුන් ගේ විමක් නොවන හෙයින් ද, සත්තති නොවන හෙයින් ද, විහෙතුජ හෙයින් ද, (ප්‍රතිබිම්බ සිද්ධාන්තය සංදූෂය. එබැවින් අන්තරා භවය පිළිගත යුතුය) ශ්‍රී මුඛයන්ම බුදුන් විසින් අන්තරා භවය වදරන ලදි. ඒ අන්තරා භවය ගතිඛී නම් වේ. පඑඑඛ්වාකතා යෙන් ද ගති සූත්‍රයෙහි වදළ හෙයින් ද, (අන්තරා භවය පිළිගත යුතුය.)

සඉඑකකතු ඛයාභාවාත්.

විපක්ෂ:—අන්තරා භවයාගේ අවිද්‍යමානත්වය පෙන්වනු පිණිස ප්‍රතිබිම්බ සිද්ධාන්ත සාධකය ඉදිරිපත් කරනුවන් විසින් එක ක්ෂණයෙහි බිම්බ-ප්‍රතිබිම්බ දෙදෙනාගේ සත්තිය වේයයි කියන ලදි. එහෙත් බිම්බ-ප්‍රතිබිම්බ දෙදෙනාගේ සමභාව යන් එකම කෙණෙහි නොවේ. මල කෙණෙහි විඤ්ඤාණය ගත් ද, අන්තභවයක උපදිනු ලබන කෙණෙහි විඤ්ඤාණය ගත් ද, එකාවර සමභාවය නොවේ එකම කාලයෙහි එකම ස්ථානයෙහි දෙදෙනකුන් ගේ විමක් නොවන හෙයින් ප්‍රතිබිම්බාදාහරණය නොපිළිගත යුතුය. මේ විකාගත විස්තරයයි.

නිස්සත්තභාවාත්.

විපක්ෂ:—බිම්බයා ගේ ප්‍රතිබිම්බය සන්තති භූත නොවේ. එහෙයින්-නුදු ප්‍රතිබිම්බ සිද්ධාන්තය සාවද්‍යය.

විහෙතුජාත්.

විපක්ෂ:—දර්පණය-බිම්බය යන හෙතු දෙකකින් ප්‍රතිබිම්බය හට ගනී. එහි දර්පණය ප්‍රධානය. බිම්බය අප්‍රධානය. භවයා ගේ සමභාවයෙහි ද, මරණය හෝ උත්පත්තිය යන දෙකින් එකක් එකම කෙණෙහි සිටී. මේසේ ප්‍රතිබිම්බ සිද්ධාන්තය විහෙතුජ කියන්න් ද, සංදූෂය. එබැවින් මරණය-උත්පත්තිය දෙක අතර අන්තරාභවය පිළිගත යුතුය. කියන ලදි ටීකාවේ;

"දක්ෂිණා-බිම්බාභ්‍යාං දධ්‍යාභ්‍යාං හෙතුභ්‍යාං ප්‍රතිබිම්බං ජායතෙ. තත්‍ර ප්‍රධානං දක්ෂිණම්. භවොදාහෙ එකමේව කාරණං එකසම්මින් ක්ෂණෙ තිෂ්ඨති. මෘත්‍යූපසර්ජිතං, උත්පත්ති සර්ජිති චීා. ඉදං ප්‍රතිබිම්බ-සිද්ධාන්තතඃ සඳෙහ ඉති මෘත්‍යූ-ත්පත්‍යනන්තරාලෙනන්තරාභවඃ සර් ඛතීව්‍ය එව"

කණෙඩාඉකතඉවඃසති

විපනි:-නරක - තිරිසන්යොනි - ප්‍රෙත - දෙව - මනුෂ්‍ය - කම් අනන්තරාභව යනුවෙන් සත්ත භවයක් බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරන ලදි. එහෙයින් ද, අනන්තර භවය පිළිගත යුතුයයි විකාශි කියයි. එහෙත් අනන්තර භවයක් බුදුන් දෙසූ තැනක් තැනක් ස්ථවිර වාදයෙන් සොයාගත නොහැක

ගඞ්ගිඃ.

විෂනි:—"ගඞ්ගං ගොක්තුං අර්හති ගච්ඡතිති= ගඞ්ගිඃ" යනු නිරුක්ති හෙයින් අන්තරා භවිකයා ගඞ්ගි නාමයෙන් ද, හඳුන්වයි.

තෛත්තිරීය ආරණ්‍යකයේ "ගඞ්ගි" නාමය ආත්මය උදෙසා යොදා ඇත්තේය.

යස්මින්නිදං සං ච වි චෛකං ස
ඔතඃ ප්‍රොතශ්ච විභූඃ ප්‍රජාසු
ප්‍ර තද් වොචෙ අමෘතං නු විද්වාන්
ගඞ්ගිඃ නාම් නිහිතං ගුහාසු

තෛත්තිරීය ආරණ්‍යක iv 3.

"තිණ්ණං බො පන භික්ඛවෙ සන්නිපාතා ගබ්භස්ස අවක්කන්ති හොති, ඉධ මාතා පිතරං ච සන්නිපතිතා ගච්ඡන්ති, මාතා ච උතුනී හොති, ගන්ධබ්බා ච පච්චුපට්ඨිතා හොන්ති, ඉත්තභාවං බො භික්ඛවෙ තිණ්ණං සන්නි-පාතා ගබ්භස්ස අවක්කන්ති හොති" යන දෙශනා පාඨ යෙහි සඳහන් වන "ගන්ධබ්බඃ" නම්; අනන්තරා භවිකයා ගැන හාලද්දිකා විකාශි කියයි.

ඉහත විකාශි ද "අනන්තරා භවි ඇත්තෙක්" එහෙම් විසඳා ගනියි.

"අනන්තරාභවූ සත්ත්වස්තු ජන්ම මරණයොර්මධ්‍යේ භවඃ ප්‍රාණියො මානෂා නෛව කායානන්තරං ප්‍රාපනුඃ නාපි ජන්ම ස මරණ ජන්මානන්තරාභවස්තාදනන්තරං භව ඝත්තවඃ ස ච ඝානන්තා ශරීරඃ ඉති"

මහාභාරතයෙහි මෙසේ කියයි. (4-7-34)

"න චාප්‍යහං චාලයිතුං-ශක්‍යා ෂඤ්ඤාවිදඛ්ඛණා
දුඃඛ ශිලා හි ගඤ්ඡිා ෂෙනා ච මෙ බලවත් ප්‍රියඃ
ප්‍රච්ඡන්නකවාෂි රක්ෂන්ති-ෂෙ මාං නිත්‍යං ශුචිසම්මතෂ"

සථවිර වාදයෙහි "ගන්ධබ්බ" යනු මෙසේ විස්තර කරයි.

"ගන්ධබ්බාති තත්‍රූපගො සත්තෂා අධිප්පෙතො. ගන්ත-බ්බාති වුත්තං හොති. තකාරස්ස වෙත්ථ ධකාරො කතො. අථවා ගන්ධබ්බා නාම රඛ්ඛන්තමා. තෙ විය තත්‍ර තත්‍ර භවෙසු නාෂා වෙසගහනතො අයම්පි ගන්ධබ්බාති වුත්තෂා සො මාතාපි තූනං සන්නිපාතකඛණතො පච්ඡාපි ඝත්තාභබ්භන්තරෙ තත්‍ර උප්පන්නෂා පඨවුපධිතොති වුත්තෂා" යනු විමති විනොදනී ටීකායි.

"ගන්ධබ්බාති" තත්‍රූපගො සත්තෂා. ගන්තබ්බාති වුත්තං හොති. තකාරස්ස ධකාරො කතොති දඨබ්බං. අථවා ගන්ධනතො උප්පජ්ජනඝතියා නිමිත්තුපට්ඨානෙන සූචනතො දිපනතො ගන්ධාති ලද්ධනාමෙන භවඝාමිකමමනා අබ්බති පවත්තතීති= ගන්ධබ්බා. තස්ථ උප්පජ්ජනක සත්තෂා, පඨවුපධිතො ඝහොතීති= උපගතො හොති. එස්ථ ච නා මාතා පිතූනං සන්නිපාතං ඔලොකයමානො සම්මුඛෙ ඨිතා නාමහොති. කම්මඝන්ත සණ්ඨිතො පන එකො සත්තෂා තස්මිං ඔකාසෙ නිබ්බත්තනතො පුරිම ජාතියං ඨිතො යෙව. ඉති නිමිත්තාදි ආරම්මණ කරණ වසෙන උපපන්නාභිමුඛා හොතීති අධිප්පෙතා" යනු සාරාර්ථ දීපනී විනය ටීකායි.

පාඨාන්තරඝකථා

ටිප්පණි:—1 අනන්තරාපරිනිබ්බායි. 2. උපපද්‍ය පරිනිබ්බායි. (=උපහච්ච-පරිනිබ්බායි) 3 අනභිසංසකාර පරිනිබ්බායි 4. සාභිසංසකාර පරිනිබ්බායි 5. ඌර්ධවඝස්‍රොත යන පඤ්චකයෙහි ප්‍රථම වූ "අනාගාමිපරිනිබ්බායි" යනුවෙන් ද, අන්තරාභවයාගේ භේදයම්නාඛ්‍ය ප්‍රකාශ කරයි. අන්තරාභවයෙහි ද, පරිනිබ්බාණය ඇති බැවින්, යනු නාලන්දිකා ටීකායි.

එහෙත් ස්ථවිරවාදයට අනුව අන්තරා පරිනිබ්බායී නම්; පඤ්චසුඩාවාසයෙහි යම් කිසි තැනක ඉප ද, උපන් කෙණෙහි හෝ මදක් ඉක්මවා හෝ මධ්‍යභාගයෙහි සිට හෝ අභීත්වයට පැමිණෙ ද, ඒ අන්තරා පරිනිබ්බායී නම් වේ. දක්වන ලදි. මනොරථපරණී අටුවාහි;

අන්තරා පරිනිබ්බායීති යො පඤ්චසු සුද්ධාවාසෙසු යත්ථ කත්ථචි උප්පන්නො නිබ්බත්තක්ඛණෙ වා ථොකං අතික්කමිත්වා වා වෙමජ්ඣෙ ඨත්වා වා අරහත්තං පාපුණාති තස්සෙතං නාමං. උපහච්චපරිනිබ්බායීති යො තත්ථෙව ආයුවෙමජ්ඣං අතික්කමිත්වා අරහත්තං පාපුණාති, අසංඛාර පරිනිබ්බායීති යො තෙසං යෙව පුග්ගලානං අසංඛාරෙහෙව අප්පයොගෙන කිලෙසෙ ඛෙපෙති, සසංඛාර පරිනිබ්බායීති යො සසංඛාරෙන සප්පයොගෙන කිලෙස ඛෙපෙති, උඩං සොතො අකනිට්ඨ ගාමිති යො හෙඨා චතුසු සුඩාවාසෙසු යත්ථ කත්ථචි නිබ්බත්තිත්වා තතො චුතො අනුපුබ්බෙන අකණිඨෙ උප්පජ්ජිත්වා අරහත්තං පාපුණාතීති"

අන්තරා පරිනිබ්බායිහු තිදෙනෙක් වෙත්. දක්වන ලදි එහි ම;

"අන්තරා පරිනිබ්බායීති යො ආයුවෙමජ්ඣං අනතික්කමිත්වා පරිනිබ්බායති, සො තිවිධො හොති. කප්පසහස්සායුකෙසු තාව අවිහෙසු නිබ්බත්තිත්වා එකො නිබ්බත්ත දිවසෙයෙව අරහත්තං පාපුණාති, නො චෙ නිබ්බත්ත දිවසෙ පාපුණාති පඨමස්ස පන කප්පසතස්ස මත්ථකෙ පාපුණාති අය මෙකො අන්තරා පරිනිබ්බායී. අපරො එවං අසක්කොන්තො චින්නං කප්පසතානං මත්ථකෙ පාපුණාති අයං දුතියො. අපරො එවම්පි අසක්කොන්තො චතුන්නං කප්පසතානං මත්ථකෙ පාපුණාති අයං තතියො අන්තරා පරිනිබ්බායී"

ගති සූත්‍රතඃ

විප්පනී:—ගති සූත්‍රයෙහි බුදුරදුන් විසින් සප්ත මහා පුරුෂ ගතිහු දෙශනා කරන ලදහ. එහි ද අන්තරා පරිනිර්වායී පුද්ගලයා වදරන ලදි. එයින් ද, අන්තරා භවය පිළිගත යුතුයයි ටීකාහි කියයි.

අඞ්ගුත්තර නිකායේ දක්නා සප්ත මහා පුරුෂ ගති ඇතුළත් ගති සූත්‍රය මෙසේය.

"කතමා ච භික්ඛවේ සත්තපුරිස ගතියෝ, ඉධ භික්ඛවේ භික්ඛු එවං පටිපන්නා හොති නොචස්ස නො ච මෙ සියා න භවිස්සති නව මෙ භවිස්සති, යදත්ථි යං භූතං තං පජහාමීති උපෙඛං පටිලභති, සෝ භවේ න රජ්ජති භවෙ නරජ්ජති අප්පුඤ්ඤතරිං පදං සන්තා සම්මප්පඤ්ඤාය පස්සති, තඤ්චඛ්වාස්ස පදං න සම්බන්ධ සබ්බා සවිඤ්ඤකතං හොති, යාසා වා පනස්ස අයං සබ්බා මානානුසයනා පහිණා හොති, න සම්බන්ධ සබ්බා භවරාගානුසයා පහිණා හොති, න සම්බන්ධ සබ්බා අවිජ්ජානුසයා පහිණා හොති, සෝ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරා පරිනිබ්බායි හොති" -පෙ- ඉමා ඛො භික්ඛවෙ සත්ත පුරිස ගතියෝ"

පූර්වශෛලීයයෝ ද, සම්මිතීයයෝ ද, මේ අන්තරා-පරිනිබ්බායි" පදය නුහුවණින් ගෙන අන්තරා භවය පිළිගත්හ සි පඤ්චප්‍රකරණ අටුවාහි කියයි.

"තත්ථ යෙසං අන්තරා පරිනිබ්බායිති සුත්ත පදං අයොනිසෝ ගහෙත්වා අන්තරා භවඨානාම අත්ථි, යත්ථ-සත්තෝ දිබ්බචක්ඛුකෝ විය අදිබ්බචක්ඛුකෝ ඉද්ධිමා විය අනිද්ධිමා මාතාපිතිසමාගමඤ්චෙව උතුසප්පායඤ්ච ඔලොකය මානෝ සත්තාහං වා අතිරෙක සත්තාහං වා තිට්ඨතීති ලද්ධි සෙය්‍යථාපි පුබ්බසෙලියානඤ්චේව සම්මිතීයානඤ්ච"යි.

13 එකක්ඛණිකාත් අභාවඤ්ඤත්-පූර්වකාල භවාකෘතිඃ ඝ පුනර්මරණාත් පූර්ව-උපපත්තික්ෂණාත් පරඃ

භාවය:—මේ අන්තරා භව සත්ත්වයා එක් භවකාරක කර්මයක්හුගේ නික්ෂේපයෙන් කැමැත්තෙන් ම පූර්වකාලභවයෙහි ආකෘතිය දරයි. ඒ පූර්වකාල භවය ද, මරණයෙන් පූර්ව වූයේ ද, උත්පත්තියෙන් පසු වූයේ ද, වෙයි.

පූර්වකාල භවාකෘතිඃ

විස්තර:—අන්තරා භවිකයාගේ ආකාරය; මරණයෙන් පූර්වයෙහි යම් බඳු ආකාරයක් ද, -එය ම ය.

"අත්ථි අන්තරා භව සත්තස්ස පුබ්බකාලභවෙ යාදිසි ආකෘතිඃ තාදිසි මෙව ධාරයති" යනු නාලන්දිකා ටිකායි.

ස පුනම්රණාත් පූර්ව-උපපත්තික්ෂණාත් පරඃ

විප්පති:—අන්තරා භවය, උපපත්ති භවය, පූර්වකාල භවය, මරණ භවය යනුවෙන් භව සතරක් වෛභාෂික වාදයෙහි උගන්වයි.

අන්තරා භවය නම්; මරණ උත්පත්ති භව දෙදෙනාගේ අතර පවත්නා භවයයි.

උපපත්ති භවය නම්; යා යුතු තැනට පැමිණීමෙන් හෙවත් ප්‍රතිසන්ධිය අවසන්කොට ඇති භවයයි.

පූර්වකාල භවය නම්; උත්පත්ති භවයට අනතුරුව මරණ භවය කෙළවර කොට ඇති භවයයි.

මරණ භවය නම්; යා යුතු තැනට පැමිණීමෙන් පසු අන්තරා භවය කෙළවර කොට ඇති භවයයි.

ස්ථවිර වාදයෙහි අන්තරා භවය නොපිළිගනී. පූර්වකාල භවය සහ මරණ භවය වෙන අයුරකින් උගන්වයි. එහි උගන්වන උප්පත්තිය භවය මෙසේය.

"තත්ථ කතමො උප්පත්ති භවො? කාමභවො රූප භවො අරූපභවො සඤ්ඤාභවො අසඤ්ඤාභවො නෙවසඤ්ඤි නාසඤ්ඤා භවො, අයං වුච්චති උප්පත්ති භවො"

14 ස ජාති ශුද්ධ දිව්‍යාක්ෂි-දෘශ්‍යඃ කර්මර්ද්ධි වෙගවාන් සකලෝ'ක්ෂඃ ප්‍රතිසවාන්-අනිවර්ත්‍යඃ ස ගන්ධභුක්

භාවය:—ඒ අන්තරාභව සත්ත්වයා සමාන ජාතීයයන් විසින් ද, සුවිශුද්ධ දිව්‍ය නෙත්‍රයන්ගෙන් ද, දකිනු හැක්කේය. කර්ම සෘද්ධි වෙගයෙන්ද, සියලු ඉන්ද්‍රියයන්ගෙන්ද, යුක්තය. අප්‍රතිසවත් ය. නො නවත්නා ගමන් ඇත්තේය. ගන්ධිය අනුභව කරයි.

ස ජාති ශුද්ධ දිව්‍යාක්ෂි - දෘශ්‍යඃ

විප්පති:—ඒ අන්තරාභවිකයා සියල්ලන්ට ම නොපෙනේ. සජාතීයයන්ට සහ පිරිසුදු දිවැස් ලැබුවන්ට පමණක් බලනු හැක්කේය. මෙහි සජාතීයයෝ නම්; අන්‍ය අන්තරා භවික සත්ත්වයෝ වෙත්.

ඒනිකිත්සා - අමනසිකාර-කාය දෙඋණ්ඩිල්‍ය-සත්‍යානමීඤ්ඤ ඔදඩ්ඩිකත්ව- අත්‍යාරම්භ-විරෝදෙවග- ජ්මනිත්තත්ව- අනාගත භය සංඥ අසිද්ලප-අනිධ්‍යායිත්ව යන එකොළොස් මල ධර්මයන් ගෙන් තොරවූ චක්ෂුස පිරිසුදුය.

භෙගවාන්

විභාවනී:—අන්තරා භවිකයා ප්‍රතිසන්ධිය උදෙසා යන ගමනෙහි කම් වෙගයෙන් ද, ඍද්ධි වෙගයෙන් ද, යුක්තය.

සඤ්ඤලක්ඛණ:

විභාවනී:—එසේ ම අන්තරා භවිකයා චක්ෂු-ශ්‍රොත්‍රාදි සියලු ඉන්ද්‍රිය යන්ගෙන් යුක්තය අඤ්ඤ නාම ඉන්ද්‍රිය ඕ.

අනිවත්තීය:

විභාවනී:—දුන්නෙන් මිදුණ ශරයක් මෙන් අන්තරා භවිකයා ගේ ගමන වළක්වනු නොහැක්කේය.

ස ගන්ධිබ්බෙන්

විභාවනී:—ඒ අන්තරා භවිකයා ගන්ධය අනුභව කරන්නේය. මෙහි ගන්ධය නාම; උත්පත්ති ගතිය ඕ; සාරඤ්ඤ දීපනී විනය ටීකාහි කියයි. මේ ගන්ධය අනුභව කරන නිසාම ගන්ධබ්බ නාම වේ. **"ගන්ධං භොකතුං අච්චි භවන්තීති නිරුක්තියා ගන්ධබ්බ සංඥා සිද්ධා"** යනු මාලඳිකා ටීකායි.

15 විපරීසඤ්ඤා මිච්ඡාති-නිත්‍යදෘශං පිරංසයා
ගන්ධබ්බානාහිතාභෙමාත්‍යෘ:-උත්ථිවපාදන්තු නාරකා:

භාවය:—විපරීත බුද්ධි ඇත්තේ භොග තෘෂ්ණාවෙන් ශරීරාත්තකර යකට පැමිණෙයි. අනිත් සත්ත්වතෙමේ ගන්ධය ද, ස්ථානය ද, කැමැතිවන්නේ ය. නෙරයිකයෝ උඩුකුරු වූ පා ඇතියෝ වෙත්.

විපරීසඤ්ඤා මිච්ඡාති නිත්‍ය දෘශං පිරංසයා.

විභාවනී:—අභාග තෘෂ්ණාව නිසා බුද්ධිය විපරීත වෙයි. එහෙයින් මු අත් ඉතිහකට පෙවත් ශරීරාත්තභාවයට පැමිණෙයි.

ගබ්භට්ඨානාභිකාමොනාහ.

විපනි:—මෙහි අනික් සත්ත්වයා නම්; සෙවදජයා සහ ඔපපාතික යා ය. සෙවදජ සත්ත්ව තෙමේ ගර්භය ද, ඔපපාතික සත්ත්ව තෙමේ ස්ථානය ද, කැමැති වෙමින් ඒ ඒ ශරීරයට පැමිණෙයි.

ඵුඡ්ඣවපාදසත්තානාරක්ඛා:

විපනි: –නිරයෙහි උපදින සත්ත්වයෝ උඩුකුරු පා ඇත්තෝව එහි යෙත්. වදුරන ලද්දේ මැයි;

"එතෙ පතන්ති නිරයෙ–උඩපාදා අවංසිරා
ඉසීනං අතිවාතාරෝ–සංයතානං තපස්සිනං"

16 සම්පජානන් විඤ්ඤත්‍යාහ:–නිඤ්ඤත්‍යාපය පරෝ'පරා:
නිඤ්ක්‍රාමත්‍යාපි සඛීණ්–මූළ්හා හි නිත්‍ය මණ්ඩජා:

කාවය:—(ගර්භාවක්‍රාන්තියෙහි) එක් සත්ත්වයෙක් මනාව දන්නේ ගර්භයට පිවිසෙයි. අනික් සත්ත්වයෙක් (මනාව දන්නේ) පිවිසෙන්නේත්, එහි වෙසෙන්නේත්, වෙයි. අනික් සත්ත්වයෙක් (මනාව දන්නේ) ගර්භයට පිවිසෙන්නේත්, එහි වෙසෙන්නේත්, එයින් නික්මෙන්නේත්, වෙයි. අණ්ඩජ සත්ත්ව තෙමේ මේ සියල්ල නොම දනිමින් ම කරයි.

සම්පජානන් විඤ්ඤත්‍යාහ:

විසඳනි:—චක්‍රවර්ති රජ තෙමේ මනාසිහියෙන් යුක්තව, දනිමින්ම ගර්භයට පිවිසෙයි.

නිඤ්ඤත්‍යා'පය'පරා:

විපනි:—ප්‍රත්‍යෙක බොධිසත්ත්වවරු මනා සිහියෙන් යුක්තව ගර්භයට පිවිසීම ද, එහි වසීම ද, කරති.

අපරා: නිඤ්ක්‍රාමත්‍යාපි.

විපනි:—සර්ව බොධිසත්ත්වවරු මනා සිහියෙන් යුක්තව, දනිමින්ම ගර්භයට පිවිසෙති; එහි වෙසෙති; එයින් නික්මෙති.

මූළ්හා හි අණ්ඩජා:.

විපනි:—අණ්ඩජ සත්ත්ව තෙමේ ගර්භයට පිවිසීම ද, එහි වසීම ද, එයින් නික්මීම ද, මුළා වූ සිත් ඇත්තේම කරයි.

(මිළඟ කාරිකාව බලනු)

17 ගර්භාවක්‍රාන්තයසතිස්‍රඃ-චක්‍රවර්ති ස්වයං භුවාම්
කර්ම-ඥානා භයෙෂාං වා-විශදත්වාද්‍යථා ක්‍රමම්

භාවය:—පූර්වෝක්ත තෙවැදෑරුම් ගර්භාවක්‍රාන්තිහු පිළිවෙළින් චක්‍රවර්ති-ප්‍රත්‍යෙක බුද්ධ හා සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ගේ ද, වෙත්. එය ද, පිළිවෙළින් කර්ම-ඥාන-කර්මඥානයන් ගේ පරිශුද්ධත්වයෙන් වේ.

ගර්භාවක්‍රාන්තයසතිස්‍රඃ චක්‍රවර්තිස්වයං භුවාම්.

විප්පනි:—වෛභාෂික වාදයෙහි ගර්භාවක්‍රාන්තිහු තුනකි. එහෙත් ස්ථවිර වාදයෙහි සතරකි. විදාරන ලදි සම්ප්‍රසාදනීය සූත්‍රයෙහි;

"**වත්‍යෙසා භූමා භන්තෙ ගබ්භාවක්කන්තියා.** ඉධ භන්තෙ එකච්චා අසම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති. අසම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා නික්කමති. අයං පඨමා ගබ්භාවක්කන්ති. පුනච පරං භන්තෙ ඉධෙකච්චා සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, අසම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා නික්කමති, අයං දුතියා ගබ්භාවක්කන්ති, පුනච පරං භන්තෙ ඉධෙකච්චා සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, අසම්පජානො මාතුකුච්ඡිම්හා නික්කමති, අයං තතියා ගබ්භාවක්කන්ති පුනච පරං භන්තෙ ඉධෙකච්චා සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමති, සම්පජානො මාතුකුච්ඡිස්මිං ඨාති, සම්පජානො මාතුකුච්ඡිම්හා ඔක්කමති, අයං චතුත්ථී ගබ්භාවක්කන්ති එතදානුත්තරියං භන්තෙ ගබ්භාවක්කන්තීසු."

මෙයින් ප්‍රථම ගර්භාවක්‍රාන්තිය ලෞකික මනුෂ්‍යයන්ට ලැබේ. ඔවුහු මවුකුස පිළිසිඳ ගැනීම ද, එහි විසීම ද, එයින් නික්මීම ද, මුළා වූ සිහියෙන්ම කරති.

චිතීය ගර්භාවක්‍රාන්තිය අසූ මහා ශ්‍රාවකයන් වහන්සේට ලැබේ. අසූ මහා ශ්‍රාවකයෝ මව් කුස පිළිසිඳ ගැනීම, සිහියෙන් යුක්තව ම කරති. මුළා වූ සිහියෙන් එහි වෙසෙති එයින් නික්මෙති.

අග්‍රශ්‍රාවකානාං අග්‍රශ්‍රාවිකානාං අග්‍ර ශ්‍රාවකයන්ට සහ ප්‍රත්‍යෙක බොධිසත්ත්වවරයන්ට ලැබේ. අග්‍ර ශ්‍රාවකයෝ ද. පසේ බුදුවරු ද, සිහියෙන් යුක්තව මව්කුස පිළිසිඳ ගනිති. එසේම වෙසෙති. එහෙත් මුළා වූ සිහියෙන් යුක්තව මව්කුසින් නික්මෙති.

චතුර්ථ ඝණීවක්‍රාන්තීය සප්ත බොධිසත්ත්වවරයන්ට ලැබේ සප්ත බොධිසත්ත්වවරයෝ මව්කුස පිළිසිඳ ගැනීම ද, එහි පිවිසීම ද, එයින් බහිවීම ද, සිහි නුවණින් යුක්තවම කරති. (මේ දක්වන ලද්දේ ගර්භාවක්‍රාන්තිය පිළිබඳ සුඛාල විලාසිනියෙහි දක්නා ස්ථවිර වාදයයි.)

කර්මක්ෂයනිමිත්තායුෂ්ක්ෂයාත් වා විමුච්‍යන්ති.

විස්තර—අන්‍යධර්මකොෂයෙහි උගන්වන අයුරු සක්විති රජවරු අනෙක ජාතිවලින් කළ කර්මයන්ගේ පිරිසුදු බව නිසා ඥාන දූලිකව ගර්භයට පිවිසෙති.

ප්‍රත්‍යෙක බුදුවරු නොයෙක් ජාතියෙහි පුරුදුකළ විශද (පිරිසුදු) වූ ඥානය ඇති නිසා ද, සක්විති රජවරුන්ට වඩා උතුකාමාවචර වූ බැවින් ද, ඥාන දූලිකව ගර්භයට පිවිසෙති. ඥාන දූලිකවම වෙසෙති.

සම්‍යක් සම්බුදුවරු අනෙක ජාතිවලින් පුරුදු කළ අත්‍යන්ත පරිශුද්ධ ඥාන-කර්ම දෙදෙනා ඇති බැවින් ද, සක්විති රජවරුන්ට සහ ප්‍රත්‍යෙක බුදුවරුන්ට වඩා උතුකාමාවචර බැවින් ද, ඥාන දූලිකවම ගර්භයට පිවිසෙති. ඥාන දූලිකවම වෙසෙති. ඥාන දූලිකවම මව්කුසින් බහිවෙති.

18 නාත්මාශ්‍රයී සංඛ්‍යා මාත්‍රං තු - කර්ම-ක්ලේශාභි ඃසංඛෘතම් අනන්තරාභව සන්තත්‍යා - කුක්ෂිඃස්ථ ප්‍රදිපවත්

භාෂ්‍ය:—ආත්මයක් නැත. ඇත්තේ කර්ම-ක්ලේශයන් විසින් සකස් කරන ලද සංඥා මාත්‍රය ම ය. අන්තරා භව සන්තාන ක්‍රමයෙන් ගර්භයට පිවිසෙයි ඒ උපදවයකැයි පඟන් සිලක් මෙනි.

නාත්මාශ්‍රයී

විස්තර:— අත්මනි ස්කන්ධාදි සම්භවසම්භූ අනුවර්තීඃඃ=ආත්මා"
(අත + මනිණ්) යනු විග්‍රහ බැවින් ස්කන්ධාදි සියලු අවස්ථා-වන්හි තමා අනුව පවත්නේ ආත්ම නාම ලේ. ආත්ම වාදය තුරු කොට ගත් ඉස්ලාමීය දාර්ශනිකයෝ මෙහි කතුන්ගෙ අදහස් විස්තර කරති.

"න ජායතෙ ම්‍රියතෙ වා විපශ්චි
න්නායං කුතශ්චින්න බභූව කශ්චින්
අජෝ නිත්‍යඃ ශාශ්වතෝ යං පුරාණෝ
න හන්‍යතෙ හන්‍යමානෙ ශරීරෙ"

කඨොපනිෂද් 11. 18 භගවත් ගීතා 11. 20

(ආත්මය) නුපදියි. නොමැරෙයි. කිසිවකින් කිසිවක් එයට ඇතුළු නොවේ. එයින් බැහැරට ද, නොයේ. අජය (භටගන්නේ නොවේ.) නිත්‍යය. ශාශ්වතය. පුරාණය ශරීරය නැසෙන කල්හි ද, එය නොනැසේ)

"අණෝරණීයාන් මහතෝ මහීයාන්
ආත්මාඃස්‍ය ජන්තෝර් නිහිතෝ ගුහායාම්
තමක්‍රතුඃ පශ්‍යති වීත ශොකෝ
ධාතුප්‍රසාදාන්මහිමාන මාත්මනඃ

කඨොපනිෂද් 11. 20

(ආත්මය) අණුන්ට ද, වඩා කුඩාය. සියලු විශාල දේට වඩා විශාලය. සියල්ලන්ගේ හෘදයෙහි වාසය කරයි. ශොකයෙන් පහවූයේ මහා බ්‍රහ්මයාගේ ප්‍රසාදයෙන් එය දකියි.

"ඛෘතඤ්ච තද් දිව්‍ය මචින්‍ය රූපං
සුක්ෂ්මාච්ච තද්, සූක්ෂ්මතරං විභාති
දූරාත් සුදූරෙ තදිහාන්තිකෙ ච
පශ්‍යත්‍යිහෛව නිහිතං ගුහායාම්

මුණ්ඩකොපනිෂද් 111. 1. 7

(ආත්මය) විශාලය. දිව්‍යමයය. අචින්‍ය සවරූපය. සියුම් දේට වඩා සියුම් ය. දුරු වූ දෙයින් ඉතා දුර පිහිටියේ නමුදු සිය සිත්හි ද, එය දක්නේය.

"ඉදන්තිනොඃස්මින් යථා ශරෙහ-කෞමාරං යෞවනං ජරා
තථා ශරීරාන්තරප්‍රාප්තිර්-ධීරස්තත්‍ර න මුහ්‍යති

(බාල = තරුණ - මහලු ගත සියල්ලන්ගේ ශරීරයෙහි අනිත්‍ය පවතී. එය අන් ශරීරයකට ද පැමිණෙයි. සුදුසුකම් නැතැත්තේ එහි දී මුළා නොවෙයි.

ය එනං වෙත්ති හනනාරං
යඤ්චෙවනං මන්‍යතෙ හනම්
උභෝ තෙ න විජානිතෝ
නායං හනති න හන්‍යතෙ

(යමෙක් ආත්මය නසන්නේය යි හෝ නසන ලද්දේ-යයි සිතා ද, ඒ දෙදෙනාම එය නොදනිති. ආත්මය මෙහා නැසෙයි. නොනසනුද ලැබේ.)

වාසාංසි ජීර්ණානි යථා විහාය
නවානි ගෘහ්ණාති නරෝ'පරාණි
තථා ශරීරාණි විහාය ජීර්ණා-
න්‍යන්‍යානි සංයාති නවානි දෙහී

භගවත්ගීතා 11. 22

(මනුෂ්‍යයා දිරූ වස්ත්‍ර හැර අලුත් වස්ත්‍ර ගන්නාක් මෙන් ආත්මය ද, දිරූ සිරුරු හැර අලුත් සිරුරු කරා පැමිණෙන්නේය.

වත්ථානි ජිණ්ණානී යථා පහාය
නවානි ගණ්හාති නරොපරානි
තිකඛිපපදෙහං ඉධ ජිණ්ණමෙව
ගණ්හාති අත්තාභිනවං සුඛෙහි

යනු විශුද්ධි මාර්ගයි.

නෙනං ඡින්දන්ති ශස්ත්‍රාණී-නෙනං දහති පාවකඃ
නචෙනං ක්ලෙදයන්‍ත්‍යාපෝ-න ශොෂයති මාරුතඃ

අච්ඡෙද්‍යෝ'යමදාහ්‍යෝ'ය-මක්ලෙද්‍යෝ ශොෂ්‍ය එව ච
නිත්‍යඃ සර්වගතඃ ස්ථාණු-රචලෝයං සනාතනඃ

අව්‍යක්තෝයමචින්ත්‍යෝයා-මවිකාර්‍යෝ'ය මුච්‍යතෙ
තස්මාදෙවං විදිත්වෙනං-නානුශොචිතු මර්හසි

භගවත්ගීතා 11-23-24 25.

(මේ ආත්මය ආයුධයකින් කැපිය නොහැකිය. ගින්-නෙන් දැවිය නොහැකිය. ජලයෙන් තෙත් කළ නොහැකිය. සුළඟින් වියලිය නොහැකිය.

මේ ආත්මය නොසිඳිය හැකිය. නොදැවිය හැකිය. තෙත් කළ නොහැකිය. වියලිය නො හැකිය. නිත්‍යය, සියල්ලන් කරා යන්නේය. තහවුරුය. අවලය. සදාකාලිකය.

ආත්මය අව්‍යක්තය, අවිත්‍යය, අවිකාර්‍යයයි කියනු ලැබේ එබැවින් මෙය දැන ශොක නොකළ යුත්තෙහි.

තම ශිෂ්‍යයකුට ආත්ම තත්ත්වය විස්තර කරමින් උපනිෂද් ආචාර්‍යවරයෙක් මෙසේ කියයි.

"අන්‍යොහං ශරීරාත්. ශරීරං තු ජායතෙ ම්‍රියතෙ. වයොභිරද්‍යතෙ ශස්ත්‍රහන්‍යාදිභිශ්ව විනශ්‍යතෙ ව්‍යාධ්‍යාදිභිශ්ව ප්‍රයුජ්‍යතෙ, තස්මින් අහං ස්වකෘත ධර්මාධර්මවශාත් ශරීරාන්තරං යාස්‍යාමි. පුර්වනිඩ විනාශෙ පක්ෂීව නිඩාන්තරම් එවමෙවාහ මනාදෞ සංසාරෙ දෙවමනුෂ්‍ය තිර්‍යඩ් නිරය ස්ථානෙෂු ස්වකර්ම වශාදුපාත්ත මුපාත්තං ශරීරං ත්‍යජන් නවං නවං ච අන්‍යදුපාදදානො ජන්ම මරණ ප්‍රබන්ධ චක්‍රෙ ඝටියන්ත්‍රවත් ස්වකර්මණ භ්‍රාම්‍ය මානඃ ක්‍රමෙණෙදං ශරීරමාසාද්‍ය සංසාර චක්‍රෙ භ්‍රමණාත් අස්මාන්නිර්විණ්ණෙණ භගවන්ත මුපසන්නොස්මි සංසාර චක්‍ර භ්‍රමණ ප්‍රශමාය තස්මාන්නිත්‍ය එවාහං ශරීරාදන්‍යඃ"

බෘහදාරණ්‍යක 4. 4. 3. උපදෙශ සාහශ්‍රි 8.

(මම (ආත්මය) ශරීරයෙන් අනිකෙක්මි. ශරීරය උපදී. මැරේ. වයසින්) පිරිහේ. ආයුධයෙන් සහ ගින්නෙන් ද, ලෙඩ රොගවලින් ද, විනාශ වේ. ආත්මය වූ මම කැදැල්ල දිරූපසු වෙන කැදැල්ලකට යන පක්ෂියකු මෙන් ශරීරයෙන් ශරීරයට මාරුවෙමි. මෙසේ ආදියක් නැති සංසාරයෙහි තමන් තමන් ගේ කර්මානු රූපව ශරීරය අත් හරනේ නමුදු අලුත් ශරීරයක් ලබන්නේය. මෙසේ උපදිමින් මැරෙමින් ඝටියන්ත්‍රයක් මෙන් කරකැවෙමින් සංසාරයෙහි හැසිරෙමින් පින්වතුන් වෙත එළඹියෙමි. එහෙයින් ශරීරයෙන් අනෙකකු නමුදු මම ආත්මයෙන් නිත්‍ය වෙමි.

"තෘණ ජලායුකා තෘණස්‍යාන්තං ගත්වාන්‍ය මාක්‍රම මාක්‍රම්‍යාත්මාන මුපසංහරති, එව මෙවාය මාත්මෙදං ශරීරං නිහත්‍ය, අවිද්‍යාං ගමයිත්වා අන්‍යමාක්‍රම මාක්‍රම්‍යත් මානමුප සංහරති"

(බෘහදාරණ්‍යක 4. 4. 3)

(පූඩාවා තණ්ඩුලේ අඟට ගොස් තවත් තණ්ඩුල පතකට් යන්නාක් මෙන් ආත්මය ද, මේ ශරීරය හැර එය ඉක්මවා වෙන ශරීරයකට යයි)

නානා දර්ශනිකයන් විසින් ප්‍රත්‍යගාත්මතත්ත්වය විස්තර කළ අයුරු "වෙදාන්ත සාරයේ" දක්නේය. අතිප්‍රාකෘතික සමහර කෙනෙක් "ආත්මා වෛ ජායතෙ පුත්‍රඃ" ආදි ශ්‍රැතීන් ප්‍රමාණ කරමින් ආත්මය නම්; පුත්‍රයා ය යි කියි.

චාර්වාකයෝ වනාහි "ස වා ඒෂ පුරුෂෝ අන්නරස-මය" ආදි ශ්‍රැතීන් ප්‍රමාණ කොට සථූල ශරීරය ආත්මයයි කියි. එයින් පුත්‍රයා ආත්මය යි යන මතය බණ්ඩනය විය.

අනිකුදු චාර්වාකයෝ "යෙ ප්‍රාණඃ ප්‍රජාපතිං සමේත්‍ය බ්‍රූයුඃ" ආදි ශ්‍රැතීන් නිසා ආත්මය ඉන්ද්‍රිය මෙන් ද, "අන්‍යෝ අන්තර ආත්මා ප්‍රාණමයඃ" ආදි ශ්‍රැතීන් නිසා ප්‍රාණය ආත්මය මෙන් ද, "අන්‍යෝ අන්තරා ආත්මා මනොමයඃ" ආදි ශ්‍රැතීන් ප්‍රමාණ කොට මනස ආත්මය මෙන් ද, ගත්හ.

බෞද්ධයෝ වනාහි "අන්‍යෝ අන්තර ආත්මා විඥාන-මයඃ" ආදි ශ්‍රැතීන් ප්‍රමාණ කොට බුද්ධිය ආත්මය මෙන් ගත්හ.

ප්‍රාභාකර - තාර්කිකයෝ වනාහි "අන්‍යෝ අන්තර ආත්මා ආනන්දමයඃ" ආදි ශ්‍රැතීන් ප්‍රමාණ කොට අඥානය ආත්මය මෙන් ගත්හ.

භට්ටාචාර්යයෝ වනාහි "ප්‍රඥානඝන එවානන්දමය ආත්මා" ආදි ශ්‍රැතීන් නිසා අඥානයෙන් වැසුණු චෛතන්‍ය සවරූපය ආත්මය මෙන් ගත්හ.

සමහර බෞද්ධයෝ "අසදෙවෙදමග්‍ර ආසීද්" යනාදි ශ්‍රැතීන් ප්‍රමාණ කොට ශූන්‍යතාය ආත්මය මෙන් ගත්හ.

නිත්‍ය වූ චෛතන්‍ය සවරූපය ආත්මය මෙන් ගත් වේදාන්තසාරයෙහි මේ සියල්ල බණ්ඩනය කරමින් මෙසේ කියයි.

"නිඝණ්ඨ ප්‍රත්‍යක්ෂසිද්ධෝ චිත්සුඛාදිරාත්මා'මනා අනාත්ම, ශෛශවාද්‍යවස්ථා විගමාත්‍රං සඳිත්‍යාදි ශබ්දප්‍රත්‍යයා විශේෂාත් අන්‍ය පුත්‍රාදි ගුණාත් පරීක්ෂනස්‍ය ප්‍රධාන්‍ය ශෛශවාද්‍යවස්ථාභාස-

සඤ්ඤා සමාදිවේදනින්ත්‍යාදිකාත් අත්තං බ්‍රහ්මාති විඤ්ඤාණඤ්ච ප්‍රාබල්‍යාදිව කත්තා වත්තුනි යුක්තානුභවාභාවාදීනං බාධිකත්වාදපි පුත්තාදි ශුන්‍ය පයිත්තන මඛිල මනාගතෙමව්''

මෙසේ නානා දෘෂ්ටිකයන් විසින් විස්තර කළ අයුරු ආත්මයයි නිත්‍යවූ නොවෙනස්වන කිසියම් පදාර්ථයක් නැත. බුදු දෙශනාවේ ආත්ම (=අත්ත) ශබ්දයෙන් ප්‍රකාශ වනුයේ පඤ්චස්කන්ධය මැයි. ලොකයා පඤ්චස්කන්ධය ආත්ම නාමයෙන් ගත් හෙයින් බුදුරජාණන් වහන්සේද, ලොකයාගේ සුබාවබෝධය පිණිස සංවෘති වශයෙන් සත්ත්ව ශරීරය ආත්ම (=අත්ත) ශබ්දයෙන් දෙශනා කළ සේක. ඒ විනා ආත්මවාදීන් විසින් පිළිගත් භවයක් පාසා නොසිදියන සුවදුක් විඳීමෙහි අධිපති වූ නොවෙනස් වන කිසි ධර්මයක් නැත. එබැවින් ''නාත්මාශ්‍රී'' යනු කිහ.

සඤ්ඤා මාත්‍රං තු

විපයනි:—මෙහි ඇත්තේ සඤ්ඤා මාත්‍රය පමණකි. දක්වන ලදි. විශුද්ධි මාගීයෙහි;

ඛන්ධා නිරුජ්ඣන්ති න චත්ථි අඤ්ඤත්‍ර
ඛන්ධාන භෙදා මරණන්ති වුච්චති

කම්ම කෙලශාභි සංඛාරානම්

විපයනි:—කර්මයන් විසින්ද, අවිද්‍යාදි කෙලශයන් විසින්ද, ඒ සඤ්ඤා මාත්‍රය සකස් කරන ලද්දේය.

''එසේ නොවැවහෙන නිමිත්ත ඇත්තාහට විද්‍යමාන කර්මයද, කෙලශ සහාය නොලද බැවින් ප්‍රතිසන්ධිය නොදේ.

බාල ජනාධ්‍යාරූඪා
ජනමරණං කෙලශ කම්ම චක්‍රාණම්
කෙලශශක්‍ය චක්‍ර නාසාන්
භාවන්ති කෘශමීන චක්‍රස්සාන්

අවිද්‍යා තෘෂ්ණාදි කෙලශයන් අනුපච්ඡින්න කල්හිම කර්ම චිත්තාදීන්ගේ උපත්තිය වෙයි. ඒ කර්ම නිමිත්තාදීන් අරමුණු කොට විඤ්ඤාණ සන්තානයාගේ භවාන්තරයට නිමින ප්‍රථම ප්‍රාණ්හාර බව වෙයි. සන්තානය විනාමිත කල්හි තදෙහ දෙශ වූ ප්‍රතිසන්ධි විඤ්ඤාණය ද, විනාමිත වේ. සන්තානී නුගේ විනාමිත භාවයක් නැතිව සන්තානය ගේ විනා මිත

භාවය නැති බැවින් හැම තන්හි ම දුගීති ප්‍රතිසන්ධියට චුතිය නිමිත්ත කල්හි පූර්ව්ජවනයෝ අකුසල් වෙති. සුගති ප්‍රතිසන්ධියට නිමිත්ත කල්හි කුසල ජවනයෝ වෙති" යනු විශුද්ධි මාගී සන්නයි.

අනන්තරාභව සන්තත්‍යා

විෂ්ණි:—254 වැනි පිටුව බලනු.

ප්‍රදීපවත්

විෂ්ණි:—"ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණය හා සමග පහළ වූ රූපකලාපත්‍රයෙහි ඇත්තා වූ තෙජෝ ධාතු සඞ්ඛ්‍යාත සෘතු තොමෝ ඨිතිකාලයට පැමිණි කල්හි පච්ඡාජාත ප්‍රත්‍යය ලැබීමෙන් උතුජ රූපයන්ගේ ද, හටගැණීම පටන් ගණියි. ආහාරජ රූපය වනාහි මව විසින් අනුභව කරන ලද්දවූ ආහාර ඔජාව ළදරුවාගේ ආමාශයට පැමිණීමෙන් බාහිර ආහාරය වූ එයින් රුකුල් ලැබීමෙන් ම ආහාර රූපය උපදවන්නට පටන් ගණියි. එසේම සංසෙදජ ඔපපාතික සත්ත්වයන්ගේ මුඛයෙහි ශෙළෂ්මය හටගත් තැන් පටන් ආහාරජ රූප උපදින්නට පටන් ගණියි. මෙසේ කර්ම චිත්ත සෘතු ආහාර යන සතර ප්‍රත්‍යයන්ගෙන් ප්‍රදීපජාලාවක් මෙන් ජීවිතාන්තය මුලුල්ලෙහි රූප කලාප යන්ගේ හටගැණීම් අවිච්ඡින්නව පවතියි. ප්‍රදීපොපමාවෙහි අභිප්‍රාය නම්; ප්‍රදීපකපාලයෙක්හි තෙල් වත්කොට පහන දැල්වූ කල්හි තුන්යම් රාත්‍රිය මුලුල්ලෙහි ඒ ප්‍රදීපය නොනිවී පවත්නේ නම්; පෙරයම දැල්වූ ප්‍රදීප ජාලාව ම රාත්‍රිය මුලුල්ලෙහි නොනිවී පැවතුණේ යයි සිතත්. එතකුදු වුවත් ඒ ප්‍රදීපජාලාවන්ගේ පැවැත්ම චිත්තක්ෂණ සතළොසකට ආයුෂ ඇත්තා වූ පහන් සිළු සමූහයකගේ එක්වීමෙන් බලන්නවුන්ට එහි මෙතෙක් පහන් සිළු ඉක්ම ගියෝ ය. මෙතෙක් පහන් සිළු උපන්නාහු යයි නොවැටහෙත් මැයි. එතකුදු වුවත් එකද පහන් සිළුවක් චිත්තක්ෂණ සතළොස කින් ඔබ්බට නො ගෙස් නිරුද්ධ වන්නේ යි. අනියමිතායුෂ ඇත්තාවූ පහන් සිළු බොහෝ ගණනක් හටගනිමින් බොහෝ ගණනක් නිරුද්ධ වෙමින් එක ම සන්තානයෙහි පවත්නා හෙයින් ප්‍රදීප ජාලාව තුන්යම් රාත්‍රිය මුලුල්ලෙහි එකාකාරව පැවතී නිවී ගිය කල්හි ම දැන් ඉතින් පහන නිවී ගියේය යි ව්‍යවහාර කරන්නාක් මෙන් ම ප්‍රතිසන්ධි

සිත හා සමග එකොත්පාද වූ රූපකලාපයෝ තුමූ සතළොස් චිත්තක්ෂණයකින් බිඳී ගොස් අනික් අනික් රූප කලාප කෙනෙක් එක ම සන්තානයෙහි උපදිමින් සියක් අව්රුද්දක් මුලුල්ලෙහි චිත්තක්ෂණ සතළොසින් සතළොසට ඇතිවන්නාවූ ඛණික මරණය නොදැන ඒ රූපයන්ගේ සන්තාන විච්ඡේද සඞ්ඛ්‍යාත වූ සම්මුති මරණය ම මරණය යි සලකන් නාහුය."

19 ශථා ක්ෂේපං ක්‍රමාත් වෘද්ධඃ-සන්තානඃ ක්ලෙශ කර්මභිඃ පරලොකං පුනර්යාතීති-අනාදි භව චක්‍රකම්.

භාවය:—කර්මානුසාරයෙන් කර්මයන් විසින් හා ක්ලෙශයන් විසින් ද, ක්‍රමයෙන් වෘද්ධි ප්‍රාප්ත වූ සකර්ක සන්තතිය පරලොවට නැවත යෙයි. මේ භව චක්‍රය හෙවත් සසරෙහි ගමනය අනාදිය ආදියක් නැත.

ක්‍රමාත්වෘද්ධඃ

විප්පනී:—මෙහි ක්‍රමයෙන් වැඩීම නම්; කලලාදි අවස්ථාවන්ගෙන් වැඩීමයි. කලල -.අර්බුද-පෙශි-ඝන-ප්‍රශාඛ යන අවස්ථාවන් ඉක්මවූ පසු මනුෂ්‍යාදි ශරීරාකාරය වේය යි ටිකාහි කියයි.

"ගබ්භසෙය්‍යක (අණ්ඩජ - ජලාබුජ) සත්ත්වයන්ට වනාහි කලල සප්තාහය, අර්බුද සප්තාහය, පෙසි සප්තාහය, ඝන සප්තාහය, ප්‍රශාඛ සප්තාහය යි පඤ්ච සප්තාහයක් ඉක්ම ගිය කල්හි කෙස ලොම සත්තාහය, චක්ඛු සොත ඝාණ ජිව්හා සත්තාහයයි මෙසේ සත් සත්තාහයෙක් වන්නේය යි අර්ථ කථාචාරීහු කියත්. මුල ටිකායෙහි වනාහි කලල දෙසත්තාහයෙක, අර්බුද දෙසත්තාහයෙක, පෙසි දෙසත්තාහයෙක ඝන දෙසත්තාහයෙක, පසාඛ දෙසත්තාහයෙකැයි මෙසේ දස සත්තාහයක් ඉක්ම ගිය කල්හි එකොළොස්වන සත්තාහයෙහි චක්ෂුදශකය ද, දොළොස්වන සත්තාහයෙහි සොතදශකය ද, තෙළෙස්වන සත්තාහයෙහි ඝාණ දශකය ද, තුදුස්වන සත්තාහයෙහි ජිව්හාදශකය ද, මෙසේ ක්‍රමයෙන් පහළ වන්නේය යි. කීයේය. ගබ්භසෙය්‍යක ප්‍රතිසන්ධි ගන්නා සත්ත්වයන්ට ප්‍රතිසන්ධිය හා සමග ස්ත්‍රියක් වී නම්; ස්ත්‍රීභාව දශකය හෝ පුරුෂයකු වී නම් පුම්භාව දශකය ද, හෘදය වස්තු දශකය, කාය දශකය, ඝන රූප කලාපයෝ තුන්

දෙනොක් ප්‍රතිසන්ධි විඤ්ඤාණය හා සමඟ එකක්ෂණිකව පහළ වන්නාහුය" යනු අභිධම්මාවතාර සඞ්ග්‍රහ භාව සන්නයි.

"තත්‍ර ප්‍රථමේ මාසි කලලං ජායතෙ; විතීයෙ ශීතොෂ්මානිලරසිද්‍රුපච්‍යමානානාං මහාභූතානාං සඞ්ඝාතො ඝනඃ සංජායතෙ. යදි පිණ්ඩඃ පුමාන්, සත්‍රි චෙත් පෙශි නපුංසකං චෙදර්බුදමිති; තෘතීශෙ හස්තාදි ශිරශාං සයථ පිණ්ඩකා නිර්ජාතාශෙතා'ඞ්ගප්‍රත්‍යඞ්ග විභාගශ්ච සුස්පෂ්ටා භවති; චතුර්ථෙ ඉන්ද්‍රියප්‍රත්‍යඞ්ග විභාගඃ ප්‍රව්‍යක්තතා භවති ඉති ඣෂී ණාං දර්ශන ප්‍රව්‍යාප්තිතාවා චෙවතනා ධාතුරභිව්‍යක්තතා භවති" යනු සුශ්‍රුතාචාර්ය මතයි.

"පළමුවන මස කලල රූපය හටගනී. දෙවන මස ශීත-උෂ්ණ-වාත යන මෙයින් පැසවනු ලබන මහාභූත යන්ගේ හැසිම ඇති ඝන රූපය උපදී. එය වට වූ ආකාර ඇත්තේ නම්; පුරුෂයෙක් වේ. දිඹුරාකාර වූ පෙශියක් වේ නම්; ස්ත්‍රියක් වේ. වට වූ ඵලාඩියක් වැනි වේ නම්; නපුංසකයෙක් වේ තුන්වන මාසයෙහි හස්ත-පාද ශිරස් පිළිබඳ වූ මස් පිඬු පහෙක් වේ එහි ඉතා සියුම් පරිදි අඞ්ගප්‍රත්‍යඞ්ග ද, බෙදී ඇත්තේය. සතරවන මාසයෙහි සියලු අඞ්ගප්‍රත්‍යඞ්ගයන් අතිශයින් ව්‍යක්තව පහළ වේ. පසුව ගබ්හෘදය අතිශයින් ව්‍යක්ත වීමෙන් විඤ්ඤාන ධාතුව ඉතා ව්‍යක්ත වේ' යනු එහි අදහසයි.

ඒ කලල රූපය ප්‍රකෘති නෙත්‍රයට විෂය නොවේ. ඒ ඒ ඉතා සියුම්ය එදවස් උපන් එළුවකුගේ ලොමක් පහන් තෙලෙහි ගලා හසා දැමූකල අවසානයෙහි ලැබෙන බිඳු පමණය යි කියති. ඒ පිළිබඳව ඇති මතාන්තර සාරාර්ථ දීපනියෙහි දක්නේය.

"ගබ්භසෙය්‍යක සත්තානං පටිසන්ධික්ඛණෙ අපරිජ්ඣා අපුරෙ එකතොං පාතුභවන්ති. තස්මිං ඛණෙ පාතු භූතා කලල සංඛාතා රූපසන්තති පරිත්තා හොති ඛුද්දක මක්ඛිකාය එතවායාමෙන පාතබ්බ මත්තාකි වත්වා පුන 'අතිබහුං එතං. සඤ්ඤපුච්ඡා තෙලෙ පක්ඛිපිත්වා උක්කිරිත්තාය ඝණ්ඩරිවා එකං ඉතෙසං හෙට්ඨතො උබරිතා තතියෙ තස්ස පන්නරසිමෙ දිවසෙ ඛීරබින්දු මත්තා භවති වුත්තං. තම්හි පරිත්තකි

පිත්වා එකං කෙසං තෙලතො උඩරිත්වා ගහිතෙ තස්ස පග්ඝරිත්වා අග්ගෙ ඨිත බින්දු මත්තන්ති වුත්තං. තම්පි පටික්ඛිපිත්වා ඉමස්මිං ජනපදෙ මනුස්සානං කෙසෙ අඬ්ඩා ඨාලිතෙ තතො එක කොඨාසප්පමාණො උත්තරකුරුකානං එක කෙසො. තස්ස පසන්න තෙලතො උඩටස්ස අග්ගෙ ඨිත බින්දු මත්තන්ති වුත්තං. තම්පි පටික්ඛිපිත්වා ජාති උණ්ණ නාම සුඛුමා තස්ස එක අංසුනො පසන්න තිල තෙලෙ පක්ඛිපිත්වා උඩටස්ස පග්ඝරිත්වා අග්ගෙ ඨිත බින්දු මත්තන්ති ඛුද්දභාණකෙහි වුත්තං, සංයුත්තභාණකා පන නීහි ජාති උණ්ණංසුහි කත සුත්තග්ගෙ සණ්ඨිත තෙල බින්දුප්පමාණං කලලං හොතීති වදන්ති''

සමන්තපාසාදිකා විනය අටුවාහි මෙසේ දක්නේය.

''තිල තෙලස්ස යථා බින්දු-සප්පි මණ්ඩො අනාවිලො
එවං වණ්ණ පරිභාගං-කලලන්ති පවුච්චති''

අර්බුද රූපය මස් සේදු දියත්තක් මෙනි. පෙශි රූපය දියවූ ඊයම් බිඳක් මෙනි. ඝන රූපය කිකිළි බිජුවක් මෙනි. පශාඛ රූපය දූත-දෙපා- සහ හිස වෙන් වූ පිළක පසකින් යුක්තය.

පරලොකං පුනර්යාති

විප්පති:—''ආචාර්යයන්ගේ මුඛයෙන් හැදෑරූ මන්ත්‍රාදියක් අතවැසි හුගේ මුඛයට යම්සේ නොවදිද? ඒ නොවැදීම් හෙතුවෙන් ඒ අතවැස්සාගේ මුඛයෙහි හැදෑරීම නො පවත්නේ නො වෙයි. පවත්නේ ම ය. දූතයකු විසින් බොන ලද මන්ත්‍රා-දකය රොගීහුගේ උදරයට නොවදිද? ඒ රොගිහුගේ රොගය ඒ උදර ප්‍රවෙශ නොවීම් හෙතුවෙන් නොසන්-සිඳෙන්නේ නොවෙයි. සන්සිඳෙන්නේ ම ය.

මුහුණෙහි අලඞ්කාර විධානය කැඩපත් ආදියෙහි ප්‍රති-බිම්බයට මුහුණු නිමිත්ත නොයේ ද, ඒ මුඛ නිමිත්ත නොයාම හෙතු කොටගෙණ ඒ ආදාසතෙලෙහි මණ්ඩන විධානය නොද පැනෙන්නේ නොවෙයි. පැනේ මැයි.

එක් පහන් වැටියකින් පහන් සිළුවක් අතික් පහන් වැටියකට සංක්‍රමණය නො කෙරේ. තත් ප්‍රත්‍යයෙන් පහන් සිළුවක් අතික් පහන් සිළුවකට නොයාම් හෙතුවෙන් ඒ පහන් වැටියෙහි පහන් සිළුව නූපදින්නේ නොද වෙයි. උපදින්නේ මැයි.

එසේම අතීත භවයෙන් මේ වර්තමාන භවයට ද, මේ වර්තමාන භවයෙන් පුනර්භවයට හෝ කිසිම ධර්මයක් තෙම සංක්‍රමණය නො කෙරේ අතීත භවයෙහි සක්ඛ්‍යායතන ධාතුප්‍රත්‍යයෙන් මේ වර්තමාන භවයෙහි සක්ඛ්‍යායතන ධාතුහු පහළ නොවන්නාහු නොවෙත්. පහළ වෙත් මැයි. **මේ වර්තමාන භවයෙහි හෝ සක්ඛ්‍යායතන ධාතුප්‍රත්‍යයෙන් පුනර්භවයෙහි සක්ඛ්‍යායතන ධාතුහු නපදින්නාහු නොවෙත් උපදින්නාහු මැයි''** යනු විශුද්ධිමාර්ග සන්නයි.

අනාදි භව චක්‍රකම්

ටීප්පනි:— **''සොකාදිහි අවිජ්ජා**
සිඩා භවචක්කම විදිතාදි මිදං
කාරක වෙදක රහිතං
ද්වාදසවිධ සුඤ්ඤතා සුඤ්ඤං''

යනු විශුද්ධි මාර්ගයි.

''මෙසේ යම් හෙයකින් ආසව සමුදයෙන් මේ ශොකාදිහු වෙත් ද, එසේ හෙයින් මේ ශොකාදිහු සිද්ධවන්නාහු අවිද්‍යාවට හෙතු වූ ආශ්‍රවයන් සිඩ කරත්. චතුරාශ්‍රවයන් සිද්ධ වූ කල්හි ද, ප්‍රත්‍යය භාවයෙහි වන හෙයින් අවිද්‍යා තොමෝ ද, සිඩ වූවා වෙයි. දත යුතුයි. මෙසේ පළමු කොට මේ ප්‍රතීත්‍ය සමුත්පාද ක්‍රමයෙහි ශොකාදීන් කරණ කොට ගෙණ අවිදු තොමෝ සිද්ධ වූවා වෙයි කියා දතයුත්තිය. යම් හෙයකින් වනාහි මෙසේ ප්‍රත්‍යය භාවයෙහි වන හෙයින් අවිද්‍යාව සිඩ වූ කල්හි නැවත අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංසකාරයෝ සම්භව වෙත්. සකර පසින් පිළිසඳ ඇ විනැණ වේනුයි මෙසේ හෙතු ඵල දෙදෙනාගේ පරම්පරාවෙහි අවසානයක් නැත්තේය. එහෙයින් **හෙතු ඵල දෙදෙනාගේ සම්බන්ධයෙන් පවත්නාවූ දෙළොස හක් ඇති ඒ භවචක්‍රය තෙම නොදන්නා ලද ආදිය ඇත්තේය''** යනු විශුද්ධිමාර්ග සන්නයි.

20 සප්‍රතීත්‍ය සමුත්පාදෙ-ද්වාදශාඞ්ගඃ ත්‍රිකාණ්ඩකඃ
පූර්වාපරාන්තයෝර් ද්වෙද්වෙ-මධ්‍යෙෂ්ටෞ පරිපූරණාඃ

භාවය:— ඒ භවචක්‍ර ස්වරූප වූ ප්‍රතීත්‍ය සමුත්පාදය අඞ්ග දෙළොසකින් ද, කාණ්ඩ තුනකින් ද, යුක්තය. ඒ අඞ්ග දෙළොසින් පූර්වාන්තද්වය අතීත භවය විෂය කොට ඇත්තේය. අපරාන්තවය අනාගත භවය විෂය කොට ඇත්තේය. මධ්‍යයෙහි අෂ්ටාඞ්ගයෝ වර්තමාන විෂය සම්පූර්ණ කරත්,

ප්‍රතීත්‍ය සමුත්පාදඃ

ටිප්පනී:—"හෙතුරත්‍ර සමුත්පාදඃ - සමුත්පන්නඃ ඵලං මතම්" (3-28) යනු අභිධර්ම කොශයෙහි ම දැක්වූ බැවින් ප්‍රතීත්‍ය සමුත්පාදය නම්; හෙතුවයි; හෙවත් අවිද්‍යාදී ධර්මසමූහයයි, ජරාමරණාදී වූ ඵලය ප්‍රතීත්‍ය සමුත්පන්නයි. විශුද්ධි මාර්ගයෙහි ද, කියන ලදි.

"පටිච්ච සමුප්පාදෙති පච්චය ධම්මා වෙදිතබ්බා; පටිච්ච සමුප්පන්නා ධම්මාති තෙහි තෙහි පච්චයෙහි නිබ්බත්ත ධම්මා"යි.

"පටිච්ච ඵලං සමුප්පජ්ජති එතස්මාති පටිච්ච සමුප්පාදෙ" යනු එහි විග්‍රහයි.

"තබ්භාව භාවි භාවකාර මත්තොප ලක්ඛිතො පටිච්ච සමුප්පාදනයො" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි විස්තර කළ අයුරුයි. එහි අන්වය ව්‍යතිරෙක වශයෙන් ප්‍රත්‍යය ලක්ෂණය දක්වන ලදී. "ඉමස්මිං සති ඉදං හොති; ඉමස්සුප්පාදා ඉදමුප්පජ්ජති· ඉමස්මිං අසති ඉදං න හොති; ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති" යනු අන්වය ව්‍යතිරෙක ප්‍රත්‍යය ලක්ෂණය පැහැදිලි කරමින් එයට ලියූ විභාවිනී ටීකා පාඨයි.

රත්නාවලියෙහිදී ආචාර්යනාගාර්ජුන පාදයන් විසින් ද, කියන ලදි.

"අස්මින් සති ඉදං භවති-දීර්ඝෙ හ්‍රස්වන් යථා සති
තස්‍යොත්පාදා දුදෙතීදං-දීපොත්පාදත් යථා ප්‍රභා

හ්‍රස්ව අසති පුනර්දීර්ඝං-න භවති ස්වභාවතඃ
ප්‍රදීපස්‍යානුත්පාදත්-ප්‍රභායාඃ අප්‍ය'සම්භවඃ

මාධ්‍යමික කාරිකාවෙහි දී නාගාර්ජුන ආචාර්යයන් විසින් ප්‍රතීත්‍ය සමුත්පාදය අභාව අටකින් යුක්තය යි කියන ලදී.

"අනිරොධ මනුත්පාද-මනුච්ඡේද මශාශ්වතම්
අනෙකාර්ථ මනානාර්ථ-මනාගම මනිර්ගමම්

යඃ ප්‍රතීත්‍ය සමුත්පාදං-ප්‍රපඤ්චොපශමං ශිවම්
දෙසයාමාස සම්බුද්ධ-ස්තංවන්දෙ වදතාං වරම්"

ද්වාදශාඞ්ගඃ

විප්පනි:—අවිද්‍යා-සංස්කාර-විඥාන-නාම රූප- ෂඩායතන - ස්පර්ශ-වෙදනා-තෘෂ්ණා-උපාදාන-භව-ජාති-ජරා මරණ යන දොළස.
(එකක් පාසා පසුව විස්තර කෙරේ.)

ත්‍රිකාණ්ඩකඃ

විප්පනි:—අතීත-අනාගත - ප්‍රත්‍යුත්පන්න යන කාලත්‍රය ම මෙහි ත්‍රිකාණ්ඩ නම්.

පූර්වාපරාන්ත යොර්දෙව දෙව

විප්පනි:—මෙහි පූර්වාන්තවය වූ අවිද්‍යා-සංස්කාර දෙදෙනා අතීතය විෂය කොට ඇත්තේ ය. අපරාන්තවය වූ ජාති-ජරා මරණ දෙක අනාගතය විෂය කොට ඇත්තේ ය.

මධ්‍යෙෂ්ඨ

විප්පනි:—මධ්‍ය භාගයෙහි පිහිටි විඥාන-නාම රූප - ෂඩායතන-ස්පර්ශ-වෙදනා-තෘෂ්ණා-උපාදාන-භව යන අට ප්‍රත්‍යුත්පන්නය විෂය කොට ඇත්තේ ය.

ස්ථවිර වාදයෙහි උගන්වන ප්‍රතීත්‍ය සමුත්පාදය අතීතාදි අධ්වත්‍රයයකින් ද, අවිද්‍යාදි ද්වාදශාඞ්ගයකින් ද, එම අඞ්ග යන් සම්බන්ධිවූම විංශති ආකාරයකින් ද, හෙතුඵල සන්ධාන වශයෙන් ත්‍රි සන්ධියකින් ද, එම සන්ධීන්ගේ ම ආද්‍යන්ත වශයෙන් සතර සංක්ෂේපයකින් ද, ත්‍රිවිධ වෘත්තයකින් ද, උභය මූලයකින් ද යුක්තය.

එහි අධ්වත්‍රය නම්; අභිධර්මකොශයෙහි දැක් වූ කාණ්ඩත්‍රයයි හෙවත් අතීත-වර්තමාන-අනාගත යන කාලත්‍රයයි එහිදු 1. අවිද්‍යා. 2. සංස්කාර දෙක අතීත අධ්වය. 3 විඥාන 4 නාමරූප 5 ෂඩායතන 6 ස්පර්ශ. 7 වෙදනා. 8 තෘෂ්ණා 9 උපාදාන. 10 භව යන අඞ්ග අට වර්තමාන අධ්වය. 11 ජාති 12 ජරා මරණ (ශොක-පරිදෙව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාස) යන අඞ්ග දෙක අනාගත අධ්වය ශොක පරිදෙවාදිය ජාති ජරා මරණයන් ගේ නිෂ්‍යන්ද ඵලයි.

වාදශාඞ්ගය නම්; අවිද්‍යා-සංස්කාරාදි දොළසයි. ඒ වාදශ අඞ්ගයන්ගෙන් අධික වූ ශොකය ආදි කොට ඇත්තා වූ උපායාසය අවසන්කොට ඇත්තා වූ ධර්මයෝ තුමූ ජාතිහු ගේ අමුඛ්‍ය ඵලය දක්වනු පිණිස වදාරන ලදහ.

විංශති ආකාරය නම්;

"මාදඟාඛයන් අතුරෙන් අවිද්‍යා-සංස්කාර දෙදෙනා ගේ ඇණීමෙන් නාඳ්‍යාවෘත්තනාය්‍යායෙන් හෙවත් එකාබද්ධව පවත්නා හෙයින් තෘෂ්ණා- උපාදාන - භවයෝ ද, ගන්නා ලද්දාහු වෙත්. ඒ තෘෂ්ණා උපාදාන භවයන් ගේ ඇණීම් හෙතු කොට ගෙණ යට කී නාඳ්‍යාවෘත්තනාය්‍යායෙන් අවිද්‍යා-සංස්කාරයෝ ද, ගන්නා ලද්දාහු වෙත්. ජාති, ජරා, මරණ යන් ගේ ඇණීමෙන් විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වෙදනා යන ධර්ම පඤ්චකය ද, ගන්නා ලද්දේයි, මෙසේ නාඳ්‍යාවෘත්තනාය්‍යායෙන් නොකියන ලද්දා වූ ධර්ම යන්ගේ ඇණීම් වන හෙයින් අතීත භවයෙහි හේතූහු පස් දෙනය. දැන් ප්‍රත්‍යුත්පන්න භවයෙහි ඵලපඤ්චකය. ප්‍රත්‍යුත්පන්න භවයෙහි හේතු පඤ්ච. ආයති භවයෙහි ඵල පඤ්ච යි යන මේ ආකාරයෝ විස්සක් ද, වෙත්."

විංශති ආකාරය.

1	අවිද්‍යා	1 අතීත හේතු පඤ්චකය
2	සංස්කාර	
3	තෘෂ්ණා	
4	උපාදාන	
5	භව	
6	විඤ්ඤාණ	2 වර්තමාන ඵල පඤ්චකය
7	නාමරූප	
8	ෂඩායතන	
9	ඵස්ස	
10	වේදනා	
11	අවිද්‍යා	3 වර්තමාන හේතු පඤ්චකය
12	සංස්කාර	
13	තෘෂ්ණා	
14	උපාදාන	
15	භව	
16	විඤ්ඤාණ	4 අනාගත ඵල පඤ්චකය
17	නාමරූප	
18	ෂඩායතන	
19	ඵස්ස	
20	වේදනා	

ත්‍රිසන්ධිය නම්; 2 සංසකාර 3 විඥාන යන ප්‍රත්‍යය දෙක අතර එක් සන්ධියකි. එය හෙතු-ඵල සන්ධියි. 7 වෙදනා 8 තෘෂ්ණා ප්‍රත්‍යය දෙක අතර එක් සන්ධියකි එය ඵල හෙතු සන්ධියි 10 භව-12 ජාති ප්‍රත්‍යය දෙක අතර එක් සන්ධියකි. එය හෙතු ඵල සන්ධියි. මේය තිසන්ධිය. මෙයින් පළුම සන්ධිය අතීත හෙතු හා වර්තමාන ඵල සම්බන්ධය කරන්නේය. චිතිය සන්ධිය වර්තමාන ඵල හා වර්තමාන හෙතු සම්බන්ධය කරන්නේය. තෘතීය සන්ධිය වර්තමාන හෙතු හා අනාගත ඵල සම්බන්ධය කරන්නේය.

සතර සංක්ෂේපය නම්; ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි අඩහ දොළොස සතර කොටසකට බෙදීමෙන් ලැබෙන්නේයි. එනම්; 1 අවිද්‍යා 2 සංසකාර දෙක එක්සංක්ෂේපයකි. එය අතීත හෙතු සංක්ෂේපයයි 3 විඥාන 4 නාමරූප 5 ෂඩායතන 6 ස්පර්ශ 7 වෙදනා යන පස එක් සංක්ෂේපයකි. එය වර්තමාන ඵල සංක්ෂේපයයි. 8 තෘෂ්ණා 9 උපාදාන 10 භව යන තුන එක් සංක්ෂේපයකි එය වර්තමාන හෙතු සංක්ෂේපයයි 11 ජාති 12 ජරාමරණ යන දෙක එක් සංක්ෂේපයකි. එය අනාගත ඵල සංක්ෂේපයයි. විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වෙදනා ද, මෙහි ම ඇතුළත් වේ.

ත්‍රිවිධ වෘත්තය නම්; ක්ලේශ වෘත්ත-කර්ම වෘත්ත-විපාක වෘත්ත යන තුනයි. එහි ක්ලේශ වෘත්ත නම්; අවිද්‍යා-තෘෂ්ණා-උපාදාන යන තුනයි. කර්ම වෘත්ත නම්; සංසකාර-භව යන දෙකයි. විපාක වෘත්ත නම්; විඥාන-නාම රූප-ෂඩායතන-ස්පර්ශ-වෙදනා යන පසයි.

උභය මූල නම්; අවිද්‍යාව සහ භවතෘෂ්ණාවයි. පූර්වාන්තයට අවිද්‍යාව සහ අපරාන්තයට භවතෘෂ්ණාව ද, මුල් වේ ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි පූර්වාන්තය හෙවත් මුල් කෙළවර අවිද්‍යාවෙන් පටන්ගෙන වෙදනාවෙන් අවසාන වේ. අපරාන්තය හෙවත් අග කෙළවර තෘෂ්ණාවෙන් පටන් ගෙන ජරාමරණයන් ගෙන් අවසාන වේ.

දෘෂ්ටි චරිතයන්ගේ සසර පැවැත්ම පිණිස අවිද්‍යාව මුල් වන හෙයින් දෘෂ්ටි චරිතයන්ගේ වශයෙන් අවිද්‍යා මූලය ද, තෘෂ්ණා චරිතයන්ගේ සසර පැවැත්ම පිණිස තෘෂ්ණාව මුල්වන හෙයින් තෘෂ්ණා චරිතයන්ගේ වශයෙන් තෘෂ්ණා මූලය ද, යන උභය මූලයන් දෙශනා කරන ලදී. එසේම උච්ඡේදවාදීන්ගේ මිථ්‍යා විශ්වාසය නැති කිරීම උදෙසා අවිද්‍යා මූලය ද, ශාස්වත වාදීන්ගේ මිථ්‍යා විශ්වාසය නැති කිරීම උදෙසා තෘෂ්ණා මූලය ද, මාතෘ කුක්ෂියෙහි ප්‍රතිසන්ධිය ගන්නා සත්ත්වයන්ගේ වශයෙන් තෘෂ්ණා මූලය ද, දෙශනා කරන ලදී (විස්තර විශුද්ධි මාර්ගයෙහි දක්නේ ය)

සංසාරචක්‍රය



"තස්සා විජ්ජා තණ්හා-මූල මතීතාදයො තයො කාලා
වේ අට්ඨ වේ එව ච-සරූපතො තෙසු අඩ්ගාත"

"හෙතුඵල හෙතු පුබ්බක
තිසන්ධි චතුහෙද සඩ්ගහං වෙතං
විසති ආකාරාරං
තිවට්ට මනවඝිතං භමති"

විසුඛි මග්ග-පටිච්ච සමුප්පාද නිද්දෙස.

"ස ප්‍රතීත්‍ය සමුත්පාදඃ-දවාදශාඩ්ගඃ ත්‍රිකාණ්ඩකඃ
පූර්වාපරාණ්ගයොර් දෙව දෙව-මධ්‍යයෙවෝ සරිපුරණාඃ"

අභිධර්මකෝශ 3, 20.

21 පුබ්බෙකතලක දහා'විද්‍ය-සංඝාරාඃ පුනඃ කර්මණඃ
ඉඤ්ඣසඤ්ඤාඃ තු විඥානං-නාම රූපං අතඃ පරම්

22 ප්‍රාක් ෂඩායතනොත්පාදාත්-තත්පූර්වං ත්‍රික සංගමාත්
සපර්‍යඃ ප්‍රාක් සුඛ දුඃඛාදි-කාරණ ඥන ශක්තිතඃ

23 විතතිඃ ප්‍රාඩ් මෛථුනාත් තෘෂ්ණා-භොග මෛථුන
රාගිණඃ
උපාදනං තු භොගානාං-ප්‍රාප්තයෙ පරිධාවතඃ

24 ස භවිෂ්‍යාද් භව ඵලං-කුරුතෙ කර්ම තද් භවඃ
ප්‍රතිසන්ධිඃ පුනර්ජාතිඃ-ජරමරණ මාවිදඃ

භාෂ්‍යඃ:—(ඒ වාදශාඛයන් අතර) පූර්ව ජන්මයන්හි රාගාදි ක්ලෙශයන්ගේ අවස්ථාව **1 අවිද්‍ය** නම් වේ. පූර්ව කර්මයන් ගේ අවස්ථාව **2 සංස්කාර** නම් වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි යොනි ගත පඤ්චස්කන්ධය **3 විඥාන** නම් වේ. ෂඩායතනොත්පත්ති යෙන් පූර්ව වූ පඤ්චස්කන්ධය **4 නාමරූප** නම් වේ.

5 **ෂඩායතනය** ත්‍රික සංගමයෙහින් සපර්‍යයෙන් පෙරටුව කියන ලදි. සුඛ-දුක් ආදියට හෙතු වූ ඥන ශක්තියෙන් පූර්ව වූයේ 6 **සපර්‍ය** නම් වේ.

සංස්පර්ශයෙන් පූර්ව වූයේ **7 වේදනාව්‍යයි.** සම්පත්තියෙහි සහ මෛථුනයෙහි ඇලුණහුගේ අවස්ථාව **8 තෘෂ්ණා** නම් වේ. සම්පත් ලැබීම පිණිස උත්සාහ කරන්නහුගේ අවස්ථාව **9 උපාදාන** නම් වේ.

අනාගතයෙහි විපාක දෙන ඵලය ඇති කර්මය **10 භව** නම් වේ. නැවත ප්‍රතිසන්ධිය **11 ජාති** නම් වේ. උත්පත්ති යේ පටන් වේදනාව ලබනතුරු **12 ජරාමරණය** කියනු ලැබේ.

1 පුබ්බෙකතලක දහා'විද්‍ය

විස්තර:—පූර්ව ජන්මයන්හි කළ රාගාදි ක්ලෙශාවස්ථාව අවිද්‍ය නම් වේ. ක්ලෙශයන් අනුව කරන ලද අවිද්‍යාව පරිවාර ප්‍රත්‍යයා යෙන් යුක්ත වූ රජ්ජු වෙති. දක්වන ලදි. නාලන්දිකා විතණ්ඩි "ක්ලේශ ඉශ්වර්‍යාණාං යේ අවිද්‍ය පරිෂ්වඤ්ජනාදීව් ශාස්ත්‍රා"

සථවිර වාදයෙහි උගන්වන අයුරු අවිද්‍යා නම්; සූත්‍රානන්ත ක්‍රමයෙන් චතුරාර්ය සත්‍යය නොදන්මය. අභිධම් ක්‍රමයෙන් නම්; දුඃඛ සත්‍යය – සමුදය සත්‍යය – නිරොධ සත්‍යය – මාර්ග සත්‍යය යන චතුරාර්ය සත්‍යයෙහි ද, පූර්වාන්ත-අපරාන්ත පූර්වාපරාන්ත-ප්‍රතීත්‍ය සමුත්පාදය යන සිව් තැනද, සමඟ අට තැන්හි නොදන්මය. එනම්; මොහයයි. බුදුරජාණන් වහන්සේ මැයි;

"තත්‍ථ කතමා අවිජ්ජා? දුක්ඛෙ අඤ්ඤාණං = පෙ = දුක්ඛනිරොධෙ ඤාණං, පුබ්බන්තෙ අඤ්ඤාණං, අපරන්තෙ, පුබ්බාපරන්තෙ, ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං"

"අනන්තරා රත්තිතා සංසාරෙ ජවාපෙන්තී= අවිජ්ජා" යන නිර්වචන හෙයින් කෙළවරක් නැති සසර හෝ. සියලු චතුර්විධ යෝනි – පඤ්චගති-එක්තිස් භව-සත්ත විඤ්ඤාණස්ථිති නවසත්ත්වාවාසයන්හි සත්ත්වයන් ඉපදිම් වශයෙන් යවන්නේ අවිද්‍යාවයි. අවිද්‍යාවේ ලක්ෂණය හෙවත්; ආකාරය නොදැනීමයි. එහි කෘත්‍ය සම්පත්තිය හෙවත්; රසය නම්; මුළාවයි. ප්‍රත්‍යුපස්ථානය හෙවත්; වැටහෙන ආකාරය නම්; මුවහ කිරීම යි අවිද්‍යාව හටගැනීමට හෙතුව කෙලෙසයයි අවිද්‍යාව නැත්තේ විද්‍යා නම් වූ අර්හත් මාර්ගඥානයෙන් කෙලෙස ප්‍රහාණය කළ ක්ෂීණාශ්‍රවයන් වහන්සේට පමණකි. ඒ හැර සෙසු සියල්ලන්ට ම අවිද්‍යාව ඇත්තේය. අන්‍යොන්‍ය සම්බන්ධයෙන් යෙදෙන්නාවූ දෙළොස් අකුශල චිත්තයෙහි දෙළොස් චෙතනාවන්ට අවිද්‍යාව උපකාර වේ. සතළොස් ලෞකික කුශල චිත්තයෙහි අවිද්‍යාව නැත්තේය. (විසතර විශුද්ධිමාර්ගයෙන් දත්තේය.)

2 සංඛාරා පුඤ්ඤාභිසංඛාරා

විභාවනී:—"පුඤ්ඤ කම්මණා දහා සංඛාර ඉත්‍යුච්‍යතෙ" යනු ටීකා බැවින් පුණ්‍ය කර්මාවස්ථාව **සංඛාර** නම් වේ. පුණ්‍ය කෙලෙසාවස්ථාව **අවිද්‍යා** නම් වේ.

සථවිර වාදයෙහි **"සංඛතා මභිසඛ්ඛරණතීති = සඛ්ඛාරා. එකූනසීසෙ කුසලා කුසල චෙතනා"** යනු දක්වා ලද බැවින් ලෞකික කුශලා කුශල කර්ම; සංස්කාරයෝ නම් වෙති. එනම්; එකුන් තිස් කුශලා කුශල චේතනාහු,

සංඛාර (=සංස්කාර) ශබ්දයාගේ තේරුමෙක් අතී විද්‍යමාන වතුදු මෙහි පුඤ්ඤාභිසඞ්ඛාර-අපුඤ්ඤාභිසඞ්ඛාර-ආනෙඤ්ජාභි සඞ්ඛාර-කාය සඞ්ඛාර-වචී සඞ්ඛාර-සහ මනෝසඞ්ඛාර යනු දු ගැණේති. එහි ද, කාය-වචී මනෝ සඞ්ඛාරයෝ පුඤ්ඤාභි සඞ්ඛාරාදින්හි ම ඇතුළත් වෙති.

1 පුඤ්ඤාභි සඞ්ඛාර නම්;

දාන ශීලාදි වශයෙන් පැවැති කාමාවචර කුසල් සිත් අට ද, භාවනා වශයෙන් පැවැති රූපාවචර කුසල සිත් පස ද, යන තෙළෙස යි.

2 අපුඤ්ඤාභි සඞ්ඛාර නම්;

ප්‍රාණඝාතාදි වශයෙන් පැවැති අකුසල් සිත් දෙළොසයි.

3 ආනෙඤ්ජාභි සඞ්ඛාර නම්;

භාවනා වශයෙන් පැවැති ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය යන අරූපාවචර කුසල් සිත් සතරයි. සියල්ල එකුන් තිසකි. කියන ලදි විභාවිනී ටීකාහි;

"තත්‍ථ කාමරූපාවචරා පෙරස කුසල චෙතනා පුඤ්ඤාභි සඞ්ඛාරෝ; ද්වාදස අකුසල චෙතනා අපුඤ්ඤාභි සඞ්ඛාරෝ; චතස්සෝ ආරූප්‍ය චෙතනා ආනෙඤ්ජාභි සඞ්ඛාරෝති එවමෙතා එකූනතිංස චෙතනා සඞ්ඛාරානාම"

4 කාය සංඛාර නම්;

කාය විඥප්තිය ඉපදවීම් වශයෙන් කායද්වාරයෙන් ඇතිවන කාමාවචර කුශල චෙතනා අට ද. අකුශල චෙතනා දෙළොස ද, යන සිත් විස්සයි.

5 වචී සංඛාර නම්;

වාග් විඥප්තිය උපදවා වාග් ද්වාරයෙහි පැවැති වූහෝකත කුශලා කුශල චෙතනා විස්ස මැයි.

6 මනෝ සංඛාර නම්;

විඥප්ති නුපදවා මනොද්වාරයෙහි පවණක් පැවැති අකුසල් දෙළොස ය, කාමාවචර කුසල් අටය, රූපාවචර කුසල් පසය, අරූපාවචර කුසල් සතරය යන එකුන් තිස් චෙතනාහි.

සංස්කරණය කරනු ලබන හෙයින් හෝ ප්‍රත්‍යය සම්වායයෙන් ඇති වන නිසා මොවුහු සංස්කාරයෝ නම් වෙත්.

(විස්තර විශුද්ධි මාර්ගයෙන් දන්නේ ය.)

3 සන්ධිස්කන්ධාත්තු විඥානං

විප්පති: "ප්‍රතිසන්ධික්ෂණ යොනිගතාඃ පඤ්චස්කන්ධාඃ විඥාන පද වාච්‍යාඃ" යනු ටීකා බැවින් විඥාන නම්; පිළිසිඳ ගන්නා කෙණෙහි යොනිගත වූ පඤ්චස්කන්ධය යි.

"පටිසන්ධි වසෙන එකූන විසති විධා, පවත්තිවසෙන ද්වත්තිංස විධං විපාක චිත්තං විඤ්ඤාණං නාම" යනු විභාවිනී ටීකා බැවින් ප්‍රතිසන්ධි වශයෙන් එකුන් විසි වැදැරුම් වූ ද, ප්‍රවෘත්ති වශයෙන් දෙතිස් වැදැරුම් වූ ද, විපාක චිත්තය විඤ්ඤාණ නම් වේ" යනු ස්ථවිර වාද යි.

එහි ප්‍රතිසන්ධි විපාක විඥාන නම්;

කුසල අහෙතුක විපාක වූ උපෙක්ඛා සහගත සන්තීරණය' කාමාවචර සහෙතුක විපාක අටය, රූපාවචර විපාක පසය, අකුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය අරූප විපාක සතරය, යන එකුන්විසි විපාක සිත්ය.

ප්‍රවෘත්ති විපාක විඥාන නම්;

කාමාවචර කුසල අහෙතුක විපාක අට හා සහෙතුක විපාක අටය, රූපාවචර විපාක පසය, අකුසල විපාක සතය, අරූපාවචර විපාක සතරය යන දෙතිස් ලෞකික විපාක සිත් ය. ලොකොත්තර විපාක විඤ්ඤාණය වට්ටකථාවට නො යෙදෙන බැවින් මෙයට ඇතුළත් නො වේ මේ සංස්කාරයන් නිසා විඥානය හටගනී.

(විස්තර විශුද්ධි මාර්ගයෙන් දන්නේ ය.)

5 නාමරූපං අතඃ පරම්

විප්පති:—කාය-මන-චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-රසන යන ෂඩායතන යන්ගේ උත්පත්තියෙන් පුළු වූ පඤ්චස්කන්ධය "නාමරූප" නම් වේය යි මෙහි උගන්වයි.

ස්ථවිර වාදයෙහි උගන්වන අයුරු අරමුණට අභිමුඛව නැමෙන්නෝය යන අර්ථයෙන් චිත්ත චෛතසිකයෝ නාම නම් වෙත්. චිත්ත චෛතසිකයෝ ඔවුනොවුන් අරමුණට

නගත්. වෙදනා සංඥා-සංඝකාර යන ඝකන්ධත්‍රය නාම යි. රූප නම්; ශීත-උෂ්ණාදීන් පෙරලෙන ස්වභාව ඇති ධර්ම සමූහයයි. එනම්; පඨවී ආදි මහා භූත රූප සතර ද, ඔවුන්ගේ උපාදාය රූප සුවිස්ස ද, යන කර්මසමුඨාන අටවිසි රූපය යි. නාමඝකන්ධ සතරෙන් එකක් වූ විඥානඝකන්ධය හෙවත් සිත; විඥාන ප්‍රත්‍යයෙහි දක්වන ලද බැවින් එයින් හටගන්නා නාමය මෙන් මෙහි දක්වන ලද්දේ වෙදනා-සංඥා-සංඝකාර යන ඝකන්ධත්‍රය සඞ්ඛ්‍යාත චෛතසික ධර්ම සමූහය යි.

"මෙහි නාමරූපං" යනු සරූපෙකශෙෂ හෙයින් "නාමං" යන්නෙන් අරූප භවයෙහි පහළ වන්නාවූ සතර නාමඝකන්ධයද, "රූපං" යන්නෙන් අසංඥ සත්ත්ව භූමියෙහි පහළ වන්නාවූ එක ම රූපඝකන්ධය ද, "නාමරූපං" යන්නෙන් පඤ්ච වොකාර භවය ද, ගැණේ.

"නාමඤ්ච" යන පෙදින් චතුවොකාර භවය ද, "රූපඤ්ච" යන පෙදින් එක වොකාර භවය ද, "නාම රූපඤ්ච" යන පෙදින් පඤ්චවොකාර භවය ද, ගනු ලැබේ. මෙසේ එක දෙස සරූපෙක සෙස සමාස නය විසින් හකුළුවා විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප දෙක වෙයි කියා දතයුත්තේයි. අසංඥ සත්ත්වයන් කෙරෙහි විඥානයක් නැති බැවින් "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන වචනය අයුතුයයි ඉදින් චොදකයෙක් කියන්නේ නම්? මේ "විඤ්ඤාණ-පච්චයා" යන වචනය අයුතු නොවේ. යුතුම වේ. මෙය වනාහි;

නාම රූපද්වයට හෙතුවූ යම් විඥානයක් වේ ද, ඒ හෙතුවූ විඥානය; විපාක ද, අවිපාක දැයි කියා දෙපරිද්දකින් යම් හෙයකින් දක්නා ලද්දේද, එහෙයින් "විඤ්ඤාණ පච්චයා නාම රූපං" යන මේ වචනය යුතුම වෙයි. සැබැයි, නම් රූ දෙකට හෙතු වූ යම් විඥානයක් වේ ද, ඒ හෙතුවූ විඥානය තෙම විපාක විඥානය, අවිපාක විඥානය යි දෙපරිද්දකින් දක්නා ලද්දේය. අසංඥ සත්ත්වයන් කෙරෙහි කර්මයෙන් හටගත් බැවින් මේ අසංඥ සත්ත්ව ජීවිත නවක රූපකලාපය ද, පඤ්ච වොකාර භවයෙහි පැවැති අභි-සංඝකාර විඥාන ප්‍රත්‍යයෙන් ද, රූපය වෙයි. හෙවත් ජීවිතෙන්ද්‍රිය නවක රූප කලාපය වෙයි. එපරිද්දෙන් පඤ්චවොකාර භවයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කුසලාදි චිත්ත-

ක්ෂණයෙහි හටගත් කම්මසමුට්ඨාන රූපය ද, යන රූප-යෙන් හටගන්නා හෙයින් මෙය යුක්ති යුක්තය" යනු විශුද්ධිමාර්ග සන්නයි.

ප්‍රාක් ෂඩායතනොත්පදාත් තත් පූර්වං ත්‍රික සඞ්ගමාත්

විස්තරය: —කාය - මන - චක්ෂු - ශ්‍රොත්‍ර - ඝ්‍රාණ - රසන (=ජිහ්වා) යන සය ෂඩායතන නම් වේ.

සපර්ශයට පෙරටුව ෂඩායතනය දක්වන ලද්දේ ඉන්ද්‍රිය විෂය-විඥානයන්ගේ පරස්පර සඞ්ගමයෙන් සපර්ශය උපදනා බැවිනි. කියන ලදි. ටීකාහි;

"ඉන්ද්‍රිය - විෂය - විඥානානාං පරස්පර සංගමාත් සපර්ශස්‍ය උත්පත්තිඃ. අත එව වාදගසු අංගෙසු සපර්ශාත් පූර්වං ෂඩායතනං උක්තමි"

ස්ථවිර වාදයෙහි ද; චක්ඛු - සොත -ඝ්‍රාණ-ජිව්හා-කාය -මන යන සය ෂඩායතනයි. එහි "ජට්ඨායතනං ච + සළා-යතනං ච= සළායතනං" යි එක ශෙෂ කළහ. ෂෂ්ඨා-යතනය අරූපාවචරයද, ෂඩායතනය පඤ්චවොකාර භවයද; සදහා ය.

"ආයතන්ති එත්ථ තං තං චාරුරම්මණා චිත්ත චෙතසිකා තෙන තෙන කිච්චෙන ඝට්ටෙන්ති වායමන්ති, ආයභූතෙ වා තෙ ධම්මෙ එතානි තනොන්ති විත්ථාරෙන්ති, ආයතං වා සංසාර දුක්ඛං නයන්ති පවත්තෙන්ති චක්ඛු විඤ්ඤාණා දීනං කාරණභූතානීති වා ආයතනානි. අපි ච ලොකෙ නිවාස ආකර සමොසරණ සඤ්ජාතිට්ඨානං ආයතනන්ති වුච්චති; තස්මා එතෙපි තං තං චාරිකානං තං තදාරම්මණා නඤ්ච චක්ඛු විඤ්ඤාණාදීනං නිවාසට්ඨානතාය තෙසම්මෙව ආකිණ්ණ භාවෙන පවත්තානං ආකරට්ඨානතාය, තත්ථෙව උප්පජ්ජන්තානං සඤ්ජාතිට්ඨානතාය ච ආයතනානි" යනු ආයතන ශබ්දයට විභාවිනී ටීකාවේ දක්නා විස්තරය යි.

නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනයන් පහළ වන අයුරු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයෙහි මෙසේ විස්තර කරයි.

"නාමරූප සඞ්ඛ්‍යාත වූ ප්‍රතිසන්ධි විඥානය තත්සම්ප්‍ර-යුක්තක නාමසකන්ධත්‍රය ඒ ප්‍රතිසන්ධි විඥානය හා සමග ඉදිරි පසු නොවී පහළ වන්නාවූ කාය-භාව-චක්ඛු-සඞ්ඛ්‍යා-තවූ රූපය ද, යන නාමරූපද්වය හෙතු කොට ගෙණ

චක්ඛු-සොත-ඝාණ-ජිවහා-කාය මනො යන ආයතනයන් සදෙන හෝ ඡඩායතන සංඛ්‍යාත වූ මනායතනය හෝ පහළ වෙයි. ඒ කෙසේ පහළ වන්නාහු ද යත්? ප්‍රතිසන්ධි විඥානය හටගත් දවස පටන් සැත්තෑ සත් රැයක් ගිය කල්හි ගබ්භසෙය්‍යක සත්ත්වයන්ගේ චක්ෂුප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූප දශයකින් යුක්තවූ චක්ෂු කලාපය ද, ඊළඟ සතියෙහි එසේ ම ශ්‍රොත්‍ර ප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූප දශයකින් යුක්ත වූ ශ්‍රොත්‍ර කලාපය ද, ඊළඟ සතියෙහි ඝ්‍රාණ ප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූප දශයකින් යුක්තවූ ජිවහා කලාපය ද, ක්‍රමයෙන් පහළ වෙත්.

ගබ්භසෙය්‍යක සත්ත්වයන්ට වනාහි ප්‍රතිසන්ධිය එක් කර්මයකින් ද, හෙවත් කාය-භාව-වත්ථු යන රූප කලාපත්‍රය කින් යුක්ත වූ ප්‍රතිසන්ධි විඥානය එක් කර්මයකින් පහළ වූවාට පසු ප්‍රතිසන්ධියෙන් සත් සැත්තෑ රැයක් නික්ම ගිය කල්හි සංසාරයෙහි දෙන ලද රූප දානමය කාමාවචර කුශල කර්ම බලයෙන් හටගත්තාවූ මහා භූතයන්ගේ ප්‍රසාදය හෙවත් ඒ මහා භූතයන්ගෙන් පෙරී එන්නාවූ තෛලය සසම්භාර චක්ෂු සංඛ්‍යාතවූ මාංස ගණ්ඩයෙහි ශ්වේත මණ්ඩල යෙන් පරික්ෂිප්තවූ කාළ මණ්ඩලයාගේ මධ්‍යයෙහි අභිමුඛ යෙහි සිටියවුන්ගේ රූපයන් පිළිඹිබු වන්නාවූ ප්‍රදෙශයෙහි හෙවත් මුං පියල්ලක් පමණ විශාල වූ ප්‍රදෙශයෙහි ඇස් පටල සත ගලා ගොස් පවත්නේය. ඒ ප්‍රසාදය එක් කොට ගත් කල්හි මනුෂ්‍යයන්ගේ ඇසෙහි උකුණු හිසක් පමණ වන්නේයයි කියත්. ඒ ප්‍රසාදය ආශ්‍රය කොට ගෙණ පවත් නාවූ විඥානය චක්ඛු විඤ්ඤාණය යි කියත්. ඒ චක්ඛවා-යතන සංඛ්‍යාතවූ චක්ෂු ප්‍රසාදය රූප දානමය කාමාවචර කුශල කර්මයෙන් පහළ වූ හෙයින් ඒ චක්ඛවායතනය නිසා පවත්නා වූ විඥානයෙන් රූප දක්නේ වෙයි

ශ්‍රොත්‍රායතනය යනු චක්ඛවායතනය පහළ වූ සතියට අනතුරු සතියෙහි සංසාරයෙහි ශබ්දදානය දීමෙන් රැස් කර ගත් කාමාවචර කුශල කර්ම බලයෙන් මේ ආත්මයෙහි පහළ වූ මහා භූතයන්ගේ ප්‍රසාද සංඛ්‍යාත වූ තෛලය ශ්‍රොත්‍ර බිලය තුළ සිහින් තඹවන් රොමයෙන් ගැවසී ගත් ඇඟිලි මුදුවකට බඳු සටහන් ඇති නගරයක් වැනි වූ වසතු වෙහි පැතිර පවත්නේය. සංසාරයෙහි ශබ්ද දානමය කුශල කර්ම බලයෙන් පහළ වූ හෙයින් ශබ්දයන් ඇදීන

ගන්නාවූ විඥානය; ඒ ශ්‍රොත්‍ර ප්‍රසාද සංඛ්‍යාත ශ්‍රොත්‍රායතනය නිසා පවත්නේය. එසේ ම සංසාරයෙහි දෙන ලද්දා වූ ගන්ධ දානමය කාමාවචර කුශල කර්මයන්ගේ බලයෙන් මේ ආත්මයෙහි පහළවූ මහා භූතයන්ගේ ප්‍රසාද තෙලය නැහැ සිදුර ඇතුළත එළු කුරයකට බඳු සටහන් ඇති ප්‍රදෙශයෙහි පැතිර පවත්නේය. **ජිව්හායතනය** යනු සංසාරයෙහි දෙන ලද රසදානමය කාමාවචර කුශල කර්මයන්ගේ බලයෙන් මේ ආත්මයෙහි පහළ වූ මහාභූතයන්ගේ ප්‍රසාද තෙලය කුල්ලකට බඳු සටහන් ඇති සසම්භාර ජිහ්වාවගේ මුදුනෙහි පිහිටියා වූ නෙලුම් මල් පෙති අගක් බඳු වූ සටහන් ඇති රස දිවය යි ව්‍යවහාර වූ කුඩා මස් වැදැල්ලෙහි පැතිර පවත්නේය. ඒ ජිව්හායතන සංඛ්‍යාත ජිහ්වා ප්‍රසාදය රස දානමය කුශල කර්ම බලයෙන් පහළ වූ හෙයින් රසාලම්බණය හැඳින ගන්නා වූ ජිහ්වා විඥාන සංඛ්‍යාත චිත්තයාගේ පැවැත්මට උපකාර වන්නේයි.

ගබ්භසෙය්‍යක සත්ත්වයන් ගේ **කායායතනය මනා-යතනවය** ප්‍රතිසන්ධිකර්මයෙන් චක්ඛු-සොත-ඝාණ-ජිවහා යන ආයතනයෝ සතර දෙන යට කී නියායෙන් කර්ම සතර කින් ද, පහළ වෙත් මැයි. ඔපපාතික-සංසෙදජ සත්ත්ව-යන්ට වනාහි උත්කෘෂ්ට කාමාවචර කුශල කර්ම බලයෙන් ප්‍රතිසන්ධි විඥානය හා සමග මේ ෂඩායතනයෝ ම එක ක්ෂණික ව පහළ වෙත් මැයි. මෙසේ නාම රූප ප්‍රත්‍යයෙන් ෂඩායතනයන්ගේ පහළවන ක්‍රමය දතයුතුයි"

6 සපර්ශිඃ ප්‍රාග් සුඛදුඃඛාදි-කාරණඥාන ශක්තිතඃ

විස්තරඃ—චක්ෂුරාදි ඉන්ද්‍රිය ද, රූපාදි විෂයය ද, චක්ෂුර්විඥානාදි විඥානය ද, යන මොවුන් එක් තැනෙක එක්වීම නිසා සපර්ශිය උපදි.

සුඛ-දුක් ආදි හෙතුන් දැනීමේ ශක්තිය යම් කලෙක උපදි ද, එයින් පෙරටුව සපර්ශිය වේ. **"සුඛ දුඃඛාදි කාරණ ඥානස්‍ය ශක්තිඃ යදා උත්පාද්‍යතෙ, තතඃ ප්‍රාග් (යාවද් වෙදනා න ජායතෙ) අයං ස සපර්ශි'** යනු ටීකායි.

(160 වැනි පිටුව බලනු)

"චක්ඛු-සොත-ඝාණ- ජිවහා- කාය යන ආයතනයන් හෙතු කොට ගෙණ චක්ඛු සම්ඵස්සය, ජිවහා සම්ඵස්සය, කාය සම්ඵස්සය, මනො සම්ඵස්සය යන සයාකාර සපශීය පහළ වෙයි. චක්ඛායතනය රූපාරම්මණයෙහි වැද ගැන්මෙන් චක්ඛුසම්ඵස්සය ද, ශ්‍රොත්‍රා යතනය ශබ්දාලම්බණයෙහි වැද ගැන්මෙන් සොත සම්ඵස්සය ද, ඝාණා යතනය ගන්ධා-ලම්බණයෙහි වැද ගැන්මෙන් ඝාණ සම්ඵස්සය ද, ජිවහා යතනය රසාලම්බණයෙහි වැද ගැන්මෙන් ජිවහා සම්ඵස්සය ද, කායා යතනය ඵොඨබ්බායතනයෙහි වැද ගැන්මෙන් කාය සම්ඵස්සය ද, මනායතනය ධර්මාලම්බණයෙහි වැද ගැන්මෙන් මනො සම්ඵස්සය ද, හටගන්නේ ය.

7 විතතිඃ ප්‍රාඞ් මෛථුනාත්

විපපනි:—සත්‍රි පුරුෂයන් සංයොගයෙන් පූර්ව වූ අවස්ථාව **වෙදනා** නම් වේ. යනු ටිකා ගත විස්තරයයි.

(71-156 පිටු බලනු)

8 තෘෂ්ණා හොග මෛථුන රාගිණඃ

විපපනි:—සම්පත්තියෙහි ද, මෛථුනයෙහි ද, ඇලුණහුගේ තත්-කාලික අවස්ථාව **තෘෂ්ණා** නම් වේ.

ස්ථවිර වාදයෙහි "**තණ්හා**" යනු ලොභ මූලික සිත් අටෙහි යෙදුණු ලොභ චෛතසික අට මේ පටිච්චසමුප්පාද යෙහි තණ්හා නම් වෙයි. "**සිටු පුත්‍රයා**" – "**බ්‍රාහ්මණ පුත්‍රයා**" යනාදීන් පියාගේ නමින් පුතා හඳුන්වන්නාක් මෙන් රූපය අරමුණු වූ තෘෂ්ණාවට අරමුණේ නමින් 1 රූප තෘෂ්ණාය යි කියති. එසේ ම 2 ශබ්ද තෘෂ්ණාය 3 ගන්ධ තෘෂ්ණාය 4 රස තෘෂ්ණාය 5 සප්‍රෂ්ටව්‍ය තෘෂ්ණාය, 6 ධර්ම තෘෂ්ණාය යි කියනු ලැබේ. මේ එක් එක් තෘෂ්ණාවක් 1 කාම තෘෂ්ණාය 2 භව තෘෂ්ණාය 3 විභව තෘෂ්ණාය යි තෙපරිදි වේ. එහි රූපාදිය ආශ්වාද වශයෙන් ගන්නා කල්හි කාමතෘෂ්ණාය. ශාශ්වත දෘෂ්ටිය හා එක්ව පවත්නා කල්හි භව තෘෂ්ණාය යි ද, උච්ඡේද දෘෂ්ටිය හා එක්ව පවත්නා කල්හි විභව තෘෂ්ණාය යි ද, කියනු ලැබේ. මෙසේ රූප තෘෂ්ණාදි ඝය කාමතෘෂ්ණාදි තුනෙන් ගුණ වීමෙන් අටළොස් වැදෑ-රුම් වේ. ඒ අටළොස ආධ්‍යාත්මක-බාහිර භෙදයෙන් සතිසක් වේ. එය-අතීත-වර්තමාන-අනාගත යන කාලත්‍රය භෙදයෙන් එක්සිය අටක් වේ.

9 උපාදානං තු භොගානාං ප්‍රාප්තයෙ පරිබාවනා:

විස්තරී:—භොගයන් ලැබීම පිණිස උත්සාහ කරන්නහුගේ තත් කාලික අවස්ථාව උපාදාන නම් වේ. (විස්තර අභිධර්ම කොශයෙහි 5-38 කාරිකාව බලනු)

දැඩිසේ ගැන්ම උපාදාන නමැයි ස්ථවිර වාදයේ සඳහන් වේ. එය 1 කාමුපාදාන - 2 දිට්ඨුපාදාන - 3 සිලබ්බතුපාදාන 4 අත්ත වාදුපාදාන යනුවෙන් සිව් වැදැරුම් වේ.

1 කාමුපාදාන නම්;

වස්තු කාමයෙහි දැඩිසේ බැඳීමයි. එය ද, එක්සිය අට වැදැරුම් තෘෂ්ණාවගේ දැඩි අවස්ථාවයි.

2 දිට්ඨුපාදාන නම්;

නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං" යනාදීන් පැවැති දශවැදැරුම් මිථ්‍යාදෘෂ්ටියයි.

3 සිලබ්බතුපාදාන නම්;

බාහිර වූ අජශිල-ගොව්‍රතාදීන්ගෙන් ශුද්ධිය වේය යි ගන්නා වැරැදි විශ්වාසයයි.

4 අත්තවාදුපාදාන නම්;

විසිවැදැරුම් සත්කාය දෘෂ්ටිය යි. හෙවත්; ආත්මයක් ඇතැයි ගන්නා බලවත් විශ්වාසය යි.

"එත්ථ ච දුබ්බල තණ්හා තණ්හා නාම; බලවති උපාදානං; අසම්පත්ත විසය පත්ථනා වා තණ්හා; තමසි චොරානං හත්ථප්පසාරණං විය; සම්පත්ත විසය ගහණං උපාදානං, චොරානං හත්ථප්පත්තස්ස ගහණං විය; අප්පිච්ඡතා පටිපක්ඛා තණ්හා; සන්තොස පටිපක්ඛං උපාදානං; පරියෙසන දුක්ඛමුලා තණ්හා; ආරක්ඛ දුක්ඛ මුලං උපාදානං" යනු විභාවිනී ටිකාහි **තණ්හා-උපාදාන** දෙදෙනා ගේ වෙනස පැහැදිලි කළ අයුරුයි.

11 ස භවිෂ්‍යද් භවඵලං කුරුතෙ කර්ම තද්භවා:

විස්තරී:—අනාගතයෙහි විපාක දෙන්නාවූ යම්බදු කර්මයක් වේ ද; ඒ කර්මය ම භව නම් වේ. සම්පත් උදෙසා රැස් කරන ලද කර්මය පුනර්භවයට හෙතු වේ.

ස්ථවිරවාදයෙහි **භවහැන්වීම** හෝ **භවශැන්ම** භවයයි. එය **කර්ම භවය** **උත්පත්ති භවයයි** දෙවැදෑරුම් වේ.

ඒ විප්‍රකාර භවයන් අතුරෙන් සතළොස් ලෞකික කුශලය, දොළොස් අකුශලය යන එකුන්තිස් චිත්තයෙහි යෙදුණු චෙතනා එකුන්තිස **කර්ම භව** නම් වෙයි දෙතිස් ලෞකික විපාක චිත්තය, තත්සම්ප්‍රයුක්තවූ පන්තිස් චෛතසිකය, කර්මජරූපයෝ විස දෙනය. යන මෙතෙක් ධර්මයෝ තුමූ **උපපත්ති භව** නම් වෙති. ඒ උපපත්ති භවය වනාහි කාමභවය, රූප භවය, අරූප භවය, සඤ්ඤී භවය, අසඤ්ඤී භවය, නෙවසඤ්ඤී නාසඤ්ඤී භවය, එක වොකාර භවය, චතු වොකාර භවය, පඤ්ච වොකාර භවය යි නව වැදෑරුම් වේ.

කාමභවය යනු එකොළොස් කාම භූමියයි. **රූපභවය** යනු සොළොස් රූපාවචර භූමියයි. **අරූප භවය** යනු සතර අරූතලයයි. **සඤ්ඤී භවය** යනු එකොළොස් කාම භූමිය, අසංඥතලය හැර අවශෙෂ පසළොස් රූතලය ආකෘසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, යන මෙතෙක් භූමිහු සඤ්ඤිභව නම් වෙති. **අසඤ්ඤී භවය** යනු එකම අසඤ්ඤිතලයයි. **නෙවසඤ්ඤී නාසඤ්ඤී භවය** යනු භවාග්‍ර සංඛ්‍යාත සතරවෙනි අරූතලයයි. **එකවොකාර භවය** යනු අසංඥතලයයි. **චතුවොකාර භවය** යනු සතර අරූතලයයි. **පඤ්චවොකාර භවය** යනු අවශෙෂ පසළොස් බ්‍රහ්ම-භූමිය හා එකොළොස් කාමභූමියයි මේ නවස්ථානය වනාහි **උත්පත්ති භවයයි** කියා ද, **නව සත්තාවාසයයි** කියා ද, ව්‍යවහාර කරත්.

11 ප්‍රතිසන්ධිර් පුනර්ජාතිඃ

විපපතිඃ – නැවත ප්‍රතිසන්ධිය **ජාති** නම් වේ. එනම්; සකන්ධියන්ගේ පහළ වීමයි. **"තෙසං තෙසං සත්තානං තං තං ගති ආදිසු අත්තභාව පටිලාභො"** යනු විභාවිනී ටීකායි. **"ජාතීති පනෙත්ථ සවිකාරා පඤ්චක්ඛන්ධා"** යනු බ්‍රහ්මජාල සූත්‍ර ටීකායි.

"මෘත්‍යොඃ පශ්චාත් යාවත් පුනර්ජන්ම ස්ථානං ජාති රුච්‍යතෙ – ප්‍රත්‍යුත්පත්ත – ස්ථිති පරික්ෂායාං යස්‍ය නාම විඥානං, අනාගතස්ථිති පරික්ෂායාං තදෙව ජාති රිත්‍යුච්‍යතෙ" යනු නාලන්දිකා ටීකායි.

12 ජරාමරණ මාවිදඃ

ටිප්පනි:—"ජාතිත ආරභ්‍ය යාවද් වෙදනාං ජරා මරණං උච්‍යතෙ" යනු ටිකා බැවින් උත්පත්තියේ පටන් වෙදනාව විඳිනතුරු ජරාමරණයයි කියනු ලැබේ.

"තිබ්බත්තස්ස අත්තභාවස්ස පුරාණ භාවො ජරා. තස්සෙව එක භව පරියාපත්තස්ස පරියොසානං මරණං" යනු විභාවිනී ටිකා බැවින් ආත්මභාව සඞ්ඛ්‍යාත සකන්ධ සන්තතියගේ දිරා යෑම ජරා නම් ද, එක් භවයකින් වෙන් කරන ලද සකන්ධයන්ගේ බිඳීම මරණ නම් ද, වේ.

25 ආවස්ථිකඃ කිලෙෂ්ටා'යං-ප්‍රාධාන්‍යාත්වංග කීර්තනම් පූර්වාපරාන්ත මධ්‍යෙෂු-සම්මොහ විනිවෘත්තයෙ

භාවය:—ආවස්ථික ප්‍රතීත්‍ය සමුත්පාදය භාග්‍යවතුන් වහන්සේ විසින් අදහස් කරන ලදී. අංග කීර්තනය ප්‍රධාන භාවයෙන් වේ. කාණ්ඩත්‍රයයෙහි බෙදීම ද, සම්මොහය දුරු කිරීම පිණිසයි.

ආවස්ථිකඃ කිලෙෂ්ටායං

ටිප්පනි—ප්‍රතීත්‍ය සමුත්පාදය ක්ෂණික - ප්‍රාකර්ෂික- සම්බන්ධික- ආවස්ථික යනුවෙන් සිව් වැදෑරුම් වේ.

1 ක්ෂණික නම්;

"ක්ෂණෙ භවඃ ක්ෂණොස්‍යාසතීති =ක්ෂණිකඃ" යනු බැවින් කෙණෙහි වූයේයි.

2. ප්‍රාකර්ෂික නම්;

"ප්‍රකර්ෂේණ දිව්‍යති චරති වා ප්‍රබන්ධයුක්තඃ = ප්‍රාකර්ෂිකඃ" යනු බැවින් සමූහ වශයෙන් ප්‍රකර්ෂයෙන් හැසිරෙනුයේ ප්‍රාකර්ෂිකයි.

3 සම්බන්ධික නම්;

"හෙතු-ඵල සම්බන්ධ යුක්තඃ" යනු බැවින් හෙතු ඵල දෙකින් යුක්තවූයේ යි.

4 ආවස්ථික නම්,

"ද්වාදශ පංචස්කන්ධිකා අවස්ථා = ආවස්ථිකඃ" යනු බැවින් පංචස්කන්ධය පිළිබඳ වූ දෙළොස් වැදැරුම් අවස්ථාවන්ගෙන් යුක්ත වූයේ යි. බුදුරජාණන් වහන්සේ විසින් මේ ආවස්ථික ප්‍රතීත්‍ය සමුත්පාදය දෙශනා කරන ලද්දේය. ආවස්ථික ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි විස්තරවන අවිද්‍යාදි ද්වාදශාඞ්ගයන්ගෙන් ප්‍රකාශ වනුයේ සකන්ධපඤ්චකය පිළිබඳ වූ ම ඒ ඒ අවස්ථාම ය. එබැවින් එය ආවස්ථික ප්‍රතීත්‍ය සමුත්පාද නම් වේ.

ප්‍රාධාන්‍ය ත්වංග කිර්තනම්.

විප්පති:—අවිද්‍යාදි නාමයන්ගෙන් අඞ්ග දෙළොසක් දෙශනා කරන ලද්දේ ඒ ඒ අංගයන්ගේ ප්‍රධාන භාවයෙහි යම් අවස්ථාවෙක්හි අවිද්‍යාව ප්‍රධානවූයේ නම්; එය අවිද්‍යාංග නම් වේ. සංස්කාරය ප්‍රධාන විනම්; එය සංස්කාරාංග නම් වේ. මෙසේ අඞ්ග දෙළොසගේ ම ඒ ඒ අවස්ථාවන්හි ප්‍රධාන භාවය ලැබේ. (විශුද්ධි මාර්ගයෙහි ප්‍රතීත්‍ය සමුත්පාද නිර්දේශයෙහි "අඞ්ගානංච වවත්ථානතො" යනු බලනු)

පූර්වාපරාන්ත මධ්‍යෙෂු-සම්මොහ විනිවෘත්තය.

විප්පති:—අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්නය යනුවෙන් කාණ්ඩත්‍රය (=අධ්වත්‍රය) බෙදීම සම්මොහය දුරුකරනු පිණිසය. ඒ සම්මොහය කාලත්‍රය භෙදයෙන් තෙවැදැරුම් වේ.

"ආසං නු ඛලු අතීතෙ" (අතීතයෙහි වූයෙම් ද?) "නාසං නු ඛලු අතීතෙ" (අතීතයෙහි නොවූයෙම් ද?) "කථං ක ආසං" (කෙසේ කවරෙක් වීම් ද?) යනුවෙන් අතීතය විෂය කොට පැවැති සම්මොහය අතීත සම්මොහයයි.

"භවිෂ්‍යාමි නු ඛලු අනාගතෙ" (අනාගතයෙහි වන්නෙම් ද?) යනාදින් අනාගතය විෂය කොට පැවැත්තේ අනාගත සම්මොහයයි.

"කිම්දං" (මේ කිම්?) "කථම්දං" (මෙය කෙසේ ද?) "කෙ වයං" (අපි කවරහු වෙමු ද?) යනාදින් අතීතය සහ අනාගතය අතර කාලය විෂය කොට පැවැත්තේ ප්‍රත්‍යුත්පන්න සම්මොහය යි මේ තෙවැදැරුම් සම්මොහය දුරු කිරීම පිණිස ත්‍රිකාණ්ඩ විභාගය වදාරන ලදි.

ස්ථවිර වාදයෙහි මේ සැකය සොළොස් අයුරකින් දක්නේ ය.

1	අහොසිං නුඛො අහං අතීත මද්ධානං	අතීත අද්ධාන
2	නනු ඛො අහොසිං ,, ,,	
3	කින්නුඛො අහොසිං ,, ,,	
4	කථං නුඛො අහොසිං ,, ,,	
5	කිං හුත්වා කිං අහොසිං නුඛො අහං අතීත මද්ධානං	
6	භවිස්සාමි නුඛො අහං අනාගත මද්ධානං	අනාගත අද්ධාන
7	නනු ඛො භවිස්සාමි ,, ,,	
8	කින්නු ඛො භවිස්සාමි ,, ,,	
9	කථං නු ඛො භවිස්සාමි ,, ,,	
10	කිං හුත්වා කිං භවිස්සාමි ,, ,,	
11	අහං නු ඛොස්මි	පච්චුප්පන්න අද්ධාන
12	නො නු ඛොස්මි	
13	කින්නුඛොස්මි	
14	කථං නු ඛොස්මි	
15	අයං නු ඛො සත්තො කුතො ආගතො	
16	සො කුහිං ගාමී භවිස්සති	

26 කෙලෝසා තීණි වට්ටං කම්ම-සපත්ත වත්ථූ ඵලං කථා ඵල මෙකභවිකං තීණි කාලානි-අවයවාවීත්‍යානුමානතෝ

සාරාර්ථය:—කෙලෙස් තුනකි. කම් දෙකකි. වස්තු සතකි. ඵල ද සතකි. මධ්‍යයෙහි වූ අඟවාංගයන්ගේ අනුමානයෙන් ආදි ම ඵලදායක හෙතුන් වෙත්. අන්‍ය හෙතුදායක ඵලයෝ වෙත්.

කෙලෙස් තීණි

විස්තර:—අවිද්‍යා-තෘෂ්ණා-උපාදාන යන මොවුහු කෙලෙස්යෝ නම් වෙත්.

දෙවැන්න කම්

විස්තර:—සංස්කාර-භව යන කම්මයි.

සපත්ත වස්තු

විස්තර:—විඤ්ඤාණ-නාමරූප-ෂඩායතන-ස්පර්ශ-වේදනා-ජාති ජරා මරණ යන මොවුහු සපත්ත වස්තුහු නම් වෙත්. අවිද්‍යාදි කෙලෙස් යන්ගේ ද, සංස්කාර භව යන කම්මයන්ගේ ද, ආශ්‍රය ලබන බැවින් විඤ්ඤාණ-නාම රූපාදිහු වස්තුහු නම් වෙත්.

ඵලං කථා

විස්තර:—සපත්ත වස්තුහු ම ඵල (විපාක) යෝ ද වෙත්.

එල හෙවනිසංඛෙපෙ-වසොමිදඛ්‍යාකුමි නතඃ

විපනි:—මධ්‍යයෙහි පිහිටි විඤ්ඤාන-නාම රූපාදි අවෝඛයන්ගේ අනුමානයෙන් අවිද්‍යා සංස්කාරයෝ හෙතුහු වෙත්. ජාති-ජරා මරණයෝ ඵලයෝ වෙත්. අතීත-අනාගත හේ ක්‍රම-යෙන් ද, මෝවුහු මේ නම් ලබති.

27 කෙලඝාත් කෙලඝඃ ක්‍රියා වෙවේම-යඤ්ඤෙ විඤ්ඤ ණාඃ සුඛිඃ වසතු කෙලඝාඝව ජාඝනෙන-භවාංඝානඃ අඝඃ භඝඃ

ඝාවය:—කෙලඝයෙන් කෙලඝය ද, කම්ය ද උපදී. කම්යෙන් ආශ්‍රය ද, ආශ්‍රයෙන් නැවත ඵලය ද, උපදී. ආශ්‍රයෙන් කෙලඝයෝ ද, උපදිත්. මේ ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි නියමය යි.

කෙලඝාත් කෙලඝඃ

විපනි—කෙලඝයෙන් කෙලඝය උපදී. තෘෂ්ණාවෙන් උපාදානය උපදින්නා මෙනී.

ක්‍රියාවෙව

විපනි:— උපාදානයෙන් භවය ද, අවිද්‍යාවෙන් සංස්කාර ද, උපදින්නාක් මෙන් කෙලඝයෙන් කම්ය ද, උපදී.

භඝනඃ වසතු

විපනි:—සංස්කාරයන්හෙන් විඤ්ඤානය ද, භවයෙන් ජාතිය ද, උපදින්නාක් මෙන් කම්යෙන් කෙලඝාශ්‍රය උපදී.

නඃ: පුනඃ

විපනි:—විඤ්ඤානයෙන් නාම රූපය ද, නාම රූපයෙන් ෂඩායතනය ද, සඵර්ශයන් වෙදනාව ද, ජාතියෙන් ජරා මරණය ද, උපදින්නාක් මෙන් කෙලඝ කම්ාශ්‍රයයෙන් කෙලඝ කම්ාශ්‍රයයෝ උපදිත්.

වසතුකෙලඝාඝව ජාඝනෙන

විපනි:—වෙදනාවෙන් තෘෂ්ණාව උපදින්නාක් මෙන් කෙලඝාශ්‍රය හෙතුවෙන් කෙලඝයෝ උපදිත්. මෙහි වසතු නම් කෙලඝ කම්යන්ගේ ආශ්‍රය යි. විශුද්ධි මාගීයෙහි "ඡසම්ඵසෙ පච්චා අවිජ්ජා, වත්තුඤ්ච පටිච්ච උප්පජ්ජති මානසං දුක්ඛන්ති එත්ථ වත්තුනති එත්ථ ආරම්මණං අධිප්පෙතං" යි මිත්තු නම් අරමුණය යි, විශුද්ධිමාගී ටීකාහි දක්නේහ. මෙහි කෙලඝාශ්‍රය යි කියති.

භවාංගානං අයං නයෝ

එපුනීඃ— භවචක්‍ර නම් වූ ප්‍රතීත්‍ය සමුත්පාදයාගේ අවිද්‍යාදි දාදශාඞ්ගයන්ගේ මේ ක්‍රමය යි. විශුද්ධිමාර්ගයෙහි;

සව්වපුඤ්ඤඤ්ඤා කිව්වා-මාරණා උපමාහි ච
[illegible]

යන ගාථාවට ලියූ විස්තරය හා සංසන්දනය කරනු.

අවිද්‍යාදීන්ගේ ක්‍රමය විස්තර කරන ශාරීපුත්‍ර සවාමීහු මෙසේ කියති.

"මෙහි අවිද්‍යානුශයෙන් යුක්ත වූ සත්ත්වයෙහි කුශලා කුශලයන් විපාක දෙන සවභාවයෙන් පවත්නා හෙයින් අවිද්‍යාව හෙතු කොට හෙන සංස්කාරයෝ උපදිති. ප්‍රතිසන්ධි විඤ්ඤාණය ද, සංස්කාරයන් විසින් උපදවන ලදුව විපාක භවයෙහි පිහිටන්නේ ය. එසේ මැයි. ජනක වූ කුශලා කුශලයන් නැති කල්හි ඒ විපාක විඤ්ඤාණයා ගේ උත්පත්තිය නොවන්නේ ය. එසේ හෙයින් සංස්කාරයන් හෙතු කොට ප්‍රතිසන්ධි විඤ්ඤාණය වන්නේය. නාම රූපය ද, ෂඩායතනය ද, නාමරූප දෙක උපනිශ්‍රය කොට ඇත්තේම ෂඩ්විධ වූ විඤ්ඤාණ සපර්‍යයට වාරත්‍රයෙන් සුදුසු පරිදි දෙන්ම පවතිනුයි නාම රූපය හෙතු කොට හෙන ෂඩායතනය වෙයි. සපර්‍යය ද, ෂඩායතනයන්ගේ සමභවයක් ඇති කල්හි ම ආලම්බන සපර්‍යා කරන්නේ ය. මාරයාගේ අසමභාව යෙහි සපර්‍යයාගේ උත්පත්තිය නැත්තු යි. ෂඩායතනය හෙතු කොට හෙන සංස්පර්‍ය වන්නේය. ඉෂ්ටානිෂ්ට ෂඩ්විධාලම්බනය සපර්‍යා කරන්නාහු ම සුඛාදි වේදනා අනුභව කෙරෙති. අනිත් ලෙසක අනුභව නො කෙරෙත්තු යි සපර්‍යා ප්‍රත්‍යයෙන් ම වේදනාව වෙයි. අනුභව කටයුතුවූ ධර්මයන් කෙරෙහි ආස්වාද වශයෙන් බලන්නාහට වේදනාව හෙතුකොට හෙන ම තෘෂ්ණාව උපදිනු යි වේදනා ප්‍රත්‍යයෙන් ම තෘෂ්ණාව වේයි. තෘෂ්ණා නමැති හොඟයෙන් පිපාසිත වූ සත්ත්වයෝ ම උපාදානයන්ට හිතවූ ධර්මයන් හොරෙහි උපාදානයන් ගේ දුඃඛාදිය හිණිස පළුත්-නාහු යි එසේ මැයි. තෘෂ්ණාව හෙතු කොට රූපාදීන්

ආස්වාද කොට කාමයන් අනුභව කටයුතු බවට පැමිණෙන්නුයි **තණ්හාව උපාදානයට ප්‍රත්‍යය වේ.** එසේම රූපාදි ප්‍රභේද ඇත්තා වූ ශබ්දාලම්බනයෙහි ගිජු වූ සත්ත්වතෙම "**නත්ථි දින්නං**" යනාදින් මිථ්‍යාදර්ශනය ද, සංසාරයෙන් මිදෙනු කැමැත්තේ නිර්වාණ ප්‍රාප්ත නොවූ අශුද්ධි මාර්ගයෙහි දෘඪ ග්‍රහණය ද, පඤ්චස්කන්ධයෙහි ආත්ම ආත්මීය ග්‍රහණ වශයෙන් ප්‍රවර්ත්තන වූ ආත්මවාද දර්ශනය ද, ගන්නේය. එසේ හෙයින් දෘෂ්ට්‍යුපාදානාදින්ට ද, ප්‍රත්‍යය වේනුයි **තණ්හා ප්‍රත්‍යයෙන් ම උපාදානය වේ.** සම්ප්‍රයෝග අනුශය වශයෙන් සුදුසු සුදුසු, පරිද්දෙන් උපාදානයන් කෙරෙහි පිහිටියාවූ ම සත්ත්වයෝ කර්මයාගේ රාශි කරණය පිණිස පවතින්නුයි **උපාදානය ම භවයට ප්‍රත්‍යය වේ.** උත්පත්ති භව සඞ්ඛ්‍යාත ජාති තොමෝ බීජයෙන් අඞ්කුරොත්පත්තිය මෙන් කර්ම භවය හෙතු කොට ඇත්ති ම ඒ ඒ භවයෙහි ලැබේනුයි **භවය ම ජාතියට ප්‍රත්‍යය වේ. ජාතිය** ඇති කල්හි **ජරා මරණ** දෙදෙනාගේ සම්භවය වන්නේ ය. ජාති රහිතයන්ට ජරාවක් වත් මරණයෙක් වත් නොවේනුයි. **ජාති තොම ජරා මරණ** දෙදෙනාට ප්‍රත්‍යය වේනුයි මෙසේ අවිද්‍යාදි ප්‍රත්‍යයන් හා ප්‍රත්‍යය සමුත්පන්නයන් ගේ තද්භාව භාවිභාව දතයුත්තේයි."

28 හෙතු ඵල සමුත්පාදෝ-සමුත්පන්නෝ ඵලං මතම්
විද්‍යා විපක්ෂා ධර්මෝ'නෙත්‍රා-'විද්‍ය'මිත්‍රා'නාත්මාදිවත්

භාවය:—මේ ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි හෙතුව සමුත්පාදය යි. ඵලය සමුත්පන්නයයි දන්නා ලදි. විද්‍යා විරෝධි වූ අන්‍ය ධර්මය අවිද්‍යා නම් වේ අමිත්‍ර-අනාත්මාදීන් මෙන්.

හෙතු ඵල සමුත්පාදෝ-සමුත්පන්නෝ ඵලං මතම්.

විස්තර—"**සමුත්පාද්‍යතෙ අස්මාත්=සමුත්පාදෝ**" යනු විග්‍රහ වැකියෙන් හෙතු ධර්මය මෙහි සමුත්පාද නම් වේ. "**සමුත්පාද්‍යතෙ අසෞ =සමුත්පන්නෝ**" යන විග්‍රහයෙහි ඵල ධර්මය සමුත්පන්න නම් වේ. කාසි-කාරණ (=හෙතු-ඵල) දෙකින් ම යුක්තවූයේ ප්‍රතීත්‍ය සමුත්පාද-ප්‍රතීත්‍ය සමුත්පන්න නම් වේ. දැක්වූ ලදි. විභූති මාහිත්‍යය කි දු

"පටිච්චසමුප්පාදෙති පච්චය ධම්මා වෙදිතබ්බා; පටිච්චසමුප්පන්න ධම්මාති තෙහි තෙහි පච්චයෙහි නිබ්බත්ත ධම්මා; කථම්දං ජාතිතබ්බන්ති චෙ? භගවතො වචනෙන" (279 වැනි පිටුව බලනු)

විද්‍යා විපක්ෂො ධර්මො'න්‍යො'විද්‍යා'මිත්‍රා'නෘතාදිවත්

විප්පනි: – විද්‍යාවට විරුද්ධ වූ ධර්මය අවිද්‍යා නම් වේ. මිත්‍ර විරෝධී වූයේ අමිත්‍රයා ද, සෘතයට විරෝධී වූයේ අනෘත ද, වන්නාක් මෙනි. විද්‍යාවගේ අභාවය අවිද්‍යාවය යි නොගන්නේ ය. මෙහි නඤ්ඤර්ථය තද් විරුද්ධාර්ථයෙහි වේ. විභාවිනී ටීකාහි ද, "විජානාතීති = විජ්ජා-න විජ්ජා අවිජ්ජා" යනුවෙන් ඒ අර්ථය ම දක්වන ලදි.

29 සංයොජනාදි වචනාත්-කුප්‍රඥ වෙත්ත දර්ශනාත් දෘෂ්ටිසත්ත් සම්ප්‍රයුක්තත්වාත්-ප්‍රඥෝපක්ලේශ දෙශනාත්

භාවය:—සංයොජනාදි දෙශනාවන්ගෙන් ද, කු ප්‍රඥාව අවිද්‍යාව යයි නො දක්වන ලද හෙයින් ද, දෘෂ්ටිය අවිද්‍යාව හා සම්ප්‍රයුක්ත බැවින් ද, දෙශනාවෙහි ද; ප්‍රඥාවගේ මල ස්වරූප යෙන් අවිද්‍යාව දක්වනු ලැබේ.

සංයොජනාදි වචනාත්

විප්පනි:—සංයොජන – බන්ධන – අනුශය – ආශ්‍රව – ඔඝ – යොගාදි හුද, අවිද්‍යා පර්යාය ශබ්දයෝ වෙත්. එයින් ද, අවිද්‍යා ශබ්ද-යාගේ අර්ථය ම ප්‍රකාශ වේ.

කුප්‍රඥ වෙත්තදර්ශනාත්.

විප්පනි:—"කුතසිතා ප්‍රඥ=කුප්‍රඥ" යනු බැවින් නිඤ්චිත වූ ප්‍රඥාව කුප්‍රඥ නම් වේ. එය අවිද්‍යාව නොවේ. ඒ කුප්‍රඥාව ද, එක් දෘෂ්ටියකි. "කුප්‍රඥ අපි දර්ශනං (=දෘෂ්ටිඃ) එව" යනු ටීකායි.

දෘෂ්ටිසත්ත් සම්ප්‍රයුක්තත්වාත්

විප්පනි:—මිථ්‍යා දෘෂ්ටිය අවිද්‍යාව නොවන බවට තවත් සාධක යක් මෙයින් දක්වයි. දෘෂ්ටි-අවිද්‍යා දෙක සංයොජනයන්හි දෘෂ්ටි (=දිට්ඨි) සංයොජන, අවිද්‍යා (=අවිජ්ජා) සංයොජන යනු වෙන් වෙන්ව ම දෙශනා කරන ලදි. එබැවින් දෘෂ්ටියත්-

අවිද්‍යාවත් දෙකකි. දෘෂ්ටියෙහි අවිද්‍යාව ඇතුළත් වේ එසේ ම දෘෂ්ටිය අවිද්‍යාවෙන් යුක්ත විය හැක. එබැවින් දෘෂ්ටි-අවිද්‍යා දෙක එකක් නොවේ. දෙකකි. මෙයින් මිථ්‍යාදෘෂ්ටිය අවිද්‍යාව යයි කියුවන් ගේ මතය ඛණ්ඩනය කරන ලදි:

ප්‍රඥෝපක්ලේශ දෙශනාත්.

විප්පති: -බුද්ධ දෙශනාවෙහි ද, ප්‍රඥාවගේ මල ස්වරූපයෙන් අවිද්‍යාව දෙශනා කරන ලදි. **"අවිද්‍යෝප ක්ලිෂ්ටා ප්‍රඥා න විශුද්ධයති"** යනුවෙන් සංයුක්ත නිකායෙහි දක්නේයයි ටීකාහි කියයි.

30 නාමත්වරූපිණඃ සකන්ධාඃ-ස්පර්ශාඃ ෂට් සන්නිපාතජාඃ පංච ප්‍රතිඝ සංස්පර්ශාඃ-ෂඩ්ඨෝ'ධි වචනාභවයඃ

භාවය:—රූපසකන්ධය හැර සෙසු සකන්ධයෝ **"නාම"** ශබ්දයෙන් ව්‍යවහාර කරත්. සන්නිපාතයෙන් හටගත් ස්පර්ශයෝ සයක් වෙත්. (එයින්) ස්පර්ශ පසක් ප්‍රතිඝස්පර්ශයෝ වෙත්. සවැති ස්පර්ශය අධිවචන (=නාම) සංඥා වේ.

නාමත්වරූපිණඃ සකන්ධාඃ

විප්පති:—රූපසකන්ධය හැර වෙදනා-සංඥා-සංසකාර-විඥාන යන සකන්ධ සතර නාමයයි ද, රූපසකන්ධය රූපය යි ද, ව්‍යවහාර කරති. දක්වන ලදි. විශුද්ධිමාර්ගයෙහි ද, **"ඉති රූපක්ඛන්ධෝ රූපං, චත්තාරෝ අරූපිනො ඛන්ධා නාමන්ති එව මේකො පඤ්චක්ඛන්ධ වසෙන නාමරූපෙ වවත්ථපෙති"**

නැමීම ලක්ෂණ කොට ඇත්තේ නාමයයි, බිඳීම ලක්ෂණ කොට ඇත්තේ රූපය යි.

ස්පර්ශාඃ ෂට් සන්නිපාතජාඃ

විප්පති:—ඉන්ද්‍රිය- විෂය - විඥානය යන මොවුන්ගේ එක් තැන එකතු වීමෙන් (=සන්නිපාතයෙන්) ස්පර්ශය හටගනී එසේ හටගන්නා ස්පර්ශයෝ සදෙනෙක් වෙත්. එනම්; චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය-මන යන මොවුහු යි. එබැවින් මොවුහු **"සන්නිපාතජ ස්පර්ශයෝ"** වෙත්.

පංච ප්‍රතිඝ සංස්පර්ශාඃ

විප්පති:—චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය යන පස ප්‍රතිඝ-ස්පර්ශයෝ නම් වෙත්. ආශ්‍රයා ලම්බනය හා ඔවුනොවුන් ගැටීමෙන් හටගන්නා බැවිනි. **"යත ආශ්‍රයා ලම්බන පරස්පරං ප්‍රතිහත්‍ය එන මුත්පාදයතඃ"** යනු ටීකා පාඨයි.

ෂෂ්ඨෝ'ධි වචනාභවයඃ

විප්පතී:—සවැනි මනඃ සපශීය නාම් නම් වේ.

31 විද්‍ය'විද්‍යෙ-තර-සපශීා-අමල කලිෂ්ට-ශෙෂිතාඃ
ව්‍යාපාදානුනය සපශ්‍රීෟ-සුඛවෙද්‍යාදයඃ ත්‍රයඃ

භාවය:—අනාශ්‍රව ප්‍රඥාවගේ ද, සාශ්‍රව ඥානයාගේ ද, අව්‍යාකෘත ප්‍රඥාවගේ ද, සපශීයෝ පිළිවෙළින් අමල - කලිෂ්ට - නෛව කලිෂ්ටනාකලිෂ්ටයෝ වෙත්. ව්‍යාපාද-අනුනය දෙදෙනාගේ සපශීයෝ ඔවුන් හා සම්බන්ධ වෙත්. සුඛ වෙද්‍යාදි තුන් සපශීයෝ ඒ නම්වලින්ම ව්‍යවහාර කරත්.

විද්‍ය'විද්‍යෙ'තර සපශීා-අමල කලිෂ්ට ශෙෂිතාඃ

විප්පතී:—විද්‍ය නම් වූ **අනාශ්‍රව ප්‍රඥාවගේ ද,** අවිද්‍යා නම් වූ **සාශ්‍රව ප්‍රඥාවගේ ද, ඉතර** යනුවෙන් හැඳින් වූ **නෛව විද්‍ය නාවිද්‍ය** නම් වූ **අව්‍යාකෘත ප්‍රඥාවගේ ද,** සපශීයෝ පිළිවෙළින් **අමල**-කලිෂ්ට - **නෛවකලිෂ්ටනාකලිෂ්ටයෝ** වෙත්.

ව්‍යාපාදානුනය සපශ්‍රීෟ.

විප්පතී:—ව්‍යාපාද-අනුනය **දෙදෙනාගේ** සපශීයෝ **ව්‍යාපාදයෙන් ද, අනුනයයෙන් ද,** සම්බන්ධවූවෝ වෙත්.

සුඛ වෙද්‍යාදයඃ ත්‍රයඃ.

විප්පතී:—සුඛ වෙදනීය - අසුඛ-වෙදනීය- නසුඛනාසුඛ වෙදනීය යන තුන **සුඛ-දුඃඛ-නසුඛ දුඃඛ** ශබ්දයන්ගෙන් ව්‍යවහාර කරත්.

32 තජ්ජාඃ ෂඩ්වෙදනා පංච-කායිකී චෛතසි'පරා
පුනශ්චාෂ්ටාදශ විධා-සා මනොප විචාරතඃ

භාවය:—චක්ෂුරාදි ෂඩිත්‍රියයන්ගෙන් ෂඩ් වෙදනාවෝ උපදිත්. එයින් පූර්ව පංචකය කායිකය. අනෙක චෛතසිකය. නැවත ඒ චෛතසික වෙදනා තොමෝ විත්තොපචාරයෙන් අට ලොස් වැදැරුම් වන්නීය.

තජ්ජාඃ ෂඩ්වෙදනා

විප්පතී:—චක්ෂු-ශ්‍රොත්‍ර-ඝ්‍රාණ-ජිහ්වා-කාය-මනස් යන ෂඩිත්‍රිය **යන්ගෙන්** රූප-ශබ්ද-ගන්ධ-රස-සපශී-ධර්ම යන ෂඩ් වෙද **නාවෝ** උපදිත්.

පංච කායිකී චෛතසී'පරා

ටීප්පනි:—ඒ ෂඩ් වෙදනාවන්ගෙන් පූර්ව පඤ්චකය කායිකය; කය සම්බන්ධ වූ බැවිනි. අනෙක හෙවත් ධර්ම වෙදනා තොමෝ චෛතසිකය; සිත පිළිබඳ වූ බැවිනි.

පුනශ්චාෂ්ටාදශවිධා-සා මනොපවිචාරතඃ

ටීප්පනි:—ඒ චෛතසික වෙදනාව නැවත මනස සම්බන්ධී උප විචාර වූ සෞමනස්‍ය-දෞර්මනස්‍ය උපෙක්ෂා යන භෙදයෙන් තෙවැදෑරුම් වේ ඒ එකිනෙක චක්ෂුරාදි ෂඩිත්‍රියයන්ගේ ස්පර්ශයෙන් රූපාදි භෙදයෙන් අටළොස් වැදෑරුම් වේ. ඒ අනුව සෞමනස්‍ය වෙදනා සයකි. දෞර්මනස්‍ය වෙදනා සයකි. උපෙක්ෂා වෙදනා සයකි. සියල්ල අට ළොසකි ඒ සැම මානසිකය.

ස්ථවිර වාදයෙහි චාර වශයෙන් වෙදනා සයකි. එය ප්‍රභෙද වශයෙන් එකුන් අනූ සිත් සමග යෙදෙන බැවින් එකුන් අනූවකි. කියන ලදි. විශුද්ධි මාර්ගයෙහි;

"චක්ඛු සම්ඵස්සජා වෙදනා, සොත - ඝාණ - ජිවහා කාය-මනො සම්ඵස්සජා වෙදනාති එවං චාරතො සළෙව වෙදනා වුත්තා. තා පන භෙදෙන එකුනනවුතියා විත්තෙහි සම්පයුත්තත්තා එකුන නවුති මතා"

33 කාමේ ස්වාලම්බනාඃ සර්වාඃ-රූපී ද්වාදශ ගොචරාඃ
ත්‍රයාණා මුත්තරඃ ධ්‍යාන-ද්වයෙ ද්වාදශ කාමගාඃ

භාවය:—කාම ධාතුවෙහි ඒ සියලු වෙදනාවන් ගේ ආලම්බන යෝ වෙත්. රූපී ධාතුගත වෙදනා තොමෝ ආලම්බන දෙළොසක් වන්නීය. ආරූප්‍ය ධාතුගත වෙදනා තොමෝ තුනකගේ ම වන්නීය. ධ්‍යාන ද්වයයෙහි දෙළොසකි ඔවුන් ගේ ආලම්බනයෝ කාමධාතුගත වූවෝ ම වෙත්.

කාමේ ස්වාලම්බනාඃ සර්වා.

ටීප්පනි:—කාම ධාතුවෙහි ඒ සියලු අටළොස් වෙදනාවෝ කාම ධාතුගත ආලම්බනයන් විෂය කොට පවතිත්. කාම ධාතු වෙහි වෙදනාවන්ට අතිකුදු රූපී අරූපී ධාතුන්හි අරමුණු විෂය නො වෙත්.

රූපී ද්වාදශ නොවරා:

විප්පනි:-රූප ධාතුවෙහි වෙදනා දෙළොසකි. ආලම්බන ද, දෙළොසක් බැවිනි. එහි සෞමනස්‍ය - දෞමනස්‍ය - උපෙක්ෂා යන තෙවැදෑරුම් හෙද ඇති රූප-ශබ්ද-සප්‍රාප්‍ය-ධර්ම ආලම්බනයෝ ම විෂය වෙත්. ගන්ධ-රසාලම්බනයෝ නො ලැබෙති. රූපී බ්‍රහ්මයන්හට ඝාණදශකය ද, ජිහ්වා දශකය ද, භාව දශකය ද, ලැබෙති.

"බ්‍රහ්මයන් ගේ කාම විරාග භාවනා වශයෙන් ගන්ධ රස සප්‍රාප්‍ය යෙහි විරක්ත බැවින් තද්විෂයවූ ප්‍රසාද-යෙහි විරාගසද්භාවයෙන් ඝ්‍රාණාදිත්‍රය නැත. බුද්ධදර්ශන ධර්ම ශ්‍රවණාදිය පිණිස වනාහි චක්ෂුඃ ශ්‍රෝත්‍රයෙහි අවිරක්ත බැවින් චක්ෂුර් වසත්වාදි වසතුද්වය එහි ලැබෙන්නේයි" යනු ශාරීපුත්‍ර සඞ්ඝරාජ වචනයි.

"රූපාවචර බ්‍රහ්මයන්ට වනාහි ඝ්‍රාණාදි ප්‍රසාදත්‍රය නැත්තේ නමුදු සසම්භාරඝාණ සසම්භාරජිව්හා සසම්භාර කාය යන මහා භූත රූපයෝ ඇත්තාහු මැයි. ඝ්‍රාණාදි ප්‍රසාදත්‍රය කුමක් හෙයින් නැත්තේ ද, යත්? කාමයෙහි විරක්ත භාවනා බලයෙන් බ්‍රහ්ම ලොකොත්පත්තිය වන හෙයින් ඝ්‍රාණාදි ප්‍රසාදත්‍රය නැත්තේයි. එසේ වීනම්; චක්ඛු සොත ප්‍රසාදද්වය කුමක් හෙයින් ලැබෙන්නේ ද යත්? බුද්ධ දර්ශන ධර්මශ්‍රවණාදිය සඳහා මුත් රූප ශබ්ද කාම කොඨාසයන් අරමුණු වශයෙන් ගන්නා පිණිස නොවෙත් යයි දතයුතුයි" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි.

ත්‍රයාණා මුත්තරා:

විප්පනි:—ආරූප්‍ය ධාතුවෙහි සෞමනස්‍ය - දෞමනස්‍ය - උපෙක්ෂා යන තෙවැදෑරුම් වෙදනා ලැබෙති.

ධ්‍යානද්වයෙ ද්වාදශ කාමිකා:

විප්පනි: —ප්‍රථම-විතීය ධ්‍යානද්වයයෙහි සෞමනස්‍ය සහගත ෂඩ් උප විචාරයෝ ද, උපෙක්ෂා සහගත ෂඩ් උප විචාරයෝ ද, වෙත්. ඔවුන් ගේ ආලම්බනයෝ කාම ධාතුගතවූවාහු ම වෙත්.

34 සෙසාසවා ලම්බන මාරූප්‍ය-ලක්ඛණා ධ්‍යානද්වයස්ස තු සවි කාමා සබ්බාපි චතුන්නං සබ-එකස්සා ලම්බනං පරා

භාවය:—රූප ධාතුගත උපවිචාරයන්ගේ ආලම්බන අටකි. ආරුප්‍යය් මදක්‍යයි මත් වෙයි. තෘතීය-චතුර්ථ ධ්‍යාන විසින් උපෙක්ෂා සහගත ෂඩ් උපවිචාරයෝ වෙත්. කාම ධාතුව ධර්මයකගේ ද, රූප ධාතුව ධර්ම සතරකගේ ද, ආරූප්‍ය ධාතුව එක ධර්මයකගේ ද, ආලම්බනය වේ.

සෙසා'සටා'ලම්බනා

විපනී: - රූපධාතුගත උප විචාරයන්ගේ ආලම්බන අටකි. එනම් සෞමනස්‍ය + උපෙක්ෂා (රූප-ශබ්ද-සප්‍රෂ්ටව්‍ය-ධර්ම) යනුයි.

ධ්‍යාන ද්වයෙතු ෂට්

විපනී—තෘතීය-චතුර්ථ ධ්‍යානද්වයෙහි උපෙක්ෂා සහගත ෂඩ් උපවිචාරයෝ වෙත්.

කාමා: සබ්බාපා

දීපනී:—කාම ධාතුව; රූප-ශබ්ද-ගන්ධ-රස-සප්‍රෂ්ටව්‍ය-ධර්ම යන මේ ෂට්කයේ ම ආලම්බනය වේ.

චතුන්නං සබ

දීපනී:—රූපධාතුව; රූප-ශබ්ද-සප්‍රෂ්ටව්‍ය-ධර්ම යන මේ සතරගේ ආලම්බනය වේ

එකස්සාලම්බනා පරා

විපනී:—ආරූප්‍ය ධාතුව; එක ම ධර්මයාගේ ම ආලම්බනය වේ.

35 චත්තාරෝ'රූපි-සාමඤ්ඤත-රූපතා: එක උෂ්ඛතා: එකෝ වෙදනා ළු සබ්බ විෂයා:—සඑජ්ජාදය සාස්‍රවා:

භාවය:—රූප ධාතුගත වෙදනා සතර ආරූප්‍ය ධාතු සාමාන්‍ය-යෙහි ද, වෙයි. ආරූප්‍ය ධාතුගත වූයේ එක ම ය. ආරූප්‍ය-යෙහි ඒ එක සව විෂය ම ය. කාම ධාතුවෙහි පඤ්ඤා සියලු උපවිචාරයෝ සාශ්‍රවයෝ ය.

චඩාඅරා'රූපි සාමඤඤක

විපජනි:—රූපධාතුගත වූ රූප - ශබ්ද-ඝ්‍රාණ ධර්මායතනය ආකාශානන්ත්‍යායතනය දක්වා පවතියි. (7-22 බලනු)

එක ලඅද්ධවසෘ

විපජනි:—ආරූප්‍ය ධාතුගත ධර්මෝපවිචාරය ත්‍රි ය.

එකො සඞ්ඛාර සඩවිඤඤ

විපජනි:—ආරූප්‍යයෙහි ඒ ධර්මෝපවිචාරය සඩධාතුගතය ම අරමුණු කරයි එය කාමධාතුගත වූ නෝ රූප ධාතුගත විඤඤයන් වන්නට සුදුසු නැත. **"නත්‍රහි සඩතො නිමා ධාතුගතො විඤඤා නා භවිතුමර්හතීති"** යනු ටීකායි.

සඤඤාවෙදන සාස්‍රවා:

විපජනි:—සෞමනස්‍ය-දෞර්මනස්‍ය-උපෙක්ෂා යන ත්‍රි ප්‍රභේදයෙන් රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය-ධර්මයන්ගේ හෙද අටළොසකි ඒ සියල්ල ම සාශ්‍රවය එසේ ම ප්‍රථම විතීය ධ්‍යානයන්හි ලැබෙන දශය ද, තෘතීය චතුර්ථධ්‍යානයන්හි ලැබෙන සතර ද, ආරූප්‍යයෙහි ලැබෙන එක ම ධර්මෝපවාරය ද, යන මේ සියලුම ආලම්බනයෝ සාශ්‍රවයෝ ය.

36 උකතං ච වඤ්ඤතෙ චානාසත්-අත්‍ර කෙලිශ ඉඤ්ඤතෙ ඛීජඤත් නාශඤත් මූල-විඝඤත් තුඤවත් තථා

භාවය:—විඤඤාණය සහ ඝඬායතනයන් කියනලදි. සංඝකාර-භව දෙක මතු කියනු ලැබේ. එමහි ක්ලේශය ඛීජය මෙන් ද; පරිත්‍යාග මෙන් ද, මූලයෙන් විඝඤය මෙන් ද, තොඅොමෙන් ද, කැමැතිවනු ලැබේ. (දෙතුරු කාරිකාව බලනු)

උකතං ච වඤ්ඤතෙ චානාසත්

විපජනි:—මෙහි ප්‍රථම කොශස්ථානයෙහි විඤඤාණය ද, ඝඬායතන්‍ය ද, කියන ලදි. (74 වැනි පිටුව බලනු) සංඝකාර භවයන් පිළිබඳ විස්තරය මීතු චතුර්ථ කොශස්ථානයෙහි ද, තෘෂ්ණා උපාදානයන් පඤ්චම කොශස්ථානයෙහි ද, කියනු ලැබේ,

අට් ශෙලඝ ඉඝ්‍යෙන

බීජමින් නාඝවත් මූල - වෘක්ෂවත් කුඝවත් තථා

පීපනී: – ප්‍රතීත්‍ය සමුත්පාදඝ කෙලඝ-කම්-වස්තූන්හි තෙපරිද්ද කින් බෙදන ලදි. (298 වැනි පිටුව බලනු) එහි කෙලඝයන් තෙරෙන් කෙලඝයෝ ද, කම්යෝ ද, වස්තූහු ද, එසේම හටඝනිත්. කියන ලදි. අභිධම්ම කොඝයෙහි; 3. 27

"කෙලඝාත් කෙලඝඃ ක්‍රියා මෙව-තඝොවඝතු තඝඃ පුනඃ වඝතු කෙලඝාඝව ජාඝඝන්ත-භව්‍යාංඝානාං අඝං නයඃ"

එය බීජයෙන් ඝාඛාපස්‍රාදිඝ ද, පථිතයෙන් දියදහරවඳ මුලඝයන් වෘක්ෂයද, තොඝහායෙන් යුකත ධාන්‍යයෙන් සඟල්ද, භවඝන්නා මෙනි.

මේ සියල්ල පිඩු කොට විශුඛිමාඝීයෙහි ඝුත දඝීන විශුඛි නිදේශයේ මෙසේ විසතර කරයි.

"පුථුජ්ජනස්ස සබ්බසොව වට්ටමූල කිලෙසානං අපහීනත්තා යං කිඤ්චි කරීය මානං කම්මං කුසලං අකුසලං වා හොති, ඉච්චස්ස කම්මකිලෙසපච්චයා වට්ට. වට්ටති, තසෙසතං වට්ටමූලං රූපක්ඛන්ධෙයෙව, න වෙදනාක්ඛන්ධාදිසු, විඤ්ඤාණක්ඛන්ධෙඝවා නරූපක්ඛන්ධාදිසුති න වත්තබ්බං, කසමා? අවිසෙසෙන පඤ්චසුපි ඛන්ධෙසු අනුසයිතත්තා. කථං? පඨවිරසාදි මිඝ රුක්ඛෙ, ඝථාහි, මහාරුක්ඛෙ පඨවිතලං අධිට්ඨාඝ පඨවිරසං ච ආපො රසං ච නිස්සාඝ තපපච්චඝං මූල-ඛන්ධ-සාඛා-පසාඛා-පල්ලව-පලාස-පුප්ඵ-ඵලෙහි වඩ්ඪිත්වා නහං පූරෙත්වා ඝාව කප්පාවසානා බීජපරම්පරාඝ රුක්ඛමවෙණ්ං සන්තානඝ මානෙ ඨිතෙ තං පඨවිරසාදි මූලෙයෙව, න ඛන්ධාදිසු –පෙ- ඵලෙ යෙව වා, න මූලාදිසූති න වත්තබ්බං, කසමා? අවිසෙසෙන සබ්බසු මූලාදිසු අනුඝතත්තාති"

1? තුඝ තණ්හුළ්හ්ස් කම්-තඃඵොවඝඩි පුඝපවත්
ඕඛඤ්ඤ ඝාත වඩ්ඪතු-තඝමින් භව චතුඨඝෙ

2? උපපත්ති භවඃ කම්ලිඝඃ-සඊකෙලඝෙඃ සඛහුම්ඝෙකඃ
ත්‍රිධාන්‍යෙ ක්‍රිඛාරූඝෙඝු-ආහාරසිතිකං ජඝත්

ඝාථාඝඃ– කම්ඝ තොඝහඃසඬ්ඛ්‍ය සඟල් මේන් වේ. එසේ ම ඔඛුඛ්ධි පුඝපමෙන් හෝ වේ. වසතුව පිදු ආහාරපාන වැනිඝ. ඒ සිව් වැදෑරුම් භවඝන් අතුරෙහි උපපත්ති භවඝ සඛහුම්ඝත සියලු කෙලඝයන්ගෙන් කිලිටි වේ. අන්‍ය භවත්‍රඝ ඝත වැදෑරුම් වේ. ආරූප්‍යඝන්හි නුත් භවඝෙහි ඉවක්, ලොකඝාඝන් සැමැක්ම ආහාරඝෙහි ඉඳී,

තුස තණ්ඩුලවත් කම්ම තෙථෙවිඝඩි පුඤ්ඤවන්

විපත්ති:—කර්මය නොහොඳ සහිත වූ සහල් මෙනි. නොහොඳ සහිත වූ සහල ම පැල හටගන්නේය. කියන ලද මැයි; ශ්‍රාවිත නිති ශාස්ත්‍රයෙහි ද, "තුෂෙෂෙරපි පරිත්‍යක්තා න ප්‍රරෝහන්ති තණ්ඩුලාඃ"යි. නොහොඳ සහිත සහල මෙන් යෙදුණාවූත කර්මය විපාකය දෙන්නේය.

කර්මය ඖෂධි පුෂ්පය මෙන් නෝ වේ. ඖෂධි පුෂ්පය ඵලය උපදවා මැලවේ. කියන ලදි. ටීකාහි "කඳ්ධි ඵලං උත්පාද්‍ය මලාඃෂෙනා" යි. එමෙන් කර්මය ද, විපාකය උපදවා අවසන් වේ.

සිඛ්ඛන්නපාන වදාසතු

විපත්ති:—වසතු ව පිසූ ආහාර පාන වැනි වේ. පිසූ ආහාර පාන-යෙන් අන් ආහාර පානයක් නුපදී. එමෙන් වසතුව ද, එයින් අන් වසතුවක් නුපදවන්නේය. කියන ලදි. ටීකාහි "සිඛ්ඛිං අන්නපානං යථා අන්නපානාන්තරං නොත්පාදයති, තථා න චෙත් නිච්චාණං අසමභවං ඝි විපාකාත් විපාකාන්තරෙ ජායමානෙ"

කාසමින් භව චතුෂ්ටයෙ

විපත්ති:—අනන්තරාභව-පූර්වීකාලභව-මරණභවය සහ උපපත්තිභවය යන සතරයි. (264 වැනි පිටුව බලනු)

උප්පත්ති භවඃ කල්පෙවඃ සබ්බකාලෙෂෙඃ සොභූමිෂෙකඃ

විපත්ති:— පූර්වෝක්ත භව සතරින් උපපත්ති භවය සවභූමිගත (කාමධාතු-ප්‍රථමධ්‍යානාදි) සියලු ම කෙලෙසයන්ගෙන් කිලිටි වේ.

ත්‍රිධාත්‍යෝඃ

විපත්ති:—ඉතිරී භවත්‍රය (අනන්තරා භවය - පූර්වීකාලභවය - සහ මරණ භවය) කුශල-අකුශල - අව්‍යාකෘතය යි තෙවැදෑරුම් වේ.

ත්‍රිණ ආරූෂ්‍යන්ති

ත්‍රිප්‍රකාර:—ආකාශානන්ත්‍යායතනාදි සතර අරූපී ධ්‍යානයන්ගේ පූර්වීකාල-මරණ-උපපත්ති සහ භවයෝ වෙත්.

ආහාරසම්භවකං ජගත්

විපතී:—ලොකයාගේ පැවැත්ම ආහාරයෙන් වේ. වදුරන ලද්දේමැයි,

"සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා සි; එතම් සියලු සඞ්ඛත ධර්මයි. ස්ථවිර වාදයෙහි මෙන්ම සම්මිතීය වාදයෙහි ද,

1 කවළිඞ්කාරාහාර (=කබළිඞ්කාර)

2 ඵස්සාහාර (=ඵස්සාහාර)

3 මනසංචේතනාහාර (=මනෝ සංචේතනාහාර)

4 විඤ්ඤාණාහාර (=විඤ්ඤාණාහාර)

යනුවෙන් ආහාරය සිව් වැදෑරුම් වේ.

"තත්ථ කබළිඞ්කාරෝ ආහාරෝ ඔජට්ඨමකං රූපං ආහරතීති ආහාරෝ, එස්සෝ තිස්සෝ වේදනා ආහරතීති ආහාරෝ, මනෝ සඤ්චේතනා තිස්සු භවේසු පටිසන්ධිං ආහරතීති ආහාරෝ විඤ්ඤාණං පටිසන්ධික්ඛණෙ නාමරූපං ආහරතීති ආහාරෝ" යනු විනය ටීකායි.

39 කවළිඞ්කාර ආහාරෝ-න මෙත්‍රුයානනාතම්බෝ
න රූපායතනං කෙසුඤ්-චොජාඛණ්ඩිකානානු ග්‍රහාත්

හේතුව:— කාමධාතුවෙහි කවළිඞ්කාරාහාරය ආයතන තුනකින් යුක්තය. ඔවුන් අතුරෙහි රූපායතන ආහාරයක් නැත. ආහාරය; ශරීර-ඉන්ද්‍රිය දෙකට අනුග්‍රහ කරන බැවිනි.

කවළිඞ්කාර ආහාරෝ (=කබළිඞ්කාරාහාර)

විපතී:— "කබළං කත්වා ඡෙඤ්ඣාහරීයතීති= කබළිඞ්කාරෝ. "ආහරීයතීති=ආහාරෝ." යනු විග්‍රහ බැවින් කබළ කොට ගිලිය යුත්තේ කබළිඞ්කාරයි. බත් කැඳ ආදී භෝජනයේ ඔජසට මේ නමකි. මෙයින් ශරීරයේ පඨවී ආපෝ තේජෝ-වායෝ-වණ්ණ-ගන්ධ-රස ඔජා යන, වෙන් වෙනා කළ නැකිසේ එකට බැඳී පවත්නා ඔජට්ඨමක රූප නිපදින්නේය. ඒ රූපයන් ආහරණය නෙවත් හෙන ඊම් කරන බැවින් ආහාර නම් වේ.

කවලීකාරා හාරය; සූක්ෂමය, ඖදාරිකය යි දෙවැදෑරුම් වේ. සියුම් සත්ත්වයන්ගේ ආහාරය සූක්ෂමාහාරයයි. සියුම් සත්ත්වයෝනම්; අන්තරාභවිකයෝ ද, දෙවියෝ ද, ප්‍රථම කලපයෙහි මනුෂ්‍යයෝ ද, වෙත්. කියන ලදි. නාලන්දිකා ටිකාහි;

"කවලීකාර ආහාරෝ ද්විවිධෝ; ඖදාරිකඃ සූක්ෂමශ්ච සූක්ෂමාන්තරාභවිකානාං (=හන්ඩ්වීඃ 3-30) දෙවානාං ප්‍රාථම කලපිකානාං මනුෂ්‍යාණාං ච ආහාරඃ. සූක්ෂම සත්ත්වානාං හි ආහාරඃ සූක්ෂමඃ"

සථවිර වාදයෙහි කබලිඞ්කාර ආහාරයාගේ ඖදාරික සූක්ෂම භෙදය ලැබෙනුයේ වස්තූන්ගේ ඖදාරික සූක්ෂම භෙදය අනුවය. මජ්ඣිම නිකාය සම්මාදිඨි සූත්‍ර වර්ණනායෙහි මෙසේ විස්තර වේ.

"එබැවින් ඕජා තොමෝ ද, (ඕදන කුලමාෂාදී වූ) ඒ වස්තූහුගේ ඖදාරික බව ද, සූක්ෂම බව ද, පිළිවෙළින් ගෙන දත යුත්තීය. ඒ එසේම යැ. කිඹුලුන්ගේ ආහාරය සඳහා මොනරුන්ගේ ආහාරය සියුම් වෙයි. කිඹුල්ලු කැටගල් ගිලිත්ල, ඒ ගල් ද, ඔවුන්ගේ කුසට පැමිණියාහු දියවී යෙත්ල. මොනරු සර්ප ගෝනුසු ආදී වූ ප්‍රාණීන් කත්ල. තවද මොනරුන්ගේ ආහාරය උදෙසා තරසුන්ගේ ආහාරය සියුම් වෙයි; ඔවුහු තුන් හවුරුදු වූ හැර දමන ලද අං හා ඇට ද, කත්ල; ඒ අං හා ඇට ද ඔවුන්ගේ කෙළවලින් තෙමුණු ඇසිල්ලෙහි ම කදල මෙන් මොලොක් වෙත්ල. තරසුන්ගේ ද, ආහාරය උදෙසා ඇතුන්ගේ ආහාරය සියුම් වෙයි. ඔවුහු වනාහි නොයෙක් රුක් අතු කතී. ඇතුන්ගේ ආහාරයට වඩා ගවර ගෝණ මුව ආදීන්ගේ ආහාරය සියුම් වෙයි. ඔවුහු නිසරු වූ නොයෙක් රුක්වල කොල ආදිය කතී. ඔවුන්ගේ ආහාරයට ද, වඩා ගවයන්ගේ ආහාරය සියුම් වෙයි. ඒ ගවයෝ අමුවූ ද, වියලුනාවූ ද, තණ කතී. ඔවුන්ගේ ආහාරයට වඩා සාවුන්ගේ ආහාරය සියුම් වෙයි. සාවුන්ගේ ආහාරයට වඩා පක්ෂීන්ගේ ආහාරය සියුම් වෙයි. පක්ෂීන්ගේ ආහාරයට වඩා පසල් වැසියන්ගේ ආහාරය සියුම් වෙයි. පසල් වැසියන්ගේ ආහාරයට වඩා ගම්මුදලින්ගේ ආහාරය සියුම් වෙයි. ගම්මුදලින්ගේ ආහාරයට වඩා රජ රජමහ ඇමැතියන්ගේ ආහාරය සියුම් වෙයි. ඔවුන්ගේ ද ආහාරයට වඩා සක්විති රජුගේ ආහාරය සියුම් වෙයි,

සක්විති රජු ගේ ආහාරයට වඩා බුම්ටු දෙවියන් ගේ ආහාරය සියුම් වෙයි ඔවුන්ගේත් ආහාරයට වඩා චාතුම්මහා රාජිකයන් ගේ ආහාරය සියුම් වෙයි මෙසේ පරනිර්මිත වසවර්තීන් ගේ ආහාරය දක්වා විස්තර කටයුතුයි. ඔවුන් ගේ ආහාරය වනාහි සියුම්ය යි කියා ම නිමාවට පැමිණියේ ය. මෙහි ද, ඖදාරික වස්තුවෙහි ඔජා මද වෙයි. දුර්වල වෙයි. සියුම් වස්තුවෙහි බලවත් වෙයි. ඒ සැබෑව. එක් පයක් පුරා ලන්නාවූ ද, කැඳ පානය කළේ මොහොතකින් ම බඩසා ඇත්තේ වෙයි. යම් කිසිවක් ම කනු කැමැත්තේ වෙයි. හිතෙල් වනාහි පතක් පමණ ද, බී දවසක් තෝ වලඳනු කැමැත්තේ වෙයි. ඔවුනතුරෙහි වස්තුව පරිශ්‍රමය දුරු කෙරෙයි. පාලනය කරන්ට නෝ හැකි වෙයි. දෙදෙන ම එක්ව ගෙන විඳාවත් දුරු කෙරෙති පාලනයත් කෙරෙත්"

කාමෙන්ද්‍රියඝනනාතම්ඝඃ

විපඤ්චනිඃ—කාම ධාතුවෙහි කවලීකාරාහාරය ඝක්ෂි-රස-ඝ්‍රාණීය යන ආයතන තුනකින් යුක්තය. රූපායතන වූ ආහාරයක් නැත

න රූපායතනං තෙසු ඝට්ඨෂ මුක්තා නානු ග්‍රහාත්.

විපඤ්චනිඃ—රූපායතනවූ ආහාරයක් නැත. ආහාරය වනාහි ඉන්ද්‍රිය; ශරීර දෙකට අනුග්‍රහ කරන්නේය. රූපයෙහි එබඳු අනුග්‍රාහකත්වයක් නැත. මෙය ඉන්ද්‍රියයන්ට හෝ මුක්ත පුරුෂ නම් වූ අර්හත්හට අනුග්‍රහ කරන්නේ ද, නොවෙයි. කියන ලදී. ටීකාහි;

ආහාරොහි ඉන්ද්‍රිය-ශරීරයෝඃ අනුග්‍රාහකඃ, රූපෙ ච නාඝනි තාදෘශං අනුග්‍රාහකත්වම්. තෙනදං සඔකිඝං ඉන්ද්‍රියං අනුඝ්නාතීති න ච මුක්ත පුරුෂං අර්හතං අනුඝ්නාතීති"

40 ඝපඤ්චි ඝංචෙතනා විඤ්ඤ-ආහාරාඃ ඝාස්‍රවා සඤ්ඤි
මනොමයඃ සමහඝවඤ්චි-ඝඤ්ඤියවානතරා ච වීඃ

ඝාවඝඃ—කාමාදී ධාතුත්‍රයෙහි ඝ්‍රෝත්‍ර-මනඃ ඝංවෙතනා- විඤ්ඤාණය යන ආහාරයෝ ඝාස්‍රවයෝය. ඝක්ෂුස්සහ අනන්තර භවිකයඃ මනොමය ද, ඝමාහාරෙමි ද, අභිනිවිඤ්ඤති ද, ඝංඛී ඝේ. (මීළඟ කාරිකාවේ "නිඤ්ඤානිඃ" යනු සම්බන්ධ කරනු)

ස්පර්ශ සංචේතනා විඥ ආහාරාඃ සාස්‍රවාඃ

විස්පතිඃ-ස්පර්ශ, මනස්සංචෙතනා, විඥන, යන ආහාරයෝ සාශ්‍රවයෝ වෙත්.

1 ස්පර්ශාහාරය නම්;

"තත්‍ර ස්පර්ශඃ ඉන්ද්‍රිය විෂය විඥනානාං ත්‍රයාණාං එකත්‍ර සංයොගෙන ජායතෙ" යනු ටීකා බැවින් ඉන්ද්‍රිය-විෂය (=ආලම්බන) විඥන යන තිදෙනා ගේ එක්තැන් වීමෙන් උපන් ස්පර්ශය යි. (3-30 කාරිකාව බලනු).

ස්ථවිර වාදයෙහි උගන්වන **ඵස්සාහාරය ද,** මෙසේ මැයි. චක්ඛුසම්ඵස්ස-සොත සම්ඵස්ස - ඝාණ සම්ඵස්සාදි සවැදැරුම් ස්පර්ශය ඵස්ස නම්. එය සුඛ-දුක්ඛ-උපෙක්ඛා යන තෙවැදැරුම් වෙදනා ආහරණය කරන (=උපදවන) බැවින් ඵස්සාහාර නම් වේ. **"ඵස්සො තිස්සො වෙදනා ආහරතීති=ආහාරො"** යනු විනය ටීකායි.

2. මනස්සංචෙතනාහාරය නම්;

"මනඃ සංචෙතනා මානසං කර්ම" යනු ටීකා බැවින් මානසික ධර්ම යි.

ස්ථවිර වාදයෙහි ද, මනො සංචෙතනාහාර නම්; ලෞකික කුශලා කුශල චෙතනාවෝ වෙත්. ඒ චෙතනාවන් භවත්‍රයෙහි ප්‍රතිසන්ධිය ආහරණය කරන බැවින් මනො සංචෙතනාහාර නම් වේ. කියන ලදී. **"මනො සංචෙතනා තිසු භවෙසු පටිසන්ධිං ආහරතීති=ආහාරො"**යි.

3. විඥනාහාර නම්;

විඥනස්කන්ධයයි. **"විඥානං විඥනස්කන්ධඃ"** යනු නාලන්දිකා ටීකායි.

ස්ථවිර වාදයෙහි ද, **විඥනාහාර නම්;** එකුන් විසි ප්‍රතිසන්ධි චෙතනායි. එනම්; සන්තීරණ දෙසිත, කාමාවචර මහා විපාක සිත් අට, රූපාවචර විපාක සිත් පස, අරූපාවචර විපාක සිත් සතර යන මොවුහු වෙත්. පිළිසිඳ ගන්නා කෙණෙහි නාම රූප දෙක ආහරණය කරන බැවින් මේ එකුන් විසි චිත්තයෝ විඥ්ඤාණාහාර නම් වෙත්. **"විඥ්ඤාණං පටිසන්ධික්ඛණෙ නාමරූපං ආහරතීති ආහාරො"** යනු විනය ටීකායි.

කබලිඞ්කාරාදී ආහාරයන්- රූප-වෙදනා-භව-නාම රූපයන් උපදවන අයුරු මජ්ඣිම නිකාය සටමාදිඞ් සූත්‍ර වර්ණනා යෙහි මෙසේ විස්තර කරයි.

"කබලිඞ්කාරාහාරය තෙමේ ඔජාෂ්ටමක රූපයන් එළවයි. මනො සංචෙතනාහාරය තෙමේ තුන් භවය එළවයි. විඤ්ඤාණාහාරය තෙමේ ප්‍රතිසන්ධි නාමරූපය ද, එළවයි; කෙසේ ද? පළමු කොට කවලීකාරාහාරය තෙම මුඛයෙහි තැබූ කෙණෙහි ම රූප අටක් උපදවයි. දතින් සුණු කරන ලදුව ආහාරකොට ගණු ලබන්නාවූ එකෙකි බත්හුල අට අට රූපයන් උපදවා මැයි. මෙසේ ඔජාෂ්ටමක රූපයන් එළවයි.

ස්පර්ශාහාරය වනාහි සුව විඳිය යුතු වූ පහස උපදනේ සුව වෙදනාව එළවයි. දුඃඛ වෙදනීය වූ (පහස) දුඃඛ වෙදනාව ද, උපෙක්ෂා වෙදනිය වූ (පහස) උපෙක්ෂා වෙදනාවද යි මෙසේ සවිප්‍රකාරයෙන් ම ස්පර්ශාහාරය තෙමේ ත්‍රිවිධ වෙදනාවන් එළවයි.

මනස්සඤ්චෙතනාහාරයෙහි කාම භවයට පැමිණෙන්නා වූ කර්මය කාමභවය එළවයි. රූපා රූප භවයන්ට පැමිණෙන්නා වූ කර්මයෝ ඒ ඒ භවයන් එළවත්. මෙසේ සවිප්‍රකාරයෙන් ම මනස්සඤ්චෙතනාහාරය භවත්‍රය එළවයි.

විඥානාහාරය වනාහි පිළිසඳ කෙණෙහි එය හා සම්ප්‍රයුක්ත වූ යම් සකන්ධත්‍රයක් වෙයි ද, ත්‍රිසන්තති වශයෙන් යම් තිස් රූප කෙනෙකුන් උපදිත් ද, සහජාතාදි ප්‍රත්‍යයෙන් ඔවුන් එළවාය යි කියනු ලැබේ. මෙසේ විඥානාහාරය ප්‍රතිසන්ධි නාමරූපය එළවාය යි මෙහි ද, මනස්සඤ්චෙතනා තොමෝ තුන් භවය එළවා ය යි. මෙහිද, ආශ්‍රව සහිත වූ කුශලා කුශල චෙතනා තොමෝ ම කියන ලදු. විඥානය ප්‍රතිසන්ධි නාම රූපය එළවාය යි ප්‍රතිසන්ධි විඥානය ම කියනලදු. අවිශෙෂයෙන් තත් සම්ප්‍රයුක්ත වූ තත් සමුත්ථාන වූ ධර්මයන් එළවන හෙයින් ද, මොවුහු ආහාරයෝයයි දතයුත්තාහුය. මේ සතර ආහාරයන් අතුරෙන් කවලීකාරාහාරය උපස්ථම්භනය කරමින් ආහාර කෘත්‍යය සිද්ධ කරයි. ස්පර්ශය තෙමේ ස්පර්ශ කෙරෙමින් ම ආහාර කෘත්‍යය සිද්ධ කරයි. මනස්සඤ්චෙතනා තොමෝ ආයුහනය කරන්නී ම අහර කිස කෙරෙයි. විඥානය තෙමේ විජානනය කරමින් ම අහර කිස කෙරෙයි

කෙසේ ද? යම් හෙයකින් කවළිංකාරාහාරය තෙමේ උපස්ථම්භනය කරමින් ම කය පිහිටුවූ දිවෙන් සත්ත්වයන් ගේ පැවැත්ම පිණිස වේ ද, ඒ එසේ මැය. කර්මයෙන් උපදවන ලද්දවූ ද, මේ කය-කවළිංකර අහරින් උපස්ථම්භිත වූයේ දසවසක් හෝ විසිවසක් නෝ ආයු ප්‍රමාණය නෙක් සිටී ද, කුමක් මෙන් ද යත්? මව විසින් උපදවන ලද්දා වූ දරු තෙමේ ධාත්‍රිය විසින් කිරි ආදිය පොවා පොවමින්ය සැරසූ ලැබිව්වෝ යම්සේ බොහෝ කලක් සිටී ද, තව ද ආහාරයකින් උපස්ථම්භිත වූ හෙයක් යම්සේ. (බොහෝ කලක් පවතී ද;) මේ වදුරන ලද්දේත් වෙයි. **යථා මහාරාජ! හෙරහ පනඤ්ඤෙ අඤ්ඤෙන දුරුනා උපත්ථම්භෙන්ති අඤ්ඤෙන දුරුනා උපත්ථම්භිතං සන්තං එවං තං නෙහං න පතති එව මෙව බෝ මහාරාජ! අයං කාමෙසු ආහාරසම්භවා ආහාරං පටිච්ච තිට්ඨති"** හි. මහරජ! ශෙයක් වැටෙන කල්හි අනික් දුවයකින් යම්සේ උපස්ථම්භ කෙරෙත් ද, අනින් දුවයකින් උපස්ථම්භිත වූයේ මෙසේ ඒ හෙය නොවැටේ ද, එසේම මහරජ! මේ කය ආහාරයෙන් පවත්නේ ආහාරය නිසා සිටී. මෙසේ කවළිංකර අහරින් උපස්ථම්භනය කරමින් අහර නිස සිඛ කෙරෙයි මෙසේ අහර නිස සිඛ කරන්නාවූ ම මේ **කවළිංකාරාහාරය** තෙමේ ආහාර සමුට්ඨාන රූපයට ද, උපාදිණ්ණක රූපයට ද, යන රූප සන්තති දෙදෙනාගට ප්‍රත්‍යය වෙයි. කර්ම රූපයන්ට අනුපාලකව ද, ආහාර සමුට්ඨාන රූපයන්ට ජනක වී ද, ප්‍රත්‍යය වේ ය යි. **ඵස්සාහාරය** වනාහි සුඛාදියට කරුණු වූ අරමුණ ස්පර්ශ කරමින් ම සුඛාදි වේදනා පැවැත් වීමෙන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස වෙයි. **මනඃසඤ්චේතනාහාරය** කුශල අකුශල කර්මයන්ගේ වශයෙන් ආයුහනන්ය කරමින් ම භව මූලය තිපදවන හෙයින් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස වෙයි. **විඤ්ඤාණාහාරය** විඤ්ඤාණය කරමින් ම නාමරූපයන් ගේ පැවැත්වීමෙන් සත්ත්වයන්ගේ පැවැත්ම පිණිස වෙයි"

මිනොළිය

ප්‍රඥප්තිය:—ගඞ්ගාදී අත්තරාභවිකයා මනොළිය ය. **"ගඞ්ගාදී අන්තරාභවිකා මනොළිය උච්චතෙ මනොළිනිදීනන්ති"** ඝන්ථ ටීකාසි.

සම්භවෙෂී

විප්පනී:—එසේ ම ගන්ධවී අන්තරා භවිකයා "**සම්භවෙෂී**" යයි ද, කියනු ලැබේ. උත්පත්ති භවස්ථානයෙහි යනු කැමැති බැවිනි. "**සම්භවෙෂී උත්පත්ති භවස්ථානෙ ගමනෙච්ඡුඃ**" යනු ටිකායි.

වෛභාෂික වාදයෙහි මෙසේ "**සම්භවෙෂී**" යනුවෙන් අන්තරා භවිකයා අඳුන්වන නමුදු ස්ථවිර වාදයෙහි "**සම්භවෙසි**" යනු ශෛක්ෂ පෘථග්ජනයන්ට නමකි. එසේම අණ්ඩජ ජලාබුජ සත්ත්වයෝ යම් තාක් කල් අණ්ඩ කොෂ-වස්ති කොෂයන් නො බිඳිත් ද, ඒ තාක් **සම්භවෙසිහු** නම් වෙත්. බිඳීමෙන් පසු **භූතයෝ** නම් වෙත්. දක්වන ලදි. සූත්‍ර නිපාත අටුවාහි;

"**සම්භව මෙසන්තීති - සම්භවෙසි. අප්පහීණ භව සංයොජනත්තා ආයතිම්පි සම්භවං එසන්තානං සෙඛ-පුථුජ්ජනාන මෙතං අධිවචනං; අථවා චතුසු යොනිසු අණ්ඩජ ජලාබුජා සත්තා යාව අණ්ඩකොසං වත්ථිකොසඤ්ච න භින්දන්ති තාව සම්භවෙසි නාම. අණ්ඩකොසං වත්ථිකොසඤ්ච භින්දිත්වා බහි නික්ඛන්තා භූතානාම, සංසෙදජා ඔපපාතිකා ච පඨම චිත්තක්ඛණෙ සම්භවෙසි නාම. දුතිය චිත්තක්ඛණෙ භූතා නාම, යෙන වා යෙන ඉරියාපථෙන ජායන්ති, යාව තතො අඤ්ඤං න පාපුණන්ති තාව සම්භවෙසි, තතො පරං භූතාති**"

(3-10 කාරිකාවට ලියූ විස්තරය බලනු. 254 වැනි පිටුව)

ගන්ධවිශ්වාන්තරාභවඃ

විප්පනී:—254-260 පිටු බලනු.

නිර්වෘත්තිඃ

විප්පනී:—ගන්ධවී අන්තරා භවිකයා අභිනිර්වෘත්ති නම් ද, වේ, උත්පත්තිය අභිමුඛයෙහි මන බැවිනි, "**යතො'ස්‍ය නිර්වෘත්තිඃ උපපත්තිඃ අභිමුඛෙ භවති**" යනු ටිකායි.

41 නිර්ශ්‍රිතතිරත්‍රවෘද්ධ්‍යර්ථං-ආශ්‍රයාශ්‍රිතයෝර් ද්වයම්
ද්වය මන්‍ය භවාක්ෂෙප-නිර්ශ්‍රිත්‍යර්ථං යථා ක්‍රමම්

භාවය:—මේ සිව්වැදෑරුම් ආහාරයන් අතුරෙහි කවලීකාරාහාරය ශරීරයාගේ වැඩිම පිණිස ය. ස්පර්ශාහාරය චිත්ත චෛත්තයාගේ වැඩිම පිණිස ය. ඉතිරි මනඃසංචෙතනා-විඥානාහාර යන දෙක පිළිවෙළින් පුනර්භවාක්ෂෙය සහ උත්පත්තිය පිණිසය.

ආශ්‍රයා ශ්‍රිතයෝර් ද්වයම්

විප්පනි:— මෙහි ආශ්‍රය නම්; ශරීරයයි. ආශ්‍රිත නම්; චෛතසිකයි. ශරීරය; චිත්තය ද, චිත්ත චෛත්ත; ශරීරය ද, ආශ්‍රය කරන බැවින් ඔවුහු ආශ්‍රයාශ්‍රිතයෝ නම් වෙත්.

ද්වයමන්‍ය භවාක්ෂෙප නිර්ශ්‍රිත්‍යර්ථං

විප්පනි:—මනොසංචෙතනා හාරය පුනර්භවය වෙත එළඹ සිටුවයි. විඥානාහාරය උත්පත්තිය දෙයි. ස්ථවිර වාදයෙහි ද, මෙසේ ම දක්වන ලදි.

"මනො සඤ්චෙතනාහාර සඞ්ඛාතං කුසලා කුසල කම්මං තීසු භවෙසු පටිසන්ධිං; විඤ්ඤාණාහාර සඞ්ඛාතං පටිසන්ධි විඤ්ඤාණං සහජාත නාමරූපෙ ආහරති" යනු විභාවිනී ටිකායි.

42 ඡෙද-සංධාන-වෛරාග්‍ය-හානි ච්‍යුත්‍යුපපත්තයඃ
මනො විඥාන එවෙෂ්ටාඃ-උපෙක්ෂායාං ච්‍යුතොද්භවඃ

භාවය:—වියොගය – සංයොගය – විරාගය – පරිත්‍යාගය – ච්‍යුතිය– උත්පත්තිය යන මොවුහු මනොවිඥානයෙහි ම ගණිනු ලැබෙත්. ච්‍යුති–උද්භව දෙක උපෙක්ෂා වෙදනායෙහි ගණිනු ලැබේ.

මනො විඥාන.

විප්පනි:— 97 වැනි පිටුව බලනු.

උපෙක්ෂායාං ච්‍යුතොද්භවඃ

විප්පනි:—අනතුරු කාරිකාව බලනු.

43 නෛකාග්‍ර'චිත්තායාශ්‍රයානඤ්-ච ඊහිත්‍ය'ව්‍යාකෘතාදිශයෙ
ක්‍රමච්‍යුතානඤ් පාදනාභි-හෘදයෙෂු මනායව්‍යුතිඃ

44 අධඃ නෘ-සුරයා-ජානාං-මීෂිදෙෂ්‍යදඃ ඔඛාදිතිඃ
සම්‍යඬ් මිථ්‍යාත්ව නියතා-ආසී'නානන්තරී කාරිණඃ

කාශ්‍ය.—මෙම ධ්‍යුයි උද්දානවෙයි. එහෙයින් විඤ්ඤාණයෙහි ගොඩෙක්. අව්‍යාකෘතදශයෙහි නිවණට පැමිණෙයි අධොගතයන් ගේ පාදයෙහි ද, මනුෂ්‍යයන් ගේ නාභියෙහි ද, දෙවියන් ගේ සහ රහතුන් ගේ හෘදයෙහි ද, විඤ්ඤාණය ගේ ව්‍යුතිය වේ. මීවෙළුදය වනාහි අප් ආදින්ගෙන් වේ. ආසීයෝ නිර්‍වාණ යට නියතවූවෝ වෙත්. ආනන්තර්‍ය කාරීහු නිරය ආදි මිථ්‍යාත්ව නියතවූවෝ වෙත්.

නෛකාග්‍ර චිත්තාශ්‍රයානඤ්

විපති:—ව්‍යුති උත්පත්තීහු මිනෝ විඤ්ඤාණයෙහි සිටිත්. විසභාග භූමි බැවින් ද, අභිසංස්කාරික බැවින් ද, අනුග්‍රාහක බැවින් ද, සමාධිගත චිත්තයෙහි ව්‍යුති උත්පත්තීහු නොවෙත්. එසේ ම මනුෂ්‍යයන් අවිතර්කක වූ නිරොධ - සමාපත්තියට සමවන් කල ද, දෙවියන් අසංඥි සමාපත්තිගත වූ කල ද, ව්‍යුති උත්පත්තීහු නොවෙත්. කියන ලදී පිකාහි;

එතඤ් ව්‍යුතිං උද්ධවෙත්‍ව මනසා විඤ්ඤාණ තිෂ්ඨතඃ. පරං කථාපි එකාග්‍ර විතක්ක (=සමාහිතෙ චිත්තෙ) න භවතඃ. විසභාග භූමි ඛඩාත්, අභිසංස්කාරිකභාවාත්, අනුග්‍රාහි කභාවච්ච තත්‍රෛව අවිතක්ක නිරෝධ සමාපත්තිං ගතෙ මනුෂ්‍යෙ, අසංඥි සමාපත්තිං ගතෙ දෙව වා නාභවතඃ"

නිරොධ සමාපත්තියට සමවන් කල මරණයක් ස්ථවිර වාදයෙහි ද, නැත. (195 වැනි පිටුව බලනු)

නිර්‍වාහ්‍ය'ව්‍යාකෘතදශය

විපති:—ඓර්‍යාපථික උපෙක්ෂා විඤ්ඤාණයෙහි හෝ විපාකජ උපෙක්ෂා විඤ්ඤාණයෙහි හෝ නිවණට පැමිණෙයි.

ක්‍රමච්‍යුතානඤ් පාදනාභි හෘදයෙෂු මනායව්‍යුතිඃ
අධඃ නෘ සුරයා ජානාඃ

විපති:—ආකස්මික සිදුවීමක් (=හදිසි සිදුවීමක්) නොවන බැවින් ක්‍රම මරණයෙහිදි නාරක-ප්‍රෙත-තිරිසන් ගත අධොගතයන් ගේ පාදයෙහි ද, මනුෂ්‍යයන් ගේ නාභියෙහි ද, දෙවිඹුන්

ගේ සහ රහතන් ගේ කෘදයෙහි ද, විඤ්ඤාණය ගේ වුත්තිය වෙයි. මෙහි "අජාතානං" යනුවෙන් රහතන් ගත්හ. පුනර්ජන්මයක් නැති බැවිනි. "අජාතානං පුනබ්භවාභිනිබ්බත්තානං අසීනං කෘදය එව මනසෘ (විඤ්ඤාණස්ස) වුත්තිං භවති" යනු ටීකාසි. (චින්තයසි.)

මම්මච්ඡේදෘ මරණදුක්ඛං

විපත්තිනිදානං—මර්මවේධදයෙන් (මරුතැන් සිදීමෙන්) වන මරණය අප්-තෙජස්-වායූන් ගෙන් ද, ඒ සමාන වූ කළු (සෙම්) පිත්ත-වාතයන්ගෙන් ද වේ.

සම්මත්ත මිච්ඡත්තනියතානං-අරියා කතකම්මාදිනං

විපත්තිනිදානං—මෙහි "සම්මත්ත" යනුවෙන් නිර්වාණය ගන්නා ලදි. ශ්‍රෝතාපන්න-සකෘදගාමි-අනාගාමි අර්හත් ආර්යයෝ නිර්වාණය ට නියතවූවෝය.

ආනන්තර්‍ය කම් කළහු නාරක – ප්‍රෙත – තිරශ්චීන් යන ගතින්ට නියතවූවෝය. මෙහි මිථ්‍යාත්ව නම්; නරකාදිගතිහු වෙත්.

"ඒ ආනන්තරිය කර්මය කළා වූ සත්ත්ව තෙමේ ඔසුපත් සහිත වූ අවීචිමහා නරකාග්නීන් අතුරුදන් යම්කිසි කරකයක ඉඳිමි නියත තුබුන් අවීචි මහා නරකයෙහි උපදින්නේ යයි කියා හෝ එක් කල්පයක් දුක් විඳින්නේයයි කියා හෝ නියත බවෙක් නොවදළේසි" යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ සන්නයි

සම්‍යක්-මිථ්‍යා දෙකට ම අයත් නුවූවෝ ආර්යයෝ ද, නොවෙත්. ආනන්තර්‍ය කාරීහු ද, නොවෙත්.

මාතෘ ඝාතනය-පිතෘ ඝාතනය-අර්හත් ඝාතනය-සංඝභේදය-දුෂ්ට චිත්තයෙන් බුද්ධ ශරීරයෙන් ලේ සෙලවීමය යන මේ පස ආනන්තර්‍ය කර්මයි. අනතුරු අත් බැවිනි ඒකාන්තයෙන් විපාක දෙන බැවින් ආනන්තර්‍ය නම් වේ. කියන ලදි. "එතඤ්ඤාතම්-නන්තරං මෙව විපාකං දදාතීති ආනන්තරියං"

"ගරු කම් තෙමේ; කුශල ගරු කර්මය, අකුශල ගරු කර්මයයි දෙයාකාර වෙයි. ඔවුන් අතුරෙන් අකුශල ගරු කර්මය විනාශි. මාතෘ ඝාතක-පිතෘ ඝාතක – අරහන්ත ඝාතක – ලොහිතුප්පාදක-සංඝභේද කම් වශයෙන් පස් වැදෑරුම් වෙයි, මේ කම් පඤ්චකය

මනුෂ්‍යයකුට මුත් අමනුෂ්‍යයකුට නොකට හැක්කේයි. ඒ කර්ම පඤ්චකය ම යම් මනුෂ්‍යයකු විසින් රැස්කෙළේ නම්; කවර කර්මයක් විපාක දෙන්නේදැයි ප්‍රශ්න කෙළේ වී නම්; සඞ්ඝභෙද කර්මය ම විපාක දෙන්නේයි. අවශෙෂ කර්ම චතුෂ්කය අහොසි කර්ම වේය යි පිළිතුරු දිය යුතුයි. සඞ්ඝභෙද කර්මය තබා අවශෙෂ කර්ම චතුෂ්කය කෙළේ වී නම්; ලොහිතුප්පාදක කර්මය විපාක දෙයි. අවශෙෂ කර්මත්‍රය අහොසි කර්ම වෙයි. ලොහිතුප්පාදක කර්මය තබා අවශෙෂ කර්මත්‍රය රැස් කෙළේ වී නම්; අරහත්ත ඝාතක කර්මය විපාක දෙයි. අවශෙෂ කර්මවය අහොසි කර්ම නම් වෙයි. අරහත්ත ඝාතකය තබා අවශෙෂ කර්මවය රැස් කෙළේ වී නම්; පියා සුශීල වන්තයකු වීනම්; මව දුශ්ශීල වීනම්; පිතෘ ඝාතක කර්මය විපාක දෙයි මාතෘ ඝාතක කර්මය අහොසි කර්ම වෙයි. මව්පිය දෙදෙනා ම දුශ්ශීල වෙත් නම්; මාතෘ ඝාතක කර්මය විපාක දෙයි. පිතෘ ඝාතක කර්මය අහොසි කර්ම වෙයි. මාතෘ පිතෘ දෙදෙන ම සිල්වත් වී නම්; එකල්හි ද මාතෘ ඝාතක කර්මය විපාක දෙයි. පිතෘ ඝාතක කර්මය අහොසි කර්ම වෙයි මව ශීලවන්තියක්ව පියා දුශ්ශීලයෙක් වී නම්; මාතෘඝාතක කර්මය ම විපාක දෙන්නේ කුමක් හෙයින් ද යත්? මාතෘ පිතෘ දෙදෙනා අතුරෙන් මව ගුණ මහත්ත්වය ඇති හෙයි නැයි දතයුතුයි අහොසි කර්මය යනු චිතීයාදි ආත්ම භාවයන්හි විපාක නොදෙන කර්මය වේ. ඒ පඤ්චානන්තර්‍ය කර්මය රැස කළා වූ පුද්ගල තෙමේ ඒ කර්මය කළා වූ ආත්ම භාවයට අනතුරු අත්බැව්හි ඒකාන්තයෙන් අපායොත්පත්තිය ලබයි එහෙයින් ආනන්තරිය කර්මය යි ව්‍යවහාර කෙරෙති. ඒ ආනන්තරිය කර්මය කළා වූ සත්ත්ව තෙමේ ඔසුපත් සහිත වූ අටමහා නරකයන් අතුරෙන් යම්කිසි නරකයක ඉපදීම නියත නුමුත් අවිචි මහා නරකයෙහි ම උපදින්නේයයි කියා හෝ එක් කල්පයක් දුක් විඳින්නේය යි කියා හෝ නියත බවෙක් නො වදාළේ යි. කල්පයක් හුගේ මධ්‍යයෙහි ආනන්තරිය කර්මයක් කෙළේ වීනම්; අර්ධකල්පයක් ම දුක්විඳ කර්මය ගෙවී යන්නේ යි. කල්ප විනාශයට දශ දවසක් මත්තෙන් ආනන්තරිය කර්මයක් කෙළේවී නම්; දස දවසක් ම අපාය දුක් විඳ කර්මය ගෙවී යන්නේ යි කල්ප විනාශයට දෙතුන් දිනක් තබා ආනන්තරිය කර්මයක් කෙළේවී නම්; ඒ පුද්ගල තෙමේ නො මළහොත් අපාය දුකින් මිදෙන්නේ යි." යනු අභිධර්මාර්ථ සඞ්ග්‍රහ භාව සන්නයි.

ආනන්තර්‍ය කර්මයන් පිළිබඳ විස්තරය

4-96 බලනු.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු